

Upload By Rangika Creations

Oshin Novel

Rangika Creations E Novels Presents

rangikacreations@gmail.com

Team Of

www.buddyalbums.com

# එක

එදා ඔෂින්ගේ අම්මට හරිම සතුටු දවසක්. ආච්චි අම්මත් ඒ තරමම සතුටින්. පිට ගෙවල්වලට වැඩට ගිහින් හිටිය දුවලා දෙන්නම ඔෂොගත්සු අවුරුද්ද වෙනුවෙන් ගෙදර ඇවිල්ලා. අම්මා හැමෝටම කෝප්පවලට රාබු බත් බෙදා අතට දුන්නා.

"අනේ මට හරි දුකයි අද ඔයාලා නුගක් දවසකින් ගෙදර ඇවිල්ලත් ඔයාලට හොඳට කෑම ටිකක් දෙන්න නොලැබුණාට" අම්මා කීවේ හිසත් නමමින්.

"ඒකට කමක් නෑ අම්ම මට නම් ඕනෑ රාබු බත් කාල හරි ගෙදර ඉන්නයි."

මිට්සු කීවේ තාත්තා දෙස බලමිනි.

"ඔයාට එහෙදි හොඳට කන්න දෙනවද දුවේ"

අම්මා නැවත ඇහුවා.

"එහෙම වෙනසක් නෑ අම්මා"

"මිට්සු මොනවද ඔය කියවන්නේ ?"

"නෑ අම්මා එතැන කෑම හොඳයි"

හරුන් කීවේ මිට්සුට වැලමිටෙන් අනිමිනි.

"කන්න දුව තව ඕනෑ තරම් අරගෙන කන්න"

"කෝ මට තව ඕනෑ"

ඔෂින් කීවේ හිනැහෙමින්.

"ආච්චි අම්මා ඇයි කන්නේ නැද්ද?" හරුන් ඇහුවා

"මට ඇති, ඔෂින්ට තව දෙන්න."

"ආ මටත් ඇති. මේක ඔෂින්ට දෙන්න අම්මා." මිට්සු කිව්වා.

"ඇයි එයාට විශේෂයක්. මටත් ඕනෑ." සෝජි කීවේ ඔෂින්ට රවමින්.

"අම්මත් කන්න අම්මා" හරුන් ලී පෙට්ටිය දෙස බලමින් අම්මට කිව්වා.

"දන්නවද හරුන් මම ළඟදි ඉස්කෝලේ යනවා. දැන් මට වයස හයයි. කීමින් යනවා කිව්වා. අම්මා මට ගල්ලෑල්ලක් ගෙනැත් දෙනවා නේද? අම්මා." ඔෂින්ගේ හුරතල් හඬ කාමරය පුරාම පැතිර ගියා.

පහුවදාම හරුන් හා මිට්සු යන්න ගියා. ඒ අවුරුද්දේ අස්වැන්න පාළු වෙලා ගියා. ඔෂින්ගේ අම්මාත් සෝජීත් අඳ කුඹුරේ වැඩ කළත් ඔවුනට හම්බ වුණේ අස්වැන්නෙන් තුනෙන් එකයි. ඒත් ඒක කන්නත් කටවල් කියක් ද ?

"ඒ මදිවට තවත් කටක්."

තාත්තා කීවේ සුසුමක් හෙළමින්.

"අනේ මමත් උඹලට කරදරයක් උනා."

ආච්චි අම්මා වැළපුණා.

"එහෙම කියන්න එපා අම්මා. අම්මාට පුළුවන් කාලේ කුඹුරු වැඩ කළා. ගෙදරට වෙලා රෙදි මැහුවා. දැනුත් පිදුරු සපත්තු මහන්ඩ අපිට උදව් වෙනවා."

"ඒ උනාට මම නිකම්ම නිකම් නාකිච්චියක්. ඇයි මම මැරෙන්නෙ නැත්තේ ?"

"ආච්චි අම්මා මොනවද මේ කියන්නේ?"

ඔෂින් ආච්චි අම්මාගේ කට වැහුවා.

එදා උදේ ඔෂින් මල්ලිලා සමග එළියේ සෙල්ලම් කළා. බිම පතිත වන හිම පියලිවලට මුහුණ අල්ලමින් හිනැහුණා.

ආච්චි අම්මා කාමරේ ඉඳලා ආවා.



"ඔෂින් මෙතැනට එන්න දුව ඉක්මනට."

එවිටම තාත්තා සමඟ උස හීන්දෑරි එක්කෙනෙක් ආවා.

"මෙයාද ළමයා? හොඳ හුරුබුහුටි පොඩි කෙල්ලක්."

"හොඳයි, ඉක්මනට හොඳ තැනක් හොයලා කියන්නම්."

ඔහු එහෙම කියනකොට ආච්චි අම්මා ඔෂින් හංගා ගත්තා.

අම්මත් එතැනට ආවා.

'හොඳයි' තාත්තා හිස නැමුවා.

ඔහු යන්න ගියා.

"සකුසො ඒක කරන්න එපා. ඒක පව් වැඩක්. ඔෂින් පුංචියි."

"තවම අවුරුදු හයයි අනේ එපා."

"මේක නරක කාලයක්. අම්මට තේරෙන්නෑ ඕවා. එන්න එන්නම කන්න කටවල් වැඩි වෙනවා."

"එහෙනම් මට කෑම එපා. මට එක වේලක් ඇති."

"අනේ ඔෂින් යවන්න එපා සකුසො."

"ඔව් සකුසො, ඔෂින් පුංචි වැඩියි."

අම්මත් තාත්තා ළඟට පැමිණ තාත්තාගේ මුහුණ බලාගෙන සිටියා.

"මොනවද මේ කියන්නේ ? තවත් දරුවෙක් ලැබෙන්න නේද ඉන්නේ?"

අම්මා ඔෂින් දිහා බලලා බිම බලාගත්තා.

"ඇයි අම්මා මේ..."

"ඔෂින් ඔයා."

"එපා සකුසො එපා. මම ඔෂින්ට පස්සේ කියන්නම්."

"නෑ... නෑ... කොයි වෙලාවේ උනත් කියන්න තියෙන දේ කියන්න ඕනෑ."

තාත්තා ඔෂින්ගේ අතින් අල්ලාගෙන ගෙට ගියා.

Rangika

අම්මාත්, ආච්චිත් ඒ සමගම ගෙට ගියා.

"ඔෂින් ඔයාත් හරුන්, මිට්සු වගේ ගෙදරින් පිටවෙලා පිට ගෙදරක වැඩට යන්න ඕනෑ."

"මම මොනවටද යන්නේ ?"

"දුවට කන්න දෙන්න අමාරුයි."

"සකුයො මට කෑම එපා. අනේ ඔෂින් යවන්න එපා."

"නෑ තාත්තා මම යන්නේ නෑ මට ඉස්කෝලේ යන්න ඕනෑ."

"ඔෂින් අපට බත් කන්න හාල් නෑ. ඔයාව යවන්නේ ගඟ පහළ ලී මුදලාලි කෙනෙක්ගේ ගෙදරට. එහේ ඕනෑ තරම් සුදු බත් තියෙනව කන්න. එයාලා ඔෂින් වෙනුවෙන් අපට හාල් දෙනවා. එතකොට ආච්චිට වේල් තුනම කන්න දෙන්න පුළුවන්."

"ඇයි මම යන්නේ. එතකොට සෝජි ඉන්නේ."

"සෝජි ඕනෑ මාත් එක්ක කුඹුරට යන්න."

"බෑ මට ඉස්කෝලේ යන්න ඕනෑ."

"අනේ මගේ පොඩි ඔෂින් මම ඔයාව යවන්නේ නෑ."

"ඔයා ගිහින් සෙල්ලම් කරන්න" ආච්චි අම්මා කිව්වා.

"ඔව්, දුව යන්න සෙල්ලම් කරන්න" අම්මත් කිව්වා.

දින ගත වී ගියා. මේ දවස්වල ආච්චි අම්මා කෑමට ආවේ නෑ.

"මට බඩගිනි නෑ" කිව්වා. සුප් එක විතරයි බීවේ.

"ආච්චි අම්මා අසනීපයෙන්, ඊයේ ගෙට ආවෙත් අමාරුවෙන්."

'ආච්චි අම්මාට පෝෂණයක් නැහැනේ. මාළුවත් තිබුණොත් කෑමට. මට හිතෙනවා ගඟට යන්න. ගඟ පහළ ජෝසු මාමාගෙන් බිලී පිත්ත ඉල්ලා ගන්නවා. කිමීටත් කතා කරනවා.' ඔෂින් හිතුවා.

කිමියි කිමීගේ මල්ලියි ඔෂින් එක්ක ගඟ ළඟට ආවා. ගඟ මිදිලා එහෙමත් තැනක අයින පිපිරී වතුර ගලාගෙන ගියා. ඔෂින් හුගක් වෙලා බිලී පිත්ත දමාගෙන සිටියා. බොහෝ වෙලා ගතවුවත් උත්සාහය අත්හැරියේම නෑ.



එකවරම බිලී පිත්ත ඇදෙන්ට පටන් ගත්තා.

ඔෂින් බිලී පිත්ත ගස්සලා ගත්තා.

ටිකක් ලොකු මාළුවෙක්.

ඒත් ඒ මාළුවා අල්ලා ගත්තේ කිමීගේ ලොකු මල්ලි.

"දෙන්න මාළුවා මගේ" ඔෂින් බිලී පිත්ත අල්ලාගෙන තන්ගුස් ලණුව අදින්න පටන් ගත්තා.

"නෑ දෙන්නේ."

ඔහු ඔෂින් ගඟට තල්ලු කළා.

"අනේ ඔෂින් ගඟට වැටුණා. ඉක්මනට ගොඩගන්න" කිමී කෑ ගැහැව්වා.

කිමීගේ මල්ලි මාළුවත් අරගෙන ගෙදර දිව්වා.

ඔෂින් වතුර පෙරී පෙරී ගෙදර ගියා.

"මොකවද දුව ඔයාට උනේ? මේ ඔයාව සීතල වෙලා."

"අම්මා, කිමීගේ මල්ලී මගේ මාළුවා ගත්තා."

"මාළුවා ඒ කොහෙන් ද ?"

"මම ගඟට ගිහින් මාළුවෙක් ඇල්ලුවා."

"මාළු අල්ලන්න ගඟට යනවද කෙල්ලෝ."

"මේ දවස්වල ආච්චි අම්මා කෑම කන්නේ නැහැ. මම හිතුවා ආච්චි අම්මාට ශක්තිය එන්න මාළුවෙක් අල්ලල ගේන්න."

"ඔෂින් ආයේ ඔයා ගඟට යන්න එපා. මට මාළු එපා දුව."

ආච්චි අම්මා ඔෂින්ගේ හිස පිස ගත්තා.

එදා දවල් ඔෂින් තමාගේ කෑම බෙදූ බත්දෙසිය රැගෙන ආච්චම්මා ළඟට ගියා.

"ආච්චම්මා මේ මගේ කෑම එක. එන්න අපි දෙන්නා කමු. ආච්චි අම්මාට කෑම ගෙනාවේ ආච්චි අම්මා අසනීපෙන් නෙමෙයි කියලා මම දැන ගත්තා. මට හරි සතුටුයි. ආච්චි අම්මා සනීපෙන් ඉන්න නිසා."

Rangika

එවිටම ඔෂින්ගේ අම්මා කාමරයට එබුණා.

"ඔයා මෙතනද ?"

"ඔව් අම්මා, ආච්චි අම්මාට මගේ කෑම එක ගෙනාවා."

"එපා ඔෂින් ඔයා ඕක කන්න. මමත් කෑවොත් ඔයාට බත් මදි වෙයි. මම කිසි වැඩකට නැති ගෑනියක්. මම මැරිලා යන්නේ නැහැනේ."

ඔෂින් ආච්චි අම්මව බදා ගත්තා.

"ඔහෙම කියන්න එපා. අපිට ආච්චි අම්මා ඕනේ."

ඔෂින් ආච්චි අම්මාට තට්ටු කරමින් කීවා.

ඔෂින් එළියට ගියා.

"මට දැන් තේරෙනවා මම බඩ පිරෙන්න කෑවොත් ආච්චි අම්මාට බත් නෑ. තාත්තා කියනවා වගේ අපිට හාල් නෑ."

ඔෂින් අම්මා හොයාගෙන කුඹුරට ගියා. එකවරම ඔෂින් දුටුවේ අම්මා ගඟ දිගේ පහළට යනවා. ඔෂින් කෑ ගහගෙන දිව්වා.

" අම්මා, අම්මා."

එත් ෆූජි ගඟේ සීතල වතුරට බැහැලා, වතුරට මැදිවෙලා වාඩි වී හිටියා.

"අම්මා අනේ අම්මා."

ඔෂින්ගේ හඬ ඇයට ඇසුණා.

"දුව ගෙදර යන්ඩ මම ඉක්මනට එන්නම්."

"අනේ අම්මා ඉක්මනට ගොඩට එන්න."

"දුව කෑ ගහන්න එපා. කාටවත් කියන්න එපා ගෙදර යන්න."

"අනේ උදව් කරන්න අම්මා මැරෙන්න යනවා."

ඔෂින් හිම ගොඩේ වැටිවැටී දුවගෙන ගියා.

ගොවියෝ කීපදෙනෙක් පැමිණ ෆූජි ගොඩට ගත්තා.

"මෙකී අපට ලැජ්ජා කරනවා."

තාත්තා ගෙදර ආව ගමන් බැනගෙන බැනගෙන ගියා.



ආච්චි අම්මා අම්මගේ ඇඟ උණුසුම් කළා.

"ලැජ්ජා කරනවා නේද ? පිරිමි මොනවද දන්නේ ගෑනු තමයි විඳවන්නේ."

"අම්මා දැන් අම්මට හොඳයි නේද ?" ඔෂින් ෆූජිගේ අත අල්ලා ගත්තා.

"දුව බය වුණා ද? දැන් මට හොඳයි."

"අම්මා මම හෙට ඉඳලා වැඩට යනවා."

"මොනවද ඔෂින් කියන්නේ?"

"මම හිත හදා ගත්තා අම්මා. නේද තාත්තා මට එහෙදි සුදුබත් කන්න පුළුවන්."

"අම්මා ඉක්මනින් සනීප වෙන්න. එතකොට බබත් හොඳ බබෙක් වෙයි."

"එපා ඔෂින්. ඔයා යන්න එපා." ආච්චි අම්මා හඬා වැටුණා.

"එපා දුව, ගෙවල්වල වැඩ කරන්න ඔයාට බෑ ඔයා තව පොඩියි."

"නෑ අම්මා, තාත්තා කිව්වා එහෙ පොඩි ළමයෙක් බලාගන්න තියෙන්නේ කියලා. මට පුළුවනි මමනෙ මල්ලිලා බලා ගත්තෙ. ඒ නිසා මට පුළුවනි."

"දැන් ඔය කථාව නවත්ත ගන්න." සකුසෝ කිව්වා.

එක දවසක් උදේ හාල් ගෝනියක් රැගෙන පුද්ගලයෙක් ආවා. ඔහු එය බිත්තියට හේත්තු කළා.

"කෝ අම්මා තාත්තා ?"

"අම්මලා කුඹුරේ" ඔෂින් කිව්වා.

"මේ මොනවද ?"

"ඔය ඔයාගේ අවුරුද්දක වැටුපට හාල්. හෙට අනිද්දට මුදලාලිගේ ගෙදර යන්න සූදානම් වෙන්ඩ. මම තාත්තා මුණ ගැහිලා එන්නම්."

ඔෂින් ලී කෝටුවක් රැගෙන හාල් ගෝනියට ඇණ ඉන් හාල් ඇට අතට ගත්තා. ඔෂින්ට තේරුණා දැන්නම් ගෙදරක වැඩට යන්නම

Rangika

වෙන බව. නෑ මට පුළුවනි ළමයි බලාගන්න. දැන් ආච්චි අම්මට තුන් වේලම බත් කන්ඩ පුළුවන්.

අම්මටත් සුදු බත්ම කන්න පුළුවන්, ඔෂින් හිතුවා.

මේ අතර අම්මා ගෙදර ආවා.

"අම්මා මේ හාල් ගෝනියක්. මේ මගේ අවුරුද්දෙම පඩිය කීවා, අම්මා මේවා සුදු බත් කන්න පුළුවන් හාල්."

"දුව ඔෂින්" අම්මා ඔෂින් බදාගත්තා.

"අම්මා දුක් වෙන්න එපා මම යන්නම්. මට හරුන්ට මිට්ටුට වගේ වැඩ කරන්න පුළුවන්."

අම්මා එදා රෑ සුදු බත් ඉව්වා. ඉස්සරලාම බත් කෝප්පය දුන්නේ ආච්චි අම්මාට.

"අම්මා මේ ඔෂින්ගේ සුදු බත්, ඔෂින්ට සතුටුයි, අම්මට සුදුබත් කන්න දෙන්න ලැබෙන නිසා. ඒක නිසා අම්මා මේ බත් ඉස්සරලාම කන්න.''

"මොනවද මේ කලේ ගෑණියේ මම හිතාගෙන හිටියේ මේ සුදු හාල් විකුණලා බාල හාල් ගේන්නයි."

"මේවා ඔහේගේ හාල් නෙමෙයි මේවා ඔෂින්ගේ. ඔෂින්ට හොඳට කන්න දීලා අරින්න ඕනෑ."

ෆූජි කීවේ තරහින්.

සියල්ලත්ම කෑවත් ආච්චි අම්මා බත් කෝප්පය අතේ තියාගෙන හඬා වැළපුණා.

අම්මා කෑම කා ඉවර වී කෝප්ප සෝදා ඇයගේ කිමෝනාවක් ගෙන එය කපා මහන්න පටන් ගත්තා. ඒ ඔෂින්ට ඇඳගෙන යන්ඩ.

රෑ නින්දේ දී ආච්චි අම්මා ආයෙමත් වැලපුණා. ඔෂින්ටත් නින්ද ගියේ කඩින්කඩ. ඒ හැම අවස්ථාවකම අම්මා මහනවා.

"අම්මා නිදා ගත්තෙම නෑ නේද ?" පාන්දරම අම්මා ළඟට ආව ඔෂින් ඇහුවා.

"ඔෂින් මම මේ ඔයාට ඇඳගෙන යන්න කිමෝනාවක් මැහුවා."



"මේක ලස්සනයි අම්මා. මේක ඔයාගේ නේද ?"

"ඔව් දුව, මම මේ කිමෝනාව මම මනමාලියක් වෙලා තාත්තා එක්ක මේ ගෙදරට එනකොට ඇඳගෙන ආවා. මම මේක තියාගෙන හිටියේ ඔයාට දෙන්න. ඒත් මේ තරම් ඉක්මනට නෙමෙයි."

අම්මා ඔෂින් වැළඳගෙන ඇඬුවා.

"ඔයා ගියාම මට හරි පාළුයි දුව. ඔයා මට කොයිතරම් උදව් කළාද? මේ නංගිලා මල්ලිලා නිසා මට හරියට ඔයා බලාගන්නවත් බැරි වුණා."

ඔෂින් අම්මා වැළඳගෙන හිටියා. උදේ අම්මා ඔෂින්ට කිමෝනාව ඇන්දුවා.

"හරි ලස්සනයි අම්මා" ඔෂින් කීවේ හිනැහෙමින්.

එළියේ සිට කතා කරන්නෙකුගේ කටහඬ ඇසුණා.

"ගෙදර කවුද ? මම මේ ලී මෝලෙන් ආවේ අර වැඩට ගෙනියන කෙල්ල ගෙනියන්ඩ."

"ඉන්ඩ එනවා." තාත්තා එළියට ගියා.

"දුව ඉවසගෙන වැඩ කරන්ඩ. පිට ගෙදරක වැඩ ලේසි නෑ. හැබැයි ඔයාට ඉන්ඩම බැරි උනොත් ආපිට එන්ඩ."

"ඉක්මන් කරන්ඩ. ළමයා ගේන්ඩ."

තාත්තා එළියේ සිට කෑගහන හඬ ඇසුණා.

"ඔන්න දුව ලේන්සුවේ ඇඳුම් දෙකකුත් තියෙනවා. බත්ගුලි දෙකකුත් තියනවා. ප්‍රවේශමෙන් වැඩ කරන්න."

ආච්චි අම්මා ඔෂින්ගේ අත අල්ලා ගත්තා. අල්ල දිගහැර එහි කාසියක් තිබ්බා.

"ඔෂින් මට ඔයාට වෙන දෙන්න දෙයක් නෑ. මේ කාසිය තියා ගන්න."

"අනේ ආච්චම්මා."

ඔෂින් ආච්චි අම්මා වැළඳ ගත්තා.

"කෝ එන්නේ නැද්ද ?"

ඔෂින් ආච්චිඅම්මාටත් මවටත් මැදිව එළියට ගියා.

"කෝ ඔය ළමයට තොප්පියක් පොරවණයක් එහෙම. අපි යන්නේ ලී පහුරේ එතකොට වතුර විසිවෙනව වැඩියි."

"ලී පහුරේ ඇයි ඒ? අපි හිතුවේ බෝට්ටුවේ කියලා. එහෙමනම් ළමයා එවන්ඩ බෑ."

අම්මා ඔෂින් තුරුලු කරගත්තා.

"බෝට්ටුවල යන්න කාටද සල්ලි තියෙන්නේ ? ලී පහුරේ නිකම්ම යන්න පුළුවනි."

"බෑ බෑ මේ පොඩි ළමයා ලී පහුරේ යවන්න බෑ."

"එහෙම නම් බෝට්ටුවේ ගෙනියන්න මුදල් දෙන්ඩ වෙයි."

"හූජ් ඔය ළමයා යවන්ඩ. අපිට බෝට්ටුවට දෙන්ඩ සල්ලි කෝ?"

ආච්චි අම්මා ගෙට ගොස් අම්මාගේ තොප්පියත්, ආච්චි අම්මාගේ කම්බිලියත් අරගෙන ආවා.

"ආ දූව මේවා ගන්න."

"එපා ආච්චි අම්මා, අම්මාට තොප්පිය නැතිව කුඹුරේ වැඩ කරන්න අමාරුයි. ඔය කම්බිලිය නැතිව ආච්චි අම්මාට සීතලේ ඉන්න වෙයි. මම යන්නම්."

ඔෂින් පෙරමුණ ගත්තා.

මෂූමරි ඒ කියන්නේ ඔෂින් කැටුව යන්න ආ තරුණයා ඔෂින් ඔසවාගෙන පහුරට ගෙන ගියා. අම්මත් ඒ පසුපසින් ගියා. තාත්තා අහක බලාගෙන සිටියා.

"ඔෂින් යනවා බලන්නවත් යන්නේ නැද්ද ? ඇත්තටම ඔයා නම් මහ පුදුම තාත්තා කෙනෙක්. අවුරුදු හතයි දරුවා වික්කා." කියමින් ආච්චි අම්මා හඬා වැලපුණා.

"අයියෝ ඔෂින්, මගේ දූව මටයි පාළු."

පහුරට නැගලා වාඩි උනා විතරයි ඔෂින්ට දැනුණා තමා සියල්ලන්ගෙන්ම වෙන්ව යන බව. ඒ වෙන්වීම දිගු කල් බව. ඇයට



හිතුණා මේ ගමන නොයන්න. ඇය පහුරෙන් පනින්න හදනකොටම මෂූමරි.

"කොහෙද මේ යන්නේ ?"

හයියෙන් අල්ලා ගත්තා.

"අම්මා අනේ අම්මා මට යන්න බෑ අම්මා, අම්මා."

ඔෂින් කෑ ගහන හඬ අම්මා අහගෙන හිටියේ කඳුළු බිබී. ඒත් හිත තද කරගෙන ඒ දිහා බලාගෙන හිටියා.

ඔෂින් හිස පහත් කරගෙන ඉඳලා හිම කන්ද දිහා බැලුවා. හිම කන්ද උඩ තාත්තා නේද ?

"තාත්තා තාත්තා."

ඇය කෑගහන්න පටන් ගත්තා.

සකුසෝ හිම කන්ද දිගේ පහළට දුවගෙන ආවා.

"ඔෂින් ඔෂින්."

ඒ හඬ කන්ද දිගේ දෝංකාර දුන්නා.

සකුසෝ ගං ඉවුරට වී දණ ගසාගෙන හඬා වැළපුණා.

තාත්තා ගැනත් අම්මා ගැනත් ඔෂින්ට දුක හිතුණා.

''නෑ, කමක් නෑ මම යනවා. මම නොගියොත් ආච්චි අම්මාට කන්න බත් නෑ. අම්මට ලැබෙන බබා හොඳ බබෙක් වෙන්න නම් මම යන්නම ඕනෑ.'' ඉන්පසු ඇය කෑ ගැසුවේ නෑ. හිම කඳු මැදින් ගලා ගිය ගඟ දිගේ පහුර පාවී ගියා.

Rangika

# දෙක

ප්‍රහුරේ ගමනින් ඔෂින් අසනීප වුණා. නිවසට ඇතුල් වීමට පෙර ඔෂින්ට වමනය ගියා.

"ඇයි ඔෂින්, ඔයාට සනීප නැද්ද ?"

මෂුමරි ඇහුවේ අනුකම්පාවෙන්.

"මෙන්න අර ළමයා ගෙනාවා."

ඔහු ගෙය දෙසට හැරී කෑගැසුවේ ඔෂින්ව අල්ලා ගෙන.

සූඩාකෝ ඒ කියන්නේ ප්‍රධාන සේවිකාව එළියට දුවගෙන ආවා.

"මෙයාද කෙල්ල. අයියෝ පොඩි කෙල්ලක්නේ. මෙයාට පුළුවන්ද අපේ බබාව බලාගන්ඩ. ඒ මදිවට ලෙඩත් වෙලා."

"ඒ පහුරේ ඇවිල්ලා. ඒ ළමයට කරකැවිල්ල."

"ඔන්න ඔය කෙල්ල ගෙට ගෙනියපන්."

ඇය ආපසු හැරී ගියා.

මෂුමරි, ඔෂින්ගේ හිස අතගෑවා. ඔසවාගෙන ගොස් ගෙතුළ තිබ්බා.

ඔෂින්ට, එහෙමම නින්ද ගියා.

සූඩාකෝ කාමරයට ගොස් ඔෂින්ට කතා කළා.

"ළමයා නැගිටපන්, දැන් උඹ මිස්ට නාගෝ මූණ ගැහෙන්න ඕනෑ. වරෙන් යන්ඩ. මෙහෙ ප්‍රධාන සේවිකාව මම. මෙහෙ වැඩ-



"කතා කරපන්, මොකද කතා නැත්තේ? ඉගෙන ගනින් කවුරු හරි කතා කළාම කතා කරන්න. තේරුණාද උඹට ?"

"එහෙමයි" ඔෂින්ගේ වියලුණු තොල් සෙලවුණා.

"වරෙන් යන්ඩ."

ඔෂින් ඇය පිටුපස ඇදුණා. ඔවුන් ගියේ විසිත්ත කාමරයකට. එහි මේසයක් ළඟ නෝනා කෙනෙක් හා මහත්තයෙක් වාඩි වී සිටියා.

"මේ ඉන්නේ නාගෝ මහත්තයා. මේ නෝන මහත්තයා."

ඔෂින් ඉක්මනින්ම බිම දණගසා හිස බිම තබා ආචාර කළා.

"අයියෝ මෙයා හරි පොඩි ළමයෙක් නේ." නෝනා කිව්වා.

"මාත් ඕක කිව්වා."

"කීයද ඔය ළමයගෙ වයස?"

"මට අවුරුදු හතයි මහත්තයා."

"හතයි, අපට කිව්වේ නවයක ළමයෙක් කියලා."

සූඩාකෝ කිව්වා.

"ඒ වුණාට මට හොඳට ළමයි බලාගන්න පුළුවනි මහත්තයා. මගෙ මල්ලිලා බලා ගත්තේ මම. මට උයන්ඩත් පුළුවනි. අම්මා කුඹුරට ගියාම මම රාබු බත් උයනවා."

"මේ ළමයා ආපිට අරින්න තියෙන්නේ."

නෝනා කිව්වා.

"එපා මැඩම්. මාව ආපිට අරින්න එපා. තාත්තට තරහ යයි. ආච්චම්මාට බත් කන්න නැතිවෙයි."

නාගෝ මහත්තයා මේ හුරුබුහුටි කෙල්ල දිහා බලාගෙන හිටියා.

"නෑ මේ ළමයා හොඳයි. යුනිකෝ දෙන්න බබාව මෙයාට."

ඔහු තම බිරිඳ දෙස බැලුවා.

බබා දැක්ක ගමන් ඔෂින් සතුටින් හිනැහුණා.

"... ... බබෙක්, අන්න මාව දැකලා හිනා වෙනවා.

ඔෂින්ගෙ පිටේ දැමූ රෙදි පටිවලින් බබාව පිටේ එල්ලුවා.

"මේ බරාදයේ ඉන්න ඇතට යන්න එපා."

"හොඳමයි."

ඔෂින් බබාව ගෙන එහෙ මෙහෙ ඇවිද්දා. ඒත් ගෙදර මල්ලිලා වගේ නෙමෙයි. මේ බබා ගේ බරට ඔෂින්ගේ උරහිස් කකියෑවා. ඒත් බබාගේ හුරතල් මුහුණට ඇය ආදරය කළා.

සෙමෙන් කකුල් කිතිකවමින් බබා හිනැස්සුවා.

"මොකද්ද ඔයාගේ නම කීවේ, ආ හරි ටකේෂි නේද ? ටකේෂිට මම ආදරෙයි. මම හැමදාම ඔයාව බලා ගන්නම්කො."

ටිකකින් බබාට ඔෂින්ගේ කරේම නින්ද ගියා.

යුනිකෝ පැමිණ බබාව පටිවලින් මුදවා වඩා ගත්තා.

"ඔෂින්ට ස්තුතියි බබා බලා ගත්තාට."

ඔෂින් එතනම තිබූ ලී වේදිකාවක වාඩි වෙලා කකියන කකුල් අතගෑවා.

"ආ උඹ මෙතන සැප ගන්නවද ? වරෙන් මට උයන්ඩ උදව් කරපන්."

ඔෂින්, සුඩාකෝ පසුපස ගියා. උඳුනේ බතක් ඉදේ. එහි පසෙක රාබු කැලි පොඩිවට කපා තිබුණා.

"ඔය රාබු කැලි ටික මේ බතට දාපන්."

"මෙහෙ කන්නෙත් රාබු බත්ද ? මෙච්චර පෝසත් අයත් රාබු බත් කනවද ?"

"නෑ, මේවා වැඩකරන අයට. එහෙම නැතිව සුදු බත් දෙන්ඩයැ. හොඳට තියෙයි."

ටික වේලාවකින් ලී මෝලේ වැඩ කරන අය තම තමන්ට අයත් ලී පෙට්ටිගෙන උයන ගෙයි මේසය ළඟ වාඩි වුණා.

සුඩාකෝ ඒ ලී පෙට්ටි තුළ වූ කෝප්ප පුරවා රාබු බත් බෙදුවා. එළවළු සුප් එකකුත් බෙදුවා.



"මේවා අස්කරලා දමපන්, අද උඹට කන්න හොඳ නෑ. වමනේ ගියා නේද ? එතකොට කන්න හොඳ නෑ."

ඔෂින් පුදුමයෙන් බලාගෙන හිටියා. සෙමෙන් නැගිටලා කාමරයට ගියා. ඔෂින්ට දැඩි කුසගින්නක් දැනුණා.

" අම්මා, මට බඩගිනියි." ඔෂින් අඳුරු කාමරයට කිව්වා.

ඒ සමගම ඇයට මතක් වුණා, අම්මා බත්ගුලියක් ලේන්සුවේ බැන්ද බව. ඇය ඉක්මනින් ලේන්සුව ලිහා බත්ගුලි අතට ගත්තා.

ඇය එය සෙමෙන් හපන්න පටන් ගත්තා.

"රසයි අම්මා, සුදු බත්."

ඇය සෙමෙන් කිව්වා.

ටික වෙලාවකින් සුඩාකො කාමරයට එබුණා.

"මොනාද කරන්නේ, බබාගේ ඇඳුම් ටික හෝදලා දමනවා."

"හොඳයි."

ඔෂින් ඇය පසුපස ඇදුණා.

ලී බාල්දියක දැමූ බබාගේ ඇඳුම් කීපයක් රැගෙන ඇය ළිඳ ළඟට ගොස් වතුර බාල්දියක් ඇද්දා.

" ආ... ආ... ඔය මොනාද කරන්නේ. රෙදි හෝදන්නේ ළිඳ ළඟ නෙමෙයි මෝඩියේ. ඔය වතුර බොන ළිඳ. පිරිසිදුව තියාගන්ඩ ඕනෑ. උඹ නම් මහ මෝඩ කෙල්ලක්. මේකත් අරගෙන ගඟට පලයන්."

"හොඳයි."

ඔෂින් අමාරුවෙන් ලී බාල්දියත් ඔසවාගෙන ගඟට ගියා. ඔෂින් ගඟ දිගේ උඩට තිබෙන හිම කඳු දෙස බැලුවා. ගඟ නිසා ඇය තම ගම වූ යමගාටාවලට ළං වූ බවක් ඇයට දැනුණා.

"අම්මා මෙහෙ බබා හරි ලස්සනයි. එයාගේ නම ටකේෂි. මැඩම් හොඳයි. මහත්තයත් හොඳයි. සුඩාකෝ නම් ටිකක් නපුරුයි. ඒත් පත්තෙස හරියයි. මම හැමදේම ඉගෙන ගන්න බලන්නම්කො." ඔෂින් තමාටම කියා ගනිමින් සීතල වතුරෙන් රෙදි සේදුවා.

ගඟට එන එක හොඳයි. එතකොට මට යමගාටාවලට ළං වුණා වගේ දැනෙනවා. ඔෂින් ලී බාල්දිය අමාරුවෙන් ඔසවාගෙන ගියා. ඔෂින් හෙමින් හෙමින් ගෙදර වැඩ කිරීමට පුරුදු වුණා. සුඩාකෝ නම් හොඳ මූණක් පෙන්නුවේම නැහැ.

"ඔය ලිපට හොඳට ගින්දර දමපන්. වතුර රත්වෙන්ඩ ඕනෑ නෝනලට නා ගන්ඩ." ගෙදර අය නෑවට පස්සෙයි ඔෂින්ට නෑමට ලැබුණේ. ඒත් ඒ වෙනකොට ටැංකියෙ අඩියෙ වතුර ටිකක් විතරයි තිබුණේ. ඔෂින් හිටියේ බඩගින්නේ.

"ඔෂින් ගිහිල්ලා නාගෙන වරෙන්. අන්තිමට යන එක්කෙනා ටැංකිය පිරිසිදු කරන්න ඕනෑ."

"මම පස්සෙ නාන්නම්."

"උඹ නෑවත් එකයි, නැතත් එකයි. ටැංකිය හෝදලා වරෙන්."

ඔෂින් ඇයට වඩා බෙහෙවින් උස ටැංකිය සේදුවේ අපහසුවෙන්.

"බෙදාගෙන කාපං."

ඔෂින් බත් දැමූ ලී භාජනයේ පියන ඇර බැලුවා. එහි තිබුණේ බත් ටිකයි.

"බත් ඉවර වෙලා."

ඇයට ඉබේට කියවුණා.

"ඔය තියෙන්නේ, ළමයෙකුට ඔය ඕනෑතරම් ඇති. විශේෂයෙන් ගෑනු ළමයි පුරුදු වෙන්ඩ ඕනෑ ලැබෙන තරමක් කාලා ඉන්ඩ. තේරුණාද?"

ඔෂින් භාජනයේ වූ අන්තිම බත් ඇටය පවා හැන්දෙන් ගෙන ඇයගේ ලී කෝප්පය පුරවා ගත්තා. හඹි කෝටු දෙකෙන් ඉක්මනින් කෑවා.

කාලය ගෙවී ගියා. ගිම්හානය උදා වුණා. ගෙවල් ඇතුළේ උණුසුම නිසා ඔෂින් බබාවත් පිටේ රඳවාගෙන ලී මෝල පාර දිගේ එහා මෙහා ඇවිද්දා. එතකොටම එතනින් ළමයි ටිකක් දුවගෙන ගියා.

"යමු, යමු පරක්කුයි, ඉස්කෝලේ පටන් අරගෙනත් ඇති."



"ඉස්කෝලේ."

ඔෂින් ඒ වචනය නැවත නැවත කිව්වා. එතකොටම එතනට මසුමරි මාමා ආවා.

"ආ... ඔෂින් අදනම් රස්නේ දවසක් නේද ?"

"ඔව් මාමා" ඔෂින් හිනැහුණා.

"ඉස්කෝලේ ළඟයිද මාමා."

"ඉස්කෝලේ ?"

"ඔව්, මේ ළඟ."

"ආ. ඔව් ඔය පාරේ ටිකක් උඩහට ගියාම. ඔෂින්ට ඕනෑනම් බලලා එන්න. හැබැයි ඉක්මනට ආපිට එන්න."

ඔෂින් වටපිට බලලා බබත් අරගෙන උඩහට දුවලා ගියා. ලොකු ගොඩනැගිලි කීපයක්, සෙල්ලම් පිටියක්, ඔෂින් හෙමින් ම ගිහින් ළඟම වූ පංතිය දිහා ජනේලයෙන් බලාගෙන හිටියා.

ගුරුතුමා කළු ලෑල්ලේ ලියූ වචනය ළමයි කියෙව්වා.

"හොඳයි ෂෙන් ඔයා ඇවිල්ලා මේ වාක්‍ය කළු ලෑල්ලේ ලියන්න. හැබැයි මතකෙන් ලියන්න."

"අනිත් අයත් පොතේ ලියා ගන්න."

ගුරුතුමා පංතිය කොනට ඇවිද ගෙන ආවා. එතකොට ඔහු දුටුවා ඔෂින් ජනේලයෙන් කළුලෑල්ල දෙස බලාගෙන ඒ වචන මුමුණන බව. ඒත් දුටු ගමන් ඔෂින් පහළට නැමිලා දුව ගියා සෙල්ලම් පිටිය පැත්තට. ඇය ළමුන් සෙල්ලම් කරන ආකාරය බලාගෙන හිටියා. එකවරම අතකින් ඇයගේ උරහිස අල්ලා ගත්තා.

ඔෂින් තිගැස්සුණා.

ඒ ගුරුතුමා.

"ඔයා ඇයි මෙහේ ?"

"සමාවෙන්න ගුරුතුමා. මම වරදක් කළේ මට සමාවෙන්න."

"නෑ ඔයා වරදක් කළේ නැහැ. ඔයාට පාසල බලන්න හිතුණද?"

"ඔව් ගුරුතුමා මට ආසා හිතුණා."

"මොකක්ද ඔයාගේ නම ? වයස කීයද ?"

"මගෙ නම ඔෂින්, මට අවුරුදු හතයි ගුරුතුමා."

"මේ බබා ඔයාගේ මල්ලීද ?"

"නෑ ගුරුතුමා, මේ බබා බලාගන්න සේවිකාව මම. මගෙ ගම යමගාටා. මම අවුරුද්දක්ම වැඩ කරන්න මෙහෙ ආවා. ඒකට අපට හාල් ගෝනියක් හම්බ වුණා. ඉතින් මගෙ ආච්චම්මටත් සුදු බත් කන්න පුළුවන් නිසාම මම මෙහෙ ආවා."

ඔෂින්ගේ සුරතල් මුහුණත් ඇයගේ හුරුබුහුටි කතාවත් දෙස ගුරුතුමා බලාගෙන හිටියා.

"ඔෂින් ඔයා ඉන්නේ කොහේද ?"

"මම ඉන්නේ අර ලී මඩුව ළඟ ගෙදර. ඒ ලී මඩුව අපේ මහත්තයාගේ."

"ඔෂින් පාසල් යන්න ආසද ?"

ඔෂින් ගුරුතුමාගේ මුහුණ දෙස බලාගෙන හිටියා. ඉතාමත් මිහිරි සිනාවකින් ඇයගෙ මුහුණ පිරීගියා.

"එහෙමයි." ඇය හිස වැනුවා.

පුංචි ටකේෂිගේ මුහුණ ඔෂින්ගේ බෙල්ලේ වැදෙන්ට පටන් ගත්තා.

"සමාවෙන්න ගුරුතුමා. බබාට නින්ද ගිහිල්ලා. මම යන්න ඕනෑ. හුඟක් පරක්කු වුණා."

ඔෂින් ගුරුතුමාට හිස නමා ආචාර කර ගෙදර දුවන්න පටන් ගත්තා. ඇය ගෙදරට ළඟා වන විට නිවැසියන් හොඳටම බය වෙලා.

"මම ආවා."

ඔෂින් බොරු හිනාවක් මවාගෙන ගෙට දුව ගියා.

"කොහේද කෙල්ලේ ගියේ ? අපි බයවෙලා හිටිය තරමක්."

"අනේ මගේ ටකේෂි, මම හරියට බය වුණා."

මැඩම් ඉක්මනට පටි ලෙහලා ටකේෂිව වඩා ගත්තා.



"කොහේද උඹ ගියේ?"

"මම කොහේවත් ගියේ නෑ. මම පාරේ ඇවිද ඇවිද හිටියේ."

ඔෂින් කීවේ බියෙන්.

"ඔෂින් පාරේ ඇවිද්ද නම් අපි සේවකයෝ හැම පැත්තටම ඇරියා. කෝ කාටවත් මූණ ගැහුණේ නැහැනේ ?"

මේ වෙලාවේ මෂූමරී ගෙට පැමිණියේ ඔෂින් නොදුටු බව කියන්නයි.

එවිටම සුධාකෝ ඔෂින්ට පාරවල් කීපයක් ම ගැහුවා. මෂූමරී ඒ පාරවල් වලක්වන්ඩ උත්සාහ ගත්තා.

"ගහන්න එපා ළමයට. ඒ ළමයා පාසල පැත්තටයි ගියේ."

"පාසල පැත්තට ? දැන් මෙකී කිව්ව බොරුව."

සුධාකෝ නැවත ඔෂින්ගේ කම්මුලට පාරක් ගැහුවා.

"කමක් නෑ මෂූමරී මාමා මමයි වැරද්ද කළේ. මම දඬුවම් විඳින්න ඕනෑ."

ඔෂින්ගේ කතාව අසා සුධාකෝ යන්න ගියා.

"ඔෂින් ගිහින් මූණ හෝදා ගන්ට."

මැඩම් දුකෙන් වගේ කිව්වා.

"හොඳමයි."

මෂූමරී ඔෂින් දෙස බලා පිටව ගියා.

දවස් දෙකකට පසුව ඔෂින් බබත් රැගෙන පාරේ ඇවිදින විට මත්සු ගුරුතුමා ගේ පැත්තට එනවා දැක ඉක්මනින් ලී අතර හැංගුණා.

"ඔෂින් ඇයි ඔය ? ඔය ලී ඇඟට වැටෙයි. බබාටත් තුවාල වෙයි." ඒ මෂූමරී මාමාගේ හඬ.

"මෂූමරී මාමා ඔය එන්නේ අර පාසලේ ගුරුතුමා. මම පාසලට ගියා කියලා මහත්තයට කියන්න වෙන්න ඇති. මට ආයිම ගුටි කරන්න වෙයි. මෂූමරී මාමා මම ඉස්කෝලෙට ගිය එක වරදක්ද ?"

ඔෂින්ගේ දුකින් පිරී මුහුණ දෙස බැලූ මෂූමරී,

Rangika

"නෑ ඔෂින් ඒක වරදක් නෙමෙයි. අපි බලමු මොකද වෙන්නේ කියලා."

ඔෂින් එතනට වී සිටින අතර මෂුමරි ජනේලයෙන් බරාදය දෙස බලා හිටියා.

"මගෙ නම මත්සු, මම මේ පාසලේ ගුරුවරයෙක්."

"එන්න ගුරුතුමා වාඩි වෙන්න."

නගෝ මහත්තයට ආචාර කළ ගුරුතුමා මෙට්ටය මත වාඩි වුණා. එතන නගෝ මහත්මියත් හිටියා.

"මෙහෙ ඉන්නවා නේද ඔෂින් කියලා අවුරුදු හතක ගෑනු ළමයෙක්."

"ආ... ඔව්." නගෝ මහත්මිය කිව්වා.

"වයස හතයි කියන්නේ පාසල් යන්න පටන් ගන්න වයස."

"ඒ වුණාට ඒ අපේ බබා බලාගන්න සේවිකාව."

"මම දන්නවා නෝන මහත්තයා. ඇය යමගාටාවලින් ගෙනා ළමයෙක්නේ."

"ගුරුතුමා මොනවද අපට කියන්නේ."

"මම කියන්නේ, ඒ ළමයා පාසල් එන්න ආසාවෙන් ඉන්නේ. ඉතින් ඒ ළමයා පාසලට එවන්න කියලයි මම මේ ඔයගොල්ලන්ගෙන් ඉල්ලා හිටින්නේ."

"ඒක කරන්න බැහැනේ ගුරුතුමා මගේ පුතා බලාගන්නේ ඒ ළමයා."

"ඉතින්, මැඩම් බබත් එක්කම ඔෂින්ව එවන්න. එතකොට මැඩම්ලට පාඩුවක් වෙන්නේ නැහැනේ."

නගෝ මහතා යුනිකෝ දෙස බැලුවා.

"ඒ කතාව හරි. එතකොට ඔෂින් බබත් එක්කම පාසලේ ඉඳියි."

"ඔව් නගෝ මහත්තයා මම ඇප වෙනවා බබාව ප්‍රවේශමෙන් තියාගන්නවා කියලා."

"හොඳයි ගුරුතුමා අපි ඔෂින් ගෙන්නවලා කතා කරමු."



මෂුමරි ඉක්මනින් ඔෂින් ළඟට ගියා.

" ඔෂින්, ගුරුතුමා ඇවිල්ලා තියෙන්නේ ඔයාව ඉස්කෝලේ යවන්න කියන්න."

"මාව ?"

ඔෂින් විමතියෙන් ඇසුවා.

"ඔව් දැන් ඔයාට කතා කරයි. මොනවත් කියවන්න යන්න එපා. ඉස්කෝලේ යන්න කැමතියි කියන්න."

"ඔෂින්, ඔෂින්."

මැඩම්ගේ හඬ ඇසී මෂුමරි ඈතට ගියා.

"එනවා, මැඩම්."

ඔෂින් ආලින්දයට ගියා.

මහත්තයාත්, ගුරුතුමාත් ඇය දෙස බලා හිටියා.

ඔෂින් බිම දණ ගසාගෙන ඔවුනට ආචාර කළා.

"ඔෂින්, කැමති ද පාසල් යන්න."

"පාසල් යන්න ?"

ඔෂින් නගෝ මහතා දෙස බලාගෙන හිටියා.

"එහෙමයි." ඇය හිස නමා ගත්තා.

"හොඳයි ඔෂින් එහෙම නම් හෙට ඔයා බබත් අරගෙන ම ඉස්කෝලේ එන්න. පොත් පත් ගල්ලෑලි හුණුකූරු මිනෑ නෑ. ඒවා මම දෙන්නම්."

"එහෙමයි ගුරුතුමා. ඔබ තුමාට ස්තූතියි."

ඔෂින් හිස බිමට නමා ආචාර කළා.

මේ සියල්ල අසා සිටි සුඩාකෝ උයන ගෙට ගියේ තරහෙන් පුපුරමින්.

"ඔෂින් මෙහෙ එනවා."

සුඩාකෝගේ නපුරුකම දැනගෙන හිටි මැඩම් ද උයන ගෙට ගියා.

Rangika

"මැඩම් ආව එකත් හොඳයි. මොන වැඩකාරයොද ඉස්කෝලේ ගියේ. වැඩ කර කර ඉස්කෝලේ යන්ඩ පුළුවන්ද විකාර. මේ කෙල්ල අපිව නටවන්නයි ඇවිල්ලා ඉන්නේ."

"ඔමින්ට බනින්ඩ එපා සුධාකෝ. මේ වයසේ ළමයි ඉස්කෝලේ යවන එක නීතියක්. ඒකයි ගුරුතුමා ඔමින් ගැන කතා කරන්න ආවේ."

"ඒ ඉතින් ගෙවල්වල ඉන්න ළමයි. මෙයා වැඩකාරියක්නේ. මෙයා ඉස්කෝලේ යැව්වාම කවුද මැඩම් මට උදව් කරන්නේ?"

"සුධාකෝ උදේ වරුවේ ඔමින් කරන්නේ බබා බලාගන්න එක. ඉතින් ඒ වෙලාවේ පාසලට ගිහින් ඔය අකුරක් ඉගෙන ගත්තා වේ. හවස එයා ඔයාට උදව් කරයි."

"ඔව්, මැඩම් හවසට මම සේරම වැඩ ටික කරන්නම්."

ඔමින් සුධාකෝටත් හිස නමා ආචාර කළා.

"මැඩම්ටත් මෙයා ඉස්කෝලේ ඇරගන්ඩ ඕනෑ නම් ඇරගන්ඩ. හැබැයි මම මෙයාට දවල් කෑම දෙන්නේ නෑ. තේරුණාද උඹට."

"දවල් කෑම නැහැ."

ඔමින් සුධාකෝ දෙස බලා හිටියා.

"එහෙමයි."

"එහෙමයි, දවස් දෙක බඩගින්නේ ඉන්නකොට ඉස්කෝලේ එපා වෙයි. බලමුකෝ."

ඇය බනිමින් යන්න ගියා.

පහුවදා උදේ ඔමින් පාසල් යන්න සූදානම් වුණා. නගෝ මහත්තයා ඔමින්ට ගල් ලෑල්ලක් ගෙනත් දීලා තිබුණා. මැඩම් බබාට ලස්සනට අන්දලා ඔමින්ගේ පිටේ රෙදි පටිවලින් බැන්දා.

"ඔමින් බබාව හොඳින් බලාගන්ඩ."

"හොඳමයි, මැඩම්."

ඔමින් මැඩම්ටත් ආචාර කර එළියට දුවගෙන ගියා.



"ඔමින් ප්‍රවේශමෙන්. බබාවත් බලාගන්ඩ."

"යන්නම්."

ඔමින් සෙසු සේවිකාවන්ටත් කිව්වා.

හැමෝම පුදුමයෙන් බලාගෙන හිටියා.

ගුරුතුමා පංති කාමරයේ දී ඔමින්ව පංතිය ඉදිරියට ගෙන ගියා.

"මේ ඉන්නේ ඔමින්, මේ ඉන්නේ ඔමින් බලා ගන්න බබා. ඉතින් අද ඉඳලා ඔමින් මේ පංතියේ ඉගෙන ගන්නවා ඔයාලා එක්ක. ඔයාලා එයාට උදව් කරන්න ඕනෑ."

"හොඳමයි ගුරුතුමා."

ළමුන් ගිරවුන් සේ කෑගැසුවා.

"හොඳයි ඔමින්, අර තියෙන ඩෙස් එකේ වාඩි වෙන්න."

ගුරුතුමා ඔමින් සමගම පංති කොනට ආවා.

"මෙන්න මම පොඩි පැදුරක් ගෙනාවා. බබා ඇඳුම් තෙමා ගත්තම ඒකේ තියලා ඇඳුම් මාරු කරන්න පුළුවන්නේ."

"ස්තුතියි ගුරුතුමා."

ඔමින් ලේන්සුවේ ඔතාගෙන තිබූ ගල්ලෑල්ල එළියට ගත්තා.

ගුරුතුමා පින්තූර පොතක් සහ හුණු කූරක් ඇයට දුන්නා. ඔමින් ලිව්වා. ගණන් හැදුවා. බබා අඬන විට එළියට රැගෙන ගොස් නැලෙව්වා. බබා නිදාගත්විට නැවත පංතිකාමරයට ගොස් කළුලෑල්ලේ වූ දෑ ලියා ගත්තා.

ළමුන් දවල් කෑමට ගිය වෙලාවල ගුරුතුමා ඔමින්ට මඟඇරුණු පාඩම් කියා දුන්නා.

"ඔමින් කෑම කන්නේ නැද්ද ?"

"නෑ ගුරුතුමා මම ගෙදර ගිහින් කනවා."

ඔමින් කොහොම කිව්වත් එක දවසකවත් කෑමට යමක් ගෙන එන බවක් ගුරුතුමා දුටුවේ නැහැ.

පාසලේ ළමයි, ළඟම වූ පලතුරු, රසකැවිලි විකිණීමට තිබූ කඩයට ගොස් බොහෝ දෑ කෑමට ගත්තා. ඔෂින් ඒ කඩයට ගියා. විවිධ කෑම වර්ග විවිධ පලතුරු ඇය මීට පෙර දැකලත් නැහැ. ආච්චම්මා දුන්න කාසිය අත්ලේ තද වී තිබුණා.

"මොනවද ඕනෑ."

වෙළඳ සැලේ කාන්තාව ඇහුවා.

ඔෂින් කිසිවක් නොකියා දුවගෙන ගියා.

ආච්චම්මා මේ කාසිය හොයා ගන්න මොන තරම් මහන්සි වෙන්න ඇත්ද ? ඒක ආරක්ෂාකර දෙන්න. ඒක නිසා මම මේ සල්ලි නාස්ති කරන්නේ නෑ.

නැවතත් ඔෂෝගත්සු උත්සව කාලය ආවා. ගිය අවුරුද්දේ ඒ උත්සවයට හරුන් හා මිට්සු පැමිණි අයුරු අම්මා සියල්ලන්ටම රාබු බත් උයා දුන් අයුරු ඔෂින්ට මතක් වුණා.

තවමත් ඇයට දවල් කෑම ලැබුණේ නැහැ. ඔෂින් කෑම නොගෙනෙන බව දැනුණු ගුරුතුමා එක් දිනක් තම්බාපු අර්තාපල් දෙකක් කොළයක ඔතා ඔෂින්ට ගෙන ගියා.

ගුරුතුමා දුටු ඔෂින්, ඔහු ළඟටම ගොස්,

"සුබ උදෑසනක් වේවා ගුරුතුමා."

සුබ පැතුවා.

"සුබ උදෑසනක් ඔෂින්, ඔෂින් මම දන්නවා ඔයා දවාලට කෑම කන්න ගෙදරට යන බව. ඒ වුණාට කෑම වෙලාවට කන්න ඕනෑ. නැතිනම් ඉගෙන ගන්න අමාරුයි. මෙන්න ඔයාට පුංචි කෑමක් ගෙනාවා. දවල් කෑම වෙලාවට කන්න."

ඔෂින් ගුරුතුමා දෙස බලාගෙන හිටියා.

"ඔබතුමාට ස්තුතියි."

හිස නමා ආචාර කළා.

ඒත් ඔෂින් ඒක කෑවේ ගඟ ළඟට ගෙනිහින්. ඒ බබාගේ රෙදි හෝදන අතර දී.



"අම්මා, මේ අල හරිම රසයි. ඒත් මට දුකයි. අම්මා ගුරුතුමාටත් දරු පවුලක් ඉන්නවා. එතුමා මේවා මට ගෙනෙන්නේ අමාරුවෙන්. මට තවම සුඩාකෝ දවල් කෑම දෙන්නේ නැහැ. කෑම නෙමෙයිනේ වැදගත් තේද අම්මා ඉගෙන ගන්න එකනේ. ඒක නිසා මම දුක්වෙන්නේ නෑ අම්මා. අම්මා කිව්වා වගේ ඉවසගෙන ඉන්නවා. මේ ශීත කාලය ඉවර වුණාම මම මෙහෙ ඉන්න අවුරුද්දත් ඉවරයි. එතකොට මම ගෙදර එනවා අම්මා."

ඔෂින් මේ සියල්ල කීවේ ගඟට. තමන්ගේ ගමට ගලායන ගඟට. ඔෂින් කිසිවක් ගැන නොතකා පාසල් ගියා. ඒ හරිම සතුටින්. ඒත් ඒ සතුට ඉක්මනින්ම නැති වී ගියා.

එදා පංතියේ දී ඔෂින් කළුලෑල්ලේ ගණනක් හදමින් සිටින විට ම බබා ඇඳුමේ තෙමා ගත්බව දැනී ඇය,

සමාවෙන්න ගුරුතුමා කියා එළියට දිව ගියා.

"අපෝ ගඳ."

පංතියෙ ළමයි නහය වහ ගත්තා. බබාගේ ඇඳුම් මාරු කර ආපසු පංතියට ආවත් එදා බබා අඬන්න පටන් ගත්තා.

"මේ මොන කරදරයක්ද යනවා යන්ඩ පංතියෙන් එළියට."

තොමොෂු පංතියේ නායකයා ඔෂින්ට කෑගැහුවා.

"එහෙමයි" ඔෂින් වකේෂි නලවමින් මිදුලට දිව්වා.

ගුරුතුමා තොමොෂු ළඟට ආවා.

"ඔයා ඔෂින්ට එහෙම නොකියන්නයි තිබුණේ."

තොමොෂු ගුරුතුමාටත් රවාගෙන,

"ළමයි අඬනකොට කොහොමද ගණන් හදන්නේ ?" ඇහුවා.

පහුවදා ඔෂින් පාසලට එන අතරමග පාලමක් උඩ පංතියේ ළමුන් කීප දෙනෙක් ම හිටියා. තොමොෂු වේවැලක් අරගෙන ඉදිරියෙන්ම හිටියා.

ඔෂින් ඔවුන් මගඇර යන්න බැලුවත් ඔවුන් ඇයගේ මග අහුරා ගත්තා.

"ළමයා අරගෙන ඉස්කෝලෙට යන්න බැහැ ඇහුණද ?"

"මට ගුරුතුමා එහෙම එන්න අවසර දීලා තිබුණා."

"ඒ වුණාට අපට කරදරයි. තමුන්ට එන්න ඕනෑ නම් ළමයා දමලා එනවා."

"එහෙම බැහැනේ. මම ටකේෂිව බලාගන්න එපැයෑ."

"මෙකිගේ කට වැඩියි."

"ගහමු. ගහමු කට වැහෙන්ඩම."

තොමසු වේවැලෙන් ඔෂින්ගේ අත්වලට කකුලට ගැහුවා.

"අනේ බබාට වැදෙයි. බබාට වැදෙයි."

ඇය එහෙ මෙහෙ පැන්නා. ඉන්පසු බිම දණගසා ගත්තා.

"මට ඕනෑ තරම් ගහන්න. අනේ ටකේෂිට වැදෙන්න ගහන්න එපා."

"එහෙම නම් ආයිම් ඉස්කෝලේ එන්න බැහැ. තේරුණාද ?"

"හොඳමයි."

"ගුරුතුමාට කියන්නත් බැහැ. ගුරුතුමාට කීවොත් අපිත් ලොකු ගුරුතුමාට කියලා මත්තු ගුරුතුමාව පාසලෙන් අස්කරලා දමනවා. අපි ඉගෙන ගන්නේ සල්ලි දීලා."

"ඔව්, ඔව්, සල්ලි දීලා..."

"අනේ සමාවෙන්න. මම ආයිම එන්නේ නෑ."

ඔෂින් ඉකි ගහ ගහ ඇඬුවා. පාසලට යන්නේ නැතිව ආපිට හැරී ගෙදර ආවා. ඒ වෙලාවේ මැඩම් සූඩාකෝ සමග ඔෂින් ගැන කතා කරන හඬ ඇසුණා.

"සූඩාකෝ, ඔෂින්ට දවල්ට කෑම දෙන්ඩ. මහත්තයා දැන ගත්තොත් මටත් බනීවි."

"නෑ මැඩම් මම කිව්වොත් කිව්ව. ඔහොම දඬුවම් නොකර ඔය ගමේ කෙල්ලෝ හදන්න බැහැ."



"ඒ වුණාට ඔෂින් මගෙ පුතාව හොඳට බලාගන්නවා. මට දුකයි ඒ කෙල්ල ගැන."

ඔෂින් සියල්ල නෑසූන ලෙස,

"ඔන්න මම ආවා."

කියමින් ගෙට දුව ගියා.

"ඇයි ඔෂින් පාසල් ගියේ නැද්ද ?"

"නෑ මැඩම්, මම ආයිම පාසල් යන්නේ නෑ."

"අන්න දැන් තමයි ඔෂින්ගේ මොළේ පෑදිලා තියෙන්නේ."

"ඔෂින් මොකද ඔයාගේ අත ඉදිමිලා මේ තුවාල වෙලා."

"මැඩම් මම වැටුණා."

"බබත් වැටුණා ද ?"

"නෑ මැඩම් බබා වැටුණේ නෑ."

"ඔය කකුල්වලත් තුවාල නේද ?" ඔෂින් කකුල් වසා ගත්තා.

"මම ගලක හැප්පිලා වැටුණා."

"ඔකනේ මම කියන්නේ මැඩම් මේ කෙල්ල එක්ක බබා ඉස්කෝලේ ඇරලා."

"නෑ මම ආයිම කවදාවත් ඉස්කෝලේ යන්නේ නෑ මැඩම්."

"ඇයි ඔයාට ගුරුතුමා බැන්නද ?"

"නෑ මැඩම් ගුරුතුමා කරුණාවන්තයි. ළමයි හොඳයි."

"නෑ මැඩම් ඔෂින්ටම දැනෙන්ඩ ඇති බඩගින්නේ රඟ. හොඳයි ඔෂින් මම ඔයාට අද ඉඳලා කෑම දෙනවා. මෙන්න රස කේක් එකක් ගන්න."

සූඩාකෝ අතේ තිබ්බ කේක් කෑල්ල දිහා ඔෂින් බලාගෙන හිටියා. එයත් අරගෙන ඇගේ කාමරයට ගියා. ලේන්සුව ලෙහා ගල්ලෑල්ල අතට ගත්තා. එහි වූ පාඩම් පොතත්, ගණිත් හැදූ පොතත් රැගෙන සවස පාසලට ගොස් පොත් ටික ඇගේ මේසය උඩ තබා ඒවාට වැඳ පංතියට ද ආචාර කර පිටව ආවා.

Rangika

එදා උදේ මෂුමරි මාමා.

"ඇයි ඔෂින් පාසල් යන්නේ නැද්ද ?"

"නැහැ මාමා."

"ඒක හොඳයි. මම දන්නවා ඔයාට දවල්ට කෑම ලැබුණේත් නැහැනේ. නොකා ඉගෙන ගන්න බැහැ. අනිත් එක පාසල් ගියාට කිසිම වැඩක් නැහැ."

"වැඩක් තියෙනවා මාමා. ඒත් මගේ අවාසනාවට මට පාසල් යන්ඩ හැටියක් නෑ." ඔෂින්ගේ හිත කිව්වා.

එවිටම ඈත පාරෙන් ආව ගුරුතුමා ඔෂින් ළඟට එනතෙක්ම ඔෂින් දුටුවේ නැහැ.

"ඔෂින්."

ඔෂින් තිගැස්සී ගියා.

"ඇයි පාසල් නාවේ."

"මම... ම....ට.... පාසල් එන්න විදිහක් නෑ ගුරුතුමා."

"ඇයි ?"

"බබා එක්ක ඉගෙනීමේ කටයුතු කරන්න අමාරුයි. මට සමාවෙන්න. මම ඔබතුමා දුන්න පොත් පංති කාමරයේම තිබ්බා."

"ඔෂින් ඕකමද හේතුව."

"ඔව්... ඔව්.... ගුරුතුමා. දැන් බබාට කිරි පොවන වෙලාව. මම යන්නම් ගෙට. මට සමාවෙන්න. ඔබතුමාගේ කරුණාව මම කවදාවත් අමතක කරන්නේ නැහැ."

ඔෂින් ගෙට දුව ගියා.

"හේතුව ඒක නෙමෙයි ගුරුතුමා."

මෂුමරි වට පිට බැ...





"කොහොමද ගුරුතුමා බඩගින්නේ ඉගෙන ගන්නේ?"

"ඒකත් ඇත්ත."

ගුරුතුමා හිස සොලවමින් යන්න ගියා. ඔෂින් දින ගනිමින් හිටියේ සීත කාලය අවසන් වූ වහාම ගෙදර යාමට බලාපොරොත්තුවෙන්.

දවසක් මෂුමරි මාමා ඔෂින්ට කතා කළා.

"ඔෂින් මම අදත් පහුරේ ලී ගේන්න උඩහට යනවා."

"අර එදා වගේ ද ?"

"අනේ මාමා මටත් යන්න ඇත්නම්."

"නෑ ඔෂින් ඔයාට නම් යන්න දෙන එකක් නැහැ. ඔෂින් මොනවද ගෙදරට කියන්න ඕනෑ."

"මාමා මට බුරුසුවක් හොයා දුන්නොත් මට පුළුවනි ලියුමක් ලියන්න."

"ඔය හැබෑද? හොඳයි මම හොයලා දෙන්නම්."

එවිටම හමුදා භටයින් දෙදෙනෙක් ගේ දිහාවට ආවා.

"ඇයි මේ?" ඔෂින් මෂුමරිගෙ අත අල්ලා ගත්තා.

"ඒ හමුදා නිලධාරී වගයක්."

ගෙට ගිය ඔවුන් නගෝ මහතා සමඟ එළියට පැමිණියා.

"මේ කවුද ?" මෂුමරි පසෙකට වුණා.

"මෙයා පුංචි කාලේ ඉඳලම මා ළඟ වැඩ කරන්නේ."

"හොඳයි නාඳුනන අය නතර කරගන්න එපා." ඔවුන් යන්න ගියා.

ඔෂින් ලොකු ඉටිපන්දමක් හොයාගෙන එය පත්තු කර තියා ගත්තා.

හදිසියේම සුධාකෝ කාමරයට එබුණා.

Rangika

"නිදා ගන්ඩ මොටද ඉටි පන්දම්."

ඇය එය රැගෙන යන්න ගියා.

රෑ වෙනකොට පුංචි කවුළුවෙන් හඳ එළිය වැටුණා. ඔෂින් හඳ එළියෙන් ලිපිය ලිව්වා. වචන, අකුරු මතක් කළා. කොහොමහරි ලියුම ලියලා ඉවර වෙනකොට එළියත් වැටිලා. එය දෙකට නමා මෂුමරි මාමාට ගෙන ගොස් දුන්නා.

"කවුද ගෙදර?"

මෂුමරි ඔෂින්ගේ නිවස ඉදිරිපිට සිට කෑගැසුවා. එළියට ආවේ ඔෂින්ගේ අම්මා.

"මම තමයි ඔෂින් එක්ක ගියේ."

තාත්තාත් එළියට ආවා.

"ඔෂින් සනීපෙන් ඉන්නවද ?"

අම්මා කඳුළු පිරි දෙනෙතින් ඇසුවා.

"ආ... ඔව්... මේ ඔෂින් ඔහේලට දෙන්න කියලා ලියුමක් දුන්නා."

"ඔ...ෂින් ලියුමක් දුන්නා ?"

"ඔව්, ඇයි ඔෂින් එහේදි ඉස්කෝලෙත් ගියානේ."

ෆුජ් වෙවුලන දෑතින් ලියුම දිග ඇරියා.

"සකුසො, මේ බලන්න ඔෂින් අපට ලියුමක් එවලා. මේ බලන්න."

"අනේ ඒත් අපට කියවන්න දන්නේ නැහැනේ."

"දෙන්න මට ටිකක් අකුරු පුළුවන්."

"අනේ එන්න ආච්චම්මාටත් ඇහෙන්න කියවන්න. ඔෂින් ගියදා ඉඳලා ආච්චම්මා ලෙඩින්."

ඔවුන් ආච්චම්මා, හිටි කාමරයට ගියා.

"අම්මා, ඔෂින්, අපේ ඔෂින් අපට ලියුමක් එවලා. මේ බලන්න."

ෆුජි අම්මාගේ හිස ඔසවා ඇයගේ ඇකයේ තබා ගත්තා.

මෂුමරි ලිපිය කියෙව්වා.



"අම්මා, තාත්තා, මම සනීපෙන් ඉන්නවා. මෙහෙ හොඳයි. තුන් වේලටම කෑම දෙනවා. මැඩම් මහත්තයා සේරම කරුණාවන්තයි. මම පාසල් ගියා. ආච්චම්මට සුදු බත්ම දෙන්න. මෙහෙ දෙන සුදු බත් හරි රසයි. ශීත කාලය ඉවර වුණාම මම ආපිට එනවා.... ඔෂින්."

මෂුමරි නම් ලිපිය කියෙව්වේ නතර කර කර කල්පනා කරමින්.

"ඔෂින් සතුටින් නම් අපට ඒ ඇති."

"දුව ෆුජි ඔෂින්ට මෑ ඇට ටිකක් යවන්න. මම අර භාජනයක දමලා ඇති."

"මොකටද අම්මා ඔෂින්ට මෑ ඇට. එයාට හොඳට කෑම ලැබෙනවා නේද සහෝදරයා."

"ආ... ඔව්.... ඔව්...."

මෂුමරි ආපසු ගොස් ඔෂින්ට ගෙදර තොරතුරු කිව්වා. ආච්චම්මා හොඳින් ඉන්නවා.

"පිදුරු සෙරෙප්පු හදනවද ?"

"ආ... ඔව්... ඔව්... හද හද හිටියේ. අම්මාටත් බබා ලැබෙන්න ළඟයි."

"ශීත කාලෙ ඉවර වෙලා ගෙදර ගියාම ඒ බබා බලාගන්නෙ මම."

"ඔෂින්, මමත් මෙහෙට ආවේ පුංචි කාලේ. මටත් මුදල් ලැබෙන්නේ නෑ. කෑම, ඇඳුම් විතරයි. නැත්නම් මම ඔයාට උදව් කරනවා. ඒ උනත් ඔයාට මොනව හරි උදව්වක් ඕනෑ වුණොත් මට කියන්න."

ඔෂින්ගේ දෙවුර අල්ලා ගෙන මෂුමරි කිව්වා.

ඔෂින් එළියේ මෂුමරි එක්ක කතා කරලා ගෙට දුවගෙන ආවා.

සුධාකෝ මැඩම් එක්ක කතා කරමින් හිටියා. ඔෂින් එහෙම ම දොර ළඟ නතර වුණා.

"මැඩම්, මම මෙතන තමයි පසුම්බිය තිබ්බේ. ඒකේ කාසි අඩුවෙලා. ඕක ගන්න ඇත්තේ මය කෙල්ලම තමයි. පොඩිකමට හිටියට මහ හොරී."

"මම නම් හිතන්නේ නෑ. සුඩාකෝ මොනවට හරි වියදම් කරන්න ඇති."

"නෑ, නෑ, මට හොඳට මතකයි නේ. ආවාවෙකො ඔකී."

ඔෂින් හෙමින් ඉදිරියට ගියා.

"ආ ඔය එන්නේ. මෙහෙ වරෙන්. උඹ සල්ලි හොරකම් කළා නේද ?"

"නෑ මැඩම්."

ඇය පිළිතුරු දෙන්නේ මැඩම් දෙස බලාගෙන.

"ගලෝපන් ඔය ඇඳුම."

ඔෂින්, සුඩාකෝ දෙස බලාගෙන හිටියා.

"හ්ම්! ගලෝපන් ඕවා. උඹ හොරෙක් නෙමෙයි නම් ඇයි ඇඳුම් ගලවන්න බැරි."

ඔෂින් හෙමින් ඇය ඇඳ සිටි උඩ කිමෝනාව ගැලෙව්වා. යටින් ඇය ඇඳ සිටියේ කෙටි කිමෝනාවක්. ඔෂින් වෙත පැන්න සුඩාකෝ එයත් ගලවා දැම්මා.

නිරුවත් උඩ කයින් යුතුව යට කලිසම පිටින් ඔෂින් බලා සිටියා.

ඔෂින්ගේ කරේ පටියක් තිබුණා.

"ගලෝපන් ඕකත්."

සුඩාකෝ එය ගලවා එහි ගැට ගසා තිබූ කාසිය ගලවා බිමට දැම්මා.

"මේ තියෙන්නේ. මැඩම් දැක්කා නේද ?"

"නෑ ඔය මට ආච්චම්මා දුන්න කාසිය. මම ඇත්තමයි කියන්නේ. ඒක දෙන්න මෙහාට."

ඔෂින් සුඩාකෝ අතින් කාසිය උදුරන විටම ඇය ඔෂින් තල්ලු කර දැම්මා.

ඔෂින් බිම ඇදගෙන වැටුණා.



මගෙ දරුවා දවස තිස්සෙම බලාගන්නේ මේ කෙසග කෙල්ල ද මැඩම්ට හිතුණා.

"සුඩාකෝ එපා ළමයට කරදර කරන්න. ඔෂින් ඔතනින් නැගිටලා යන්න."

මැඩම් කීවේ අනුකම්පාවෙන්.

"කොහේවත් යන්න නෙමෙයි. මේ රෙදි අරගෙන ගඟට ගිහින් සෝදගෙන වරෙන්."

ඔෂින් සීතලෙන් ගැහෙමින් ගඟට ගියා.

"ආච්චම්මා මට සමාවෙන්න. මට බැරි වුණා ආච්චම්මා අමාරුවෙන් එකතු කරලා මට දුන්න කාසිය රැක ගන්ඩ. මට සමාවෙන්න."

ඔෂින් ගඟට දමා අත ගන්න සැමවිටම අත හිරිවැටුණා.

ඔෂින්ගේ හිතට මහා දුකක් දැනුණා. ආච්චම්මගෙ කාසිය අහිමි වීම වගේම ඇය නිරපරාදේ හොරෙක් කිරීම ගැන.

ඔෂින් හනිකට ගෙදර ගියා. ඇය රෙදි බාල්දිය ගෙට ගෙනියන විටම,

"ඔහොම හිටපන්, කෝ බලන්ඩ හොඳට හෝදලද කියලා."

සුඩාකෝ රෙද්දක් අතට ගත්තා,

"මෙන්න හෝදලා තියෙන හැටි. සබන් එහෙමම. ගෙනියපන් ආයිම ගඟට ගිහින් හොඳට හෝදාගෙන වරෙන්."

ඇය එම රෙදිකෑල්ලෙන්ම ඔෂින්ගේ මුහුණට දමා ගැසුවා. ඔෂින් සුඩාකෝ දෙස බලාගෙන හිටියා. ඇයට දැනුණේ කෝපයක්. පුංචි හිත තරහෙන් පිරී ගියා. ආපිට හැරී ඇය ගඟ වෙත ගියා. මුහුණට වැටෙන හිම පියලි පිස දැමුවේවත් නැහැ. ඇය එක තීරණයකට එළඹියා.

"ඔව් මම යනවා ගෙදර. මගෙ ගෙදර යමහාටා යනවා. මේ ගඟ ඉවුර දිගේ උඩට ගියා ම මගෙ ගෙදර යන්න පුළුවනි." රෙදි බාල්දිය එතනම අත ඇරිය ඔෂින්, ගං ඉවුර දිගේ දිගටම ගමන් කළා. හිම පියලි ඇගෙ මුහුණ සිපගත්තා. හිස පුරාම හිම පියලි විසිරී තිබුණා.

Rangika

# තුන

"අ ම්මා හරි සීතලයි. මම ඉක්මනට ගෙදර ආවා. අම්මා ආවචම්මාට සතුටුයි නේද ? තාත්තා මම ආවා. අවුරුද්ද ඉවරයිනේ."

ඔෂින් දැස් වසාගෙන අපහසුවෙන් කියෙව්වා.

"කෙල්ලට සිහිය ඇවිල්ලා වගෙයි."

ඒ නුපුරුදු හඬට ඔෂින් ඇස් ඇරියා.

"මේ කොහේද ?" ඔෂින් ඇසුවා.

ඔෂින් සමගම පිදුරු කට්ටලයකින් වැසී සිටි තරුණ පිරිමි කෙනෙක් නැගී සිටියා.

"මේ කවුද ? ඔයාලා කවුද ?"

"ළමයෝ ඔයා හිමේ වැටිලා ඉඳලා මේ සංසකු තමයි ඔයාව මෙහෙ අරගෙන ආවේ. ගේනකොට දරදඬු වෙලා සීතලට. මම නම් හිතුවේ මැරිලම කියලා. මේ සංසකු දවස් තුනක් ඔය ළමයව ගින්නෙන් රත් කළා. දවස් තුනකට පසසේ ඔය ළමයට සිහිය ආවේ. මේ සංසකු නැතිනම් ඔයා මෙලහට මැරිලා."

"ස්තුතියි සංසකු මාමා."

"ඔයා තව ටිකක් නිදා ගන්න. මම රස්නෙට සුප් එකක් හදාගෙන එන්නම්."

ඔෂින්ට වෙහෙසට එහෙම ම නින්ද ගියා.

නැවත නින්දෙන් පිබිදෙන විටම ඔෂින්ට උණු සුප් කෝප්පයක් රැගෙන ආවේ සංසකු.



"බොන්න මේ සුප් එක. මේක හා මස්වලින් හැදුවේ."

"බොන්න."

ඔෂින් ගේ කට ළඟට බඳුන ළං කළා.

"දෙන්න මාමා මගෙ අතට. මම බොන්නම්."

ඔෂින් උඩට ඔසවනු ලැබුවා. ඇයගේ උඩුකය නිරුවත්වයි තිබුණේ.

"මෙන්න සංසකුගේ ඇඳුමක්. ඔය ළමයට මේක අන්දවන්න."

වයසක පුද්ගලයා සත්ව ලෝමවලින් සෑදූ ඇඳුමක් ගෙනැත් දුන්නා. ඔෂින් එය අන්දවන තෙක් හිටියා. ඉන්පසු සංසකු අත වූ කෝප්පය ගෙන සෙමෙන් සුප් ටික බිව්වා.

"හරිම රසයි. මට තව එකක්."

"ඉන්න මම තව ගෙනෙන්නම්."

සංසකු එළියට ගියා.

"ඇත්තමයි කී දවසක් නිරාහාරවද ? ඔය ළමයා ගේනකොට අයිස් කුට්ටියක් වෙලා හිටියේ. එයා කිව්වා මම මේ ළමයා කොහොම හරි බේරාගන්නවා කියල. මේ දවස්වල දඩයමේ ගියෙත් නෑ. ඔයා ළඟම හිටියා. උණුසුම් කළා. ඔය ළමයා හරි වාසනාවන්තයි. මෙහෙ හිම කුණාටු අඩු වුණාම ඔය ළමයා යවන්නම්කො ගෙදර."

තව දින දෙකක් ගෙවී ගියා. එළියේ මත්තු සීයා සංසකු මාමා සමග වේගයෙන් කතා කරනවා ඔෂින්ට ඇහුණා.

"ඔය කෙල්ලව මම ගිහින් ඇරලවන්නම්. සංසකු යන්න එපා. ආයිම ඔයාට වෙඩි කන්න වෙයි. අනිත් එක ඔය ළමයා හොයාගෙන දෙමාපියෝ ආවොත් එහෙම ආයිම ඔයා අහුවෙනවා. හරිම භයානකයි. දැන් ළමයට හොඳයි."

"ඒ උනාට තවම හිම කුණාටුව. ගෙදර යන්න තරම් තවම ළමයා නිරෝගී නැහැ."

"ඒ වුණාට මම කැමති නෑ ඒ ළමයා තියාගෙන කරදරේ වැටෙන්න."

ඔෂින් හෙමින් ඔවුන් දෙදෙනා ළඟට ගියා.

Rangika

"මට සමාවෙන්න සීයා. අනේ සංසකු මාමා මාව ගෙදර යවන්න එපා."

"මොනවා ගෙදර යවන්න එපා."

ඔත්සු පුදුමයෙන් ඇහුවා.

"ඔව්, මම මේ පැනලා එන ගමන්."

"කොහේ ඉඳලද ?''

''ගෙදර ඉඳලා ?"

"නැහැ සීයා, මේ සැරේ වගාව පාළුයි. අපේ ගෙදර හාල් තිබුණේ නැහැ. මම බත් කෑවොත් ආච්චම්මාට බත් නැතිවෙනවා. ඒ නිසා මම අර පහළ ලී මෝලේ බබෙක් බලාගන්න ගියා. ඒ වෙනුවට මගෙ අවුරුද්දෙ වැටුපට හාල් ගෝනියක් ලැබුණා. නමුත් මට එහෙන් එන්න වුණා."

"ඇයි ? එහෙ වැඩ වැඩිද ?"

"වැඩ නම් වැඩියි තමයි. ඒත් ඒක නෙමෙයි හේතුව."

"එහෙම නම් ?"

"මම ගෙදරින් එනකොට ආච්චම්මා ළඟ තිබුණ එකම කාසිය මට දුන්නා. මම ඒ කාසිය ප්‍රවේශම් කරගෙන හිටියා. පටියක බැඳලා කරේ දමාගෙන හිටියා. මොනතරම් බඩගිනි වුණත් මම ඒක මාරු කළේ නැහැ. ඒත් ඒ ගෙදර සුඩාකෝ එයාගේ මුදල් වගයක් නැති වුණා කියලා මගෙ කාසිය ගත්තා. මම හොරෙක් කිව්වා. මට හරියට දුක හිතුණා. ඒ ආච්චම්මාගේ කාසිය රැක ගන්ඩ බැරිවුණ නිසා. ඉතින් මගෙ හිත කිව්වා ඒ ගෙදරින් පැනලා එන්ඩ. මම හිම කුණාටුවෙම ආවා."

"ඔයා බිම වැටිලයි හිටියේ හොඳ වෙලාවට මගෙ කකුලට ඔයාගේ අතක් පැකුණා. එතකොට තමයි මම දැක්කේ හිමවලින් යට වී හිටිය ළමයෙක්ව."

"ඉතින් ඇයි ආපිට ගෙදර යන්ඩ අකමැති."

"මගෙ අවුරුද්ද ඉවර වෙන්න තව කල් තියෙනවා. හාල් ගෝනිය ගත්ත නිසා තාත්තා මාව ආපිට ඒ ගෙදර එක්ක යයි."



"අනේ මාමා මම මෙහෙ ඉන්නම්. මට වැඩකරන්න පුළුවනි. රාබු බත් උයන්න පුළුවනි."

සංසකු ඔෂින් දෙස බලා හිටියා.

"මොකක් ද ඔයා ගේ නම ?"

"මගෙ නම ඔෂින්."

"ඔෂින්, ඔෂින් ඒක හරිම ලස්සන අර්ථවත් නමක්. විශ්වාසය, භක්තිය, පිරිසිදු බව, ශක්තිය, පිපුන මලක කෙමිය, දෙවියන් ඔය වගේ අර්ථ කිහිපයක් ම ඒ නමේ තියෙනවා."

"ඒ කොහොම වුණත් මේ ළමයා මෙහෙ තියාගෙන බැහැ."

"හිම නිසා කොහෙවත් යන්න බෑ. සරත් කාලය එනකල් මෙහෙ හිටපුවාවේ."

"ඔෂින් එන්න ඇතුළට තවම මෙහේ සීතලයි."

"අහන්ඩ සංසකු ඒ ළමයා මෙහෙ තියාගෙන බැහැ. දෙමාපියො හමුදා පොලීසියට කියලා මෙහෙ හොයාගෙන ආවොත් ඔයාව අහුවෙනවා. මම ඔයාව බේරා ගත්තේ මේ කෙල්ලක් නිසා අමාරුවේ වැටෙන්න නෙමෙයි. මගෙ පුතාල වෙනුවට දෙවියෝ ඔයා මට එව්වේ. අනේ සංසකු අපි ඒ ළමයා ඇරලමු."

"මත්සුයෝ ඒ ළමයා එක්ක තරහ ගන්න එපා."

"අහන්න සංසකු මෙහෙ කෑම තියෙන්නෙත් අපි දෙන්නට විතරයි."

"හොඳයි මම වැඩිපුර දඩයම් කරන්නම්කො."

සංසකු තුවක්කු රැගෙන හිමේ පහළට ගියා. ඔහු ආවේ හාවෙක් අරගෙනයි. ඔෂින්, මත්සුයොට උයන්න උදව් කළා.

"එන්න සංසකු බත් කන්න."

"ඔයා ඔෂින්ට වැඩිපුර බෙදලා දෙන්න."

"මේ බත් උණුවෙන් කන්නේ හුගක් කාලෙකින්. මම හිටිය ගෙදර මම කෑම කන කොට රාබු බත් සීතල වෙලා. සුප් එක වතුර වගෙයි."

"ඔෂින් මමත් ඒ දවස්වල අඳ ගොවියෙක්. ඉඩම් හිමියන්ට වැඩ කළා. මම විවාහ වුණේ පහුවෙලා. මට පුතාලා දෙන්නෙක් හිටියා. ඒ දෙන්නාම යුද්දේ දී මිය ගියා." මත්සුයෝ අඬන්න පටන් ගත්තා.

"ඔය කතාවලින් දැන් වැඩක් නැහැ. මැරුණ පුතාලා ආයිම එන්නේ නෑ."

සංසකු භාජනයත් එතනම දමා නැගිට යන්න ගියා.

"සීයා අඬන්න එපා. දැන් සීයට සංසකු මාමා ඉන්නවානේ. සීයා මෙහෙ ඉඳන් මොකද කරන්නේ."

"මම ගල් අඟුරු හදනවා."

"හැමදාම මෙහෙද ඉන්නේ ?"

"නෑ, මෙහෙ දර ඉවර වුණාම වෙන තැනකට යනවා."

"ඒ කොහේ ද ?"

"ඔය ළමයට ඒවායින් වැඩක් නෑ."

"සංසකු මාමට ගෙදරක් නැද්ද සීයා."

"එයාගේ ගෙදර මෙහේ."

එවිටම ළඟම වෙඩි හඬක් ඇසුණා. ඔෂින් නැගිට්ටා.

"අන්න සංසකු මාමා." ඇය එළියට දිව ගියා.

❖❖❖

නාගෝ මහතාත්, මහත්මියත් අසල වාඩි වී සිටින්නේ සුඩාකෝය.

"දැන් ඔෂින් ගිහින් සතියකටත් වැඩියි නේද ?"

"සති තුනක් වුණා."

"ඉතින් මේ ළමයට මොකද වුණේ. අපි වග කියන්න එපායැ."

"මොනවට ද අපි පැනලා යන අයට වග කියන්නේ. එයා හොරෙක්."

"හොරෙක් ? ඇයි එහෙම කියන්නේ."

නාගෝ මහතා ඇසුවා.

"මෙන්න මේ සුඩාකෝගේ මුදල් පසුම්බියෙන් කාසි වගයක් නැති වුණා නේ. ඔෂින් ළඟ තිබිලා එක කාසියක් හොයා ගත්තා. ඊට පස්සේ තමයි ඔෂින් යන්න ගියේ."



"ඇයි මට ඔය විත්තියක් නොකීවේ ? "

"එක කාසියයි ඔෂින් ළඟ තිබුණේ. ඔයා දඬුවම් කරයි කියලා මම නොකීවේ."

"අයියෝ අසරණ ඔෂින්."

"ඇයි එහෙම කියන්නේ ?"

"දවසක් හදිසියට මමයි සුඩාකෝගෙ පසුම්බියෙන් කාසි ටිකක් ගත්තේ. මට ඒක කියන්න බැරි වුණා."

"මොනවා."

නාගෝ මහත්මිය ඇස් ලොකු කර ගත්තා.

"පව්, ඔෂින්."

"ඒත් ඉතින් ඔෂින්ට කාසි කොහෙන්ද ?"

"ඇයි ඒ ළමයා කීවේ ආච්චම්මා එයා එනකොට දුන්න එකක් කියලා. අපරාදේ සුඩාකෝ ඔෂින්ට හිරිහැර කළේ."

"මගෙයි වැරැද්ද, මට අමතක වුණා මුදල් ගත්තා කියන්ඩ."

"මහත්තයා, මම ඔෂින් ගෙනාව මනුස්සයට එන්න කිව්වා. මේවා කියන්ඩ එපා. ඔෂින් මෙලහට ගෙදර ගිහින් ඇති."

"ඔය හිම කුණාටුවේ ළමයෙකුට යන්න පුළුවන් ද ?"

"ඔකි හරි හිත හයිය කෙල්ල. කොහොම හරි ගෙදර යන්න ඇති."

"මහත්තයා, නාගෝ මහත්තයා."

"අන්න අර මිනිහා ඇවිත්, මම කතා කරලා එන්නම්."

ඇය බරාදය පැත්තට ගියා.

"මේ අර ඔහේ ගෙනැත් දුන්න කෙල්ල පැනලා ගියා."

"පැනලා ගියා කොහේද ?"

"කවුද දන්නේ. තමුසෙ කිව්වේ ඒකිට වයස අවුරුදු නවයයි කියලා. එතකල් ඒකිට වයස හතයි. ඉතින් මගොම බොරුකාරයෝ ගේන එවුනුත් බොරුකාරයෝ, හොරු."

Ranjika

"එහෙනම් ඒකි ආපිට ගෙදරම යන්න ඇති."

"ගෙදර තමයි. වෙන කොහේ යන්නද ? ඒකි ඇවිල්ලා අවුරුද්දක් වත් හිටියේ නෑ. අපි දුන්න හාල් ගෝනිය අපට ඕනෑ."

"ඒක නම් කරන්න බැහැ."

"මොකද බැරි. තමුසෙට බැරිනම් මම මෙහෙ කුලීකාරයො එවන්නම්. තමුසෙ යනවා."

ඔහු සෙමින් මුමුණමින් යන්න ගියා.

ඇය සේවකයෝ දෙදෙනෙක් කැඳෙව්වා.

"අර මිනිහා යන්නේ යමගාටා. මෙහෙ හිටිය ඔෂින්ගෙ ගෙදර උඹලත් පලයල්ලා. ආපිට කෙල්ල ගේන්න එපා. ඒ වුණාට අපි යැව්ව හාල් එක ඇති. ඒක අරගෙන වරෙල්ලා. මෙන්න මේ කාසිය ඔෂින්ගෙ අතටම මතක් කරලා දෙනවා."

"හොඳමයි."

❖❖❖

සංසකු කාමරයට එන විට ඔෂින් සංසකුගේ ඉරුණ ඇඳුමක් මසමින් හිටියා.

"ඔය මොකද ?"

"මේක ලෙහිලා තිබුණා. මම මැහුවා. මම මහන්න දන්නවා. නංගිලාගේ මල්ලිලාගේ ඇඳුම් මහන්න මම අම්මට උදව් කරනවා."

"එපා."

සංසකු ඔෂින් අතින් ඇඳුම උදුරාගෙන ගියා.

ඔෂින්ට දුක හිතුණා. පාළුවක් දැනුණා. ගෙදර, අම්මා, ආච්චි මතක් වුණා. ඔෂින් සංසකුට ණය ගැතියි. ඒ නිසාම සංසකුට ආදරෙයි. වරෙක ඔත්සු සීයා,

"මේ දරුවා බලු කික්කියක් වගේ සංසකු පිටි පස්සේ ඇවිදිනවා නේද ? ඒ වුණාට අපට ළමයි කරගහගෙන ඇවිදලා බැහැ."



ඔත්සු සීයා එහෙම කියන නිසාද සංසකු සමහර වෙලාවට ඔෂින්ව නොතකා හරින්නේ කියා ඔෂින්ට හිතුණා. එකදවසක් ඔෂින් සංසකුගෙ පොත් දෙක තුනක් පෙරලමින් හිටියා.

"ඕවා මොකට ද ?"

සංසකු ඒවා උදුරා ගත්තා.

"මම ටිකක් ඉගෙන ගත්තා. බබත් අරගෙනම පාසල් එන්න කියලා මිත්සු ගුරුතුමා මට කිව්වා. ඒත් ටික දවසක් යනකොට ඒ පංතියේ ළමයි බබා අඬනවා කියලා මට එන්න එපා කිව්වා."

සංසකු නිහඬව ම එළියට ගියා. ඔෂින්ට බටනලා හඬක් ඇසුණා. ඇය ඒ හඬ ඇසීමට එළියට ගියා. සංසකු බිම පෙරළී තිබූ ගසක වාඩි වී බටනලාවක් වාදනය කරමින් හිටියා.

ඔෂින් ඔහු ඉදිරියේ හිට ගත්තා.

"මොකක්ද මාමා ?"

සංසකු නලාව ඔෂින් අත තබා යන්න ගියා.

ඔෂින් ඔත්සු සීයාට උදව් කළා. රාබු සෝදා කපා දුන්නා. ලිපට ගින්දර දැම්මා. ගල් අඟුරු අහුරන්න උදව් කළා. විටෙක සංසකුගෙ ලෝම ඇඳුමක් සෝදා දැම්මා.

" ඔෂින්. මෙන්න ඔයාට මම ඇඳුමක් හැදුවා. දැන් ඔය සංසකු මාමාගේ ඇඳුම අයින් කරලා මේක අඳින්න බලන්න."

"අනේ සත්ව හම්වලින් නේද ?"

"කෝ හිටින්න මම අන්දන්න."

ඔෂින් ම එය ඇඳ ගත්තා.

"හරි උණුසුම් සීයා. සීයට ස්තුතියි."

ඇය නැමී ආචාර කළා.

"ඒත් ඉස්සරහින් ටිකක් මදියි නේද ? කෑල්ලක් දමන්න වෙයි."

"නෑ මේක පිරිමහගමු. හරිම සනීපයි. උණුසුම්. ඉන්න මම සුප් එක බඳුන්වලට දමාගෙන එන්නම්."

ඔෂින් එළියට ගියා.

"දැන් මට දොස් කියන්නේ නෑ නේද ?"

"ඔව්, සංසකු ඔෂින් පුදුම ළමයෙක්. වයස 7 ළමයෙකුට කරන්න පුළුවන් වැඩ නෙමෙයි එයා කරන්නේ. ඒ වගේ ම තමයි කතාවට ගියාම. අපේ පාළුව නැතිවුණා."

❖❖❖

"ගෙදර කවුද ? ගෙදර කවුද ?"

ඔෂින්ගේ මව එළියට ආවා.

"කෝ ඔහෙලගේ ඔෂින්."

"ඔෂින් ?? ඔෂින් වැඩට අරගෙන ගියේ ඔහේ නේ."

"ඒ වුණාට දැන් එහේ ඔෂින් නෑ."

"අනේ සකුසො එළියට එන්න. ඔෂින් ඒ ගෙදර නැහැලු." ෆුජි කෑ ගැහුවා. තාත්තා එළියට දුවගෙන ආවා.

"මේ මට බොරු නොකර ඔෂින්ව එළියට ගේනවා."

"ඔෂින් මෙහෙ ආවෙ නෑ."

"නැත්තෙ මොකද? දැන් එහෙන් ඇවිල්ලා සති දෙකක් විතර ගියාලු."

"මේ හිම කුණාටුවෙ ඔෂින් ආවලු. පුදුමයි."

"අනේ මගෙ ඔෂින් ඔයාට මොනවා වෙලා ඇත් ද ?" ආච්චම්මාත් එතනට පැමිණියා. එවිට ම එතනට කඩා වැදුණේ ලී මුදලාලි ගෙ සේවකයෝ. සුඩාකෝ පැවසූ ලෙසට ම ඔවුන් ගෙට බලෙන්ම ඇතුල් වී හාල් ගෝනිය රැගෙන ගියා. සකුසො ඔවුන්ට පහර දුන්නා. ඔවුනුත් සකුසොට පහර දුන්නා.

"අනේ සකුසො එපා. ඔහෙ ගෙනිච්චාවේ."

ඔවුන් සකුසෝව තල්ලු කර දැම්මා. ඔහු බිම වැටී කෑ ගැහුවා.

"හිතුවක්කාරී ඔකි නිසා තමයි මේ සේරම කරදර."



"එහෙම කියන්න එපා සංසකු. අනේ මගේ ඔෂින්. මේ හිම කුණාටුවෙ නම් කාටවත් ගමට එන්න බෑ."

"ඔකි මැරිල ගියදෙන්."

"අනේ සකුසො මොනාද ඔය කියන අවකැපෙන කතා. ඔෂින් ඔය කොහේ හරි ඇති. හිම අඩුවුණාම ගෙදර එයි."

ආච්චම්මා දිගටම 'අනේ මගෙ ඔෂින්' කියමින් අඬන්නට වුණා.

"මං යනවා ඔෂින් හොයන්න." ෆුජි මද දුරක් දුව ගියා. සකුසෝ ඇය අල්ලා ගත්තා.

"කොහෙද යන්නේ. ඔච්චරද අපට දරුවෝ ඉන්නේ. ඔහේ ගියාම පොඩි එකා බලාගන්නේ කවුද ?"

"මම ඔයාට කීවා ඔෂින් පොඩි ළමයෙක්. වැඩට යවන්න එපා කියලා. ඔයා ඇහුවෙ නැහැනේ."

"ඔෂින් පොඩි වුණාට කල්පනාවෙන් වැඩ කරන්න දන්නවා. කොහේ හරි ප්‍රවේශමට ඇති ෆුජි."

"අනේ අම්මා ඔෂින් පොඩි ළමයෙක්. එයා කොහොමද හිමේ එන්නේ."

"අම්ම... අම්මා..." සෝජි දුවගෙන ආවා.

"අර මිනිසුන්ගෙන් එක්කෙනෙක් මේක ඔෂින්ට දෙන්න කියලා දීලා ගියා."

"මේ මොකක් ද ?" ෆුජි එය දිගැරියා.

"කාසියක් ?"

"කාසියක් කෝ බලන්න. මේ මම ඔෂින්ට දුන්න කාසිය. ඔෂින්ට මොකද වුණේ දෙයියනේ."

අම්මාත්, ආච්චම්මාත් අඬන්න ගත්තා. තාත්තා කුඩය රැගෙන යන්න ගියා.

ඔෂින් සුප් එකක් හදලා ලිපේ තිබ්බා. කෝටු කෑලි කඩමින් ලිපට එබුවා. එකපාරටම කාමරයට පැමිණි සංසකු පිදුරු කට්ටලය උඩට ඇදගෙන වැටුණා.

Rangika

" සංසකු මාමා. සංසකු මාමා. අයි මොකද වුණේ. මේ මේ ඇය ඔහුව හරවන්න බැලුවා. එතකොට ඇයගේ අතට දැඩි රස්න දැනුණා. ඇය තම අත සංසකුගේ නලල මත තැබුවා.

"උණ හොඳටම උණ. සිහියත් නෑ, සීයා..... ඔත්තු සීයා ඉක්ම එන්න...." ඇය ඔත්තු සොයා එළියට ගියා. ඔහු සිටියේ ගල් අ පෝරණුව ළඟ.

"සීයා එන්න.... එන්න ඉක්මනට. සංසකු මාමාට හොඳටම උණ

"මොනවා එහෙනම් අර තුවාල ආයෙම පැහැවන්න ඇති."

ඔහු ඔෂින්ටත් පෙර ගෙට දුව ගියා.

"මේ ඇඳුම් ගලවන්න. ඔෂින් ඉක්මනට වතුර එකක් ලිපේ තියන්

"හරි මේ තියනවා." ඔෂින් ලී බාල්දියට ගෙන ආ වතුර භාජන දමා ලිපේ තබා ගින්දර දැම්මා.

"ඔෂින් එළියට ගිහින් හිම අරගෙන එන්න. මේ උණ බස්සන් හිම කොට්ටයක් නලල උඩ තියන්න ඕන."

"හොඳයි."

ඔෂින් උණු වතුර එක සීයා ළඟ තබා එළියට දුවගෙන ගියා. ඇ භාජනයකට හිම අහුරු අහුරු දමා ගත්තා.

ඔත්තු ඒවා රැගෙන විත් රෙදි කැල්ලක දමා කුඩා කොට්ටය මෙන් සාදා සංසකුගේ නලල මත තබන අයුරු ඔෂින් බලාගෙ හිටියා. හිම දියවන විට තවත් හිම දමා නැවත නලල මත තැබුවා. අතර උණු වතුර රැගෙන සංසකුගේ පපුව මත වියලී තිබූ තුවා තවන්න පටන් ගත්තා. ඔෂින් පුදුමයෙන් බලාගෙන හිටියා. ඒක දි තුවාල කැළලක්.

"මේ තුවාලය නිසා තමයි මේ සේරම. යුද්ධයක්" ඔත්තු තමාට කියා ගත්තා. ඔෂින් සංසකුගේ ඇඳුම් ලිපට අල්ලමින් වේලා දැම් වරින්වර එළියට ගොස් හිම රැගෙන ආවා. හිම අතට ගන්නා අවස්ථා ඇයගේ දැත් සීතලෙන් සීතල වී හිරිවැටී ගියා. ඇය අත්වලට පිඹි හිම භාජනයකට දැම්මා. ඔත්තු කළාක් මෙන් රෙදි කැල්ලක හිම ඔ සංසකුගේ නලල මත තැබුවා. එදා රාත්‍රියේ ඔත්තු ටිකක්වත් නිදාගත්



නැහැ. සංසකුගේ පය පාමුල වාඩි වී සිටියා. ඔෂිනුත් වරින් වර සංසකුගේ නලල හිමෙන් තෙත මාත්තු කළා. හිස නවාගත්ත ඔත්තු යුද්ධයට ශාප කළා. පහුවදා වෙන විට සංසකු සෙමෙන් ඇස් ඇරියා.

"උණ අඩුයි. ඔෂින් සංසකුගේ උණ අඩු වෙලා. මං බයේ හිටියේ ගිය සැරේ වගේ දින ගණනක්ම සිහි නැතිව ඉදියි කියලා."

"සංසකු මාමාට බොන්න කැඳ ටිකක් හදන්නම්. රසටම හදන්නම්."

ඔෂින් හාල් ටිකක් රැගෙන භාජනයට දමා සේදුවා. ඇය එය ලිප තබා ලිපට ගින්දර දැම්මා.

"සංසකු ඔයා දන්නවද ? ඔෂින් ඊයේ රෑ එළිවෙනකල් ඇහැරී ලා. වරින් වර ඔයාගේ නලලට හිම කොට්ටය තිබ්බා."

"පව්, අහිංසක කෙල්ල."

සංසකු ඔෂින් දෙස නිහඬව ම බලාගෙන හිටියා.

"මෙන්න බොන්න මාමා රස්නෙන් ම සුප් එක."

සංසකු බිත්තියට හේත්තු වී සුප් එක අතට නොගෙන ඔෂින් දෙස බලාගෙන හිටියා. ඔෂින් හිනා වෙමින් සංසකු දෙස බැලුවා.

"ඔෂින් ඔයාට ස්තුතියි, ඔයා හොඳ ළමයෙක්."

සංසකු සුප් භාජනය අතට ගත්තා.

"ඔව්, සංසකු ඔෂින් ඔයා වෙනුවෙන් හුගක් මහන්සි වුණා. ඔයාගේ තෙත ඇඳුම් ටිකත් ගින්දරින් වේලනවා මං දැක්කා."

ඔෂින් හිනැහෙමින් බලා සිටියා.

"මං බයේ හිටියේ ඔයා මැරෙයි කියලා. සනීප වුණ නිසා මට හරි සතුටුයි."

"ඔෂින් මම සමහර වෙලාවට ඔයාට සැරෙන් කතා කළා. හිත රිදෙන්න ඇති. මම දන්නෙ නෑ ළමයෙක් එක්ක කොහොමද ඉන්න ඕනෑ කියලා. ඔයාට කියවන්න ඉගෙන ගන්න ඕනෑ කීවා නේද ? මං සනීප වුණාම ඔයාට කියවන්න, ලියන්න, ගණිතය එහෙම කියලා දෙන්නම්."

"ඔය ඇත්තම ද ? මට හරි සතුටුයි. ස්තුතියි සංසකු මාමා." ඇ ඔහුට ආචාර කළා. සංසකු මාමා ඔෂින්ට ආදරෙන් කතා කිරීම පිළිබ ඇයට දැඩි සතුටක් දැනුණා. ඇය ඔහුගේ ඇඳුම් සෝදා දැම්මා. ඉක්ම රාබු බත් උයා දුන්නා. බය සැක නැතුව සංසකුගේ පොත් අරං බැලුවා. ඔෂින් එහි වූ පොතක් අකුරු අමුණමින් කියෙව්වා.

"ඕ... මා... සොයුර...

මා... තනි.... නො..... කරන්.... න...."

එවිට සංසකු කාමරේට ආවා.

"ආ සංසකු මාමා මං ඔයාගේ පොතක් බැලුවා. මට සමාවෙන්න"

"ඒත් ඔෂින් ඔය පොත ඔයාට තේරෙන්නේ නෑ. ඕකෙ තියෙන්නෙ කවි."

"කවි ? කවි කියන්නේ මොනවද මාමා."

"කවි... ඒවා නිකන් ගීත වගේ."

"අනේ එහෙනම් ඒවා කියවන්න. මං අහගෙන ඉන්නම්."

"මා දයාබර සොයුර
මේ කඳුළු ඔබටයි
මා තනිකර නොයන්න
ඔබ පවුලේ බාලයාය
දෙමාපියනි ඔබ පහනක්
මරුවා හා එක්ව
මා තනි නොකරන්න
යුද්ධය වැඩකට නැති දෙයක්
වන්නේ මිනිසුන් මිය යාම පමණයි
ඔබ මිය නොයා යුතුය
මා දයාබර සොයුර
ආපිට එන්න
අපි තනි නොකරන්න"

"සංසකු ඔය දේවල් ඔය ළමයට තේරෙන්නේ නෑ." ඔත්සු කීවේ හිතාවෙමින්.



"ඔෂින් මේ කවි අක්ක කෙනෙක් මල්ලිට ලියූ කවි. යුද්ධය නිෂ්ඵල දෙයක් බවයි මේ කවිවලින් කියැවෙන්නේ ඔෂින්."

"ඇයට යුද්ධය ගැන තේරෙන්නේ නෑ සංසකු."

"ඒත් මම දැක්කා සංසකු මාමගේ ඇඟේ ලොකු කැළලක් තියනවා."

"ඔෂින් මොනාද ඔය කියවන්නේ. ඕව කාටවත් හෙම කියන්නේ නෑ." ඔත්සු කීවේ තරහින්.

"ඇයි සීයා එහෙම කියන්නේ. යුද්දෙට යන එක නම්බුවක් නේ. එහෙම අයට අපේ ගමේ අය හරියට ගරු කරනවා. යුද්ධෙට ගිහින් කකුලක් නැති කෙනෙක් ගමේ ඉන්නවා. ඒක නම්බුවක් විදිහටයි සලකන්නේ."

"නම්බුවක්. ඔෂින් දන්නවද යුද්දෙදි මිනිස්සු මැරෙනවා. මිනිස්සු හිරේ දමනවා. මේ ඔත්සු සීයගෙ ළමයි දෙන්නම මළා. තවත් හිතනව ද යුද්දය නම්බුකාරයි කියලා."

ඔෂින් සෙමෙන් හිස දෙපැත්තට වැනුවා.

"යුද්ධය ඕනෑ නෑ ඔෂින්. ඔයාට ලොකු වුණාම තේරෙයි. මේ පොත ඔෂින් තියා ගන්න. අද හොඳට පායලා. මම දැන්ම කඳුකරය පැත්තේ යනවා. අද දඩයම් කරන්න හොඳ දවසක්."

සංසකු පිටුපසින් ඔෂින් ද දිව ගියා.

ඔෂින් මෙහෙම සැහැල්ලුවෙන් හිටියත් ඔෂින්ගේ අම්මත් ආච්චම්මාත් හිටියේ හරිම දුකෙන්. එදා රෑ ෆුජි ඔෂින්ගේ නම කියමින් නින්දෙන් අවදි වුණා.

"ඔෂින්... ඔෂින් මම එනවා." මෙවිටම ආච්චම්මා ෆුජිට කතා කළා.

"අම්මා ඔෂින් මට කතා කරනවා. මට අඬගහනවා."

"නෑ ෆුජි ඔයා හීනයක් දැකලා."

"සකුසො.... සකුසෝ..... අනේ නැගිටින්න."

"ඇයි මොකද ? මොකද ?"

"ඔමින් මට කතා කරනවා. එයාගේ ආත්මෙ මේ කොහේ හරි සැරිසරනවා ඇති."

"මේ ගෑනියේ ඔය මෝඩ හීනෙ කියන්න ද මාව ඇහැරෙව්වේ. නිදාගන්නවා විකාර නැතුව. ඔමින් ගැන හිතන එක මම අත් ඇරලා තියෙන්නේ."

"අනේ මගේ ඔමින්" ආච්චම්මා ද ඇහැරී හඬා වැටෙන හඬ ඇසුණා.

"අම්මා අඬන්න එපා. මං හෙට පන්සලට යනවා."

උදේම ඇහැරුණ ෆුජි සකුසො අවදි වීමට පෙර හාල් ගෝනියෙන් හාල් ටිකක් ලේන්සුවට දමාගෙන පන්සලට ගියා. ඇය ආපසු ආවේ පන්සලෙන් ලබාගත් ලී සිහිවටනයක් රැගෙන. ඇය එනතෙක් සකුසෝ බලා සිටියා.

"කොහේද ගියේ ? කියනවා."

සකුසෝ ෆුජිගේ අතින් අල්ලා ගත්තා. ඇය අත අත්හරවා ගෙන ගෙට ගොස් ලී සිහිවටනය මේසය මත තැබුවා.

"අම්මා මං ඔමින්ගේ ආත්මය වෙනුවෙන් පූජාවක් තිබ්බා."

"පූජාවක් තිබ්බා. අපට කන්න තියෙන හාල් ටික ගෙනිහින් දුන්නා. ඒක දීලා ගෙනාව ලී කෑල්ල ද මේ." සකුසෝ එය විසිකර දැම්මා.

"අපරාදේ හාල් ටික."

"හාල් ටිකට මැරෙන්න හදනවා. මම තමයි අඩුවෙන්ම හාල් ගෙනිච්චේ. ඒ නිසා පූජාවත් අඩුවෙන් කළේ." ඇය ලී සිහිවටනය නැවත මේසය මත තැබුවා.

"ඔමින්ගේ ආත්මය සන්සිඳුවන්න මං මෙක කරන්න ම ඕනෑ සකුසෝ."

"මේ ගෑණිට විකාර."

ඇයට පා පහරක් එල්ල කළ සකුසෝ තරහින් එළියට ගියා.

"දුව අඬන්න එපා. සකුසෝ ඔය කේන්තිය කියලා පෙන්නන්නේ එයාගේ හිතේ තියෙන දුක. එයාටත් දුකයි ඔමින් ගැන."



"අම්මා, එයා හැම විටම හිතන්නේ ඔමින් ජීවතුන් අතර කියලා. අපි එහෙම හිත හිතා පූජාව පරක්කු කළොත් ඔමින් කොහොමද දිව්‍ය ලෝකේ යන්නේ ඉක්මනට. මේ ලෝකේ එයා වින්දෙ දුක. එහෙදිවත් සැප ලැබෙන්න ඕනෑ."

මිදුලට ගොස් සිටි සකුසෝ කඳුළු පිසදා ගත්තා.

"තාත්තා" සෝජි කන්ද බැසගෙන ආවා.

"අලුත් අවුරුද්ද ළඟයි නේද ?"

"ඒත් මේ සැරේ අවුරුදු නෑ."

"මේ සැරේ අපේ අස්වැන්නත් හොඳයි නේ තාත්තා."

"ඒ වුණාට අපට මරණයක් වෙලා. ඔමින්...."

"ඒකත් එහෙමද ?" සෝජි ගෙට ගියා.

Rangika

# හතර

"ඔමින්.... ඔමින්.... මෙහෙ එන්න එළියට."

ඔත්තුගේ ප්‍රීතිමත් හඬ ඇසෙයි.

"මෙන්න මම ඔයාට මෝල් ගහකුයි වංගෙඩියකුයි හැදුවා."

"හානේ ඇත්තම තමයි. මේවා මටම ද හැදුවේ?"

"ඔව්, අවුරුදු ළඟයිනේ අපි හාල් කොටලා කැවිලි හදමු."

සංසකු එතනට ආවා.

"ඔන්න, ඔමින් බලාගන්න මෙන්න මෙහෙමයි කොටන්නේ."

ඔත්තු මෝල් ගහ ඊගෙන වංගෙඩිය කොටා පෙන්නුවා.

"මම දන්නවා සීයා, මම ගෙදරදී පිටි කොටනවා."

"එහෙනම් දොරසාකි කැවුම් හදන්නත් පුළුවන්ද ?"

"ඒවා නම් බැහැ. අර සුකි බත් ගුලි හදමු. ඒකට ඕනෑ කරන්නේ මාළු."

"ආ මම ගඟට ගිහින් මාළු අල්ලා ගෙන එන්නම්."

ඔත්තු සතුටින් කිව්වා.

"ඔමින් අන්න අර ලිප උඩ මම තැම්බුව හාල් වගයක් ඇ
අරගෙන එන්ඩ අපි කොටමු."

වංගෙඩියට තැම්බූ හාල් දමා ඔත්තු කොටන විට ඔමින් එක් එ
පාරට වංගෙඩියට අත දමා පිටි ඉවත් කළා.



"කෝ මටත් දෙන්ඩ බලන්ඩ."

සංසකු මෝල්ගහ වේගයෙන් කෙටූ අතර පිටි හැලී ගියා.

"ඔහොම බෑ. ඔහොම බෑ."

ඔත්තු කෑගැහුවා. තුන්දෙනාම හිනාවුණා.

අවුරුදු දවසේ ඔමින් හදපු කැවිලි ගණන් කර පෙන්නුවා.

"දොළහයි. හරිද සංසකු මාමා."

"ඔව් ඔමින්, ඔයා දක්ෂයි. දැන් ඔයාට කියවන්න පුළුවන්. ගණන් හදන්න පුළුවන්."

"ඒ ඉතින් මාමා මට හැමදාම කියලා දුන්න නිසා නේ. සංසකු මාමාට ගොඩාක් ස්තූතියි."

"ඔමින්ගේ උනන්දුව නිසයි."

ඔත්තු සකේ බෝතලයක් ගෙන සංසකුට කුඩා කෝප්පයකට වත්කර දුන්නා.

"අවුරුද්දට සකේ හොඳයි."

"හැබැයි ටික ටික....."

"මේ අවුරුද්ද අපිට හොඳයි නේද සංසකු. අපිට ඔමින් ඉන්නවා."

ඔත්තු ගීතයක් ගැයුවා. ඔමින් දුකෙන් බලා සිටියා.

"ඒ ගීතය මම දන්නවා සංසකු මාමා. ඒක පාරුකාරයන්ගේ ගීතයක්. ඉස්සර ලී වෙළඳ සැලේ ඉන්නකොට මම ගඟ ළඟට ගිහින් ඒවා අහගෙන ඉන්නවා. මට මතක් වෙන්නේ අපේ ගෙදර. මට දැනුත් ගෙදර මතක් වුණා. අපේ අම්මට බබා හම්බ වෙලා ඇති."

"ඔමින් ඔයාට ගෙදර යන්න ඕනෑ නේද ? හොඳයි සරත් කාලයේ අපි ගෙදර යමු. එතකල් සතුටින් ඉන්න."

"නෑ මට දුකක් නෑ. මම ඔයාලා දෙන්නා එක්ක මෙහෙ ඉන්නේ සතුටින්."

ඔමින් එළියෙ වැඩ කරන විට, දර කඩන විට, සංසකු කියවූ කවි මිමුනුවා.

සොයුර, මා දයාබර
මා තනි නොකරන්න
මේ කඳුළු ඔබටයි
මරුවා සමග එක්ව
මා තනි නොකරන්න

සංසකු ලී කොටයක් ගෙන දේව රූපයක් කපමින් සිටියා.

"ඔමින් ඔයාව දෙමාපියෝ හොයනවා ඇති නේද ?"

"නෑ සංසකු මාමා ගෙදර අය දන්නේ නැහැනේ මම පැනලා ආවා කියලා. සරත් කාලයේ දී ගෙදර ගියාම හිතයි මම කොන්ත්‍රාත්තුව ඉවර වෙලා ආවා කියලා. "

"ඒක හරි තමයි. ඔමින් ඔයා හොඳට කල්පනා කරලා වැඩ කරන ළමයෙක්."

"සංසකු මාමා ඔය දේව රූපය කපන්නේ පූජා පවත්වන්ඩ ද?"

"නෑ ඔමින්, මම මේ රූපය කපන්නේ මා අතින් යුද්ධයේ දී මිය ගිය මිනිසුන් වෙනුවෙන්. ඔමින් මම යුද්ධයට සාප කරනවා. ඔයා කවදාවත් කාටවත් ක්‍රෝධ කරන්න එපා. යම් කෙනෙකුට රිදෙව්වොත් තමාටම දුක් වෙන්න සිද්ධ වෙනවා. තේරුණා ද ඔමින්."

ඔමින් හිස වැනුවා.

"කෙනෙකුට වෛර බඳින්ඩ ඉස්සර ඔයා ගැනම හිතන්න. කෙනෙක් ඔයාගේ හිත රිදෙව්වොත් දොස් නගන්න යන්න එපා. එයාට අනුකම්පා කරන්න. ඔයා කෙනෙකුට ආදරෙන් සමාව දුන්නොත් ඔයාට ආපිට ආදරය ලැබෙයි. මම ඔයාට ලියන්න, කියවන්න, ගණන් හදන්න කියලා දුන්නා. ඒවා කොයි තරම් ඉගෙන ගත්තත් වැඩක් නෑ ඔයාගේ හිත හොඳ නැත්නම්. ඔමින් ඔයා හොඳ කෙනෙක් වෙන්ඩ."

සංසකු මේ සියල්ල කීවේ ඈත කඳුවැටි දෙස බලාගෙන.

"මම දන්නේ නෑ මේවා ඔමින්ට තේරුම් ගන්ඩ පුළුවන් ද කියලා. ඒත් ඔයා ලොකු වුණාම මේ කතා තේරුම් ගනියි. එතකල් මම කිව්ව දේවල් මතක තියා ගන්න."



"හොඳයි." ඔමින් හිස වැනුවා. ඊට පස්සේ සංසකු කිසිවක් කතා කළේ නැහැ. හිස නවාගෙන පිළිමය නෙලන්න පටන් ගත්තා.

සරත් සමය ආවා. හිම කැට දියවෙන්න ගත්තා. ඔමින් වෙන්ව යන දිනයත් ළං වුණා.

"එහෙම නම් ඔමින් ඔයා හෙට යනවා නේද ?"

"මම මෙහේ ඉන්න කැමතියි. ඒත්......"

"අම්මලා ඔයා ගෙදර නොගියොත් දුක් වෙයි."

"ඔමින් ඔයා මගේ මිණිබිරියක් කියලයි මට හිතෙන්නේ. ඔයා පුංචි උනාට හොඳට වැඩ කරන්න පුළුවනි. ඒ වගේම ඔයා කරුණාවන්තයි."

"ඔමින්, ඉදිරියේදී කරදර එයි. ඒත් ඔයා සතුටින් ඉන්න."

"හෙට ඔමින් යන නිසා අද අපි විශේෂ කෑමක් හදමු. මම යනවා මාළුවෙක් බිලිබාගන්න."

ඔමින් බිම බලාගෙන හිටියා. ඇයගේ දෑසින් කඳුළු කඩා හැලුණා.

"ඔමින්, සතුටු වෙන්න. ඇයි දුක්වෙන්නේ? ඔයා හෙට දෙමාපියන් ළඟට යනවානේ."

ඔමින් දැස පිස දමා ගෙයින් එළියට දුවගෙන ගියා. ඇය කන්ද දිගේ ගඟ පහළට දුව ගියා. ඇය දුටුවේ ඔත්තු ගඟේ ගල් අස්සේ වැටිලා ඉන්න හැටියි.

"අනේ...... අනේ සංසකු මාමා. ඉක්මන් කරන්න. සීයා වැටිලා."

සංසකු හා ඔමින් ඔත්තු අල්ලාගෙන නිවසට ගෙනාවා.

"මේ කකුල හොඳටම තුවාල වෙලා."

"තුවාල වුණත් කමක් නෑ සංසකු. මගෙ කකුල ගල් දෙකක් අතර හිරවෙලා උලුක්කු වුණා නේ. ආයි......"

"ඉන්න මේ රෙදි පටියෙන් තදට ඔතනකල්. ඔමින් මේ කකුල හොඳට අල්ලාගන්න."

"මම හෙට ඔමින්ව ඇරලවන්න නේ හිටියේ. බලන්නකෝ සිද්ධ වුණ දේ."

"සීයාට හොඳ වෙනකල් මට ගෙදර යන්න ඕනෑ නෑ."

"නෑ... නෑ... මම ඔමින්ව ගෙදර එක්ක යනවා."

"එපා සංසකු මේක භයානක අවස්ථාවක්. ඔයා ගම්මානයට යන එක සුදුසු නෑ."

"ඔයාගේ කකුල කවදා හොඳ වෙයිද දන්නේ නැහැ. ඔමින් මේ සරත් කාලයේ ගෙදර නොගියොත් එයා මෙහෙ හිටිය බව දැන ගනියි. ඒ නිසා ඔමින්ටත් කරදරයක් නොවෙන්න එයාව ඇරලවන්න ඕනෑ."

"ඔමින් මේ හර්මෝනි නළාව ඔයා තියා ගන්න. මාව මතක් වෙන්න. ඔයාට හිතට දුකක් ඇති වුණාම මේ නළාව පිඹින්න. ඔමින් මෙන්න ඔයාගේ ඇඳුම් මේ ලේන්සුවේ ගැට ගැහුවා. දැන් මේක උරහිසේ එල්ලා ගන්න. මේක ඇතුලේ බත් ගුලි දෙකක් ඇති. ඔමින් දැන් අපිට යන්ඩ වෙලාව."

ඔමින් ඔත්හුගේ දෙපා අල්ලා ගත්තා.

"සීයා අපි සන්තෝසයෙන් හිටියා. අපි දෙන්නා මේ ලිපේ ඉව්වා. සීයා මට සත්ව හම් වලින් ඇඳුම් හදලා දුන්නා. මට මේ කිසි දෙයක් අමතක වෙන්නේ නෑ. මම ආයිම ඔයාලා බලන්න එන්නද?"

"එපා ඔමින්, අපි වෙන තැනකට යනවා. දැන් මෙහේ දර ඉවරයි. මට ගල් අඟුරු හදන්නත් ඕනෑ නේ."

"මට හොඳට සැලකුවා. සීයාට ස්තූතියි."

"සංසකු ප්‍රවේශමෙන් ගිහින් එන්න. මටත් එන්න තිබුණා. කරුමෙට මගෙ කකුල උලුක්කු වුණා."

ඔමින් හා සංසකු යන අයුරු ඔත්හු බලා සිටියා. ඔහු කකුල අද්දමින් දොරකඩ ළඟට වී බලාගෙන සිටියා.

ඔමින් හා සංසකු හිමේ එරෙමින් ගමන් කළා. බොහෝ තැන්වලදී ඔමින් බිම ඇද වැටුණා.

"ඔමින් ටිකක් දුවලා යමුද ? ඔයාට මහන්සිද ?"

"නෑ සංසකු මමා, අපි යමු. ඔයා ඉක්මනට ආපිට යන්න. සීයා දැන් බයවෙලා බලාගෙන ඇති."



"ඒත් ඔමින් ඔයාට යන්න අමාරුයි මේ හිම ගොඩේ. එන්න මම ඔයාව උස්සාගෙන යන්නම්."

සංසකු ඔමින්ව පිටේ රුඳවා ගත්තා. ටික දුරක් ගිය විට,

"සංසකු මාමා අන්න අර ඈත පේන ගෙවල් දිහා බලන්න. ඒ අපේ ගම. දැන් මට යන්න පුළුවනි. ඔයා ආපිට යන්න."

"නැහැ මේ හරියේ හිම ඝනකම වැඩියි. මම තව ටික දුරක් ඔයාව ඇරලවන්නම්."

" නෑ සංසකු මාමා, ඔයා ආපිට යන්න. දැන් මට යන්න පුළුවනි. ඔත්හු සීයා බයේ ඇති."

"ෂ්... ෂ්...." සංසකු ඔමින් අරගෙන හිම කන්දකට මුවා වුණා. ඔවුන් ඉදිරියට එමින් සිටියේ හමුදා භටයින් කීප දෙනෙක්.

ඔමින් හොඳටම බය වුණා. සංසකු මාමාට කරදරයක් වෙයිද? ඇයට මතක් වුණේම ඔත්හු සීයා.

"සංසකු හමුදා භටයෝ ගම්මානයට එනවා. ඔයා අහුවුණොත්."

හමුදා භටයින් යන්න ගියා.

ඔමින් රැගෙන සංසකු හිට ගත්තා. එකවරම ඔමින්ට කැස්සක් ආවා.

එකවරම හමුදා භටයින් තුවක්කු එල්ල කරගෙන ආපිට හැරුණා.

"ඔහොම හිටපල්ලා. උඹලා කවුද ?"

ඔවුන් සංසකු අල්ලා ගත්තා.

"මම දඩයක්කාරයෙක්."

"එතකොට මේ කෙල්ල ? "

"මේ මගේ නංගී. සරත් කාලයේ එයා පාසල් යවන්නයි හිතුවේ. මගෙ ගෙදර එක්ක යනවා."

"මොකක්ද උඹේ නම කෙල්ලේ."

"මම ඔමින්, මේ සංසකු මාමා."

"ආ....." ඔවුන් සංසකුව දෙපැත්තෙන්ම අල්ලා ගත්තා.

ඔමින් රැගෙන බිම දැමුවා.

"අනේ එයා අත අරින්න. එයා අත අරින්න."

"අත අරිනවා මාව. අපි වරදක් කළේ නැහැ."

"වරද ? වරද තමයි කන්දේ හැංගිලා ඉන්න එක."

"කොහේද මාව ගෙනියන්නේ."

"ආපහු හමුදාවට."

"අනේ එයා අත අරින්න."

ඔමින් එක් නිලධාරියෙක්ගේ අත හැපුවා.

"මේ යක්ෂ කෙල්ල."

ඔහු ඔමින්ට තුවක්කු බඳෙන් පහර දුන්නා. සංසකු සියල්ලන්ගෙන් මිදී ඔමින් වඩා ගත්තා.

"එයාට හිරිහැර කරන්න එපා."

"යන්ඩ එපා. අපි උඹට වෙඩි තියනවා."

සංසකු ඔමින් වඩාගෙන දුවන්න පටන් ගත්තා. ප්‍රධාන නිලධාරියා ඔහුගේ හින බැඳි කොපුවෙන් පිස්තෝලයක් එළියට ගත්තා. එය එල්ල වුණේ සංසකුට. වෙඩි හඬ දෙකක් සමගම සංසකු ඇද වැටුණා. ඔමින් බිම පෙරලී ගියා. ඔමින් ඉක්මනට නැගිට සංසකු වැළඳ ගත්තා.

"අනේ සංසකු මාමා අනේ......"

"බයවෙන්ඩ එපා ඔමින් ඔයා ගමට දුවන්න."

"අනේ බෑ මම මාමාව දාලා යන්නේ නෑ."

"ඇයි එයාට වෙඩි තිබ්බේ. ඇයි." ඔමින් කෑගැහුවා.

"මම දැන් නිදහස් ඔමින්..... මෙහෙමයි ජීවිතය..... ජීවත් වෙ....න්න. ඕනෑ..... පසුතැවිලි නො.... වෙන්....න නයි."

සංසකුගේ දෑස් පියවී ගියා.

"අනේ සංසකු මාමා. අනේ මාමා."

"ඒයි කෙල්ල නැගිටපන්."



"බෑ මට යන්ඩ දෙන්න. ඇයි මයගොල්ලන් එහෙම කළේ?"

"ඔන්න ඔකිව ඇදගෙන එනවා."

"එනවා යන්ඩ."

එක් සෙබලෙක් ඔමින්ගේ අතින් ඇදගෙන ගියා. ඇය පසුපස හැරෙමින්.

"අනේ සංසකු මාමා....."

වරින් වර කිව්වා. සෙබලුන් ගම මැදින් ඔමින්වත් කැටුව ගමේ පිහිටුවා තිබූ හමුදා කාර්යාලයට ගියා. ගම්මු පුදුමයෙන් බලා හිටියා. හමුදා කඳවුරේ දී ඔමින්ගෙන් ප්‍රශ්න කළා.

"වෙන කවුද ඒ ගෙදර හිටියේ ?"

"කවුරුවත් හිටියේ නැහැ."

"ඇත්ත කතා කරනවා. වෙන කවුද හිටියේ ?"

"කවුරුත් නැහැ."

නිලධාරියා ඔමින්ගේ මුහුණ හරහා පාරක් ගැහුවා. ඔමින්ගේ කටින් ලේ ගලා ගියා. එවිටම එතනට ප්‍රධාන නිලධාරියෙක් පැමිණියා.

"මිනිහා හමුදාවෙන් පැනලා හිටපු එකෙක් නේද ? යුද්ධයකට යන්න ඇති. ලොකු තුවාල කැළැල් තිබුණේ. කොහේද ඉඳලා තියෙන්නේ."

"මේ කෙල්ල කියන්නේ කඳු මුදුනේ කියලා. කොච්චර ඇහුවත් වෙන කෙනෙක් හිටියේ නෑ කියනවා."

"තෝ බලන්ඩ. අයිසේ මේ පුංචි කෙල්ලක්නේ."

"මහත්තයා ඇයි එයා මැරුවේ. එයා දඩයක්කාරයෙක්. හරි කරුණාවන්තයි."

"එයා දඩයක්කාරයෙක් නෙවෙයි. හමුදාවෙන් පැනලා ගිය කෙනෙක්."

"අනේ සංසකු මාමා වෙනුවෙන් පූජාවක් වත් තියන්න ලැබුණේ නැහැ."

Ranjika

"එයා හමුදාවේ නිසා අපි නිසි ආචාර දැක්වුවා. ඔයා ඒ ගැන වද වෙන්ඩ එපා. දැන් ගෙදර යන්ඩ."

ඔෂින් හිස නමාගෙන කාර්යාලයෙන් නික්මුණා. ඇය නිවසට ළඟා වුණා. ඒත් ඈත තියාම නිවස දෙස බලා හිටියා.

"සෝජි ඔය දරමඩුවෙන් දර කෑල්ලක් ගෙන්ඩ."

සෝජි එළියට ආවා. ඔහු දුටුවේ ගේ දෙස බලා සිටින ඔෂින්. ආපසු හැරුණ ඔහු ගෙට දුව ගියේ,

"තාත්තා, අන්න ඔෂින්ගේ අවතාරය. අර.... අර...."

"කෝ... කෝ..." අම්මාත්, තාත්තාත්, ආච්චම්මාත් එළියට දුවගෙන ආවා.

"අම්මා, අම්මා" ඔෂින් දුවගෙන විත් අම්මා බදා ගත්තා.

"ඔෂින්, මගෙ ඔෂින් ඔයා."

"මම දැනගෙන හිටියා ඔෂින් කවදා හරි එයි කියලා."

ආච්චම්මා සතුටින් කිව්වා. තාත්තා ඔෂින්ව අම්මා වෙතින් ඇදල අරගෙන කම්මුලට දෙක තුනක්ම ගැහුවා. ඇය බිම ඇදගෙන වැටුණා.

"හිතුවක්කාරී ගිය ගෙදරින් පැනලා ඇවිත් අපට අවනම්බු කළා. ගන්න එපා මේකිව ගෙට. පලයන් හිටපු දිහාවටම."

ඔෂින් සෙමෙන් නැගිට ආපසු යන්න හැරුණා. අම්මා ඔෂින්ව වැළඳ ගත්තා.

"ඔෂින් ඇයි මේ, ඔයා කොහේ යන්නද ? තාත්තාට තරහ ගියේ ඔයා ගෙදරින් පැනලා ආවාට. ඔයා දන්නවද ලී මුදලාලිගේ සේවකයෝ ඇවිල්ලා ඔයාට දුන්නු හාල් අරගෙන ගියා. එතකොටයි අපි දැන ගත්තේ ඔයා ඒ ගෙදරින් පැනලා ඇවිල්ලා."

ඔෂින් හොඳටම බය වුණා.

"අම්මා, තාත්තා මට ගහයි."

"එන්න මේ මඩුවට. ඔයා ඒක ඇතුළට වෙලා ඉන්න. මම ඔයාට කන්ඩ අරගෙන එන්නම්."



ඔෂින් අඳුරු කාමරයේ වූ පිදුරු ගොඩක හේත්තු වෙලා හිටියා. ඇයට අඳුර තුළින් පෙනුණේ සංසකු වෙඩි වැදී මිය ගිය අයුරු. ටික වේලාවකින් අම්මා කෑම තැබූ බත්දේසියක් රැගෙන මඩුව තුළට ආවා.

"දුව ඔෂින් මේ කෑම කාලා ඉන්න."

ඔෂින් බත් බඳුනත් හෂි කෝටු දෙකත් අරගත සෙමෙන් බත් කෑවා.

"ඔෂින් ඒ ගෙදරින් පැනල ඇවිත් ඔයා කොහෙද හිටියේ."

ඔෂින් බිම බලා ගත්තා.

"කඳුකරේ."

"කඳුකරේ කවුරු එක්කද ?"

"එයා දඩයක්කාරයෙක්. තව එහෙ හිටියා සීයා කෙනෙක්."

"දඩයක්කාරයෙක් එයා කෝ?"

"එයා ගිහින් අම්මා."

ඔෂින් දැස් වසාගෙන අඩන්න පටන් ගත්තා.

"කියන්න දුව කොහේද එයා ගියේ."

"අම්මා එයාට හමුදාවෙන් වෙඩි තිබ්බා."

"වෙඩි තිබ්බා ?"

"ඔව්, එයා මාව ඇරලවන්න ගමට ආවා. එතකොට එතකොට..."

ඔෂින් අඩන්න පටන් ගත්තා.

"මගෙ දුව" අම්මා ඔෂින්ව වැළඳ ගත්තා.

"දැන් නිදාගන්න. මම ඔයාට පොරවන්න කම්බිලියක් අරගෙන එන්නම්."

අම්මා මඩුවෙන් ඉවත්ව ගියා.

"දුව හුගක් දුක් විඳලා තියෙනවා අම්මා."

නින්දට වැටුණ ෆූජි අම්මාට ඇහෙන්න කිව්වා. විනාඩියකින් සකුගෙසා කාමරයෙන් ඉවත්ව ගියා. ඔහු ගියේ ඔෂින්ව බලන්න. ඔෂින්ට හොඳට

නින්ද ගිහින්. සකුසෝ කම්බිලිය හොඳට පොරවා ඔෂින්ගේ මුහුණ දෙස බලා සිට යන්න ගියා. ෆුජි ඒ සියල්ල දෙස හොරෙන් බලා සිටියා. පහුවදා උදේ ආච්චම්මා ඔෂින් සිටි මඩුවට ගියා.

"ඔෂින්, ඔෂින්, නැගිටින්න. දැන් එළිවෙලා හුගක් වෙලා."

ඔෂින් තිගැස්සී ඇහැරුණා. ඇය කල්පනා කළේ ඉන්නේ සංසුන් සමගද ගෙදර ද කියලා.

"ඇයි ඔෂින්. ඔයාට තවම තෙහෙට්ටුද ?"

ආච්චම්මාගේ දයාබර කටහඬ ඔෂින්ගේ මතකය අවදි කළා.

"දුව, දුක්වෙන්න එපා. තාත්තා ඔයාට ගැහුවේ ඔයා අර ගෙදරින් පැනලා ආව නිසා. තාත්තා කියනවා දුව පිළිගත්තානම් ඔයා කළ වැරැද්දට දඬුවමක් දුන්නේ නැහැ වගෙයි කියලා. තාත්තා සෝජි එක්ක කුඹුරට ගියා. අන්න අම්මා එළියෙ රාබු හෝදනවා. එන්න දුව එළියට."

ඔෂින් එළියට ආවා. අම්මාට රාබු හෝදන්න උදව් කළා.

"ඔෂින්"

තාත්තාගේ වේගවත් හඬින් ඔෂින් තිගැස්සුණා.

"උඹව මිල්ටරි පොලිසියෙන් ඇල්ලුවද ?"

ඔෂින් බලාගෙන හිටියා.

"කතා කරපන් උඹ නිසා ගමේ මිනිස්සු මට හිනාවෙනවා. මම උඹට....."

තාත්තා ඔෂින් ඇදලා අරගෙන කම්මුල්වලට වේගයෙන් ගහගෙන ගියා. අම්මාත්, ආච්චම්මාත් කෑ ගහගෙන සකුසෝ අල්ලා ගත්තා. ඔෂින් සිහි නැතිව ඇදගෙන වැටුණා.

"මොනවද ඔහේ ඒ කළේ."

"ආයිම ඔකිව ගෙට ගන්න එපා."

"මේ මගේ දරුවා. මොනවද සකුසෝ කියන්නේ. ඔෂින් සේරම කිව්වා. අපි ඒ දඩයක්කාරයට ස්තුතිවන්න වෙන්ඩ ඕනැ. හිමේ මැරෙන්ඩ ගිය ඔෂින් බේරාගත්තාට."



"දඩයක්කාරයා ? ඒකා දඩයක්කාරයෙක් නෙමෙයි. හමුදාවෙන් පැනලා ගිය එකෙක්."

"කවුරු උනත් ඒ මනුස්සයා වෙඩිකාලා තියෙන්නේ ඔෂින්ව ගමට ඇරලවන්න ඇවිත්. ඔෂින් කිසිම වරදක් කරලා නැහැ."

"ඇයි අර ගෙදරින් පැනලා ආව එක."

"ඒකට එයාට වැරදි කියන්න බැහැ. ඒ ගෙදරින් ඔෂින් ගෙන් හුගක් වැඩ අරගෙන හරියට කන්න දීලත් නැහැ."

ආච්චම්මා ඔෂින්ගේ හිස වළොක්කුවේ තබාගෙන මුහුණ අත ගාමින් ඇඬුවා.

"මීට පස්සේ මම ඔෂින්ව කොහේවත් යවන්නේ නැ."

ෆුජි ඔෂින්ගේ මුහුණේ වතුර ගාමින් කතා කළා.

"ඔෂින්, ඔෂින්, ඇස් අරින්න මගෙ දුව."

"ඕනැ එකක් කරගනිල්ලා."

සකුසෝ ආපිට හැරී ගියා. ඔහු සමග සිටි සෝජිද තරහින් බලා සිට යන්න ගියා. දින ගත වී ගියා. අම්මා තාත්තා සමග කුඹුරට යනවා. සෝජිත් ඔවුන් සමගයි. ඔෂින් පොඩිම නංගිව බලාගත්තා. ආච්චම්මා අනිත් පොඩි නංගියි, මල්ලියි එක්ක සෙල්ලම් කළා.

"ඒයි මිල්ටේරිකාරයා එක්ක හිටියා නේද ? ඒකා බයගුල්ලෙක්. ඒකනේ හැංගිලා හිටියේ. හූ— හූ—"

කන්ද උඩට පැමිණි ගැමි ළමයි ඔෂින්ට ගල් දමා ගැසුවා.

"දුවනවා යන්ඩ, දුවනවා."

ආච්චම්මා හැරමිටිය වනමින් ඔවුන් එළවා දැම්මා. සවස අම්මා පැමිණි පසු ආච්චම්මා විස්තරය කිව්වා.

"ඇත්ත තමයි ඒකා බයගුල්ලෙක්."

සෝජි ඔෂින් දෙස බලලා කිව්වා.

"එයා බයගුල්ලෙක් නෙමෙයි. සටනේදී තුවාල වෙලා, තුවාල කැළැල් හැම තැනම."

"බයගුල්ලා, බයගුල්ලා."

"සෝජි සංසකුට එහෙම කියන්න එපා. සමාව ගන්නවා, සමාව ගන්නවා."

ඔෂින් සෝජිගේ අත් දෙකම අල්ලා ඇද්දා.

"බයගුල්ලා."

සෝජි ඔෂින්ව තල්ලු කර දමා දුව ගියා. ආච්චම්මා ළඟ වූ විශාල කූඩයේ පුංචිම නංගි නිදි. ආච්චම්මා ළඟ අනිත් නංගිලත් නිදි. ඔෂින් සංසකු දුන්න නලාව සඟවා තිබුණේ පිදුරු ගොඩේ. ඇය මඩුවට ගිහින් ඒ නලාව රැගෙන එය සිප ගත්තා. ඉන්පසු සෙමෙන් නලාව පිඹින්න පටන් ගත්තා. ටික වෙලාවකින් මඩුවේ දොර ඇරුණා. ඔෂින් නලාව සඟවා ගත්තා.

" ඔෂින් ඔයා නලා හඬ ඇසෙන කොට මම හිතුවා ඒ නම් ඔෂින් තමයි කියලා."

දොරකඩ හිටගෙන හිටියේ ඔත්සු.

"අනේ සීයා ඔයා."

"ඔව් ඔෂින් මම ඔයා හොයාගෙන ආවා. මම දන්නවා සිද්ධවුණ දේවල් සේරම. මට මගෙ සංසකු අහිමි වුණා."

"ඔත්සු සීයා වාඩිවෙන්න."

"එපා ඔෂින්, එන්න මාත් එක්ක, මට ඔයාට කතා කරන්න ඕනෑ."

ඔෂින් ඔත්සු පිටුපස ගියා.

"සීයා මිල්ට්‍රියෙ බැඳුන අය නරකද ?"

"නෑ ඔෂින්."

"එහෙනම් ඇයි සංසකු මාමා නරක කෙනෙක් කියන්නේ. ඇයි එයාට බයගුල්ලෙක් කියන්නේ."

"සංසකු බය නෑ ඔෂින්, එයා හමුදාවෙන් පැන්නේ සටන් කරන්න බයෙන් නෙමෙයි. යුද්ධයේදී එකිනෙකා මරාගන්නා හැටි දැකලා කලකිරීමෙන්. යුද්ධයේදී එයාගේ යාළුවෝ එයාගේ ඇස් පනාපිටම





මැරුණා. ඇයි මේ එකිනෙකා මරාගන්නේ කියලා එයා පසුතැවිලි උනා එයා මරපු අය ගැන. හමුදාවේදීමයි එයාට බරපතල තුවාල වුණේ. එයා ඒ තුවාල සුව කරගන්න හිතුවේ නැහැ. එයා හමුදාවෙන් පැනලා ආවා. තුවාලවල වේදනාවටම හොඳටම උණ හැදිලා හිමේ වැටිලා ඉන්නකොට මට හම්බවුණේ. මම එයා ගෙනැල්ලා වෙදකම් කළා. මගේ නැතිවුණ පුතාලා දෙන්නා වෙනුවටයි දෙවියෝ එයා මා ළඟට එව්වේ. සනීප වෙනකොට ඔහුට හුඟක් දේවල් අමතක වෙලා තිබුණා."

"ඔෂින් සංසකු හොඳ යුද පරම්පරාවකින් පැවත එන කෙනෙක්. ඒත් එයා මැරුණා. මට දුකයි. හැබැයි එයා හිටියේ සතුටෙන් නෙමෙයි. සංසකුට මරණය හොඳයි. ඔහු නිතර කිව්වා."

"සෙබලු වෙඩි තියපු වෙලාවේ සංසකු මාමා කීවේ දැන් මම නිදහස් කිව්වා."

"ඉතින් ඔෂින් දැන් ඔයා ඇත්ත දන්නවා. එයා බයගුල්ලෙක් නෙමෙයි. සංසකු මගේ වීරයා. නැමදාම වීරයා."

"මම දැන් යන්න ඕනෑ ඔෂින්."

"ඔයා ආයිම මෙහෙ එන්න මාව බලන්න."

"මම දැන් ඉන්නේ වෙන කන්දක. ආයිම මට ඔයා බලන්න එන්න බැරිවෙයි. ජීවිතයට බොහෝම කරදර එයි. ඒවාට බය නැතිව මුහුණ දෙන්න. ඔයාට හරි කියලා හිතෙන දේ කරන්න."

ඔත්සු ඔෂින්ගේ අත් දෙකම අල්ලා ගත්තා.

"මම යන්නම් ඔෂින්."

ඔෂින් හිස නමා ඔත්සුට ආචාර කළා. ඔහු ඈත යන හැටි බලාගෙන හිටියා.

## පහ

හරුන් ගෙදර ආවා.

"ඔෂින්, ඔයා ගෙදර. ඔයාගේ කොන්ත්‍රාත්තුව ඉවරයිද ?"

"හරුන් ඔයා ආපිට යන්නේ නෑ නේද ? අනේ ගෙදර ඉන්න මටත් පාළුයි."

"අපෝ එහෙම ඉන්න බෑ. මේ සැරේ යන්නේ සේද කම්හලට."

"සේද කම්හලේ වැඩ අමාරුයි නේද ?"

"ඒ වුණාට පඩි හොඳයි. තාත්තා තමයි ලෑස්ති කරලා දුන්නේ. එහෙ සේද කබාන් දෙනවා කිව්වා. මිට්ෂුත් එයාගේ කොන්ත්‍රාත් එක ඉවර වුණාම සේද කම්හලට එනවා කිව්වා."

"හරුන් සේද කම්හලේ වැඩ කරන්න ලේසි නෑ දුව." ආච්චම්මා කිව්වා.

"ගෙවල්වල වැඩත් ලේසි නෑ ආච්චම්මා."

"අම්මා සේද කම්හලට යන්න ඉන්න ළමයගේ හිත කඩන්න එපා." සකුසො පිදුරු තලමින් කිව්වා.

"ඒ වුණාට මේ ළමයා තවම පොඩියි නේ සකුසො."

"මොනවද හිතන්නේ. හාල් ඉවරයි. ණයටත් ගත්තා. දැන් ඒවට පොලියක් එක්ක දෙන්න වෙනවා. හරුන් විතරක් නෙමෙයි, ඔෂින් මේ සැරේ ඔයත් පිට වැඩට යන්න ඕනෑ. ගෙදරට වෙලා නිකම්ම හිටියට සල්ලි ලැබෙන්නේ නෑ. තේරුණාද ඔෂින්ට."



"හොඳමයි." ඔෂින් එතනින් ඉවත්ව මඩුවට ගියා. නලාව රැගෙන සෙමෙන් පිඹිමින් සිටියා.

එකවරම හරුන් මඩුවට ආවා.

"ඔෂින් කොහෙන්ද ඕක."

"සංසකු දුන්නා. හිතට දුකක් දැනුණාම පිඹින්න කිව්වා."

"ඔය හර්මෝනිකාවක්. හරි ගණන් සංගීත භාණ්ඩයක්."

"එයා මතක් වෙන්න තියා ගන්න කිව්වා. හරුන් සංසකු මාමා මට ලියන්න, කියවන්න පුරුදු කළා. මට ගණන් හදන්නත් පුළුවනි."

"ඔන්න අහගන්න සංසකු මාමා ඉගැන්නුව කවියක්,

අහෝ සොයුර,
මේ කඳුළු ඔබටයි
අප අතහැර නොයන්න
නැසුණොත් ඔබ
මට කාගේ පිහිටක්ද

හරුන් මට ඕක ලියලා පෙන්වන්නත් පුළුවනි."

"ඔයා හරි දක්ෂයිනේ."

"ඔන්න බලන්න."

ඔෂින් කෝටුවක් ගෙන වැල්ලේ අකුරු ලියා පෙන්නුවා.

"ඔෂින් ඔයා ගල්ලෑල්ලක් ගන්න මේ සල්ලි තියා ගන්න. හැබැයි තාත්තට කියන්න එපා."

"ඔයාගේ සල්ලි මට එපා හරුන්. ඔයා ඒවා අමාරුවෙන් හොයපුවා."

"නෑ ඔෂින්, අපිට ඉගෙන ගන්න බැරිවුණා. ඔයා ඉගෙන ගන්න. තනියම හරි ඉගෙන ගන්න. මම ආයිම වැඩට යනවානේ. එතකොට මට මුදල් හම්බවෙයි."

"ඔයාට ස්තූතියි හරුන්."

ඔෂින් හිස නමා ආචාර කළා.

"ඔමින් ඔයා අපට වඩා හරි වෙනස්. ඔයා ඉගෙන ගන්ඩ. තනියම හරි ඉගෙන ගන්ඩ."

ඔමින් ගමේ කඩේකින් ගල්ලෑල්ලක් ඇරගෙන එන්න ගියා. ඒ චූටි නංගියත් පිටේ රඳවාගෙන. එන්න පරක්කු වන විට පොඩි එකී අඬන්න පටන් ගත්තා. ඇය නංගි ගලවා කුඩේ තියා ගල්ලෑල්ල ගෙන ලියන්න පටන් ගත්තා.

"සංසකු මාමා, ඔයා දිව්‍ය ලෝකේ ඇති. මම නගරයෙන් ගල්ලෑල්ලක් ගත්තා. මේක ගන්න මට සල්ලි දුන්නේ හරුන්. ඒ මගේ අක්කි. මම හැමදාම සංසකු මාමාට විස්තර ලියන්නම්."

"ඔමින්."

"මේ එනවා." ඔමින් ගල්ලෑල්ල පිදුරු ගොඩේ හැංගුවා.

"මොනවද මඩුවට වෙලා කරන්නේ."

"මං නංගි බලාගත්තා."

"එහෙම කිය කියා නිදාගන්නවා නේද ?"

"සකුසො ඔමින්ට බනින්න එපා. ළමයා බලාගන්න එකත් ලෙහෙසි නැහැ."

"කට්ටියම ඉන්න එක හොඳයි. අස්වැන්න පාළු වෙලා. ඒ මදිවට දිගටම වැස්ස. කරන්න කිසිම වැඩක් නෑ. මෙහෙම කොහොමද ජීවත් වෙන්නේ."

මේ අතර ඔමින් මඩුවට ගොස් ගල්ලෑල්ල ගෙන සංසකුට ගෙදර විස්තර ලියන්න පටන් ගත්තා.

"ඔමින්." තාත්තා කතා කළා.

"ඔමින්, ඔමින්, මේකි මෙලහට මඩුවට වෙලා නිදි ඇති. කම්මැලි කෙල්ල දවසම නිදාගන්නවා."

"එහෙම කියන්න එපා, ඔමින් කොච්චර වැඩ කරනවද ?"

"උඹ කටවහගනින් ගෑණියේ."

සකුසො මඩුවට ගියා. ඔමින් හිස නමාගෙන ගල්ලෑල්ලේ ලියනවා.



"උඹ මොකද කරන්නේ. මේක තමයි දවස තිස්සෙම මඩුවට රිංගලා කරන්නේ නේද ? මෙහාට ගනින් ඕක."

ඔමින් සෙමෙන් ගල්ලෑල්ල දිගු කළා.

"කොහෙන්ද උඹට ගල්ලෑලි ගන්න සල්ලි."

"හරුන් දුන්නේ."

"සල්ලි වලට ගල්ලෑලි නොගත්තට කන්ඩ හාල් ටිකක් ගන්ඩ තිබුණා."

සකුසො ගල්ලෑල්ල විසි කළා. ෆුජි දුවගෙන ආවා.

"ඔමින්ට හිරිහැර කරන්න එපා."

අම්මා ඔමින්ගේ කැඩුණු ගල්ලෑල්ල එකතු කළා. ඒ ගමන්ම පුදුමයෙන් ඔමින් දිහා බැලුවා.

"මේවා ලීවේ ඔයාද ?"

"ඔව් අම්මා, ගල්ලෑල්ලක් ගන්ඩ හරුන් සල්ලි දුන්නේ."

"හොඳට ලියන්න පුළුවන් වගේ නේද ?"

"ඔව් අම්මා, මට කියවන්ඩත් පුළුවනි."

"අනේ දුව, අපිට ඔයා පාසල් යවන්ඩ බැරිවුණානේ."

"කමක් නෑ අම්මා මම තනියම ඉගෙන ගන්නම්."

"හොඳයි, මට සතුටුයි දුව."

කෑම ගන්නා වෙලාවේ සකුසො කතා කළා.

"මේ සැරේ අස්වැන්න පාළුයි. වැස්ස නිසා කරන්ඩ වැඩකුත් නෑ. මම කල්පනා කළා මේ පළාත අතහැරලා යන්ඩ. අපි බ්‍රසීලයට යමු."

"ඇයි අපි යන්නේ. මේ අපේ ගම්බිම. මේක දමලා යන්ඩ බැහැ." ෆුජි කිව්වා.

"තේරුම් ගන්නවා. රාබු බත්වත් කන්න ලැබෙන්නේ නැහැ. බ්‍රසීලයට ගියාම කන්න ලැබෙයි. එහෙ සරු පස. මෙහෙ වගේ හිම නෑ. කන්ඩ සේරම දේවල් වවා ගන්ඩ පුළුවනි. විකුණන්ට කෝපි වගා

කරන්ඩ පුළුවනි. කණ්ඩායමක්ම යන්ඩ කතා කරගත්තා. මමත් යනවා. අපි හැමෝම යන්ඩ ඕනෑ."

"එතකොට හරුන්, මිට්ෂු ?"

"ඒ ගොල්ලන්වත් ගෙන්වා ගන්නවා."

"සකුසො මොනවද මේ කියන්නේ. ආච්චම්මා කොහොමද යන්නේ ?"

"අම්මට මල්ලි ළඟ ඉන්න කියනවා. සහෝදරයෝ තව ඉන්නේ, මම ම බලා ගන්ඩ ඕනෑයැ."

"මොකද නැත්තේ පවුලේ වැඩිමලා තමයි දෙමාපියෝ බලාගන්ඩ ඕනෑ."

"ඒත් අම්මට තේරෙනවා සිද්ධ වෙලා තියෙන දේ."

"මගේ හිතට එකඟ නෑ අම්මව දමලා යන්ඩ."

"අනේ මම උඹලට කරදරයක් වුණා නේ. මාව මැරිලාවත් යන්නේ නැහැනේ."

"අම්මා එහෙම කියන්න එපා. අම්මට වැඩකරන්න පුළුවන් කාලේ අපට කොච්චර උදව් කළාද ? දැනුත් මේ පොඩි ළමයි බලා ගන්නේ අම්මා. මම නම් අම්මව දාලා යන්නේ නෑ."

"එහෙම නම් සේරම බඩගින්නේ මැරියල්ලා."

"අනේ ජුජ් ඔයාලා යන්න. ඔයාලා සතුටින් හිටියොත් මට ඒ ඇති."

"අම්මා දමලා යන්නේ නෑ අම්මා."

ඔෂින් මඩුවට ගොස් කැඩුණු ගල්ලෑල්ලේ සංසකුට ලිපියක් ලිව්වා.

සංසකු මාමා,

අපි මෙහෙන් යනවා. ඒ ඈත රටකටලු. ඒත් ඒ ගමනට අම්මා කැමති නෑ. ආච්චම්මා දමලා යන්න වෙන නිසා. මමත් කැමති නෑ ආච්චම්මා දමලා යන්න. සංසකු මාමා මට මතක් වෙනවා ඔයා මාව කඳු මුදුනේ ඔයාලා ගෙදර ගෙන ගියාම මත්සු සීයා කිව්වා,



"උඹ හැංගිලා ඉන්නේ. උඹ මේ කෙල්ල ගෙනාපු එක වැරැද්දක් කියලා. එතකොට සංසකු මාමා කිව්වා, මම වගේ හැංගිලා ආපු එකියකට මට පිටුපාන්න බෑ කියලා. ඒත් මාමා අද දුක්වෙනවා, එහෙන් පැනලා ආපු එක ගැන. ඒකෙන් සිද්ධ වුණේ අපේ හාල් ආපිට බලෙන්ම ගෙනිච්ච එකයි. මම දිගටම හිටියා නම් තව හාල් ගෝනියක් ලැබෙනවා. එතකොට අපට වෙන රටකට යන්න වෙන්නේ නෑ. ආච්චම්මා තනිකරන්න වෙන්නෙත් නෑ.

ඔෂින් මේවා ලිව්වේ වරින් වර ගල්ලෑල්ලේ ලිවූ දේළි මකමින්. ටිකකින් පොඩි නංගියි මල්ලියි එළියෙ අඬන හඬ ඇයට ඇසුණා. පුංචිම බබා ඔෂින් ළඟ කූඩයක නිදි. ඔෂින් ලිවීම නවතා මිදුලට දුව ගියා.

"ඇයි ඔයාලා අඬන්නේ."

"ආච්චම්මා, ආච්චම්මා අරහෙ ගියා."

"මොනවා ආච්චම්මා ගියා. ඔයාලා අඬන්න එපා. චූටි නංගියාව බලාගන්ඩ. මම ඉක්මනට ආච්චම්මාව හොයාගෙන එන්නම්."

ඔෂින් දුවගෙන ගියා. අම්මාට පණිවිඩය කියා ඇය ගියේ ගඟ පැත්තට.

"ආච්චම්මා, ආච්චම්මා... ආච්ච... ම්... මා."

ඇය දුටුවා ආච්චම්මා ගඟ ළඟ වූ ගල්කුලකට නගින අයුරු.

"ආච්චම්මා ඔය කොහේද යන්නේ. යන්න එපා. යන්න එපා. ඔහොම නතර වෙන්න. ආච්චම්මා ලිස්සලා වැටෙයි. අනේ තවත් යන්න එපා."

ආච්චම්මා නතර වී ඔෂින් දෙස බැලුවා.

"ඔෂින් එන්න එපා. මයා ආපහු යන්න දුව."

"නෑ, නෑ, මම ආපිට යන්නේ නෑ. ආච්චම්මා එහොම ඉන්න."

ඔෂින් ආච්චම්මාව ඇල්ලීමට ගල්කුලට ඉක්මනින් නැග්ගා. ආච්චම්මා පළමුව හැරමිටිය අත ඇරියා. ඔෂින් නිහඬව ම පැමිණ [illegible]

"අනේ ආච්චම්මා මොනාද ඒ කරගන්න ගියේ ?"

"අපිට ආච්චම්මා ඕනෑ. මම යන්නේ නෑ ආච්චම්මා දමලා. මං කොහේ හරි වැඩ කරලා ආච්චම්මාට කන්න ගෙනැත් දෙන්නම්. ඔහොම දේවල් කරන්න එපා."

ඇය ආච්චම්මාව බදාගෙන අතමිට මොලවා සෙමෙන් පහර දෙමින් ඇය සිප ගත්තා.

"මම වැඩකට නැති නාකිච්චියක් ඔෂින්, ඔයාලගේ අම්මා බුසිලයට යන්න බැහැ කියන්නේ මම නිසා. මගෙන් වැඩක් නෑ මැරිලා ගියාදෙන්"

"ආච්චම්මාව මම බලා ගන්නවානේ. අපි යමු, අන්න පොඩි නංගිලා අඬනවා."

ආච්චම්මාගේ කකුළ උළුක් වෙලා තිබුණා. ෆුජි එය පටියකින් ඔතමින්,

"අම්මා තාමත් රිදෙනවද ?"

"නෑ ෆුජි මගෙ හිතයි රිදෙන්නේ."

"හිත රිද්දගන්ඩ එපා අම්මා. මම අම්මට මගෙ අම්මට වගේම ආදරෙයි. මම මනමාලියෙක් වෙලා මෙහෙ ආව දවසේ ඉඳලා අම්මා මට කරුණාවෙන් සැලකුවා. මේ සේරම ළමයි ලොකු මහත් කරන්ට අම්මා හුගක් දුක් වින්දා. ඒ නිසා අම්මව අත ඇරලා අපි යන්නේ නෑ. සකුසො මම රස්සාවකට යන්නම්. ඔෂින් ළමයි බලා ගනියි."

"එතකොට පොඩි එකා."

"පොඩි එකාටත් සැපට හැදෙන්ඩ ක්‍රමයක් තියෙනවා. ඔයා කලබල කරන්ඩ එපා. තව දවස් තුනකින් මම රස්සාවට යනවා."

ඔෂින් සෙමෙන් මවට ළං වුණා.

"අම්මා. ඔයා ඇත්තටම රස්සාවකට යනවද ?"

"හුම්..." අම්මා හීල්ලුවා.

පසුවදා කුඹුරට ගියේ සකුසොයි සෝජියි විතරයි.

"පුරුද්දට ගියාට ඇති වැඩක් නෑ. වැස්සට සේරම විනාශ වෙලා"



"අම්මා, අද කුඹුරට යන්නේ නැද්ද ?"

"නෑ ඔෂින්. අද නංගිට හොඳට කිරි දෙන්න ඕනෑ."

ටිකකින් අසල්වැසි කාන්තාවක් වූ රිකි නැන්දා ආවා.

"ෆුජි ඔන්න මම ආවා."

"හොඳයි මම බබාට හොඳට බඩ පිරෙන්න කිරි දුන්නා."

"ඒක හොඳයි. ඒ ගොල්ලන් මෙයාව එයාලගේ දරුවෙක් වගේ බලා ගනියි."

"රිකි, මේ දරුවාට මම මනපු ඇඳුම් වගයක්. ඒත් ඒවා ඕනෑ වෙන එකක් නැති වෙයිද ?"

"නෑ දෙන්ට. ඒවා වෙන කෙනෙකුට හරි දෙන්ඩ බැරියැ."

ඔෂින් දොරකඩින් එබුණා.

"අම්මා ඔයා බබා ගෙනියන්ට දෙන්වද හදන්නේ ?"

ෆුජි හිස වැනුවා.

"බෑ මම ඔය බබා ගෙනියන්න දෙන්නේ නෑ. ඒ මගේ නංගි."

ෆුජි ඔෂින්ව අල්ලා ගත්තා.

"ඔෂින් දුක්වෙන්න එපා. මම කුමිව දුන්නේ දරුවෝ නැති දෙන්නෙකුට. කුමි පොඩි නිසා එයා හිතයි ඒ තමයි දෙමාපියො කියලා. දරුවා හොඳින් හැදෙයි. එයාට රස කෑම ලැබෙයි."

ඔෂින් අම්මාගේ ළය ළඟ මුහුණ තබාගෙන සෙමින් ඉකිගැහුවා. ෆුජිගේ දෑසින් කඳුළු කඩා වැටුණා. සවස ෆුජි දරුවා ගැන සකුසොට කිව්වා. අත්තම්මා ඉකිගහන හඬ ඇසුණා.

"මම හෙට උදේම වැඩට යනවා."

"අම්මා, ඒ මොන විදිහේ තැනක්ද ?"

"ගීසාල් කියලා විවේක ගන්න තැනක්."

"මොන වගේ වැඩද එහේ තියෙන්නේ."

"උයන්න, රෙදි හෝදන්න."

ෆුජි සියල්ල කීවේ ඉවත බලාගෙන.

"ඔමින්, මම ගියාම ඔයාට ගේ බාරයි."

"අම්මා, මම වැඩට ගියා නම් අම්මට මෙහෙම යන්න වෙන්නේ නැ නේද ? අනේ අම්මා, මට සමාවෙන්න."

"නැ ඔමින්, ඔයා නංගිත්, මල්ලිත් බලාගෙන ආච්චම්මාත් බලාගෙන තාත්තාටයි සෝජීටයි උයලා දෙන්නකෝ. එතකොට ඔයා ලොකු වැඩ කොටසක් කරනවානේ."

පසුවදා උදේම ෆුජි පිටත් වුණා. ඔමින්, නංගිත් මල්ලිත් දෙදෙනාම අල්ලාගෙන අම්මා පසුපස ගියා. ෆුජි පසුපස නොබලාම පාර දිගට ම ගියා. දින ගත වී ගියා. දවසක් තාත්තා වේලාසනම ගෙදර ආවා.

"ඔමින්, අපට හාල් මලු පහක් ලබාගන්ඩ ක්‍රමයක් තියෙනවා."

"හාල් මලු පහක් ?"

"තාත්තා ඇත්තටම හාල් මලු පහක් ලැබෙයිද ?"

"ඔව්, ඔමින් නගරයේ තියෙන ලොකුම හාල් වෙළඳ ආයතනය රිකි තමයි පණිවිඩය කිවේ."

"මම යන්නම් තාත්තා, එතකොට අපිට ආපිට අම්මා ගෙන්නා ගන්න පුළුවනි."

"සකුසො මොනවද ඔය ළමයට කියන්නේ. අපි ෆුජී එවන සල්ලි පිරිමහගනිමු. එපා ඔමින් වැඩට යවන්න."

"නැ ආච්චම්මා, එයාලා මට හාල් මලු පහක් දෙනවලු. එතකොට ආච්චම්මාටත් බත් හුගක් කන්න පුළුවනි."

"මට ඕනැ නැ. ඔයා යන්න එපා මතකද දුක් වින්ද තරම."

"ආච්චම්මා ගමේ ළමයි මට ඔච්චම් කරනවා. හමුදාවෙන් අල්ලගෙන ගියා කියලා. සංසකු මාමා බයගුල්ලෙක් කියනවා. ඒ නිසා මම කගායා යන්නම් ආච්චම්මා."

"හොඳයි ඔමින්, ඔයා යන්න."

තාත්තා කිව්වා.

"තාත්තා, මම අම්මා හමුවෙලා යන්නම්."



"පිස්සුද ඔමින් එහෙ ඇතයි."

"එහෙනම් අම්මා පයින්ම ගියේ."

"කටවහගෙන අර රාබු මුල් ටික පස් වලින් වහනවා."

තාත්තා කිව්වා.

"හොඳයි."

ඔමින් ටික වෙලාවක් රාබු පාත්තියේ හිටියා. හිටි ගමන් මඩුවට ගිහින් හාල් මුට්ටියෙන් හාල් දෝතක් අරගෙන ලේන්සුවක ඔතා ගත්තා. මෙච්චරයි ගත්තේ ආච්චම්මා, මට සමාවෙන්න. ඇයගේ කිමෝනාවක් රැගෙන එයද ලේන්සුවේ ගැට ගසා ලේන්සුව උරහිස දෙපස ගැට ගසා ගත්තා. ආච්චම්මා හොඳින් ඉන්ඩ. ගෙය පැත්තට හිස නැමූ ඔමින් ඉක්මනින් යන්න ගියා. ඒ පාරදිගේම හුගක් දුර ගියා. ඒ පාරේ එන මගියෙක් මුණ ගැහුණා.

"කරුණාකරලා මට කියනවද මේ පාරෙන් ගීෂන් යන්ඩ පුළුවන්ද කියලා."

"ඈ ගීෂාන් යන්ඩ තනියම, පයින් ම ?"

"ඔව්, එහෙ අම්මා ඉන්නවා."

"ඔය උඩ පාරෙන් දිගටම යන්ඩ."

"ස්තූතියි." ඔමින් හිස නමා ඉක්මනින් ගියා.

රාත්‍රිය උදා වුණා. ඇය පාර අයිනේ වූ ගෙදරක දොරට තට්ටු කලා.

"සමාවෙන්න මම අම්මා ඉන්න තැනට යනවා. අද රෑට මට මෙහේ ඉන්න පුළුවන්ද ? මම ළඟ හාල් තියෙනවා. ආ, මේක ගන්න."

"එන්න ගෙට." ගෘහණිය කිව්වා.

පසුවදා ගමන් ඇරඹි ඔමින් ගීෂාන් නිවාඩු නිකේතනය සොයා ගෙන ගියා. එහි සිටි තරුණ කාන්තාව ඔමින් දෙස බැලුවා.

"මෙහෙ ඉන්නවද ෆුජි කියලා කෙනෙක්. ඒ මගේ අම්මා. අම්මට කියනවද ඔමින් ඇවිල්ලා කියලා."

"ස්තුතියි ඔබේ කරුණාවට."

ෆුජි සමග ඔෂින් හිස නමා ආචාර කළා.

"මේක ඔයා ළඟ තියා ගන්න මාව මතක් වෙන්න. මේ සල්ලි බෝට්ටුවට දෙන්න."

"අම්මා එහෙනම් ප්‍රවේශමෙන් ඉන්න."

"දුවත් ප්‍රවේශම් වෙන්න."

ඔෂින් බෝට්ටුවේ නැගී යන අයුරු ෆුජි නෙත්වල කඳුළු පුරවාගෙන බලාගෙන හිටියා.

# හය

ඔෂින්ට බෝට්ටුවේ සිට සකායා ආයතනයට මඟ පෙන්නුවේ බෝට්ටුවේ පැමිණි මගියෙක්.

"මේක හරි විශාලයි නේ."

කගායා හාල් ගබඩාව දෙස බලා ඔෂින් කිව්වා.

"ඔයාගේ ගමන සාර්ථක වේවා!"

"ස්තුතියි ඔබට." ඔෂින් හිස නමා ආචාර කළා. ගබඩාවේ ඉදිරි කාමරයේ සීප දෙනෙක් ම හිටියා.

"මෙන්න මම ආවා."

ඔෂින්ගේ හඬට වැඩි අවධානයක් යොමු වුණේ නැහැ.

"මේ මහත්තයා මම මෙහෙ වැඩට ආවේ."

"වැඩට ආවා."

"ඔව් පොඩි බබෙක් බලාගන්ඩ."

"අපි නම් ඒ විස්තර දන්නේ නෑ. දැන් මිසිස් යගිරෝ එයි එතකල් ඔතන වාඩිවෙලා ඉන්න."

ඔෂින් එතන වූ කීම පඩිය මත වාඩි වුණා.

"ආයුබෝවන් මැඩම්." කාර්යාලයේ අය අසුන්වලින් නැගිට්ටා.

ඔෂිනුත් ඉක්මනට හිට ගත්තා.

"මේ ඉන්නේ... ඒක හොඳයි. දැන් ඔයා මේ බිස්නස් භාර අරගෙන මාව බිස්නස්වලින් නිදහස් කරලා විවේක ගන්න දෙන්න ඕනෑ."

Rangika

"ඒ වුණත් අම්මා නැතිව මට ම තනියම කරන්න බැහැ." ජීරෝ කිව්වා.

"කවුද මේ කෙල්ල?"

යශිරෝ මහත්මිය ඇහුවා.

"මැඩම්, මම ඔෂින්. මෙහෙ ආවේ බබෙක් බලා ගන්න."

"කවුද කිවේ ළමයෙක් බලන්න එන්න කියලා."

"ටිකි තමයි කිවේ. ඒ අපේ ගමේ නැන්දා කෙනෙක්."

"මිනෝ වත් කිව්වද ළමයි බලන්න කියලා. ගිහිල්ලා අහන්න."

මිනෝ ඒ කියන්නේ යශිරෝ මහත්මියගේ ලේලි පැමිණ ඇයට ආචාර කළා.

"අම්මා මම වැඩට ළමයෙක් ඉන්නවද ඇහුවා. එක්ක එන්න නම් කිවේ නැහැ."

"මොකට ද වැඩකාරයෝ. ගෙදරත් දෙන්නෙක් ඉන්නවානේ."

"අම්මා මේකයි හේතුව."

පුතා අම්මාට හේතුව පැහැදිලි කරන්න උත්සාහ ගත්තා.

"මිනෝට ටිකක් සනීප නැහැ. එක්කෙනෙක් කායෝව පාසල් එක්ක යනවා. ඉතින් පුංචි බබා බලාගන්නයි අපි හිතුවේ."

"අපි හිතුවට මට කිවේ නැහැනේ."

"ඔව් අම්මා සමාවෙන්න. මම මේ කෙල්ල ආපිට යවන්නම්."

මිනෝ පඩිය උඩ වාඩි වී සිටි ඔෂින්ට කතා කළා.

"ඔය ළමයට මේ දවස්වල දෙන්ඩ වැඩක් නෑ. ඔයා ආපිට යන්ඩ. හෙට උදේ බෝට්ටුවෙන් යන්ඩ. මෙන්න මෙතන බෝට්ටු ගාස්තුව වැඩියෙනුත් තියෙනවා."

"අනේ මැඩම් මාව ආපිට යවන්ඩ එපා. පොරොන්දුව හාල් මිටි පහක්."

"ඔයා මෙච්චර දුර ගෙන්නුවාට මට සමාවෙන්න. ඔයා ආපිට යන්න." මිනූ කිව්වා.



"මාව ආපිට යවන්න එපා වඳින්නම්. අනේ මට යන්ඩ කියන්න එපා. අස්වැන්න පාළු වුණා. ආච්චම්මාට අසනීපයි. ආච්චම්මාට බත් කන්න පුළුවන් වෙන්නේ මම මෙහෙ වැඩ කළොත්, අනේ මට ආපිට යන්න බැහැ."

"ඔය ළමයා හෙටම ආපහු යවනවා." කිව්ව යශිරෝ මහත්මිය යන්න ගියා.

"මොකක් ද ඔයාගේ නම ?"

"මගේ නම ඔෂින්, අනේ මැඩම් මම හොඳට වැඩ කරන්නම්. මට උයන්නත් පුළුවනි."

"උයන්ඩ අය මෙහෙ ඉන්නවා. දැනට මේ කෑම එක කන්න. හෙට උදේ ම ඔයා යන්න. මේ කිමී මේ ළමයට උයනගෙයි නිදාගන්ඩ දෙන්ඩ."

ඔෂින් කෑම බඳුනත් අතේ තියාගෙන දුකෙන් බලාගෙන හිටියා. ඇය රාත්‍රිය ගත කළේ උයන ගෙයි බරාඳයේ. ඔෂින් පාන්දරින් ම අවදි වුණා. ඇය උයනගෙට ගියා. එහි වූ විශාල උදුන දෙස බලා සිටියා. ලොකු ලිපක්. මේක පත්තු කරලා වතුර ටිකක් උණු වෙන්ඩ තියන්න ඕනෑ. මැඩම්ලාට උදේට මූණ හෝදන්න පුළුවන්නේ. මාත් උදේම යන්න එපා යැ. ඇය දර දමා උදුන පත්තු කළා. ඉන්පසු භාජනයක් ලිප තබා එයට වතුර ලී බාල්දියෙන් ගෙන ආවත් උදුනට ඇය උස අඩු නිසා බංකුවකට නැග වතුර භාජනයට දැම්මා. ටිකකින් දොර ඇරෙන හඬක් ඇසුණා.

"මම උදේම අවදි වුණා. ඉතින් මට හිතුණා මැඩම්ලාට මූණ හෝදන්න වතුර ටිකක් රත් කරන්න. කමක් නෑ නේද ?"

ඔෂින් ලිපට තව දර කෑල්ලක් දමමින් කිව්වා.

"ඔයාමද ඔය ලිප පත්තු කළේ ?"

ඒ හඬ ඔෂින් අඳුනා ගත්තා. යශිරෝ මහත්මිය.

ඔෂින් ඉක්මනින් බිම දණ ගහගත්තා.

"සමාවෙන්න ලොකු මැඩම්, මම හිතුවේ මෙහෙ වැඩ කරන කෙනෙක් දොර ඇරියා කියලා."

"මම ඇහුවේ ඔය ළමයම ද මේ ලිප පත්තු කලේ."

"ඔව්, ලොකු මැඩම් මම වරදක් නම් කලේ මට සමාවෙන්න."

"ගෙදර දී වැඩ කරනවද ?"

"ඔව් ලොකු මැඩම් මට හොඳට වැඩ කරන්න පුළුවනි. පුංචි නංගිත් පිටේ එල්ලගෙන තමයි මම වැඩ කරන්නේ. අම්මයි, තාත්තයි සෝජියි කුඹුරට ගියාම ආච්චම්මාත් එක්ක මම අනිත් නංගිලාත් බල ගන්නවා. අපි උයන්නේ රාබු බත්නේ. මට පුළුවනි ඒවා උයන්න. ඉතින් මට ලිප පත්තු කරන්න පුළුවනි මැඩම්."

"කුඹුරක් තියෙනවා කිව්වා නේද ? එහෙනම් හාල් ඇතිනේ."

"නෑ මැඩම්, අපි අද ගොවියෝ. අපිට හම්බ වෙන්නේ අස්වැන්නෙන් තුනෙන් එකලු. මේ සැරේ වැස්ස වැඩි නිසා කුඹුරු පාළු වුණා. ආච්චම්මාට බත් ටිකක් කන්න හාල් ලැබෙන නිසාමයි මැඩම් මම මෙහෙ ආවේ."

"පුංචි නංගිටයි අම්මටයි බත් දෙන්නේ නැද්ද ?"

"පුංචිම නංගිට නම් කිරි දෙන්නේ. ඒත් අම්මට කන්න නැති නිසාත් අම්මට වැඩකට යන්න ඕනෑ නිසාත් නංගිව වෙන පවුලකට දුන්නා. ඒ ගැන මට දුකයි මැඩම්."

ඔමින්ගේ නෙත්වලට කඳුළු ආවා.

"හොඳයි."

ලොකු මැඩම් ආපිට හැරුණා.

"ලොකු මැඩම් මම දැන්ම ආපිට යනවා. තරුණ මැඩම්ට කියන්න මම ගියා කියලා. බෝට්ටුවට සල්ලි දුන්නාට, ඉන්න දුන්නාට ස්තුතියි කිව්වා කියන්න."

යශිරෝ මහත්මිය ගෙට ගොස් මිනෝට පණිවිඩයක් ඇරියා.

"ඇයි අම්මා." මිනෝ යශිරෝ මහත්මියට ආචාර කර මෙට්ටය මත වාඩි වුණා.

"අර ළමයා කවුද ?"

"අර ඔමින් ද ?"



"ඔව් ඒ කෙල්ල කියන්නේ ආච්චම්මට බත් කන්න දෙන්න ඕනෑ නිසාලු මෙහේ ආවේ. හාල් මලු පහකට අවුරුදු දෙකක් ම වැඩ කරන්න. මට ඒ ළමයා ගැන දුකයි. සායෝ බලාගන්ඩ ඒ ළමයා නතර කර ගන්ඩ."

"ඇත්ත ද අම්මා. ඔමින්ට හරි සතුටු හිතෙයි."

"හැබැයි මම නතර කර ගන්ඩ කිව්වා කියන්ඩ එපා. ඔයයි නතර කර ගත්තේ කියන්ඩ."

ඔමින් ලේන්සුවත් කරේ රඳවාගෙන දැන් කළ යුත්තේ කුමක් දැයි කල්පනා කළා.

"ඔමින් අන්න ඔයාට මිනෝ මැඩම් කතා කරනවා." කුමී පැමිණ කිව්වා.

"හොඳයි."

"එන්න මෙහෙන්."

ඔමින් ඇය පිටුපස ගියා. මිනුගේ කාමරය ළඟට ගිය උමී,

"මැඩම්. ඔමින් ආවා."

"ඉන්න කියන්න මම එන්නම්."

මිනෝ හිනැහෙමින් කාමරයෙන් එළියට ආවා.

"ඔමින් සුබ ආරංචියක් තියෙනවා කියන්න."

ඔමින් ඇය දෙස බලාගෙන හිටියා.

"ඔයාට අද ඉඳලා මෙහෙ වැඩ කරන්න පුළුවනි."

"ඇත්ත ද මැඩම්, අනේ හුඟක් ස්තුතියි."

ඔමින් බිම දණ ගසා අත්දෙක දිගුකර හිස ඒ මත තැබුවා.

"හොඳයි එන්න ඔමින්, මම ගෙදර අය අඳුන්වලා දෙන්න. මේ කායෝ, මගෙ ලොකු දුව, මේ සායෝ එයාව තමයි ඔයා බලාගන්ඩ ඕනෑ. මේ ඉන්නේ උමිය, මේ ඉන්නේ කියෝ. ඒ දෙන්නම පුංචි කාලේ මෙහෙ වැඩට ආවේ."

"හොඳයි මට පුළුවනි ඔයාලටත් උදව් කරන්න."

"හොඳයි උමී, ඔෂින්ට කාමරය පෙන්වන්න."

"හොඳයි උමී, ඔෂින්ට කාමරය පෙන්වන්න."

"එන්න අපි ඉන්න කාමරේම ඔයාට ඉන්න පුළුවනි."

"මේ කාමරේ ද? මේක හරි ලොකුයි නේ. අපි පුළු සේවකයො උනත් හොඳට සලකනවා නේද ?"

"අම්මෝ ඔෂින් දන්න දේවල්."

"මම ඉස්කෝලේ ගිහින් තියෙනවා."

"ඇත්තට."

"ඔව්, හැබැයි ඔබෙක් බලාගන්න ගමන්. තව මම අඳුරන මාමා කෙනෙක් මට ලියන්න කියවන්න ඉගැන්නුවා."

"ඔයාගේ වයස කීයද ?"

"මගෙ වයස අවුරුදු 9 යි."

"මම නාන බාල්දිය හෝදන්නද ? බබාගේ ඇඳුම් හෝදන්නත් පුළුවනි. මේ ලාම්පු වලට හුගක් තෙල් යනවා නේද ? අපි පාවිච්චි කරන්නේ පුංචි ලාම්පු."

"ළඟදි අපට විදුලිය ලැබෙනවා."

"විදුලිය ?"

"ඔව්, එතකොට ලාම්පුවලට තෙල් දමන්න ඕනැ නෑ. චිමිනි හෝදන්න ඕනැත් නෑ. මේ බිත්තියේ තියෙන ස්විච් එක දැම්මා ම ලයිට් එකක් පත්තු වෙනවා. එතකොට හොඳට එළියයි."

මෙවිටම මිනෝ ඇඳුම් කිපයක් රැගෙන ආවා.

"ඔෂින් මේවා කායෝගේ ඇඳුම්. හැබැයි පරණ නෑ. මේවා ඔයාට."

"මේවා මට හොඳ වැඩියි මැඩම්."

"හොඳයි මේ කිමෝනාව ඇඳගෙන එන්නකො සායෝ බලාගන්න."

මිනෝම ඔෂින්ට කිමෝනාව ඇන්දුවා.

"දැන් හරි ලස්සන කෙල්ලක්."



ඔෂින් හිනැහුණා සතුටින්. ඔෂින් සායෝ පිටේ රඳවාගෙන එහා මෙහා ඇවිද්දා. එවිටම කායෝ උමී සමග පාසල් යන්ට සූදානම්ව පැමිණියා.

"සුබ දවසක්."

ඔෂින් කිව්වත් කායෝ රවාගෙන යන්ට ගියා.

"කොහේද කායෝ යන්නේ?"

"යන්නේ පාසලට. ඔෂින් මිස් කායෝ කියලා කතා කරන්න."

"ඇයි එයාට තනියම පාසල් යන්ට බැරිද ?"

උමී කිසිවක් නොකියා යන්ට ගියා.

මිනෝ පැමිණ බබාව ගත්තා. 'සායෝට නින්ද ගිහින්. දෙන්න ඔෂින්. ඔයා ගිහින් කෑම කන්න.' ඔෂින් එයාගේ පෙට්ටියත් රැගෙන කෑම කාමරයට ගියා. පෙට්ටිය තුළ කෑම බඳුන් දෙකක් හා හමි කුට්ටමක් තිබුණා.

"ඔෂින් බෙදාගෙන කන්න." කියෝ කිව්වා.

"මේවා තිරිඟු බත් නේද ? මම හිතුවේ මෙහෙ සේවකයන්ට දෙන්නේ රාබු බත් කියලා. ලී මුදලාලිගෙ ගෙදරත් දුන්නේ රාබු බත්."

"මෙහෙ එහෙම නෑ. මැඩම්ලා කියන්නේ සේවකයන්ට පෝෂණ කෑම දෙන්ඩ ඕනෑ, එතකොට තමයි වැඩ කරන්න ශක්තිය ඇති වෙන්නේ කියලා."

"මෙහාට හාල් කොහෙන්ද ?"

"ඇයි අද ගොවියෝ වගා කරන ඒවා කුඹුරු අයිති අය විකුණනවා. ඒවා මේ ගබඩාවලට ගේනවා."

"රෙදි හෝදගෙන එන්නද ?"

"ඔෂින්ට ඔය වැඩ කරන්න බෑ."

"නෑ මට පුළුවනි. මම රෙදි ටික හෝදගෙන එන්නම්."

ඔෂින් රෙදි රැගෙන ගඟට ගොස් හෝදාගෙන ආවා.

"ඔෂින් රෙදි හෝදන්න කොහේද ගියේ ?" කියෝ ඇහුවා.

"මම ගඟට ගියා."

"ගඟෙන් හෝදන්නේ නෑ. ළිඳේ වතුර පිරිසිදුයි. ළිඳෙන් හෝදන්න."

"හරිම වෙනසක්. ලී මුදලාලිගෙ ගෙදර දී ගඟෙන් හෝදන්න ඕනෑ. ළිඳෙන් හෝදන්න දෙන්නේ නෑ. ඒකට මෙහෙ අනිත් පැත්ත. මේ සේරම මට නම් පුදුමයි."

එදා සායෝ බබා ටිකක් අඬන නිසා ඔමින් බබාවත් අරගෙන පාර පැත්තට ගියා. එකවරම ඔමින්ට ඇයගෙ නම කියා කතා කරනවා ඇහුණා. ඇය හැරී බැලුවා.

"රිකී නැන්දා."

"ඔමින් එහෙනම් ඔයා සගායාවල වැඩ නේද ? මට හරි සතුටුයි. මම බයේ හිටියේ ඔයාට රස්සාව හම්බුණේ නැද්ද කියලා. එදා මම ඔයාලගේ ගෙදර යනකොට ආච්චම්මයි තාත්තයි හොඳටම බයවෙලා. ඔයා නොකියාම කොහෙද ගියේ."

"මම අම්මා බලන්න ගියා."

"මටත් ටිකක් දොස් කිව්වා. මම ආවෙම ඔයා ගැන තොරතුරු හොයන්න."

"ආව දවසේ නම් ලොකු මැඩම් මාව ආපිට යවන්නම කිව්වා. පහුවදා පොඩි මැඩම් මට ඉන්න කිව්වා."

"ඔමින් හරි වාසනාවන්තයි. ඉතින් ඔමින් හොඳට කෑම හම්බ-වෙනවා නේද ?"

"ඔව් නැන්දේ අපට තිරිඟු බත් දෙනවා. මැඩම්ලට නම් සුදු බත්. කොහොමද රිකී නැන්දේ මෙයාලා සුදු බත් කන්නේ. සුදු බත් වවන අඳ ගොවියා හැමදාම දුකෙන්."

"ඒ..... ඔමින් මොනවද ඔය කියවන්නේ. මට කිව්වට වෙන කාටවත් ඇහෙන්න කියන්න එපා ඔය කතා. ඔමින් කවුරු කුඹුරු වැව්වත් ගැණුම්කාරයෝ ඉන්ඩම එපායැ. තේරුණාද ?"

ඔමින් හිස වැනුවා.

"මම නම් කවදාවත් ගොවිතැන් කරන්නේ නෑ. කොග වෙලෙන්දෙක් වෙනවා."



"ඉදිරියට වෙන දේවල් පස්සේ. ඉස්සර වෙලා ඔයාට පවරලා තියෙන වැඩ ටික හොඳින් කරගෙන ඉන්ඩ. මම මැඩම්ලාවත් මුණ ගැහිලා අදම ආපිට යනවා. ඔයාගේ ආච්චම්මා හොඳටම බය වෙලා ඉන්නේ."

"හොඳයි රිකී නැන්දා. මම හිතන්නේ දැන් හාල් ගෙදරට හම්බවෙලා ඇති. ලොකු මැඩම් කිව්වා හාල් මලු පහක්ම යවන්න කියලා."

රිකී මේ තොරතුරුත් රැගෙන ඔමින්ගේ ගෙදර ගියා. ආච්චම්මා රිකී දැක්ක ගමන් ම,

"අනේ රිකී මගේ ඔමින් හොඳින් ඉන්නවද ? හම්බවුණාද ?"

"ඔව්, ඔව්, ඔයා බයවෙන්න එපා. ඔමින්ගේ හාල් ටිකත් ලැබෙන්න ඇති නේද ?"

"ඔව්, හාල් මලු පහක් ම ලැබුණා. ඒවා ලැබුණේ රිකී ඔයා නිසානේ. අපි ඔයාටත් සලකනවා. ස්තූතියි ඔයාට." ආච්චම්මා හිස නමා කිව්වා.

"ඔමින් හරිම බුද්ධිමත් ළමයෙක්. මැඩම්ලත් ආදරෙයි. එහෙ ඉන්නවා ඔමින්ගෙම වයසේ පුංචි නෝනා කෙනෙක්."

"එහෙමද ?" ආච්චම්මා කල්පනාවට වැටුණා.

"එහෙනම් ඔමින්ට කරදර වෙයිද දන්නේ නැහැ. ඒ පුංචි නෝනා ගෙ පැවැත්ම වෙනස් ඇතිනේ. එයාට ගෙදර එන්න වෙයි ද දන්නෑ."

"නෑ එහෙම නෑ. ඔමින් ට හොඳට මොළේ තියෙනවා."

❖❖❖

"මගෙ සොයුර - මා හැරදා නොයන්න."

ඔමින් සංසකු කියා දුන්න කවිය නිතර ම කිව්වා. 'සංසකු මාමා දැන් මම ආයිම පිට වැඩ.' ඇය තනියම කියෙව්වා. ඇයට ඉදිරිපස කාමරයකින් සැමිශේන් එකක හඬ ඇසුණා. ඔමින් සෙමෙන් ඒ පැත්තට ගියා. මිස් කායෝ ගුරු මහත්මියගෙන් වාදනය ඉගෙන ගන්නවා. ඔමින් ආසාවෙන් එදෙස බලා හිටියා. අහම්බෙන් කායෝ දැක්කා ඔමින් බලාගෙන සිටින ආකාරය. ඇය ඉක්මනින් පැමිණ කාමරයේ දොර වසා දැම්මා.

Rangika

"මිස් කායෝ හරි වෙනස්."

ඔෂින් තමාට ම කියා ගත්තා.

"මට ඉස්කෝලේ යන්ඩ බෑ."

කායෝ ආච්චම්මාත්, තාත්තාත්, අම්මාත් කතා කරමින් සිටි තැනට පැමිණ කිව්වා.

"ඇයි ඒ ?"

යශිරෝ මහත්මිය ඇසුවා.

"පිරිමි ළමයි මට වද දෙනවා."

"ඔයත් පිරිමි ළමයි එක්ක සටන් කරන්න."

"කායෝ මොනවද මේ කියන්නේ. යන්න ගිහින් කෑම කන්න." එහෙම කිවේ මිනෝ.

"නෑ මට කෑම එපා."

"කන්න ඕනෑ නැත්නම් කන්න එපා. මේ මොහොතේ කී දෙනෙක් කන්න නැතිව බඩගින්නේ ඉන්නවද ? බලන්න ඔෂින්. ආච්චම්මාට කන්න දෙන්න එයා මෙහෙ වැඩ කරනවා. ඔයාටත් වඩා බාලයි. ලෝකේ ජීවත් වෙන්න අමාරුයි. ඒක තේරුම් ගන්න. තමන්ට හිරිහැරයක් වෙනවා නම් ධෛර්ය අරගෙන සටන් කරන්න."

"මට කන්න ඕනෑ. මට තනියම පාසල් යන්න ඕනෑ."

"නෑ නෑ ඔයාට තනියම යන්න බෑ." තාත්තා කිව්වා.

"ඔය බලන්න ඔය දෙන්නා හුරතල් කරලා මෙයාගේ ධෛර්ය නැති වෙලා."

"ඔන්න අද නම් මම පාසල් යන්නේ තනියම."

"මේවා සේරම අම්මාගේ සටන් කතා නිසා." තාත්තා කිව්වා.

කායෝ පොත් රැගෙන මිදුලට ආවා. කිමිත් ඇය පසුපස ආවා.

"එන්න එපා කිවා නේ මගේ පිටි පස්සෙන්."

"ඇයි එයාට තනියම යන්න බැරිද ?"



"මේ, ඔෂින් වැදගත් අයට එහෙම කතා කරන්නේ නෑ. එයා මෙයා කියලා. මිස් කායෝ කියන්න. මම එදත් ඔයාට කියලා දුන්නා."

මිනෝ එළියට ආවා. කිමිත් කායෝ පිටුපස ගියා.

"ඔෂින්, මෙහෙ එන්න. මේ කෑම ඔයාට. හැබැයි කාටවත් කියන්න එපා."

"ස්තුතියි, මැඩම්. මැඩම් හරිම කරුණාවන්තයි."

ඔෂින් ඒ කෑම පිඟාන දෙස බලාගෙන හිටියා. රෝස පාටින් මලක් හදලා ඒක උඩ තබා තිබුණා. ඇය සෙමෙන් එය කෑවා.

රසයි. අනේ නංගිලාටත් දෙන්න තිබුණා නම්, ඔෂින් සායෝවත් රැගෙන එළියට ගියා.

"ඔෂින්, එළියෙ සීතල සුළඟක්. බබාට හොඳ නෑ. එළියට යන්න එපා." කුමි කිව්වා.

"හොඳයි."

කුමිත්, කියොත් කාමරවල ඉදිරිපස බරාදය පිරිසිදු කරමින් සිටියා.

"ඔය මොනවා වලින් ද ඔයාලා බිම මදින්නේ."

"මේ සෝයා බෝංචි වලින් කිරි හලලා අහක දමන රොඩු."

"අපි නම් එහෙම අහක දමන්නේ නෑ. අපි ඒවා කෑමට ගන්නවා උයලා."

"ඔෂින් ඔයා මේ කාමර වලට යන්න එපා.

කුමිත්, කියොත් වැඩ නිමකර පිටව ගියා. ඔෂින්ට ඒ කාමර ඇර බලන්න ම හිතුණා. දොරවල් සෙමෙන් ඇර ඇතුළ බැලුවා. කාමර සියල්ල හරිම පිළිවෙළට පිරිසිදුව තිබුණා. එක කාමරයක සෙල්ලම් බඩු විසිරී තිබුණා.

"මේ මිස් කායෝගේ කාමරේ."

ඔෂින් තමන්ටම කියා ගත්තා. පසෙක තිබුණේ පොත් රාක්කය. පොත් පිරිලා මේසය උඩ අලුත්ම පොත්. ඔෂින් එහි වූ උඩම පොත අතට ගත්තා. හරි ලස්සන පින්තූර. මට කියවා ගන්න ආසයි. මම මේක අරගෙන කියවලා ආපහු තියනවා.

ඔෂින් පොත රැගෙන කිමෝනාව අස්සේ සඟවා ගත්තා. සායෝ නිදා ගත්තාට පසු මිනෝ මැඩම්ට දරුවා දුන්නා. පොතත් රැගෙන මුල්ලකට ගිහින් සෙමෙන් කියෙව්වා. හරි ලස්සන කතාවක්. ශේර්ම කියවන්න ඕනෑ.

මේ වෙලාවේ කායෝ පාසලේ සිට නිවසට පැමිණියා. ඇයත් පැමිණි විගසම ඇයගේ අලුත්ම පොත් සෙව්වා.

"කුමි, මෙහෙ එන්න. කෝ මගෙ අලුත්ම පොත. මෙතන තිබුණා. ඒක නැහැනේ. තාත්තා ඒක මට ඊයේ ගෙනත් දුන්නේ. ඔෂින්වත් මගෙ කාමරයට ආවද?"

"නෑ මිස් කායෝ."

"නෑ, නෑ ඔෂින්ම තමයි ගන්න ඇත්තේ. මම කීප දවසක් ම දැක්කා බඩු ඔතාගෙන එන පත්තර පිටු පැත්තකට වෙලා කියවනවා."

"කෝ ඔෂින්."

කායෝ ඔෂින් සොයා ගියා.

"ඔෂින්, ඔෂින්."

ඔෂින් සිටියේ පොත කියවමින්.

"මේ තියෙන්නේ පොත. මම හිතුවා උඹ තමයි හොරා කියලා."

"අනේ මිස් කායෝ. මම පොත ගත්තේ හොරකමට නෙමෙයි. කියවන්න ගත්තේ."

"ගත්තේ මගෙ කාමරේට හොරෙන් රිංගලා. ඒක හොර වැඩක් නෙමෙයි ද ? දෙනවා මෙහාට. අම්මා මේ බලන්න."

මිනෝ දුවගෙන ආවා.

"නෑ මැඩම්, මම මේ පොත ගත්තේ බලලා ආපහු තියන්න."

"ඒත් නොකියා ගත්ත එක වැරැද්දක්."

මිනෝ කීවේ තරහින්.

"ඔෂින්ගෙ වරද නෙමෙයි. අපි ඔයාව විශ්වාස කළේ. ඔයාලා දුප්පත් මිනිස්සු. දුප්පත් අය ළඟ හොඳ ගතිගුණ නෑ. ඒ ගැන සිත



වෙන්නත් නෑ. යමු කායෝ. ඔය ගැන කතා කරලා වැඩක් නෑ. ඔයා ආපිට යන්න ලෑස්ති වෙන්න. අපිට හාල් ආපිට අවශ්‍ය නෑ."

ඔෂින් බිම බලාගෙන හිටියා.

මම කළේ වරදක් ද ? පොත ගත්තේ හොරකමට නෙමෙයි නේ. ඒත් මෙහෙ අය මම ගැන හිතන හැටි ගැන මට දුකයි.

"ඔෂින් දැන් ජේනවා නේද කල්පනා නොකර කරන වැඩවල ප්‍රතිඵල ගැන. ඔයා හොඳ ළමයෙක් නෙමෙයි."

කුමි ඔෂින්ව පැත්තට තල්ලු කර දැම්මා. කායෝගේ කාමරයට අවසර නැතිව ඇතුල්වීම, පොතක් හොරකම් කිරීම පිළිබඳ ඇයට චෝදනා එල්ල වුණා.

"අන්න ලොකු මැඩම් ඔෂින්ට කතා කරනවා."

කියෝ ඔෂින්ට දැනුම් දුන්නා. ඔෂින් කල්පනා කළා. මම පොත ගත්තේ බලන්න. බලලා තියන්න. ඒත් මම නිකම්ම හොරෙක් වුණා. ඔෂින් කාමරය දෙසට ගියා. කාමරයේ මිනෝ සහ කායෝත් යගිරෝ මහත්මියත් හිටියා.

"අම්මා කිව්ව එක ඇත්ත. එදාම අපිට ඔෂින්ව ආපිට යවන්න තිබුණේ. ඔෂින් හොඳ පවුලක ළමයෙක් නෙමෙයි නේ. එයාගේ පවුලෙන් ළමයා එව්වේ හාල් ඕනෑ නිසයි. හොඳ වෙලාවට මේ හොරකමට අහුවුණේ. නැත්නම් මහ කරදරයක් වෙන්න තිබුණා."

මිනෝ කියන කිසි දෙයකට යගිරෝ මහත්මිය කතා කළේ නැහැ.

"මැඩම් මම ආවා."

ඔෂින්ගේ සිහින් හඬ කාමරයේ දොර ළඟින් ඇහුණා.

"එනවා ඇතුළට."

"සමාවෙන්න මැඩම් මම වැරැද්දක් කළේ. ඒත් මම පොත් හොරකම් කළේ නැහැ."

"ඒත් උඹ මගෙ කාමරේට ගියේ හොරකමට නෙමෙයි ද ?"

කායෝ කෑගැහුවා.

"කායෝ නිහඬ වෙන්න."

"ඔෂින් ඇයි එහෙම කළේ?"

"මැඩම් මම කියන්නේ ඇත්තමයි. මට ඕනෑ වුණේ පොත කියවලා ආපිට ගිහින් තියන්න."

"මොකට ද කායෝගේ කාමරයට ගියේ ?"

"කියෝ කිව්වා කාමරවලට යන්න එපා කියලා. මගෙයි වැරැද්ද. මම මිස් කායෝගේ කාමරේ දොර ඇරියා. එතකොට පොත් රාක්කය දැක්කා. මට ආශා හිතුණා ඒක කියවන්න."

"ඔයාට පොත් කියවන්න පුළුවනැ ?"

"නෑ ආච්චම්මා ඒක හුගක් ගණන් පොතක්. කාටහරි විකුණන්න හිතන්න ඇති."

"අනේ නෑ එහෙම හිතුවේ නෑ."

"මම අහන්නේ ඔෂින්ට කියවන්න බැරි නම් ඇයි මේ පොත ගත්තේ."

යශිරෝ මහත්මිය ඇසුවා.

"මට කියවන්න පුළුවන් මැඩම්."

"දෙන්න කායෝ ඔය පොත ඔෂින් අතට කියවන්න බලන්න."

ඔෂින් හැමෝගෙම මුහුණු දිහා බලලා පොත් අතට ගත්තා.

"හරුකි දැක්කා ළමයි කැස්බෑවෙකුට හිරිහැර කරනවා. කෝටුවලින් අනිනවා. හරුකිට ඕනෑ වුණා කැස්බෑවා ළමයින්ගෙන් බේරා නැවත මුහුදට දමන්න."

"හොඳයි නේ ඔෂින් ඔයා අපූරුවට කියෙව්වා. කායෝ ඔයාගේ පොත් ඔෂින්ට දෙන්ඩ. ඒ ළමයා ඒවා කියවයි. තිබුණට ඔයා කියවන්නෙත් නැහැනේ."

"දෙන්නේ නෑ මගේ පොත් මම."

කායෝ ගස්සාගෙන යන්ඩ ගියා.

"අම්මා ඇයි එහෙම කියන්නේ. කායෝගේ හිත රිදෙයි නේ."

"මිනෝ මේක අහන්න. ඔෂින් පොත් ගෙනිහින් තියෙන්නේ හොරකමට නෙමෙයි. කියවලා ආපහු ගෙනත් දෙන්න."



"මෙච්චර හොඳට කියවන්න ඉගෙන ගත්තේ කොහොමද ඔෂින්?"

"මැඩම් මම බබෙක් බලාගන්න ගමන්ම ටික දවසක් පාසල් ගියා. තව මාමා කෙනෙකුත් මට උදව් කළා."

"හොඳයි ඔෂින්ට යන්න පුළුවනි. මීට පස්සේ අනුන්ට සැක හිතෙන වැඩ කරන්න එපා."

"හොඳයි."

ඔෂින් නාන බාල්දිය සෝදා එහි වතුර පුරවා ලිප පත්තු කර ගින්දර දැම්මා.

කුමී හා කියෝ ඇඳුම් මසනවා දුටු ඔෂින් එතැනට ගියා.

"මටත් ආසයි මහන්ඩ, දෙන්න මම මහන්න."

"ඔයා දැන් නාන බාල්දිය හේදුවා නේ. දැන් ටිකක් මහන්සි නිවා ගන්න."

"ඒත් මට වැඩ ඉගෙන ගන්න ඕනෑ. මම මෙහේ ඉන්න අවුරුදු දෙකට සේරම දේවල් ඉගෙන ගන්න ආසයි."

"මම මෙහෙට ආවේ අවුරුදු දහයෙන් ඉස්සර වෙලාම මම කළේ කායෝ බබාව බලාගන්න එක. ඒ කාලේ ගෙදර ඉවුම් පිහුම් කළේ කුමී." කියෝ කිව්වා.

කායෝගේ කාමරෙන් මහ හඬින් පාඩම් කියවන හඬ ඇහුණා.

"ඇහුණද ඔෂින් ඔයා නිසා දැන් මිස් කායෝ පාඩම් කරනවා. යශිරෝ මැඩම් හැම වෙලාවෙම උත්සාහ ගත්තේ ඔෂින් මිස් කායෝත් එක්ක තරග කරවන්නයි."

"ඒක මිස් කායෝට හොඳයි."

කුමී මාළුවෙක් රැගෙන කපන්න පටන් ගත්තා.

"මම ආසයි මාළු කපන්න ඉගෙන ගන්න."

මේ වෙලාවේ මිනෝ උයන ගෙට ආවා.

"ඔෂින්. ළමයි බලන අයට උයන ගෙට එන්න තහනම්."

"සමාවෙන්න මැඩම්."

"කමක් නෑ මට බබා දෙන්න. ඔෂින් දැන් විවේක ගන්න."

"ඒක මගෙ වරද මැඩම්. මට තිබුණා මැඩම් ඔෂින්ට ඒ බව කියන්න."

"මට සමාවෙන්න කුමි, මමයි වරද කළේ."

මිනෝ ආපසු ගියා.

"මම දන්නව මට වැඩි දවසක් මෙහෙ වැඩ කරන්න ලැබෙන එකක් නෑ." ඔෂින් බිම බලාගෙන කිව්වා.

"ඇයි ඒ ?"

"මැඩම්ලට තරහ යන වැඩමයි මම කරන්නේ."

යගිරෝ මහත්මිය වැඩ කරමින් සිටි තැනට පැමිණි කායෝගේ පියා,

"අම්මා හදිසි වැඩක් ද ?"

"ඇයි ජිරෝ හදිසියක් ද ?"

"ඔව්, අම්මා එන්නකෝ කාමරයට."

යගිරෝ මහත්මිය කාමරයට ගියා.

"අම්මා මට දැන් ඔෂින්ලගේ ගමේ, යමගාටාවල මිනිහෙක් මුණ ගැහුණා. මම නිකමට ඔෂින් ගැන ඇහුවා. ඒ මනුස්සයා ලොකු විස්තරයක් කිව්වා. මේ ඔෂින් මහ භයානක කෙල්ලක්"

"ඒ කියන්නේ?"

"ඔෂින් ඉස්සර වැඩ කළ තැනින් පැනලා ගිහිල්ලා මිලිටරියෙන් පැනලා ගිය මිනිහෙක් එක්ක මාස හයක් විතර කඳු මුදුනේ ගෙදරක හිටියලු. ඒ මිනිහට ඔෂින් ඉස්සරහම වෙඩි තියලා මරලා දැම්මලු. ඔෂින්වත් මිලිටරි පොලිසියෙන් අල්ලාගෙන හිර කරගෙන හිටියලු. මේ කෙල්ල මේ මොනවත් නොකියා අපේ ගෙදර වැඩට ආවා. ඔෂින් තියාගන්න එක භයානකයි අම්මා."

"ඔවා සේරම පහුගිය කතා. අපි දන්නේ නැහැනේ ඔවා සත්‍ය ද කියලා. මම වෙලාවක ඔෂින්ගෙන් අහලා බලන්නම්. දැනට ඔහේ හිටපුවා වේ."



ඔෂින් ලිපට ගින්දර දමමින් වතුර උණු කළා. ඒ ගෙදර සියල්ලන්ටම නෑම සඳහායි. ඒ සමගම ඇය කිමෝනාව තුළ රඳවා තිබූ නලාව අතට ගත්තා. ඇයට සංසකු මතකයට ආවා. ඔෂින් හිතට දුකක් ආව දවසට මේ නලාව පිඹින්න. ඇය නලාව දෙතොල් මත තියා සෙමෙන් පිඹින්න පටන් ගත්තා. මිහිරි හඬක් පැතිර ගියා. ඒ හඬ අහගෙන ඇය පිටුපස සිටියේ මිස් කායෝ. ඔෂින් තිගැස්සී හිට ගත්තා.

"මොකක්ද ඔෂින් ඔය?"

"මේ නලාවක්."

"කෝ දෙන්න බලන්න."

කායෝ නලාව හරව හරවා බැලුවා.

"ඔෂින් මට මේ නලාව දෙන්න. මම මේකට ඔයාට සල්ලි ඉල්ලලා දෙන්නම්."

"බැහැ..... මේක නම් දෙන්න බැහැ මිස් කායෝ."

"ඇයි බැරි ? මම මේකට සල්ලි දෙන්නම්. මේ සකාටා නගරයේ සාප්පුවල ඔය නලා ඇති. ඔයා එකක් අරගන්න."

"බැහැ. මට මේ නලාව දෙන්න බෑ මිස් කායෝ. අනේ මට සමාවෙන්න."

ඔෂින් හිස නැමුවා.

"ආ මේ නලාව ඒ තරම් ගණන් ද ? එන්න එහෙනම්." කායෝ නලාව පොළවේ ගැහුවා.

"ඇයි එහෙම කළේ ? ඇයි එහෙම කළේ ?"

ඔෂින්ටත් නොදැනීම ඇය තුළ තරහක් ඇති වුණා.

"එහෙම කළේ ? එන්න බලාගන්නවා."

කායෝ නලාව වෙත ගොස් ඇයගේ සෙරෙප්පුවෙන් එය පාගා දැම්මා.

"එපා... එපා."

ඔෂින් කායෝ ව තල්ලු කළා. ඇය විසි වී වැටුණා. නැවත නැගිට ආ කායෝ ඔෂින්ට ගැහුවා. ඇඟ සීරුවා. ඔෂින් නෑම වෙලාවෙම

කායෝ ව පැත්තකට තල්ලු කළා. කායෝ ඔෂින්ගේ අත හැපුවා. ඒ වේදනාව නිසාම ඔෂින් වේගයෙන් කායෝව තල්ලු කළා. ඇය ළඟ ම වූ කණුවේ වැදී බිම ඇද වැටුණා. ඉන්පසු නිහඬ වුණා. ඔෂින් දුව ගොස් කායෝගේ හිස ඔසවා ඇගේ උකුලේ තියා ගත්තා.

"අනේ කවුරු හරි උදව්වට එන්න. මිස් කායෝට සිහි නැති වෙලා. ඉක්මනට."

ඔෂින් කෑගැහුවා. සේරටම පෙර දුවගෙන ආවේ කුමී. ඇය කෑගහන්න පටන් ගත්තා. ගෙදර සියලු දෙනාම දුවගෙන ආවා.

"අනේ කායෝ. මොකද වුණේ. ගන්න ගන්න ඉක්මනට. උස්සලා කාමරයට ගෙනියමු."

"මොකද වුණේ ඇත්තට මොකද වුණේ ?"

මිනෝත්ට ජිරෝත්, හොඳටම බය වෙලා. යගිරෝ මහත්මිය පැමිණ වතුර කෝප්පයක් ගෙන්වා කායෝගේ හිස දෙපැත්තේ ම ගෑවා.

"ඇයි අම්මා මොනා ද ඔය කරන්නේ?"

"බය වෙන්න එපා. හිස තුවාල වෙලා නැහැ. මෙයාට සිහි නැති වෙලා විතරයි. කෝකටත් දොස්තර ගෙන්වන්නකෝ."

"කායෝ, කායෝ, ඇස් අරින්න දුව."

කායෝ කෙඳිරි ගාමින් සෙමෙන් ඇස් ඇරියා.

"ඇයි මගෙ දුව ඔයාට මොකද වුණේ?"

"අම්මා. ඔෂින් මට වැටෙන්නම ගැහුවා."

"මොනවා ඔෂින්."

ජිරොත්, මිනොත් කට ඇරගෙන එකිනෙකා දෙස බලාගත්තා.

"මම අම්මට කිව්වා. ඒකි බයානක කෙල්ලක් කියලා."

"හරි මම ඒක බලාගන්නම්."

"අන්න දොස්තර මහත්තයා ආවා."

"මේ ඇඳුම් තෙත්වෙලා. ඇඳුම් මාරුකරලා එයාව දොස්තර මහත්තයාට පෙන්නවන්න ගෙනියන්න."



මිනෝ කියෝ සමග කායෝ ඔසවා ගෙන ගියා.

"අම්මා, මේ කෙල්ල පොලීසියට භාර දෙමු."

"ඊට ඉස්සර වෙලා මොනාද වෙලා තියෙන්නේ හොයන්න එපායැ."

"කුමී ඔෂින්ට එන්න කියන්න."

කුමී ඔෂින් සොයාගෙන ගියා. ඔෂින් ලිප දෙස බලාගෙන කල්පනා කරමින් හිටියා.

"ආයෙත් වැරැද්දක් කළා නේද ?"

කුමී, ඔෂින්ව වේගයෙන් තමා වෙතට හරවා ගත්තා.

ඔෂින් බිම බලාගත්තා.

"අන්න යගිරෝ මැඩම් කතා කරනවා."

"කොහොමද මිස් කායෝට"

"එනවා මාත් එක්ක යන්න. ඉක්මනට."

ඔෂින් සෙමෙන් සෙමෙන් කුමී පසුපස ගියා.

"ඔය කෙල්ලනම් පොලීසියට භාර දෙන්නයි ඕනෑ."

ජිරෝගේ කටහඬ ඇසුණා.

"මැඩම් මම ආවා." ඔෂින් කිව්වා.

ඉක්මනින් දොර ඇරිය ජිරෝ ඔෂින් ඇදලා අරගෙන ඇයට වේගවත් කම්මුල් පහරක් දුන්නා. ඇය බිම ඇද වැටුණා. ඊත් ඉක්මනට දණ ගහගත්තා.

"ජිරෝ මොනවද ඒ කළේ? පුංචි කෙල්ලෙකුට ඔහොම ගහනවද?"

ඒ යගිරෝ මහත්මියගේ හඬ.

"නෑ මැඩම් මම වැරැද්දක් කළා. මම දඬුවම් විඳින්න ඕනෑ."

ඒ වචන සමග ම ඔෂින්ට පහර දීමට ජිරෝ අත මිට මොලවා ගත්තා.

"ඇයි එහෙම කළේ ?"

යගිරෝ මැඩම් ඇහුවා.

Rangika

"මමයි වැරැද්ද කළේ මට දඬුවම් දෙන්න මැඩම්."

"උඹ මෙහෙ වැඩකාරියක්. තමාගේ ස්වාමිදුවට ගහනවද වැඩකාරියෝ. අම්මාගේ වැරැද්ද ? ඇයි අම්මා මේ කෙල්ල මිල්ටරි පොලිසියට ගෙනිච්චා කියලා මම කිව්ව නේ. අම්මා ඇහුවද ?"

"ඔෂින් ඔයාගේ ගමේ කෙනෙක් කිව්වලු ඔයා හමුදාවෙන් පැනලා ගිය එක්කෙනෙක් එක්ක හැංගිලා හිටියා කියලා. ඒක ඇත්ත ද ?"

"මැඩම් එයා පැනලා ගියේ යුද්ධයට බයේ නෙමෙයි. එයාට යුද්දේ එපා වෙලා තිබුණේ. එයාගේ යාළුවෝ යුද්දයෙන් මැරෙන කොට එයාට හරිම කළකිරීමක් ඇති වුණේ. ඒකයි යුදබිමෙන් පැනලා ආවේ. ඇඟ හැම තැනම මාරාන්තික තුවාල කැළැල් තිබුණා. එයා බයගුල්ලෙක් නෙමෙයි. යුද්ධයෙන් ඇති වැඩක් නැහැ. මරණය විතරයි. ඔන්න ඔහොමයි මට සංසකු මාමා කියලා දුන්නේ. මට ලියන්න, කියවන්න, ගණිතය ඉගැන්නුවේ සංසකු මාමා. යුද්ධය තිබෙන බව කියා දුන්නේ එයා."

"දෙවියනේ මෙච්චර පොඩි කෙල්ලක් මෙහෙම බැරෑරුම් දේවල් කියන හැටි."

ජීරෝ පුදුමයෙන් කිව්වා.

"මැඩම් මාව මරණයෙන් බේරා ගත්තේ සංසකු මාමා. මාව හිමෙන් වැහිලා ඉඳලා තියෙන්නේ. සංසකු මාමා ඔත්සු සීයා එක්ක එකතු වෙලා මගේ ජීවිතය බේරා ගත්තා. ඒ වගේම මාව ගම්මානයට ඇරලන්න ඇවිත් එයා වෙඩි කාලා මැරුණා. මේ හර්මෝනියාව මට දුන්නේ සංසකු මාමා. මට මේක මිස් කායෝට දෙන්න බෑ මැඩම්."

ඔෂින් කියවාගෙන ගියා.

"ඒක ද මිස් කායෝ මරන්න හැදුවේ."

"ඔයාගේ අතත් තුවාල වෙලා නේද ?"

යශිරෝ මහත්මිය ඔෂින්ගේ අත අල්ලා ගත්තා.

"මෙතන දත් පාරවල් ? යන්න ජීරෝ ගිහිල්ලා දොස්තර මුණ ගැහෙන්න."

"මොකද දොස්තර මහත්තයා."



"නෑ බරපතල නෑ. හිස ගෙඩි ගැහිලා. ඒකට මේ ක්‍රීම් එක ගාන්න. ළමයි ගහ බැන ගන්නවා. ඒතරම් ඒවා ගැන බයවෙන්න එපා."

දොස්තර මහත්තයා යශිරෝ මහත්මිය මුණ ගැසී ගියා.

ඔෂින් තවමත් යශිරෝ මහත්මියගේ කාමරේ.

"මැඩම්, මොකද ? මිස් කායෝට"

"ඔයා වද වෙන්න එපා. එයාට අමාරුවක් නෑ. ඔයා අද සායෝ බබා බලාගන්ඩ ඕනෑ නෑ. ඔයා උයන ගෙට ගිහින් විවේකව ඉන්ඩ."

"හොඳමයි."

ඔෂින් මැඩම්ට ආචාර කර සෙමෙන් නැගිට ගියා.

Rangika

# හත

ඔෂින්ට මේ දිනවල බබා බලාගන්න ලැබුණේ නැහැ. ඒ තරමටම මිනෝ ඔෂින් සමග අමනාප වෙලා හිටියා. ඔෂින් ලොකු ලේන්සුවක් රැගෙන ඇයගෙ බඩුමුට්ටු ඔතා ගත්තා. එහි ගල්ලැල්ල හා අම්මා දුන් බෝනික්කාත් ඇයට ලැබුණු කිමෝනා දෙකකුත් තිබුණා. ඔෂින් නිතර එය දිගහැර බලමින් ඔතා තිබුණා. කොයි මොහොතේ හෝ කගායා අතැර යන්න සූදානමින් ඇය හිටියෙ.

යශිරෝ මහත්මිය ඔෂින් සොයා ආවා.

"ඔෂින්, එහෙම නම් යන්න ලෑස්ති ද ?"

ඔෂින් ඉක්මනින් හිට ගත්තා. සෙමෙන් හිස වැනුවා.

"ඔයා ගෙදර යන එක හොඳයි. මොකද මගෙ ලේලියි පුතයි ඔයාට නරක විදිහට සලකයි. දැන් එයාලාගෙ හිත කැඩිලා නේ. කායෝත් මහ මුරණ්ඩු ළමයෙක් බව මම දන්නවා."

"මැඩම් මිස් කායෝට හොඳ ද ?"

"ඔව්, එයාට හොඳයි. ඔෂින් මේ සකාටා නුවර ව්‍යාපාරවලින් දියුණු වන නගරයක්. මෙහෙ වැඩිදෙනා යුද්ධයට කැමති නැහැ ඔෂින්. ඔයාගේ සංසකු මාමා වගේ. නමුත් කිසි කෙනෙක් එහෙම යුද්ධය ගැන ප්‍රසිද්ධියේ කතා කරන්නේ නැහැ. මොකද රජයට බය නිසා. තේරුණාද ඉතින් මම වගේ යුද්ධයට විරුද්ධ මගෙ යාළු ව්‍යාපාරිකයො ඉන්නවා. ඉතින් ඔෂින්, ඔෂින් කැමති නම් මම වෙන තැනක රැකියාවක් හොයා දෙන්නම්."

"මැඩම් මට ගෙදර යන්න බෑ මැඩම්."



"මම දන්නවා. ඔෂින් නරක ළමයෙක් නෙමෙයි. ඔයා බොහෝම නිර්භීත, ඇත්ත කතා කරන ළමයෙක්. ටික දවසක් ඉන්න. මම ඔයාට ඒ ගෙදරක වැඩ කරන්න හොයා දෙන්නම්."

යශිරෝ මහත්මිය කෑම ගැනීමට කාමරයට ගියා.

"අම්මාත් හරි අහිංසකයි."

"කායොත් ඒවා තමයි ඉගෙන ගෙන තියෙන්නේ."

මේ කතා යශිරෝ මහත්මිය පැමිණි විගසම අවසන් වුණා.

"අම්මා එන්න පරක්කු නිසා අපි කෑම කෑවා."

"අම්මා, ඇයි අර ඔෂින්ව ගෙදර යවන්නේ නැද්ද ?"

"මොකද හදිස්සිය. මම ඒ ළමයව ළඟදීම වෙන ගෙදරකට යවනවා."

"හැබැයි අපේ යාළුවන්ගෙ ගෙවල්වලට නම් යවන්න එපා." ජීරෝ කිව්වා.

"කොහේ ගියත් ඔෂින්ට වරදින්නේ නැහැ."

"හොඳයි ඇයට මෙහෙම දෙයක් වුණා නම්."

"ජීරෝ මතක තියා ගන්ඩ කායෝට, ඔෂින් නිකම්ම ගැහුවේ නෑ. ඒ දෙන්නා ගහගත්තා. එක අතකට කායෝ තේරුම් ගනියි හැම දේම මුදලට ගන්න බැහැ කියන එකත්."

ඔෂින් ලී දෙකක් ගෙවී තීපයක් අරගෙන බස්සෝ දෙන්නෙක් හැදුවා.

"මොකද ඔෂින් කරන්නේ."

"මේවා ඉස්සර ආච්චම්මා අපට හදලා දෙනවා."

"ඉතින් ඔෂින් මොකටද මේවා හදන්නේ ?"

"මේවා මම හදන්නේ මිස් කායෝට දෙන්න. තුමී මේක මිස් කායෝට දෙන්න. මට සමාවෙන්න කියන්න. මට ඒ කාමරයට යන්න දෙන්නේ නැහැනේ."

"හොඳයි මම ගෙනියන්නම්."

කුමී ඒවා රැගෙන කායෝගේ කාමරයට ගියා.

"මිස් කායෝ, නිදිද ?"

"නෑ. මම ඇහැරිලා ඉන්නේ. මේ මොනවද ?"

"ඔය බස්සෝ දෙන්නා හදලා දුන්නේ ඔෂින්. මිස් කායෝට දෙන්න කිව්වා. එයාට සමාව දෙන්න කිව්වා."

"ඇත්තම ද මේවා හැදුවේ ඔෂින් මද ?"

"ඔව්, මිස් කායෝ මම දැක්කා හදනවා."

"එයා හරි දක්ෂයි නේද ? මට තරහ යන්නත් ඇත්තේ ඒ නිසා වෙන්න ඇති නේද ? මේවා හරි ලස්සනයි."

"ඒත් ඉතින් දැන් ඔෂින්ට යන්න වෙලා නේ."

"ගියා ද ?" කායෝ මෙට්ටය මතින් නැගිට්ටා.

"නෑ යන්ඩ ලෑස්තියි. එයා දරුණු වැඩක් නේ කළේ."

"නෑ, කෝ ආච්චම්මා...."

කායෝ නැගිටලා දුවලා ගියා. අම්මාත්, තාත්තාත්, ආච්චම්මත් කාමරයේ හිටියා.

"ආච්චම්මා මේ බලන්න."

"ආ බස්සෝ දෙන්නෙක්. කොහෙන්ද ?"

"දන්නවද ආච්චම්මා ඕක හදලා දුන්නේ ඔෂින්."

"ඔෂින් කෝකටත් දක්ෂයි."

"ආච්චම්මා එදා මම ඔෂින්ගේ තලාව බිම දමලා පෑගුවා. මම ඔෂින් එක්ක ගහගත්තා. හැබැයි මම පැරදුණා. මම හිතාගෙන හිටියෙ මුදලට ඕනෑ දෙයක් ගන්න පුළුවන් කියලයි."

"ඒත්, ඉතින් දැන් ඔෂින් යනවා නේ."

"අනේ එපා ආච්චම්මා, ඔෂින් යවන්න එපා."

"මොනවද ඔය කියන්නේ කායෝ." මිනෝ ඇහුවා.

"ඔව් අම්මා මම හැම වෙලාවෙම ඔෂින් එක්ක තරග කළා."



"ඒකෙන් මට මගෙ පොත් සේරම කියවා ගන්න ලැබුණා. මට විභාගය ලේසි වුණා. ඇයි අම්මලා තරහින් හිතන්නේ."

"ඔයා හරි කායෝ. මටත් ඕනෑ කළේ ඔයා ඔෂින් එක්ක තරගයට දමන්න තමයි."

යශිරෝ මහත්මිය කිව්වා.

"අනේ ආච්චම්මා ඔෂින් නතර කර ගන්න."

"කායෝ...." මිනෝ කෑගැහුවා.

"නෑ, මට ඔෂින් ඕනෑමයි."

"හරි කායෝ ඔයා කියනවා නම් මම ඔෂින් නවත්වා ගන්නවා. මට අනික් අයගේ කැමැත්තෙන් වැඩක් නෑ."

"ස්තූතියි ආච්චම්මා."

කායෝ යශිරෝ මහත්මිය වැළඳ ගත්තා. ඔෂින් බිම දණ ගසා ජනේල කවුළුවෙන් ඈත බලා ගෙන හිටියා.

"ඔෂින්ට යශිරෝ මැඩම් එන්න කිව්වා."

ඔෂින් ඉක්මනින් කුමී දෙස බැලුවා.

"මට වැඩ කරන්න අලුත් තැනක් හොයා ගන්න ඇති."

"ඔෂින් කැමතිද එහෙම වෙන තැනක වැඩ කරන්න."

ඔෂින් හිස දෙපසට වැනුවා.

"කොහෙත්ම නෑ. ඒත් මම අතින් හරියට වැරදි සිද්ධ වෙනවා. ඒ නිසයි මම යන්නේ. මිනෝ මැඩම්ගෙ හිත හොඳටම රිදිලා. අනේ මට හරි ආදරෙන් මැඩම් සැලකුවා නේ."

ඔෂින් යශිරෝ මහත්මියගෙ කාමරයෙ දොර ළඟට ගියා.

"මැඩම්, මම ආවා."

"ඔෂින් එන්න ඇතුළට."

ඔෂින් කාමරයට ගොස් මැඩම්ට ආචාර කළා.

"මැඩම් මට යන්න අලුත් තැනක් හොයලා ඇති. ඒත් මම මේ ගෙදරින් යන්නේ හරිම දුකෙන් මැඩම්."

"ඇයි වද වෙන්නේ. ඔමින් මේ ගෙදරින් යන්නේ නෑ."

ඔමින් හිස එසෙව්වා. ඇය පුදුමයෙන් බලා සිටියා.

"ඔයා මෙහෙ වැඩ කරනවා. සායෝ බලාගන්නවා."

"අනේ ඒක නම් හරිම හොඳයි. මේ දවස්වල මම සායෝ බබා නැතිව පාළුවේ හිටියේ."

"ඒ විතරක් නෙමෙයි. කායෝ එයාගේ අලුත් පොත් ඔයාට කියවන්න දෙනවා කිව්වා."

"මිස් කායෝ මා එක්ක තරහා නැද්ද ?"

"නෑ. ඔමින් දන්නවද ? කායෝ තමයි බල කළේ ඔමින් යවන්න එපා. මෙහෙ තියාගන්න කියලා."

"මට සමාවෙන්න මැඩම්. මගෙ අතිනුත් වැරදි සිද්ධ වුණා."

"හොඳයි ඔයා දැන් කෑම කාලා ද ?"

"එහෙමයි."

"එහෙනම් දැන් ගිහින් නිදාගන්ඩ."

පසුවදා උදේ මිස් කායෝ පාසල් යාමට එළියට ආවා. ඔමින් සායෝ බබාවත් රැගෙන මිස් කායෝ ළඟට ගියා.

"මිස් කායෝ තුවාල රිදෙනවද ?"

"නෑ. ඔමින් ඔයාගේ අත රිදෙනවද ?"

"ටිකක් වත් නෑ මිස් කායෝ."

"හැබැයි ඔමින් මම අනිත් සැරේ ඔයාට ගහලා පරද්දනවාමයි."

"යන්නම්."

"ප්‍රවේශමෙන්."

ඔමින් හා මිස් කායෝ ඉක්මනින් හොඳ යාළුවෝ වුණා. මිස් කායෝ ඔමින්ට ඇයගේ පොත් දුන්නා. අපහසු වචන කියා දුන්නා. ඇය චීන අකුරු ලියන අයුරු ඔමින්ට කියා දුන්නා. මේ අතර මීනෝ කාමරයට ආවා.



"ආ.... ඔමින් මොකද මෙහෙ කරන්නේ."

"අම්මා, මම එයාට චීන අකුරු ලියන හැටි කියා දුන්නා."

"ඔමින් යන්ඩ එළියට."

"හොඳමයි."

"ඇයි අම්මා ඔමින් එළියට ඇරියේ ?"

"කායෝ තේරුම් ගන්න. අනාගතයේදී ඔයා මෙහෙ පාලකයා වෙනවා. ඒ නිසා වැඩකාරියෝ කිට්ටුවෙන් ආශ්‍රය එපා. ඔයා ඔමින් ආශ්‍රය කිරීමෙන් කිසිම ප්‍රයෝජනයක් නෑ. ඉදිරියේ දී කරදර වෙයි."

"මම ආච්චම්මාගෙන් අහන්නම්."

කායෝ යශිරෝ මහත්මිය සොයා ගියා.

"ආච්චම්මා මට වඩා ඔමින් වෙනස් ද ?"

"ඔව්. ඔමින් දුප්පත් ළමයෙක්."

"ඇයි ඔමින් මගේ කාමරයට එනවට අම්මා අකමැති."

"කායෝ ඔමින් දුප්පත් වුණේ ඔමින්ගෙ වරදකින් නෙමෙයි. එයා සේවිකාවක් විදිහට සේවය කළාට ඔයාගේ වයසෙ ළමයෙක්. එයාට හොඳින් සලකන්න."

"මට දුකයි ආච්චම්මා. එයා මගෙ වයසේ නමුත් එයාට පාසල් යන්න විදිහක් නැහැ. එයා ළමයි බලන සේවිකාවක්. ආච්චම්මා ඔමින් පාසල් යවන්න බැරිද ?"

"ඒක කරන්න බෑ. එයා සායෝ බලාගන්න එපායැ. අපි ඒ වෙනුවෙන් එයාලගේ ගෙදරට හාල් යවනවා. හාල් නොයැව්වොත් එයාගේ ආච්චම්මාට බඩගින්නේ ඉන්න වෙනවා."

"මට දුකයි ඔමින් ගැන."

"ඒක හොඳයි කායෝ. ඔයාට කාගේ හරි දුක ගැන තේරෙනවා නම්. ඉස්කෝලේ නොගියාට ඔමින් දක්ෂයි. ඔයත් එයාට නොදන්න වචන කියලා දෙන්න. එයත් ඔයා වගේම දියුණු වේවි."

දින කිහිපයකට පසු උයන ගෙට ගොස් යශිරෝ මහත්මිය ඔමින් මුණ ගැසුණා. ඔමින් ලිප පත්තු කරමින් හිටියා.

Rangika

"ඔෂින් ඔයා උයනවද ?"

"නෑ, මැඩම් මම වතුර උණු කළා."

"ඒත්, ඔයාට තියෙන්නේ බබා බලාගන්න විතරයි නේ."

"මැඩම් මම ආවේ දුප්පත් ගමක ඉඳලා. මම දන්නේ නෑ මෙහෙම තැනක හැසිරෙන හැටි. මට සමාවෙන්න. වැඩ කරන කොට මගේ පාළුව මැකෙනවා මැඩම්."

"හොඳයි ඔයාගේ කැමැත්තක්."

ටික වේලාවකින් මිස් කායෝ ඔෂින් සොයා ආවා.

"ඔෂින් එන්න ටිකකට මගෙ කාමරයට."

"මම ඔයාගේ කාමරයට නොගියොත් හොඳයි මිස් කායෝ. මීනෝ මැඩම්ට තරහා යාවි."

යශිරෝ මහත්මිය මේ වචන අසා සිටියා.

"ඔෂින්...."

"එනවා මැඩම්."

"අද හවස්ට ඔයාගේ වැඩ ඉවර වුණාම මගෙ කාමරයට එන්න ඕනෑ."

"හොඳමයි."

ඔෂින් සවස යශිරෝ මහත්මියගෙ කාමරයට ගියා.

"එන්න ඔෂින්."

ඔෂින් යශිරෝ මහත්මියට ආචාර කර බිම ඉඳ ගත්තා.

"ඔෂින්ට කියවන්න පුළුවන් වුණාට ලියන්න අමාරුයි නේද?"

ඔෂින් හිස සෙලෙව්වා.

"මම හිතුවා ඔෂින්ට ලියන්න උගන්වන්න."

"ඔය ඇත්තමද මැඩම්."

ඔෂින්ගේ මුහුණ පුරා මිහිරි සිනාවක් පැතිර ගියා.



"දැන් මේ බුරුසුව අරගෙන තීන්ත බෝතලයෙන් පොගවන්න. වැඩි තීන්ත බෝතලේ දාරේ තියලා ගලා යන්න ඉඩ දෙන්න. අන්න හරි දැන් හොඳට කොන්ද කෙළින් කරලා වාඩි වෙලා ලියන්න පටන් ගන්න. අන්න හරි."

"තව ටිකක් කෙළින් වෙන්න."

ඔෂින් ඒ කියන කියන ආකාරයට ප්‍රවේසමට බුරුසුව හසුරුවමින් අකුරු ලිව්වා.

"හොඳයි බොහෝම හොඳයි."

එකවරම කායෝ කාමරයට දුවගෙන ආවා.

"ආච්චම්මා ඔෂින් මොකද කරන්නේ ?"

"ඔෂින්ට ලියන්න ඉගැන්නුවා."

"හොඳයි මමත් එන්නද ?"

"කොච්චර හොඳයි ද කායෝ."

එවිටම මීනෝ කාමරයට ආවා.

"ඔෂින්ගෙ ගෙදර වැඩ ඉවරයි. මම එයාට ලියන්න උගන්වනවා. කායෝත් ඒවි."

"අම්මා.... කායෝට ඔෂින් එක්ක එකට ඉගෙන ගන්ඩ පුළුවන් ද?"

මීනෝ අමනාපයෙන් පිටව ගියා. ඔෂින් බය වුණා. අකුරුත් ඇද වුණා.

රාත්‍රී කෑම මේසයේ දී පුතා ඊරෝ කතා කළා.

"මොනවද අම්ම මේ කරන්නේ ?"

"ඇයි මොකද ?"

"ඔෂින්ට ලියන්ඩ උගන්වනවද ?"

"ලියන්ඩ විතරක් නෙමෙයි ගණන් උගන්වන්ඩත් මම හිතාගෙන ඉන්නවා. ඔෂින් මා ළඟට එන්නේ එයාගේ සේරම වැඩ ඉවර කරලා."

"ඒත් අම්මා එයා වැඩකාරියක්."

Rangika

"ඒත් එයා ළමයෙක්."

"කායෝත් එයා එක්ක ඉගෙන ගන්ඩ එනවද ?"

"ඔව්, ඇයි වැරැද්ද මොකක්ද ?"

"ඔෂින්ගේ නරක වැඩ එයත් ඉගෙන ගනියි."

"මට තේරෙන විදිහට නම් ඔෂින්ගෙන් වැරැද්දක් වෙලා නැහැ. අනිත් එක කායෝ බුද්ධිමත්. එයා හොඳ නරක හොඳට දන්නවා."

එදා සවස යශිරෝ මහත්මිය දෙන්නාටම ඇබකය භාවිතා කර ගණන් හදන ආකාරය කියා දුන්නා.

"අපි වෙළෙන්දෝ. ඇබකය පාවිච්චි කරලා ගණන හදන්ඩ ඉගෙන ගන්ඩ ඕනෑ. තේරුණා ද කායෝ. ඔයානේ කගායා ආයතනය පාලනය කරන්නේ අනාගතයේ දී. එතකොට ඔෂින් ඔයාට උදව් කරයි."

කායෝත්, ඔෂින් සමගම තරගයට ගණන් හැදුවා. දෙන්නාම එකට හිනැහුණා. යශිරෝ මහත්මිය මේ තරගය දෙස බලා සතුටු වුණා. ඔෂින්ගේ පිටේ සායෝ බබා රඳවන ගමන් මිනෝ කතා කළා.

"ඔෂින් ඔයා කායෝගේ වැඩකාරිය බව අමතක කරන්න එපා."

"එහෙමයි." ඔෂින් හිස වැනුවා.

"ඔෂින් මිනෝ මැඩම්ගෙ හිත රිදෙන වැඩ කරන්න එපා."

කියෝ ඔෂින්ට කිව්වා. එදා ඔෂින් යශිරෝ මහත්මියගෙ කාමරයට ගොස් පසෙක වාඩි වී හිටියා.

"ඔෂින් මොකද අද ඉගෙන ගන්ඩ කල්පනාවක් නැද්ද ?"

"මැඩම්, මම හිතුවා පාඩම් නතර කරන්ඩ."

"ඇයි හේතුව මොකක්ද ?"

"මට ඒ පාඩම් තේරුම් ගන්ඩ අමාරුයි."

"බොරු කියන්ඩ ඉගෙන ගන්ඩ එපා ඔෂින්. ඔයාට මගෙ ලේලී මොනවා හරි කියන්න ඇති. ඔෂින් මෝඩ වෙන්ඩ එපා. ඔයා හැමදාම දුප්පත් වෙලා ඉන්ඩද කල්පනාව. මට ඕනෑ ඔයාට ස්වශක්තියෙන් නැගිටින්න කියලා දෙන්නයි. ඔය එක එක්කෙනා කියන දේවල් අමතක කරන්ඩ. ඔයා ආත්මාර්ථකාමී වෙන්ඩ. තේරුණා ද ?"



"එහෙමයි."

ඔෂින් ඇබකය ළඟට ගෙන පාඩමට සූදානම් වුණා. එදා දවල් ඔෂින්, ලාම්පු දෙකක චිමිනි සෝදා පිහදමමින් සිටියා.

"ඔෂින්, ඔයාට ආයිම චිමිනි හෝදන්න වෙන්නෙ නෑ."

කායෝ කිව්වා.

"ඇයි මිස් කායෝ ඒ ?"

"ඇයි අපට ළඟදී විදුලිය ලැබනවා නේ."

"විදුලිය ?"

"ඔව් එන්නකෝ මේ බිත්තිය ළඟට. මෙන්න මේ තියෙන ස්විච් එක දැම්මා ම අර තියෙන විදුලි බල්බ් එක පත්තු වෙනවා. එතකොට ගෙට හොඳට එළිය වැටෙනවා."

"එතකොට ඒකට විදුලිය ලැබෙන්නේ කොහොමද ?"

"ඒක කරන්නේ එළියේ හිටවන කණුවකින්. ආච්චම්මා කිව්වා අද හවසට කණු හිටවනවා කියලා. එතකොට අපි බලමු."

සවස් වන විට විදුලිබල දෙපාර්තමේන්තුවේ සේවක පිරිසක් පැමිණ කණුවක් සිටුවීමට පටන් ගත්තා.

"ඔෂින්, අපි එළියට ගිහින් බලමු."

"මැඩම් කිව්වා එළියට යන්න එපා කියලා."

"මම නම් එළියට යනවා. ඔයා එන්න."

"හොඳයි මම සායෝ බබා දීලා එන්නම්."

සියලු දෙනා මිදුලට වී කණුව වළ තුළට දමා ඔසවන අයුරු බලා හිටියා. කායෝ එම නිලධාරීන් ළඟට ගියා.

"මේ අදම අපට විදුලිය ලැබෙනවාද ?"

"බබා එහාට යන්න."

"මේ කම්බි දිගේ ද විදුලිය ගමන් කරන්නේ. මට ආසයි දැන ගන්න."

"කායෝ මෙහාට එන්න."

මිනෝ කෑගැහුවා. එකවරම කණු ඔසවමින් සිටි කඹය කැඩී ගියා. කණුව වේගයෙන් බිමට පාත් වුණා. කායෝ සිටියේ එතනමයි.

"කායෝ..... කායෝ අයින් වෙන්න."

ඔෂින් ක්‍රියාත්මක වුණා. ඇය පැන කායෝත් තල්ලු කරගෙන එහා පැත්තට වැටුණා. දෙන්නාම එක ගොඩේ පෙරළී අඬන්න පටන් ගත්තා.

"කා....යෝ...." මිනෝ එතනම සිහි නැතිව ඇදගෙන වැටුණා.

"මොකද ළමයින්ට වුණේ ?"

සේවකයන් පැමිණ අඬමින් සිටි කායෝ හා ඔෂින් ඔසවා ගත්තා.

"නෑ බයවෙන්න එපා. මේ බබා අනිත් බබාව තල්ලු කළ නිසා එයාගේ ජීවිතේ බේරුණා."

"ඉක්මනට දොස්තර ගෙන්වන්න."

ජ්රෝ මිනෝ ඔසවා ගනිමින් කතා කළා. වෛද්‍යවරයා පැමිණියාට පසුයි මිනෝට සිහිය ආවේ.

"අම්මා, අම්මා."

කායෝ අම්මාගේ මුහුණට එබෙමින් කතා කළා.

"කායෝ ඔයාට මොනවත් වුණේ නැහැ නේද ?"

මිනෝ කායෝව වැළඳ ගත්තා.

"මම දැක්කේ කායෝව කණුවට යටවෙනවා වගෙයි."

"වෙනව තමයි ඔෂින් නොහිටියානම් ඔෂින් කායෝව එහාට තල්ලු කළා."

"ඇත්තද ? අනේ ඔෂින් ඔයා මගෙ දුව බේරා ගත්තා. ඔෂින් ඔයා මගෙ දුවෙක්."

මිනෝ ඔෂින් සිප ගත්තා.

"මීට පස්සෙත් කායෝව බලාගන්න."



"ඔව්, ඔෂින් ඔයාට ස්තුතියි."

ජිරෝ හිස නමා ආචාර කළා. ඔෂින් හිටියේ බියෙන්.

"මිස් කායෝ තල්ලු කළාට මට සමාවෙන්න."

"නෑ, ඔෂින්, දෙවියො තමයි ඔයාව එව්වේ. නැත්නම් අද කායෝ නැහැ."

"අනේ කායෝ."

මිනෝ, කායෝ වැළඳ ගත්තා. අඬන්න පටන් ගත්තා.

"ඔයා සහෝදරියකට වගේ ඔෂින්ට සලකන්න දුව."

මිනෝ ඇඬුම් අතරින් කිව්වා.

ටික දවසකින් ඔවුනට විදුලිය ලැබුණා. සියලුම විදුලි පහන් දැල්වෙන විට කායෝත්, ඔෂිනුත් අත්පොලසන් දුන්නා.

"හරිම ලස්සනයි."

ඔෂින් පුදුමයෙන් බලාගෙන හිටියා.

"තාත්තා දන්නවද කොහොමද විදුලිය ලැබෙන්නේ කියලා."

"පහන් ටිකක් අරගෙන පුංචි මිනිස්සු විදුලි පහන් ඇතුළට රිංගලා."

සියලු දෙනාම මේ විහිළුවට හිනා වුණා. ඔෂින් කගායාවල පැමිණියාට පසු එළඹි අවුරුදු උත්සවය එයයි. දෙසැම්බර් මාසයේ අවසාන සතියේ ඔශෝගත්සු අලුත් අවුරුදු උත්සවයට කගායා නිවැසියන් සූදානම් වුණා. කුමී සහ කියෝ විවිධ කැවිලි වර්ග සාදන අයුරු ඔෂින් බලා සිටියා. අවුරුදු දා උදේ මිනෝ ඔෂින්ව කාමරයට කැඳෙව්වා.

"මේ පාර්සලය ඔෂින්ට, තෑග්ගක්."

"ස්තූතියි." ඔෂින් හිස බිම තබා ආචාර කළා.

"ලෙහලා බලන්න ඔෂින්."

එසේ පවසමින් මිනෝම පාර්සලය ලිහුවා.

"ලස්සන කිමෝනාවක්."

"හරි ලස්සනයි මැඩම්."

ඇය එය පවසන විටම කායෝ කාමරයට දුවගෙන ආවා. ඇයද ඇඳ සිටියේ ඒ වර්ගයේම කිමෝනාවක්.

"දෙන්නාටම එක වගේ ඇඳුම්. අඳින්න ඔෂින්. ඔයාලගේ කොණ්ඩ හදන්නත් කොණ්ඩා මෝස්තර කාරියක් ඒවි."

මිනෝ ඔෂින්ට කිමෝනාව අඳින්න උදව් කළා.

"හරි අපූරු කෙල්ලෙක් නේ."

ඇය සතුටින් පැවසුවා.

දෙන්නාගේම කොණ්ඩය සකස් කලේ කොණ්ඩා මෝස්තර දමන්නියක්.

"මට ලැජ්ජයි." ඔෂින් සෙමෙන් කිව්වා.

"මගෙ ජීවිතේට මෙහෙම ලස්සනට ඇඳලා නැහැ."

"ඉක්මනට එන්න ඔෂින් අද වැඩිහිටියන්ගෙන් පුංචි අපට තෑගි ලැබෙනවා."

"තෑගි...... ?"

"ඔව්, අවුරුදු වලට එහෙම චාරිත්‍රයක් තියෙනවා. අද හවසට අපි පන්සල් යමු."

"දැන් සේරම කෑම කාමරයේ ඇති එහෙට යමු."

"මේ දෙන්නාගෙ ලස්සන, හරියට නිවුන්නු වගෙයි."

සේවකයෝ කායෝටත්, ඔෂින්ටත් විහිලු කළා. සියලුම සේවකයන් වාඩි වී සිටියා.

"ඔබලා සියලු දෙනාම මේ ආයතනය දියුණු කරන්න බොහෝම වෙහෙස වුණා. ඒ ගැන සියලු දෙනාටම ස්තූතියි. හැමෝටම සුබ අලුත් අවුරුද්දක් වේවා."

ජීරෝ සකේ බඳුනෙන් සකේ පුරවාගෙන සුබ පැතුවා.

"ඔබ සැමටත් එසේම."

සියලු දෙනා සුබ පැතුවා. ඔවුනට තෑගි ලැබුණා. සියලු දෙනාම එදිනට විශේෂයෙන් සාදන නූඩ්ල්ස් කෑවා. සකේ බිව්වා. කායෝ ඔෂින්ට පන්සල් යන්න කතා කළා,



"බැහැනේ මිස් කායෝ මට සායෝ බබා බලාගන්න තියෙනවා."

"නෑ ඔෂින්, අලුත් අවුරුද්දට සේවකයන්ට දවස් තුනක් නිවාඩු. යන්න කමියි, කිකොයි එක්ක පන්සල් ගිහින් එන්න."

කායෝ, ඔෂින් හා සේවිකාවන් දෙදෙනා පන්සල් ගියා.

"බලන්නකො මේ ළමයි දෙන්නගෙ ලස්සන. එක වගේම කිමෝනා ඇඳලා හරි හැඩයි."

පන්සලට පැමිණි කාන්තාවක් තවත් කාන්තාවකට කිව්වා,

"ඇහුණ ද ?"

කායෝ ඔෂින්ට වැලමිටෙන් ඇන්නා.

"හරියට සෙනග නේද ?"

ඔෂින් වටපිට බැලුවා. එකවරම ඇය දුටුවේ මව වැනි කාන්තාවකි. පිරිමි කීප දෙනෙක් සමග කාන්තාවන්ද ද කීප දෙනෙක් හිටියා.

"අම්මා...." ඔෂින්ට කියැවුණා.

"නෑ ඒ අම්මා නෙමෙයි." ඒත් පුජ් එක්වරම ඔෂින් දැක්කා.

ඇය සෙසු අය සමග පඩිපෙළ බැස ගියා. ඒ ඔෂින් දෙස බලමින්.

"ඔයා ඒ ගෑනි අඳුරනවද ?"

නැහැයි ඔෂින් හිස සෙලෙව්වා.

"පන්සල ඉස්සරහට වෙලා මේ ගෑනු මුකුළු කරන හැටි. ලැජ්ජ නැතිව ඇති."

කිකෝ කිව්වා.

ඒ අවස්ථාවේ සිට ඔෂින්ගේ හිතේ බලපෑවේ ඒ සිටියේ අම්මා ද? යන ප්‍රශ්නයයි. නිවාඩු නිකේතනයේදීත් අම්මා ලස්සනට ඇඳලා හිටියා ඔෂින්ට මතක් වුණා. කායෝත්, අම්මාත්, කිකෝත් කාඩ් සෙල්ලම් කළා. ඔෂින්ටත් කියා දුන්නා. ඒත් ඔෂින් හිටියේ වෙහෙස වූ ආකාරයටයි.

"ඔෂින් මොකද දිගටම පරාද වෙන්නේ."

කායෝ ඇසුවා.

"මම මේ සෙල්ලම ඉගෙන ගත්තේ දැන්නේ. මට තාම හුරු නැහැ."

ජීරෝ කලබලයෙන් ගෙට ආවා.

"කෝ කිකෝ ?"

"ඇයි මහත්තයා ?"

"අර එළියේ පාර පැත්තේ ගෑණියෙක් අපේ ගේ දිහා එහා මෙහා යනවා මම දැක්කා. ගිහින් බලන්න ටිකක්. අද කාලේ හොරුත් වැඩියි නේ."

"හොඳමයි."

ඔමින්ගේ හදවත සැලෙන හඬ ඇයටම ඇසුණා.

"එහෙනම් ඒ අම්මා තමයි." ඔමින් හිතුවා.

"ආයිම ඔමින් වැරැද්දුවා."

කායෝ කිව්වා.

"මට ටිකක් නිදිමතයි. මැඩම් මට සමාවෙන්න. මම යන්නද ?"

යශිරෝ මැඩම් ඔමින් දෙස බලා සිටියා.

"යන්න ඔමින්, අද පාන්දරම නේ ඇහැරුණේ."

ඔමින් හිස නමා ආචාර කළා.

"දැන්නම් කවුරුත් ජේන්න නැහැ මැඩම්."

කිකෝ කාමරයට ආවා.

ඔමින් සෙමෙන් කාමරයෙන් එළියට පැමිණ පිටුපස දොර ඇරගෙන එළියට ගොස් පාර පැත්තට ගියා. කිසිවෙක් පෙනෙන්නට සිටියේ නැහැ. ඒත් ටිකකින්,

"ඔමින්........ ඔමින්....." හඬ ඇසී ඇය ඒ පැත්ත බැලුවා.

"අම්මා....."

ඔමින් දුවගෙන ගොස් අම්මාව වැළඳ ගත්තා.

"අම්මා ද පන්සලේ හිටියේ."



"දුව කොහොමද ? ඔයා හරිම ලස්සනයි. ලස්සන නෝනා කෙනෙක්. මට හරි සතුටුයි."

"අම්මා කොහොමද සකාවා ආවේ ?"

"මම වැඩකරපු තැන අය එක්ක. මම පන්සලේ දී කතා නොකළේ ඒක දුවට හොඳ නැති නිසා. ඒත් දුව ඔයාටවත්, තාත්තාටවත්, ආච්චම්මාටවත් ලැජ්ජා වෙන දේවල් කරන්නේ නැහැ දුව. ඒක මතක තියා ගන්න."

"දැන් අම්මා යන්න. රෑ වුණා නේ."

"දුව, මේ සල්ලි ඔයා තියාගන්න."

"එපා අම්මා සල්ලි තියෙනවා. ඔය සල්ලිවලට ආච්චම්මාට රස කැවිලි ගිහින් දෙන්න. අම්මා දුන්න බෝනික්කාත් ඉන්නවා."

"දුව වැඩකාරකමට යනවට මම දුක් වුණා. ඒත් මේ ගෙදර අය ඔයාට දරුවෙකුට වගෙ සලකනවා දැක්කාම මට හරි සතුටුයි"

"දැන් අම්මා ගෙදර යන්න."

"මාව දැක්කොත් දුවට හොඳ නෑ. මම යන්නම්. "

ඔමින්, මව වැළඳ ගත්තා. මව හඬමින්ම ඇයගෙන් වෙන් වූවා. මව පිටව යන අයුරු බලා සිටි ඔමින් ආපිට හැරී ගෙට ගොස් දොර වසන විටම එතන යශිරෝ මහත්මිය සිටියා. ඔමින් තිගැස්සුණා.

"මැඩම්, ඒ මගෙ අම්මා."

ඔමින් එතනම වූ බිත්තිය අල්ලාගෙන බිම ඉඳ ගෙන ඇඬුවා.

"දුක්වෙන්න එපා ඔමින්. ගෑනුන්ට තමාගේ දෙමව්පියන්ට, දරුවන්ට, ස්වාමියාට වැඩ කළ යුතුයි. ඒ තමයි ගෑනුන්ගේ දෛවය. ඔයාගේ අම්මත් ගෙදර අය වෙනුවෙන් වෙහෙසෙනවා. අම්මා මොනවා කළත් එයා ගැන අගිතක් හිතන්න එපා. ඒ අම්මට කොයි තරම් දුකක් ඇතිද ? ඔයා අම්මාව හොඳට බලාගන්න ලොකු වුණාම. දැන් කාමරයට යන්න."

පසුවදා පාසල් නොගිය කායෝ කාමරයට වී මහ හඬින් කෑගැසීමට පටන් ගත්තා.

"මට බෑ මේ කිමෝනා ඇඳලා පාසල් යන්න. දැන් වැඩි දෙනා අඳින්නේ බටහිර ඇඳුම්. මටත් ඒවා ඕනෑ."

"මිනෝ මෙහෙ එන්ඩ."

"එනවා, අම්මා."

"මොකද ඔය කායෝ කෑගහන්නේ?"

"අම්මා එයාට බටහිර ඇඳුම් ඉල්ලනවා."

"එයාගෙ පදයට නටන්න ද හදන්නේ ?"

"එහෙම ම නෙමෙයි අම්මා. ඒවා අඳින එක නම් පහසුයි."

කායෝ ආච්චම්මාගේ කාමරයට කඩා වැදුණා.

"කායෝ කවුරුත් කරන දේවල් ඔයා කරන්න අවශ්‍ය නැහැ. කිමෝනාව අපේ සාම්ප්‍රදායික ඇඳුමක්. ඒක ගෑනු ළමයෙකුට හොඳ වැදගත් පෙනුමක් ගේනවා."

"එහෙම නම් මම හෙට ඉඳලා පාසල් යන්නේ නෑ."

"බොහොම හොඳයි. ඔයාට යන්න බැරිනම්, නොයා ඉන්න."

"අම්මා..."

"කායෝ කෑගැහුවට වැඩක් නෑ. බටහිර ඇඳුම් අරගෙන දෙන්නේ නෑ. මීනෝ ඇහෙනවද ? කායෝ දූක කියන දෙය අඳුරන්නේ නෑ. හොඳයි මම එයාට තේරුම් කරන්නම්කෝ."

එදා සවස යශිරෝ මහත්මිය ඔෂින්ට කතා කළා.

"ඔෂින් අද ඔයා රාත්‍රියට කන්න රාබු බත් ටිකක් උයන්න."

"හොඳමයි."

ඔෂින් උයන ගෙට ගොස් රාබු සෝදා පුංචි කෑලිවලට කැපුවා. හාල් ලිපේ තබා ඉදීගෙන එන විට එයට රාබු දැමුවා.

"ඔහොමද රාබු බත් උයන්නේ ?"

"ඔව්, ඔයාලා රාබු බත් කාලා නැද්ද ?"

"නෑ ඔෂින්, මගෙ තාත්තා ධීවරයෙක්. අපි කැවේ තිරිඟු බත්."



තුමී කිව්වා.

"අපිත් කැවේ තිරිඟු බත්."

කියොත් කිව්වා.

"අපි නම් අවුරුදු දවසට කැවෙත් රාබු බත්ම තමයි." ඔෂින් කිව්වා.

"මොකටද දන්නේ නෑ මැඩම් මේවා උයන්ඩ කීවේ ?"

එදත් ඔෂින් යශිරෝ මහත්මියගෙ කාමරයට ගොස් ගණන් ඉගෙන ගත්තා. ජීරෝ කාමරයට ආවා.

"අම්මා, අපි කායෝ ආසා දේ අරගෙන දෙමු නේද ?"

"ඔව් අම්මා ඒ ඇඳුම් අඳින්න පහසුලු."

මිනෝ සෙමෙන් කිව්වා.

"ඔහොම ගියොත් එයා ඉල්ලන හැමදේම දෙන්න වෙයි."

"අන්න කන්නෙත් නැතිව කාමරේ දොරත් වහගෙන."

"ඔහෙ හිටපුවාවේ. බඩගිනි වුණාම කන්නේ නැතෑ."

ටික වෙලාවකින් ඔෂින් හිස ඔසවා යශිරෝ මහත්මිය දෙස බැලුවා.

"මැඩම් මිස් කායෝට බඩගිනි ඇති."

"ඔයාගේ වැඩ ඉවර කරන්න. ඔයා රාබු බත් ඉව්වද ?"

"ඔව්, මැඩම්."

"එහෙම නම් කෝප්පයට දමලා මෙහෙ ගෙනැත් තියන්න."

"හොඳමයි."

ඔෂින් රාබු බත් කෝප්පය ගෙන ආවා.

"මට බඩගිනියි. මාව බඩගින්නේ මරන්නද හදන්නේ."

කායෝ කෑගහමින් කාමරයට ආවා.

"ආ එන්න කායෝ. කන්න මේ කෑම."

"මම මේවා කන්නේ මට ඇඳුම් අරගෙන දෙනවා නම් විතරයි."

Rangika

"කෑම කෑවොත් දෙනවා."

කායෝ කෑම බඳුන ගෙන හෂි කෝටුවෙන් එක කටක් කෑවා.

"තූ ඃ.... තූ මේ මොන ජරාවක්ද ?"

"ඔය රාබු බත්."

"ඔෂින් ඔයා කන්න රාබු බත්." ඔෂින් හෂි කෝටු දෙක අරගෙන රාබු බත් කෑවා.

"මිස් කායෝ අපි හැමදාම කෑවේ රාබු බත්. ඒච්චරයි අපට තිබුණේ. සමහර වේල්වලට ඕකත් නැහැ. මම නම් ප්‍රාර්ථනා කළේ රාබුබත් කන්න ලැබෙන්න කියලයි."

"බලන්න සමහර ළමයි බඩගින්නේ ඉන්න හැටි. ඔෂින්ම බලන්න. එයාලට තුන් වේලටම රාබු බත්. ඒකත් ආච්චම්මට බත් දෙන්න නම් ඔෂින් ගෙදරක වැඩට යන්න ඕනෑ. ඔයා මෙහෙ ඇඳුම් ඉල්ලනවා."

"කන්න මිස් කායෝ මේ රාබු බත් හොඳයි. මමයි ඉව්වේ."

කායෝ රාබු බත් ටික ටික කෑවා.

"නරකම නෑ. මට අලුත් ඇඳුම් එපා."

දෙදෙනාම රාබු බත් කන අයුරු යශිරෝ මහත්මිය හිනැහෙමින් බලා සිටියා.

ඒ මාර්තු මාසයයි. ඒ මාසයේ තුන් වෙනිදා ගැහැනු ළමයි වෙනුවෙන් පවත්වන "හිනමත්සූරි" උත්සවයට කායෝ සූදානම් වුණා. මේ සඳහා කායෝ පාවිච්චි කළේ රෙදිවලින් සෑදූ බෝනික්කන්. පියගැටපෙළක් මෙන් සාදා වේදිකාවක් මත රතු පාට ඇතිරිල්ලක් දමා කායෝ බෝනික්කන් පෙළට තිබ්බා. ඇය කුඩා කල සිටම මේ උත්සවයට ගත් බෝනික්කන් බොහොමයක් තිබුණා. ඔෂින් මේ බෝනික්කන් දෙස ආශාවෙන් බලා සිටියා.

"ඔෂින්ගේ ගෙදර මේ උත්සවය පවත්වන්නේ නැද්ද ?"

"නෑ මිස් කායෝ."

"ඇත්තද ?"



"මිස් කායෝ මම මෙහෙම උත්සවයක් ගැන දැන ගත්තෙත් අදමයි. ඇයි මේ උත්සවය පවත්වන්නේ?"

"මේ උත්සවය පවත්වලා ගැහැනු ළමයින්ට නිරෝගිමත් හා වාසනාවන්ත අනාගතයක් ප්‍රාර්ථනා කරනවා."

මිනෝ පැහැදිලි කළා.

"එහෙමද ?"

"මේ සැරේ මටයි ඔෂින්ටයි දෙන්නටම සුභ පැතුම් ලැබෙනවා."

"ස්තූතියි." ඔෂින් හිස වැනුවා.

"ඔෂින් මේ උඩම පේළියේ ඉන්නේ ජපන් අධිරාජයා සංකේත කරන බෝනික්කා. මේ අධිරාජිනිය. මේ රාජ සභාවේ අය."

කායෝ, විමතියෙන් බලා සිටින ඔෂින්ට ඒ එක එක විස්තර කළා.

"මිස් කායෝ පිරිමි ළමයි වෙනුවෙනුත් මෙහෙම උත්සව පවත්වනවද ?"

"ඔව්. ඔෂින් ඒ උත්සවය පවත්වන්නේ මැයි මාසයේ ඒකට කියන්නේ තොදොමෝ නොහි" කියලා.

"ඒ උත්සවයටත් බෝනික්කෝ පාවිච්චි කරනවද ?"

"නෑ ඔෂින් ඒ උත්සවයට කාෆ් මසුන්ගේ හැඩය තියෙන කොඩි එල්ලනවා. අම්මා එහෙම තේද කරන්නේ."

මිනෝ ගෙන් කායෝ ඇසුවා

"අපේ ගෙදර අයියලා, මල්ලිලා වෙනුවෙන්, තොදෝමෝ නොහි උත්සවය පවත්වන කොට පුරාණ රණවිරුවන්ගේ ඇඳුමෙන් සැරසුව කිනිරාවෝ බෝනික්කෝ පාවිච්චි කළා."

ඔෂින් මේ සියල්ල අගාවෙන් අසා සිටියා. හිනමත්සූරි උත්සවය වෙනුවෙන් විවිධ රසකැවිලි සකස් කළා.

ඔෂින් සිතුවේත්, කීවේත්,

"අනේ මේ කෑම ආච්චම්මාටයි, නංගිලාටයි යවන්න තියෙනවා නම් කියලයි."

හදිසියේම රිකි නැන්දා ආවා. හීනමත්සූරි උත්සවය දැක ඇය කිවේ, "ගමේ ගෑනු ළමයෙකුට නම් මෙහෙම උත්සවයක් ගැන හිතන්නවත් බෑ. ඔමින් වාසනාවන්තයි."

"රිකි නැන්දා දැන් හිම දියවෙලා නිසා අම්මා ගෙදර එන්න ඇති නේද ?"

"ආ ඔව් අම්මා ගෙදර ආවා."

"ආච්චම්මා හොඳින් ඉන්නවාද ?"

"ආ ඔව්, ආච්චම්මා ඔමින්ට හරි ආදරෙයි."

එදා සවස රිකි ආපසු යාමට සූදානම් වන විට යගිරෝ මැඩම් ඇයට කතා කළා. ඇය සිටි කුඩා මේසය මත කැවිලි පාර්සලයක් තිබුණා.

"කරදර කරනවා කියලා හිතන්න එපා රිකි, ඔයාට පුළුවන්ද මේ කැවිලි පාර්සලය ඔමින්ගේ ආච්චම්මාට ගිහින් දෙන්න."

"ගෙනියන්න නම් පුළුවනි මැඩම් ඒත්."

"ඇයි ?"

"මම ඔමින්ට කිවේ නෑ මැඩම්. ආච්චම්මාට අමාරුයි. නිතරම ඔමින්ගේ නම කියනවා."

"එහෙමද එහෙම නම් අපි ඔමින්ව ගෙදර යවමු නේද ?"

"කුමි, ඔමින්ව එක්ක ගෙන එන්න."

ඔමින් යගිරෝ මහත්මියගේ කාමරයට ගියා.

"ඔමින්ට ගෙදර යන්න ආසා ඇති නේ. රිකිත් එක්ක ගිහින් එන්න."

"මම ආපිට එනවා නේද මැඩම්."

"ඔව් ඉක්මනට එන්න."

"මීනෝ, ඔමින්ට ගෙනියන්ඩ හාල් ටිකක් ලෑස්ති කරන්ඩ කියන්ඩ. රිකි මේ සල්ලිත් ඔමින්ගේ අම්මට දෙන්ඩ."

ඔමින් කාමරයට ගොස් ඇඳුම් ටිකත්, ගල්ලැල්ල හා නලාව විශාල ලේන්සුවක එතුවා.



"ඔමින්, ඇයි ඔය සේරම ගෙනියන්නේ."

"ඇයි ? හිටි හැටියෙ මාව ගෙදර යවන්නේ."

"ඒ අම්මලා නංගිලා බලලා එන්න නේ."

"මම බයවුණා."

"ඔවා තියන්ඩ. ඇඳුමක් විතරක් ගෙනියන්ඩ."

"ඔය ඇත්තමද ? මම ආපිට එනවද ?"

❖❖❖

"අම්මා, මේ සුප් එක බොන්න. මේක හොඳට ගුණයි. අම්මට නැගිටී ගන්න පුළුවන් වෙයි."

"මට එපා ෆුජී, මට බොන්න බැහැ."

"අනේ අම්මා, ටික ටික බොන්නකො. ඔමින් හිටියා නම් කොහොම හරි පොවයි."

"ඔමින්, ඔමින් අනේ පොඩි එකී."

"මට ඔමින් බලන්න ආසයි ෆුජී. අපි ඔමින්ට බර පැටෙව්වා. ඔමින් මට බත් කන්න ඕනෑ නිසා ලී මුදලාලි ළඟ වැඩ කළා. බර වැඩ."

"අම්මා දැන් ඔවා හිතන්න එපා. ඔමින් සතුටින් ඉන්නවා. ඔමින් අවුරුද්දට එයි. අම්මා මේවා බීලා සනීප වෙන්ඩකෝ."

"ෆුජී මට ඉක්මනට විවේක ගන්ඩ පුළුවනි. ඒත් මට ඔමින් නැතිව පාළුයි. ඔමින්ට මම ආදරෙයි."

"මම ඔමින් ලී වෙළෙන්දාගේ ගෙදර යනකොට දුන්න කාසිය ඔමින් ප්‍රවේසම් කළා. මට දෙන්නවත් දෙයක් නෑ."

"අම්මා කතා කරලා වෙහෙසෙන්න එපා. මේ සුප් හැන්ද හැන්ද බොන්නකෝ."

ෆුජී කොතරම් පෙරැත්ත කළත් ආච්චම්මා සුප් බීවේ නැහැ.

ඔමින් ගැන කියමින් ඇඬුවා.

Rangika

සකුසො ආවා.

"මොකද දැන් ?"

"ඔෂින් ගැනමයි කියන්නේ. ඔෂින් එක්ක එන්න ක්‍රමයක් නැද්ද සකුසො. මැරෙන්න ඉස්සර ඔෂින් දකින්න ආසයිලු."

ෆුජි කල්පනා කරමින් සුදු බත් කැඳ ටිකක් හැදුවා.

"අම්මා."

කන්ද උඩින් ඇසුණේ ඔෂින්ගෙ හඬ.

"ඔෂින් ඔයාද ?"

ෆුජි ඉක්මනට එළියට ආවා.

"ඔව්, අම්මා මම රිකි නැන්දා එක්ක ආවා."

"යශිරෝ මැඩම් කිව්වා ඔෂින් එක්ක යන්න කියලා ආච්චම්මා බලන්න." රිකි කිව්වා.

"කෝ ආච්චම්මා.... ආච්චම්මා..... ආච්....ච....ම්මා.. ඇයි අම්මා ආච්චම්මා නිදි...."

"ඔෂින් ඔයා ආව එක ලොකු දෙයක්. ආච්චම්මාට සනීප නෑ. ඔයා ගැනම අහනවා."

"මම ඔෂින්ට කිවේ නෑ. යශිරෝ මැඩම්ට කිව්වා. ඒ පාර තමයි ඔෂින් එව්වේ."

"මාව ගේන්න දුන්නේ ආච්චම්මා අසනීපෙන් නිසාද ?"

"අනේ රිකි, ඔයාට බොහොම ස්තුතියි. මේ අම්මගෙ අවසාන දවස් ටික කියලයි මට හිතෙන්නේ."

"අම්මා මොනවද මේ කියන්නේ ? අනේ තාත්තා දොස්තර මහත්තයා එක්ක එන්න. අනේ තාත්තා, සල්ලි තියෙනවා. එක්ක එන්න."

"වැඩක් නෑ ඔෂින් දොස්තර මහත්තයා කිව්වා හොඳට කෑම දෙන්න කියලා. දැන් වයසත් අසූගානක්. පෝෂණයත් අඩුයි කිව්වා."

"දුව ඔයා ආච්චම්මාට කතා කරන්න බලන්න."

ඔෂින් ආච්චම්මාගේ මුහුණ ළඟටම ළංව මුහුණ අතගාමින් කතා කළා.

"ආච්චම්මා.... මගෙ ආච්චම්මා අනේ ඇස් අරින්න. මම ඔෂින්.... මම ආච්චම්මා බලන්න ආවා. අනේ ඇස් අරින්න."

ඇය සෙමෙන් ආච්චම්මා සෙලෙව්වා. කණ ළඟටම ළංව කතා කළා.

"මම ඔෂින්. අනේ ආච්චම්මා.... මේ.... බලන්න."

ටික වෙලාවකින් ආච්චම්මා ඇස් ඇරියා.

"ආච්චම්මා ඇස් ඇරියා. අම්මා මේ බලන්න."

"ආච්චම්මා.... මේ.... මම...... ඔෂින්."

"ඔ..ෂින්... මගෙ දුව.... මේ.... ඔයාද ?"

"ඔව්, ආච්චම්මා මාව අඳුනාගත්තා."

"ඔයා ලස්සනයි ඔෂින්, කිමෝ....නාව ලස්සනයි."

"එහෙ හැමෝම මට ආදරෙයි ආච්චම්මා."

"අම්මා අපි කැඳ බොමු. ආ... ඔෂින් මේ ටික ආච්චම්මාට පොවන්න."

ඔෂින් ආච්චම්මාගේ හිස ඇයගේ ඇකයේ තබා ගත්තා.

"ආච්චම්මා මේ සුදු බත්. තව රසකැවිලිත් දුන්නා යශිරෝ මැඩම්. ඒවා සේරම ආච්චම්මාට. කට අරින්න මේ කැඳ හැන්ද බොන්න."

ඇය සෙමෙන් කට ඇරියා. ඔෂින් කැඳ හැන්දක් පෙව්වා.

"රසයි.... හරි..... රසයි."

"ඔෂින් මට ඔයාට දෙන්නවත් දෙයක් නෑ ඔෂින් මට දුකයි."

"ඇයි දුක් වෙන්නෙ ආච්චම්මා මම පුංචි කාලේ මා බලා ගත්තා. මල්ලිලා නංගිලා බලා ගත්තා. කොච්චර වැඩ කළාද. මේ හැන්දත් බොන්න ආච්චම්මා."

"ඔයා කරුණාවන්තයි."

ඇය කැඳ හැන්ද බීවේ නැහැ.

"ඔයා දැක්කා..... මගේ.... හිත... නි..ද..හස්... ඔෂින්..... ම"

ආච්චම්මාගේ බෙල්ල පැත්තකට වැටුණා.

"අනේ ආච්චම්මා ඇයි මේ.... අම්මා... තාත්තා...."

"ඔෂින් ආච්චම්මා මිය ගියා. දැන් කෑගහලා වැඩක් නෑ."

සකුසො ඔෂින්ට කිව්වා.

ෆුජ් පැත්තකට වෙලා ඇඬුවා.

"ඔෂින් ඔයා ආව එක කොච්චර හොඳද? අන්තිමට ඔයාව දැක්කා. ඔයා අතින් අන්තිම කැඳ උගුරත් බිව්වා. අනේ ජීවිත කාලයම දුකෙන්, බඩගින්නෙන් හිටියේ. මට දුකයි ඔෂින්."

නංගිලා මල්ලිලාත් අඬා වැටුණා.

ලොකු පෙට්ටියක් වේවැල්වලින්ම සාදා ඒ තුළ මිනිය තැන්පත් කර රෙද්දකින් ඒ පෙට්ටිය වැසුවා. ඒ පෙට්ටිය තාත්තා පිටේ එල්ලා ගත්තා. පන්සලේ පූජකවරයෙක් සීනුවක් නාද කරමින් පෙරමුණේ ගියා. ඔෂින්ගේ පවුලේ සියලු දෙනාම තුන්හුලස් කොඩි සහිත කෝටු රැගෙන පිටු පසින් ගියා. සොහොනේදී මිනිය පුළුස්සා අළු කුඩා පෙට්ටියක තබා රැගෙන ආවා. එය නිවසේ තබා හඳුන්කූරු පත්තුකර පවුලේ සියලු දෙනාම ආගම සිහි කරමින් සිටියා.

පසුදින රිකි සමග ආපසු යාමට ඔෂින් සූදානම් වුණා.

"ඔෂින් මේක ඔයාට දෙන්න කිව්වා ආච්චම්මා."

ඔෂින් අතවූ රෙදි කෑල්ල දිග ඇරියා.

"කාසියක්."

"ඔය කාසිය අර ලී මුදලාලිගේ ගෙදරින් එවලා තිබුණේ."

"මේ කාසිය නිසා මම හරි දුකෙන් හිටියේ අම්මා. ආච්චම්මා දුන්න කාසිය මට රැකගන්න බැරි වුණ නිසා. ඒත් ඒක අන්තිමට මටම ලැබුණා. මම මේ කාසිය ප්‍රවේසම් කර ගන්නවා."



රිකි පැමිණි නිසා ඔෂින් අම්මාගෙන් සමුගත්තා.

''අම්මා මම නම් කවදාවත් අඳ ගොවියෙක් වෙන්නේ නෑ. ආච්චම්මා වගෙ අම්මා වගෙ දුක් විඳින්නේ නෑ.''

ඔෂින් ස්ථිර හඬින් කිව්වා. ඒ තීරණය දැඩිව සිතාගෙන ඔෂින් නිවසින් සමු ගත්තා.

# අට

ඒ 1916 වසරය. ජපානයේ ආර්ථිකය දියුණු වෙමින් තිබුණා. ඔෂින් කගායා ආයතනයට සේවයට එන විට ඇය නව හැවිරිදි දැරියක්. තවත් වසර හතක් කාලය ඉගිල ගොසිනි. දහසය හැවිරිදි රූමත් තරුණියක් වූ ඔෂින් දැන් ගෙදර ප්‍රධාන සේවිකාවය. එපමණක් නොව කගායා ආයතනයේ ගනුදෙනු පිළිබඳ කටයුතු ද ඇය අතින් සිදු වේ. ඒ යගිරෝ මහත්මියගේ මඟපෙන්වීම යටතේ ය. මේ කාර්යයන් නිසාම සේවිකාවන් ඇය ඇමතුවේ 'මිස් ඔෂින්' යනුවෙනි. මේ වන විට මෙහි සේවය කරන උමි නම් දොළොස් හැවිරිදි සේවිකාවට මැහුම් වැඩ කියා දෙමින් ඇය ගේ අතීතය සිහිපත් කළා.

"උමි, මම කගායා ආයතනයට එනකොට වයස අවුරුදු 9 යි. ඒ සායෝ (ඔ)බා බලා ගන්න. එතකොට මෙහෙ වැඩ කළ කුමිගෙන් කිකෝගෙන් මම හුඟක් දේවල් ඉගෙන ගත්තා. කුස්සියෙ වැඩ, විවිධ කෑම හදන හැටි, මැහුම් ඔය සේරම ඉගෙන ගත්තා. යගිරෝ මැඩම් මට ලියන්න, ගණන් හදන්න ඉගැන්නුවා. මිස් සායෝ මට පොත්වල අපහසු වචන කියලා දුන්නා. ඒ ඉගෙන ගත් හැම දෙයක් ම මට හුඟක් ප්‍රයෝජනවත් වුණා තේරුණා ද ?"

"ඔයත් මම වගේ හුඟක් දේවල් ආසාවෙන් ඉගෙන ගන්න."

"මිස් ඔෂින් අන්න, හාල් ගබඩාවේ මැනේජර් මහත්තයා ඔයාට කථා කළා."

"හොඳයි."



"ඔෂින්.... ඔෂින්."

මිනෝ ඔෂින් සොයා උයන ගෙට පැමිණියා.

"මැඩම් මිස් ඔෂින් හාල් ගබඩාවට ගියා."

"මොනවා, අරහෙ අමුත්තෝ ඇවිල්ලා. ඔෂින් ගේන්නා ගන්ඩ ඕනෑ. ඔෂින් උයන ගෙයිත් වැඩ. හාල් ගබඩාවේත් වැඩ. හරියට වැඩ වැඩියි නේ."

"උමි ගිහින් ඔෂින්ට එන්න කියන්න. කෝ මිකෝ, ගන්න ඔය රසකැවිලි ටික මට හරි ගස්සන්න."

ඔෂින් උයන ගෙට දුවගෙන ආවා.

"මැඩම් මොනාද ඔය කරන්නේ. අයින් වෙන්න අපි ඕවා හදලා ගන්නම්."

"ඔෂින් ඉක්මනට වෙන කිමෝනාවක් ඇඳගෙන තේ චාරිත්‍රය පවත්වන්ඩ. අමුත්තෝ ඇවිල්ලා. අම්මත් බලනවා ඔයා කෝ කියලා."

"හොඳයි."

ඔෂින් යගිරෝ මහත්මිය පසෙකින් වාඩි වී තේ චාරිත්‍රය පවත්වන්ඩ සූදානම් වුණා. ඇය කෝප්පයකට අමු තේ කොළ දමා උණුවතුර දැම්මා. ඉන්පසු කුඩා බුරුසුවකින් ඒවා කලවම් කළා. ඉන් පසු තේ කොළ එහි අඩියේ තැන්පත් වන තෙක් ඉවසිල්ලෙන් බලා සිටියා. ඒ තේ වෙනත් භාජනවලට දමා එක් එක් අය ඉදිරියේ ආචාර කර පිළිගැන්නුවා.

"මේ තේ චාරිත්‍ර ගැන නම් මම මොනවත් දන්නේ නැහැ. ඒත් ඒක පවත්වන හැටි බලා ඉන්න ආසයි."

සකුරාකිගේ පියා පැවසුවා.

"බොහොම හොඳට කළා. හොඳට පුරුදු කරලා තියෙනවා."

"ඔෂින් දක්ෂයි. එයාට හොඳට මල් සැකසුම් කරන්නත් පුළුවනි."

"ඒ ගැන ඇයට හරිම සතුටයි."

උයන ගෙට ආව මිනෝ ඔෂින්ට කතා කළා. එවිටම මිස් කායෝ එතනට ආවේ චිත්‍ර අඳින උපකරණ ද ඔසවාගෙන.

"කායෝ අදවත් පාසලට යන්නේ නැද්ද ?"

"නෑ අම්මා. මම චිත්‍ර අඳින්න මුහුදු වෙරළට යනවා."

"චිත්‍ර ඇඳලා හරියන්නේ නෑ. කගායා ආයතනය බලාගන්නේ කවුද ?"

"ඇයි සායෝ ඉන්නේ."

"එයාට නෙමේ. ඔයාටයි කගායා ආතයනය අයිති වෙන්නේ. බලන්න ඔෂින් හාල් ගබඩාවෙත් වැඩ, උයන ගෙයි වැඩ සැලසුම් කරන්නෙත් එයා. ඇයි ඔයා ඔෂින් ආදර්ශයට ගන්නේ නැත්තේ."

"අම්මා ඔෂිනුයි මමයි දෙන්නෙක්. සිතුම් පැතුම් වෙනස්. මම ළඟදීම ටෝකියෝ ගිහින් චිත්‍ර කලාව තවත් ටිකක් ඉගෙන ගන්නවා."

"අක්කා මෙහෙ එන්න."

සායෝ කායෝගේ අත අල්ලා ගෙන යශිරෝ මහත්මිය හා අමුත්තන් සිටින තැන පෙනෙන තැනකට ගියා.

"අර ඉන්නේ ඔෂින්ගෙ මනමාලයාගේ අම්මයි තාත්තයි."

"ඇත්ත ද ? ඔයා කොහොමද දන්නේ ?"

"මම අහගෙන ආවචම්මා අම්මා එක්ක කතා කරනවා."

"ඉන්නකෝ මම ඔෂින්ගෙන් අහන්න."

කායෝ ඔෂින් සොයා ගියා.

"ඔෂින් ඇත්තටම ඔයා බඳිනවද අර සකුරාකිව."

"මොකක් ද කිව්වේ ?" ඔෂින් දෙනෙත් මහත් කොට කායෝ දෙස බැලුවා.

"අර ඇවිල්ලා ඉන්නේ ඔයා ගේ මනමාලයාගේ අම්මයි තාත්තයි. සකුරාකි ලා පොහොසත් ව්‍යාපාරිකයෝ. ඒක නෙමෙයි මම අහන්නේ. ඔයා ඒ මිනිහා බඳිනවද ?"



"මිස් කායෝ මම දැනුයි දන්නේ ඒ කවුද කියලාවත් මම දැනගෙන හිටියේ නෑ. යශිරෝ මැඩම් මට තේ චාරිත්‍රය කරන්න කීවා මම ඒක කළා."

"එතකොට ඔයා ඒ මිනිහා බඳින්න කැමතියි නේද ? මට නම් හරිම පුදුමයි. ඇහැටවත් නොදැක්ක කෙනෙක්. මගෙ ආච්චම්මාගේ කැමැත්තට ම ඔයා වැඩ කරන්න එපා. තේරුණා ද ? මම් යනවා."

මිස් කායෝ චිත්‍ර ඇඳීමට මුහුදු වෙරළට ගියා. ඔෂින් එතන සිට ම කල්පනා කළා. ඇයට තේරුම් ගියා ඉක්මනින්ම සැමියෙක් සමග මේ නිවසින් පිටව යාමට සිදුවන බව. එදා සවස මිස් කායෝ නිවසට පැමිණි විට ඔෂින් සුප් කෝප්පයක් රැගෙන කාමරයට ආවා.

"ඔෂින්, ස්තූතියි ඔයාට. මට බඩගිනි වෙලයි හිටියේ. ඔයා දන්නවා මට ඕන දේ නේද ?"

කැසට් යන්ත්‍රයේ ගීතයක් ප්‍රචාරය වුණා. මිස් කායෝ එය අසා සිටියේ අසාවෙන්.

"ඔෂින් මේ අලුත් ම ගීතයක්. හරිම ජනප්‍රිය ගීතයක්."

"එහෙම ද ?"

"ඒක නෙමේ. මං ඔයාට දුන්න පොත් දෙක කියෙව්ව ද ?"

"වෙලාවක් තිබුණේ නෑ මිස් කායෝ."

"ඔව් ඉතිං ඔයා හාල් ගබඩාවට දුවනවා. එතනින් උයන ගෙට දුවනවා. ඕක තමයි ජීවිතේ."

"ඉතිං මම උයන ගෙට යන්නේ ඔයාලට රසට කෑම උයන්න නේ."

"එතකොට හාල් ගබඩාවට යන්නේ ?"

"ඒ යශිරෝ මැඩම්ට උදව් කරන්න නේ."

"ඕකද ජීවිතේ මෝඩයෝ. ගැහැණු මුලදී හිරු වගේ. පස්සෙ සඳ වගේ. අපේ අයිතිවාසිකම් රැකගන්න අපි සටන් කරන්න ඕනේ. හැමදාම මිනිස්සුන්ට යටත් වෙලා ඉන්න බෑ. අර පොත් කියවන්නකෝ. ඒවල හොඳට විස්තර කරලා තියෙනවා."

"මටත් කියන්නෙ ඕක කියවලා සටන් කරන්නද ?"

ඔෂින් හිනැහෙමින් ඇසුවා.

"ඇයි අපිට අපි වෙනුවෙන් සටන් කරන්න බැරි. ඔයා අනුන් කියන දේවල් කරන්න එපා."

"මිස් කායෝ මට ඉරු සඳු නොවුනට දුප්පත් වෙන්න නම් ආසා නෑ. මගෙ ආච්චම්මා මැරෙනකම්ම දුක් වින්දා. මගෙ අම්මා තාමත් දුක් විදිනවා. මිස්ට සකුරාකි මට හොඳ වැඩියි. මම අද ගොවියෙක්ගෙ දුවක්. ඔන්න ඔහොමයි මම හිතන්නේ."

"මම නම් හිතුවේ ඔෂින් බුද්ධිමත්, දක්‍ෂයි කියලා."

"හැමදෙනා ම වෙනස් මිස් කායෝ."

"හැබැයි මම නම් ඔය වැඩිහිටියෝ කියන විදිහට බඳින්නේ නෑ. මම යනවා ටෝකියෝ. චිත්‍ර ශිල්පිනියක් වෙන්න."

"එතකොට කගායා ආයතනය ?"

"ඔන්න ඔෂින් ආච්චම්මා වෙන්න හදනවා."

"ඒ වුණාට කගායා ආයතනයට මිස් කායෝ ඕනෑ."

"ඕවා මෝඩ අදහස්."

මේ සියල්ල අසා සිටි මිනෝ යශිරෝ මැඩම්ගේ කාමරයට ගියා.

"කායෝ එන්න එන්නම මුරණ්ඩු වෙනවා අම්මා."

"මිනෝ දැන කරන්න තියෙන්නේ කායෝත් විවාහ කරලා දෙන එක. මං ඒ ගැනත් කල්පනා කළා. බිටෝ පවුලේ දෙවන පුතා ගැන. ඒ ගොල්ලන් පරම්පරාවෙන් ම වැදගත් පෝසත් මිනිස්සු."

"ඒත් කායෝ අකමැති වුණොත්?"

"ඒක මං බලාගන්නම්. මිනෝ ගිහින් කායෝට එන්න කියන්න."

"කායෝ කායෝ" මිනෝ කාමරයක් පාසා කායෝ හෙව්වා. ඇය උයන ගෙට ගියා. ඔෂින් සේවිකාවනට යම් යම් වැඩ පවරමින් හිටියා.

"ඔෂින්."

"එනවා මැඩම්."



"කෝ මිස් කායෝ දැක්කේ නැද්ද ?"

"මට හිතෙන්නේ චිත්‍ර අඳින්න මුහුදු වෙරළට ගියා."

"අනේ ඔෂින් ඔයා ඉක්මනට ගිහින් කායෝ එක්කගෙන එන්න. අරහෙ අම්මා කායෝ එනකම් බලාගෙන. මට තමයි ඉවගෙන් බැනුම් අහන්න වෙන්නේ."

"හොඳමයි."

ඔෂින් අත් පිස්නාවෙන් අත පිස දමා ගොතා සෙරෙප්පු කුට්ටම දමාගෙන මුහුද පැත්තට දුවලා ගියා. ඔෂින් දැක්කා වෙරළ අයිනේ කායෝ චිත්‍ර අඳින හැටි. ඔෂින් සෙමෙන් එතනට යන්න ගියා. ඒත් එකවරම තරුණයෙක් ඇයව තදින් අල්ලා ගත්තා. ඔෂින්ගේ අත් දෙකත් ඔහුගේ අත්වලට තද වී තිබුණා. ඔහු ඔෂින්ගේ කණට කර කතා කළා.

"බයවෙන්න එපා මිස්. මං පස්සේ පොලිසිය පන්නනවා. අපි පෙම්වතුන් වගේ මෙහෙම ටික දුරක් යමු. අනේ කරුණාකරලා කෑගහන්න එපා."

පසු පසින් දිව ආ පොලිස් නිලධාරීන් මවුන් පසුකර ඉදිරියට ගියා. ඔෂින් බියෙන් ගැහෙමින් හියා නොමෙයි ඇගේ දෙපා ඉදිරියට යැවුණා. ඔවුන් එසේ ගියේ කායෝ ඉන්න තැනටයි. එකවරම කායෝ හැරී බැලුවා.

"ඔෂින්, ඔය මොකද ? මම දැනගෙන හිටියේ නැහැනේ ඔයාට පෙම්වතෙක් ඉන්නවා කියලා."

මේ වෙලාවේ ඔෂින් අත්දෙක නිදහස් කරගෙන තරුණයා තල්ලු කරලා දමා කායෝ ළඟට දුවගෙන ආවා.

"මේ මිනිහා මාව අල්ලා ගත්තා."

ඇය කීවේ තරුණයාට රවමින්.

"සමාවෙන්න මිස්. මට පොලිසියෙන් බේරෙන්න තිබුණ එකම ක්‍රමය නිසයි මම එහෙම කළේ. ඒ ගැන මට සමාවෙන්න."

ඔහු කායෝගේ චිත්‍රය දෙස බලාගෙන කිව්වා.

"ඔයා ද මිස් මේ චිත්‍රය ඇන්දේ?"

Rangika

"ඔව්, මම."

"මුහුදේ තියෙන පාළු ගතිය මේ චිත්‍රයේ තියෙනවා. හරි අපූරුයි."

"ස්තුතියි ඔබට. මම කායෝ. මේ ඉන්නේ ඔෂින්. අපේ ගෙදර වැඩට. හැබැයි අපි දෙන්නා සහෝදරියො වගෙ හරිම යාළුයි."

"මොකක්ද ඔයාගේ නම?"

"මම යශුඩා. මම ව්‍යාපාරිකයෙක්."

"එහෙනම් ඇයි පොලිසියෙන් ඔයා පස්සේ පන්නන්නේ."

"ඒ වැරදි තොරතුරු වගයකට රැවටිලා. කොහොමත් මේ මිස්.... මිස් ඔෂින් නිසා මම ලොකු කරදරයකින් බේරුණා. මට සමාවෙන්න, ඔයාට බොහොම ස්තුතියි. මම යන්නම්."

"ඒත් ඔයා තනියම යන්න එපා. ඉන්න මාත් එන්නම් ඔයා එක්ක."

"පොලිසිය ආපිට ආවොත්."

"මිස් කායෝ අන්න යශිරෝ මැඩම් ඔයාට කතා කරනවා."

"ඔෂින් ගෙදර යන්න."

"මිස් කායෝ ඔයා කොහෙද ඔය යන්න හදන්නේ. මේ මිනිහා හොරෙක්ද මිනීමරුවෙක්ද දන්නෙත් නැතිව."

"නෑ, එයා එහෙම කෙනෙක් වෙන්න බෑ. බලන්න කිසි කෙනෙක් මගෙ චිත්‍රයක් ගැන කතා කරලා නැහැ. මිස්ට යශුඩා තමයි මගෙ චිත්‍රයක් හොඳයි කියපු එකම එක්කෙනා. මම දන්නවා ඔයාට හොඳ කලාකාමී හදවතක් තියෙනවා. ඉන්න මම ඔයාට උදව් කරන්නම්. අපි යමු."

කායෝ තරුණයාගේ අත අල්ලා ගත්තා.

"මිස් කායෝ."

ඔෂින් බියෙන් කෑගැහුවා.

"ඔෂින් ඔයා ගෙදර ගිහින් කියන්න මම එන්න පරක්කු වෙනවා කියලා."



මේ අතර ඔෂින් චිත්‍ර උපකරණ හා චිත්‍ර රැඳවුම උස්සා ගත්තා. ඔවුන් පිටුපස දුව ගියා. ඔවුන් ගියේ තානායමට. තානායම ළඟදී යශුඩා කතා කළා.

"එහෙම නම් මිස්ලා දෙන්නා ආපිට යන්ඩ. මිස් ඔෂින් මම ඔයාව බය කළා නේද ? ඔයා තාමත් ඉන්නේ බයෙන්. ඒ ගැන මට සමාවෙන්න."

මේ අතර කායෝ කතා කළා.

"මිස්ට යශුඩා ඔයාට ආයිම උදව් ඕනෑ වේවි. මෙන්න අපේ දුරකථන අංක කාඩ් එක. කතා කරන්න මම බලාගෙන ඉන්නවා. නැවත හමුවෙමු."

ඔෂින් මිස් කායෝ ඇදගෙන ගියා.

"ඔෂින් එයා නම් ලොකු වෙළෙන්දෙක්."

"වෙළෙන්දෙක් නෙමෙයි හොරෙක්."

"මොනවද ඔය කියන්නේ. වැදගත් මිනිස්සුන්ට එහෙම කතා කරන්න එපා."

"වැදගත් නිසාද පොලිසියෙන් පැන්නුවේ. මට නැගෙන්වයි තිබුණේ."

"එයාට මේ චිත්‍රයේ කලාත්මක බව තේරුණා. ඔයාට මේවා තේරෙන්නේ නෑ ඔෂින්."

නිවසට යනතෙක්ම ඔෂින් කිසිවක් කතා කළේ නැහැ. කමුත් ඇය හිටියේ කේන්තියෙන්. ඒත් කායෝ හිටියේ අමුතුම සතුටකින් පිබිදීමකින්. මේ අහඹු සිද්ධිය ඔෂින්ගේ මෙන්ම කායෝගේත් අනාගතයේ ජීවිතවලට විශාල බලපෑමක් ඇති කරන බව ඔවුන් දැන සිටියේ නැහැ.

"කායෝ කොහේද ගියේ ?"

"මම ඉර බහිනව අඳින්න ගියා."

"චිත්‍ර ඇන්දට කමක් නැහැ. දැන් එයත් විවාහ කර දෙන්නයි අපේ කල්පනාව."

"මම දැන්ම විවාහ වෙන්න කැමති නැහැ."

"එහෙම කියලා බැහැ. අපටම ගැලපෙන පවුලකින් අපි දැනටමත් කතා බහ කරලයි ඉන්නේ."

"ඇයි මගේ ජීවිතයට අනවශ්‍ය විදිහට ඇඟිලි ගහන්නේ."

"පුදුම කතාවක්නේ. අපි ඔයාගේ වැඩිහිටියෝ."

යශිරෝ මහත්මිය කිවේ කෝපයෙන්.

"අනිත් එක කගායා ආයතනය ඔයා භාරගන්න එපැයි."

"නෑ ඒක සායො ලොකුවෙලා බලා ගනියි. මට බෑ එහෙම වගකීම භාරගන්න."

කායෝ ඔෂින් සොයා උයන ගෙට ගියා.

"ඔෂින්, මට රසට කෑම ටිකක් හදලා දෙන්න පුළුවන් ද ?"

"ඇයි මිස් කායො කොහේ හරි චිත්‍ර අඳින්න යනවද ?"

"නෑ මේක යශුඩාට."

කායෝ කිවේ වට පිට බලමින්.

"අර මිනිහාට ?"

ඔෂින් විමතියෙන් කායෝ දෙස බැලුවා.

"එයා හොරෙක් නෙමෙයි."

"එහෙනම් පොලිසියෙන් පැන්නුවේ."

" කියන එක කරන්න. ඉක්මනට කෑම ටිකක් හදලා දෙන්න."

ඔෂින් අකමැත්තෙන් නමුත් රසට කෑම වර්ග කීපයක්ම හැදුවා. කායෝ කෑම පෙට්ටිය ගත්තේ,

"ස්තූතියි ඔෂින්. හැබැයි කාටවත් කියන්න එපා." කියමින්

කායෝ ඉක්මනින් යශුඩා නතරව සිටි තානායමට ගියා. ඇය සීනුව නාද කළ විට කාන්තාවක් එළියට ආවා.

"සමාවෙන්න, මෙහෙ ඉන්නවද යශුඩා කියලා මහත්තයෙක්."

"ආ ඔව්, හතරවෙනි කාමරේ."



"ස්තුතියි." කායෝ ඇයට හිස නමා කාමර අංක 4 සොයා ගොස් කාමරයේ දොරට තට්ටු කළා.

"කවුද ?"

"මම කායෝ. අර මුහුදු වෙරළේ දී මුණ ගැහුණේ."

යශුඩා කාමරයේ දොර හැර ඇය ඇතුළට පැමිණි පසු දොර වසා දැමුවා.

"මම ඔයාට කෑම ටිකක් ගෙනාවා."

"අපරාදේ මම දැන් කෑම කෑවා විතරයි."

"ඒත් මේවා රසයි. මම ඔෂින්ට කියලා හදවා ගත්තේ."

ඇය යශුඩා ලියමින් සිටි මේසයේ පොත් වලට එබුණා.

"ඔයා දේශපාලන පොත් කියවනවා නේද ? එහෙනම් ඔයා දේශපාලන ශිෂ්‍යයෙක්."

"නෑ මම වෙළෙන්දෙක්."

"වෙළෙන්දෙක් ළඟ මේ පොත් නැහැ. මමත් මේ සමහර පොත් කියවලා තියෙනවා. ඒවා කියවන විට කාන්තා නිදහස ගැන ලිපිත් මම වරින් වර කියවනවා. මමත් කැමතියි ගෙදරින් නිදහස් වෙන්න."

"මොකක්ද ඒකෙන් ඔයා අදහස් කරන්නේ?"

"උදාහරණයක් කියන්නද. අපේ ගෙදර ඉන්න ඔෂින් විවාහ කර දෙන්නයි මගෙ ආච්චම්මා ලෑස්ති වෙන්නේ. ඔෂින්ගේ කැමැත්ත බලන්නේ නැහැ. මම නම් ඒවට විරුද්ධයි. ඇයි අපේ අනාගතය ගැන තීරණ ගන්න අපට නිදහසක් තියෙන්න ඕනේ."

"ඒ වුණාට දෙමාපියෝ දරුවන්ට නරකක් කරන්නේ නැහැනේ."

"ඒත් එයාලා අපේ නිදහස නැති කරනවා."

"ඔෂින් විවාහයට කැමති වෙලා තියෙන්නේ එහෙම නම් ?"

"මම ඔෂින්ට වඩා වෙනස්. එයා වගේ නෙමෙයි. මම විවාහ වෙන්නේ මට කැමති කෙනෙක් එක්ක. අම්මලා බල කළාට මම විවාහ වෙන්නේ නෑ."

"මිස් කායෝ මම දැන් එළියට යන්න ඕනෑ. ඔයා ආපිට යන්න."

"මමත් ඔයා එක්කම යන්නම්."

"නැහැ ඒක හරි නැහැ. ඔයා යන්න."

සවස හාල් ගබඩාවේ සේවකයෙක් ඔෂින් සොයා ආවා.

"මිස් ඔෂින්ට ෆෝන් කෝල් එකක්."

"මට ද ? මට වෙන්න බෑ."

"නෑ මිස් ඔෂින්ව තමයි ඇහුවේ. එන්න පරක්කුයි."

මිස් යශිරෝ එතනට පැමිණියා.

"යන්න ඔෂින් ගිහින් බලන්න කවුද ? මොනවට ද කියලා."

"හොඳමයි."

ඔෂින් ඒප්‍රණය ගලවා හාල් ගබඩාවට ගියා.

ඇය ශ්‍රවණ උපකරණය කනේ තබා ගත්තා. ඉදිරියේ වූ කථන උපකරණය දෙස බලාගෙන කතා කළා.

"මම, ඔෂින් ඔය කවුද කතා කරන්නේ....?"

"මම යශුඩා, ඔයාලට මුහුදු වෙරළේ දී මුණ ගැහුණේ. මතකයි නේද ? මට ඔෂින්ව මුණ ගැහෙන්න ඕනෑ. මුහුද ළඟට එන්න හතරට, මම බලාගෙන ඉන්නවා. මිස් කායෝට කියන්න එපා."

"මේ... හලෝ.... මේ.."

එහා පැත්තේ දුරකථනය විසන්ධි වුණා.

ඔෂින් කල්පනා කරමින් නිවස තුළට ආවා. යශිරෝ මහත්මිය ඇය එනතෙක් බලාගෙන හිටියා.

"කවුද ? ඔෂින්."

"මේ අඳුරන එක්කෙනෙක් මැඩම්. ශිෂ්‍යයෙක්."

"ඔයා අපේ දුරකථන අංකය දුන්නද ?"

"නෑ මැඩම්."

"මොනාද එයා කියන්නේ."



"මට මුණ ගැහෙන්න එන්නලු."

"හොඳයි මුණ ගැහිලා එන්න. ඉක්මනට ආපිට එන්න."

"හොඳමයි."

ඔෂින්ගෙ හිත නොසන්සුන්. යශුඩා නිසා ඇයගේ නිස්කලංක ජීවිතය අවුල් වෙලා. එයා මොකටද මට එන්න කියන්නේ. සමහර විට මිස් කායෝටයි එයාටයි උදව් කරන්න කියලා කියන්න වෙන්න ඇති. මැඩම්ලා දැනගත්තොත් මැඩම්ලට බොරු කියන්න වෙනවා. අනේ දෙවියනේ මම එහෙම වංචා කරලා නැහැනේ කවදාවත්."

ඔෂින් හිත කලබලෙන් සවස හතරට පාරට බැස්සේ මිස් කායෝ නිවසේ සිටිනවාදැයි බැලීමෙන් පසුවයි. කායෝ නිවසේ සිටියෙත් නැහැ.

ඔෂින් ටික දුරක් යන විටම මඟ සිටි යශුඩා ඇයට එක්වූවා. ඔහු තොප්පියක් පැළඳ මුහුණෙන් අඩක් වැසෙන සේ කබායේ කොලරය උස්සා තිබුණා. ඔෂින්ට සමීපව ගමන් කළා.

"ඔෂින්, එදා වගෙම මොනවත් නොහිතා යන්ට ඉඩ දෙන්න."

"ඇයි මිස්ට යශුඩා මට කරදර කරන්නේ. කවුරුත් කවදාවත් මට දුරකථන ඇමතුම් දීලා නැහැ. මැඩම්ට බොරු කියන්නත් සිද්ධ වුණා."

"මට සමාවෙන්න ඒ ගැන. ඔෂින් මට ඔයාගෙන් උදව්වක් අවශ්‍යයි."

"මම දන්නවා ඒක."

"මොනවද ඔයා දන්නේ ?"

"ඔයා මිස් කායෝ රවටාගෙන. ඔය දෙන්නට උදව් කරන්නද මට කියන්නේ."

"නැහැ ඔෂින් එහෙම දෙයක් අපි අකර නැහැ."

"නැත්තේ මොකද ? මිස් කායෝ කෑම හදාගෙන මිස්ට යශුඩා හමුවෙන්න යන්නේ නැද්ද ?"

"ඔය මිස්ට කැල්ල ඕනෑ නෑ. ඔයා මට කෝටා කියන්න. ඒ තමයි මගෙ හිතේෂියන් කතා කරන විදිහ."

"මම ඔයාගේ හිතේෂියෙක් නෙමෙයි. මේ ගමන් මට මහ කරදරයක්."

"එහෙම ඔයාට කරදර කරන්න හිතුණේ ඔයා ගැන විශ්වාස කළ නිසයි. මේ අහන්න ඔමින් මම වෙළෙන්දෙක් නෙමෙයි. මම ශිෂ්‍යයෙක් නෙමෙයි. මම විප්ලවකාරයෙක්."

"විප්ලව....."

ඔමින්ට එකවරම සංසකු මාමා මතක් වුණා.

"මොකද ඔමින් ගැස්සුණේ ? බය වෙන්න එපා."

"නෑ."

"අපි විප්ලව කරන්නේ අද ගොවියන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන්. බලන්න ගොවියෝ දුක් විඳලා වගා කරනවා. ලැබෙන්නේ අස්වැන්නෙන් තුනෙන් එකයි. ඉඩම් හිමියා හැමදාම පොහොසත්. අද ගොවියා දුකෙන්. බඩගින්නෙන් ණය බරින් ඉඩම් හිමියාගෙ වහලෙක් වගෙයි. අපි රජයට කියන්නේ ගොවියාට අස්වැන්නෙන් තුනෙන් දෙකක්ම දෙන්න කියලයි. ඒකට නිකම් හඬ නැගුවට ගණන් ගන්නේ නැහැ රජය. ඒක නිසා වෙනත් ක්‍රියාමාර්ග ගන්නේ. දැන් තේරුණා ද ඔමින්."

"ඔව්, මගේ පියත් අද ගොවියෙක්. ආච්චම්මාට ඇති වෙන්න කන්න දෙන්න තිබුණේ නෑ. නැති බැරි කම නිසාම මගේ පුංචි නංගි වෙන පවුලකට හදා ගන්න දුන්නා. හැමෝම හැමදාම හිටියේ බඩගින්නේ. හාල් මලු පහක වැටුපට මම පුංචි කාලේම බබෙක් බලාගන්න මෙහෙ ආවා."

"මම ඔය විස්තර ටිකක් දන්නවා ඔමින්. ඉතින් මට හිතුණා ඔයාගේ පියා අද ගොවියෙක් නිසා මම මේ කියන කරුණු ඔයා තේරුම් ගනියි කියලා. හැබැයි ඔමින් මගෙ පියා නම් ඉඩම් හිමියෙක්. ඒ ඉඩම් හිමියාගෙන් සල්ලි අරගෙන මම ඉඩම් හිමියන්ටම විරුද්ධව විප්ලව කරනවා."

දෙන්නාම හිනැහුණා.

"මොකක්ද ඕනෑ කිව්ව උදව්ව."



"ඔමින්, මම ඉන්නේ කොහේද කියලා මගෙ දෙමාපියෝ දන්නේ නැහැ. ඒක මගෙ නිදහසට බාධාවක්. මට මුදල් ටිකක් අවශ්‍යයි. මට ඔයාගේ නමට ඒක ගෙන්වා ගන්න ඕනෑ. අද හෙටම ඒක ලැබෙයි. ඒක මගෙ කාමරයට ගෙනත් දෙන්න පුළුවන් ද ? මේ කිසි දෙයක් මිස් කායෝට කියන්න එපා. මම ඔමින් හැර වෙන කිසිම කෙනෙක් විශ්වාස කරන්නේ නැහැ. වැඩි වෙලාවක් මෙහෙම මට ඉන්නත් බැහැ. ඔයා දන්නවනේ පොලිසිය මා පිටුපස පන්නන බව. අනිත් එක මම දන්නවා මම ඔයාට කරන්නේ කරදරයක් බව. ඒ ගැන මට අනේක වාරයක් සමාවෙන්න. එහෙම නම් ඔයා ආපිට යන්න ඔමින්. මම නවතින්නම්."

කෝටා ඔමින්ට ආචාර කළා. ඔමින් ප්‍රතිආචාර කළා.

ඔමින් නිවසට යනතෙක් කල්පනා කළේ, දැන් තැපැලෙන් මුදල් ආවාම මොනවද මම මැඩම්ට කියන්නේ. අනේ ලොකු මැඩම්ට බොරු කියක් කියන්නද ? ඔමින්ට දැඩි හිසරදයක් දැනෙන්නට වුණා. ඇය නිවසට පැමිණි ගමන් ම කාමරයට වී මෙට්ටය මත වැතිරුණා. ඒත් ටිකකින් සේවිකාවක් පැමිණ

"මිස් ඔමින්, මිස් ඔමින් ලොකු මැඩම් ඔයාට කතා කරනවා."

ඔමින් ලොකු මැඩම්ගෙ කාමරයට ගියා.

මම ඇත්ත කියනවා. කෝටාගෙ නමවත්, එයා විප්ලවකාරයෙක් කියලාත් කියන්නේ නෑ.

ඔමින් තමාටම කියා ගත්තා.

ඔමින් යශිරෝ මහත්මියට ආචාර කර තනම් පැදුරේ වාඩි වුණා.

"ඔමින් අසනීපෙන් ද ?"

"මැඩම් මගෙ හිස කකියන්න පටන් ගත්තා. දැන් හොඳයි. පොත්වල ගණන් හදන්න පුළුවනි."

"නෑ මම  ඔයාට එන්න කිව්වේ ඔයාගේ ගමන ගැන අහන්න. කීකි ශිෂ්‍යයා මුණ ගැහුණා ද ?"

ඔමින්ගේ හදවත ගැහෙන හඬ ඇයටම ඇහුණා.

"ඔව් මැඩම්."

"එයා උදව්වක් ඉල්ලනවා නේද ?"

ඔෂින් පුදුමයෙන් යශිරෝ මහත්මිය දෙස බැලුවා.

"කියන්න මොකක් එයා ඉල්ලන උදව්ව. එයා මුදල් ඉල්ලනවද?"

ඔෂින් සෙමෙන් කතා කළා.

"මැඩම් එයාට තාත්තා මුදල් එවනවලු. ඒ මුදල් මගෙ නමට ගෙන්වලා දෙන්න බැරි ද ඇහුවා."

"ඇයි එයාගෙ ලිපිනය."

"එයා වරින් වර යාළුවන්ගේ ගෙවල්වල ලු ඉන්නේ. ස්ථිර පදිංචියක් නැති නිසාලු."

ඔෂින් සියල්ල කීවේ බිම බලාගෙන.

"හොඳයි ඔෂින් එහෙම නම් මේ වාරයට පමණක් මුදල් ගෙන්වලා දෙන්න. හැබැයි නැවත එහෙම කරන්න බැහැ කියන්න. ඔයා දැන් විවාහ වෙන්න ඉන්න කෙනෙක්. ඔය වගේ වැඩ කරන එක ඔයාට හොඳ නෑ. තේරුණා ද ? ඔෂින්."

"හොඳමයි."

"හොඳයි දැන් කාමරයට ගිහින් තව ටිකක් විවේක ගන්න."

'මට මැඩම්ට බොරු කියන්න සිද්ධ වුණා.' ඔෂින්ගේ ඇස්වල කඳුළු පිරුණා.

"ඔෂින් එන්න මගේ කාමරයට."

කායෝගේ කාමරය තුළින් ඇයගෙ කටහඬ ඇසුණා.

"ඔෂින් ඔයා කොහෙද ගියේ. මම ඔයාව හෙව්වා. ආච්චම්මා කිව්වා ඔයා ගමනක් ගියා කියලා."

"මම එළියට ගියා මිස් කායෝ."

"බලන්න මේ චිත්‍රය හොඳයි ද කියලා."

කායෝ ඔෂින්ගේ උරහිසින් අල්ලා ගෙනැවිත් චිත්‍රය නිරාවරණය කළා.

මුහුදු වෙරළක්. ඉර බැස යනවා. මුහුද දෙස බලා සිටින පිරිමි රුවක්.



"ලස්සනද කියන්නකෝ."

"ලස්සනයි."

"මම මේ දවස් ටිකේම මහන්සි වුණා මේ චිත්‍රය ඉවර කරගන්න. දන්නවද ඔෂින් මම මේ චිත්‍රය ඇන්දේ තෑගි දෙන්න."

"තෑගි දෙන්න ? කාටද ?"

"ඔය පින්තූරයේ ඉන්න එක්කෙනාට."

"මෙයා කවුද ?"

"ඔය ඉන්නේ යශුඩා. ඔයාට මතකනේ මුහුදු වෙරළේ දී අපට මුණ ගැහුණේ."

"ආ... ඔව්, ඔව්..."

කායෝ පින්සල රැගෙන පාට තවරා චිත්‍රයේ අඩුපාඩු සකස් කරන විට ඔෂින් එතැනින් මැකැරුව ගියා.

පසුදිනම ඔෂින් නමට තැපෑලෙන් ලිපියක් ලැබුණා. ඔෂින් වෙව්ලන දෑතින් ලිපිය ගත්තා.

"ඔෂින් මේ මුදල් ගිහින් දෙනවද ? නැත්නම් අර ශිෂ්‍යයා මෙහෙේ එනවද ?"

"නෑ, මැඩම් මම මේක එයාට දීලා එන්නද ?"

"හොඳයි දීලා එන්න. හැබැයි මතක ඇතිව කියන්න ආයිම මෙහෙම මුදල් ගෙන්වන්නයි ගිහින් දෙන්නයි බැහැ කියලා."

"හොඳමයි මැඩම්."

ඔෂින් යශිරෝ මහත්මියට ආචාර කර ලිපිය කිමෝනාව තුළ රඳවාගෙන එළියට ගියා. ඉක්මනින්ම ඇය කෝරා සිටි තානායමට ගියා. පුංචි සීනුව නාද කළා. කාන්තාවක් එළියට ආවා.

"මිස්ට යශුඩා මුණ ගැහෙන්න."

"ආ ඔයා ඔෂින් ද ? අන්න යශුඩා මහත්තයා කාමරේ ඉන්නවා. යන්ඩ."

ඇය කාමරය ළඟ නතරව දොරට තට්ටු කළා.

"කවුද ?"

කාමරයෙන් කෝටාගේ කලබලකාරී හඬ ඇසුණා.

"මම ඔෂින්."

"ඔෂින්, ඉන්න මම ඉක්මනට දොර අරින්නම්."

ඇරුණ දොරින් එළියට පැමිණි කෝටාට ඔෂින් ආචාර කළා. කෝටාත් පෙරලා ආචාර කළා.

"එන්න ඔෂින් ඇතුළට."

"බැහැ. මෙන්න ඔයාගේ ලිපිය."

ඔෂින් කිමෝනාව තුළින් ගත් ලිපිය කෝටාට දිගු කළා.

"ඔෂින් කරුණාකරලා ඇතුළට එන්න."

කෝටා ලිපිය අතට ගත්තේ ම නැහැ. ඔහු දෙස මොහොතක් බලා සිටි ඔෂින් සෙමෙන් කාමරය ඇතුළට ගියා.

"ඔෂින් මම දොර වහන්නම්. ඔයා දන්නවනේ මම ඉන්නේ හැංගිලා බව."

ඔෂින් හිස වැනුවා.

"වාඩිවෙන්න ඔෂින්."

කෝටා කුඩා ස්ටූලයක් ගෙනවිත් තිබ්බා. මේසය මත විශාල පොත් කිහිපයක්. කොළ රැසක් බිම වැටී තිබුණා. ඔෂින් හිස කරකවමින් කාමරය නිරීක්ෂණය කළා.

"මම ඉක්මනට යන්න ඕනෑ. මෙන්න ඔයාගේ ලිපිය."

එවරත් කෝටා එය අතට ගත්තේ නෑ.

"ඔෂින් ඔයා දෙවෙනි වරටත් උදව් කළා. මම කවදාවත් මේ උදව්ව අමතක කරන්නේ නෑ. ඔෂින්, එදා අප අතර ඇති වුණ සිද්ධිය, ඒක මට අමතක කරන්න බැහැ ඔෂින්."

"ඔෂින්."

මෙවර කෝටාගේ හඬ ඔෂින්ට ඇසුණේ කණ ළඟින්මයි.



"ඔෂින් මාව විශ්වාස කරන්න."

කෝටා ඔෂින්ගේ අත් දෙක අල්ලා නැගිට්ටවා ගත්තා.

"ඔෂින්, මම ඔයාට ආදරෙයි ඔෂින්."

කෝටා ඔෂින්ගේ දෑත් සිප ගත්තා. ඔෂින්ගේ දෑත් වෙව්ලලා ගියා. දාඩිය දැම්මා. ඇඟ පණ නැති වෙලා ගියා වගේ ඔෂින්ට දැනුණා.

"කියන්න ඔෂින්, මොකවද මම ගැන හිතන්නේ?"

කෝටා ඔෂින්ගේ ඉණ වටා අත යවා ඇය තුරුළු කර ගත්තා.

"ඒත්... ඒ... ත්......"

"මොනවත් කියන්න එපා ඔෂින්. අපි එදා හමුවුන දවසේ ඉඳලා හිතින් දහස්වාරයක් ඔයාව මෙහෙම තුරුළු කර ගෙන හිටියා. ඒ වෙලාවට මට හිතෙනවා මම සැබෑ විප්ලවකාරයෙක් ද කියලා. මමත් මනුස්සයෙක් නේ ඔෂින්. එදා මම ඔයාව මෙහෙම තුරුළු කර ගත්තේ පොලිසියෙන් බේරෙන්න. ඒත් අද මම ඔයාව තුරුළු කර ගත්තේ මගේ හිතේ තියෙන ආදරේ උණුසුම ඔයාට දැනෙන්න. ආදර වචන මම ඒ තරම් දන්නේ නැහැ ඔෂින්. ඒත් ඔයා මට ආදරෙයි නම් මම ඔයාව විවාහ කර ගන්නවා ඔෂින්."

"එතකොට ඔයාගේ විප්ලවය."

"ඔව්, ඔෂින් මම හොඳටම දන්නවා ඔයා වගේ කෙල්ලෙක් විවාහ කර ගත්තත් මගේ විප්ලව කටයුතු කරගන්න බාධාවක් නොවන බව. කියන්න ඔෂින් ඔයා මගෙ යෝජනාවට කමැති ද ?"

කෝටා ඔෂින්ගේ මුහුණ දෑතින් ම අල්ලා උඩට ඔසවා ගත්තා. ඔෂින්ගේ නෙත් කෝටාගේ මුහුණ මත රැඳුණා. ඒ මුහුණ සතුටින් පිරිලා. ඒ දෑස දෙස බලන්න බැරුව ඔෂින් දෑස් පියා ගත්තා.

"ඔෂින්, අපි ඉක්මනට විවාහ වෙමු. මම අද හෙටම මෙහෙන් යනවා. ඒ වුණාට ඉක්මනට ආපිට එනවා. අපි ඔයාගෙ ගමටම ගිහින් විවාහ වෙමු."

ඔෂින්ගේ තලල් තලයට කෝටාගේ දෙතොලේ උණුසුම දැනුණා.

කෝටා ඔෂින්ව ග්‍රහණයෙන් මුදා හැර ඔෂින්ගේ දෑතම අල්ලා

Rangika

මෙතෙක් අතේ පොඩි වූ ලිපිය ඔෂින් කෝටාට දුන්නේ විලිබර සිනාවකින්.

"ස්තූතියි කළ උදව්වට. මම ආයිම ඔයාට කරදර කරන්නේ නැහැ."

"ඔයාගේ ඇඳුම් තියෙනවා නම් දෙන්න මම සෝදලා ගෙනැත් දෙන්නම්."

"නෑ, ඔෂින් මම අද හෙටම යනවා නේ. ස්තූතියි ඔයා එහෙම උදව් කරන්න හිතුවට."

"එන්නම්." ඔෂින් හිස නැමුවා. කෝටාත් හිස නමා ආචාර කළා.

ඔෂින් පාර දිගේ ගියේ සිහිනයකින් පාවී යනවා වගේ සැහැල්ලුවෙන්.

'මොකක්ද මේ අමුතු සතුට, හැඟීම' ඇය හිතන්න පටන් ගත්තා.

"මිස් ඔෂින් අන්න ඔයා ගේ අම්මා ඇවිල්ලා."

ඇය නිවසට යන විට උමි කිව්වා.

"කෝ කොහේ ද ?"

"අන්න ඔයාගේ කාමරයේ ඉන්නවා."

"ඇයි අම්මා ගෙදර කරදරයක් ද ?"

"ඔෂින්, මාව ගෙන්නුවේ යගිරෝ මැඩම්. මට රිකි අතේ ගමන් ගාස්තු යවලා තිබුණා. ඉතින් මට හරි සතුටුයි ඔෂින් ඔයා විවාහ වෙන බව දැන ගත්තාම. මැඩම් මට සේරම විස්තර කිව්වා."

ඔෂින්ට එකවරම මතකයට ආවේ කෝටා. එතකොට කෝටාට වූ පොරොන්දුව. කෝටාගේ ප්‍රාර්ථනාව.

"ඇයි ඔෂින් දුකෙන් වගේ. ඔයා හුඟක් සතුටු වෙන්න ඕනෑ. ඔයා එදා කිව්වා ඔයා කවදාවත් අඳ ගොවි බිරිඳක් වෙන්නේ නෑ කියලා. ඉතින් ඔයා ව්‍යාපාරික බිරිඳක් වෙන්නයි යන්නේ. මම දන්නවා ඔයා හරිම වාසනාවන්තයි දුව."

"නෑ අම්මා මේ මැඩම තේරුව කෙනෙක්. මට බඳින්න බෑ කියන්න අම්මා."

"ඔෂින් මොනවද මේ කියන්නේ."



"මට දැන්ම බඳින්න බැහැ අම්මා."

"ඇයි ඒ බව මැඩම්ට නොකීවේ. මේ සේරම සූදානම් කරලා තියෙද්දී ඇයි එහෙම කියන්නේ. විවාහ ගිවිස ගැනීමේ දිනයත් වෙන් කරලා."

"අම්මා ආදරයක් නැතිව විවාහයක් කර ගන්නේ කොහොම ද?"

"මට තේරුම් ගන්න බෑ. ඇයි ඔෂින් මෙහෙම කියන්නේ කියලා."

"අම්මා, මට කරුණාවන්ත කෙනෙක් මුණ ගැහුණා. එයා කැමතියි මාව විවාහ කරගන්න."

"මොනවද ඔෂින් කියවන්නේ?"

ඔෂින්ගේ දෑසින් කඳුළු ගලා ගියා.

"අනේ අම්මා."

"මම කොහොමද ඔෂින් මැඩම්ට මේ ගැන කියන්නේ. මට මැඩම් මෙතේ හාල් ගබඩාවක වැඩක් හොයලා දුන්නා. අපි බලමු. ඔයා අඬන්න එපා. මමත් සකාටාවල ඉන්නවනේ. ඒත් මම නම් කියන්නේ ඔයා මේ විවාහයට කැමති වෙන්න හිත හදා ගන්න කියලයි."

එදා ඔෂින්ගේ මව තගායා ගෙදර රාත්‍රිය ගත කළා. ඔෂින්ගේ හිත හැදීමට ඇය හැම විටම උත්සාහ ගත්තා.

"අනේ අම්මා අඳුරන්නේ නැතිව, කතා බහ නොකර කොහොමද විවාහ වෙන්නේ."

"ඒ වුණාට බැඳලා බලන්න. එතකොට අඳුරාගන්න ලැබෙයිනේ. ටික දවසකින් කොහොම කෙනෙක් ද කියලා අඳුනාගත්තාම ඒ විදිහට හැඩ ගැහෙන්න පුළුවනි. ගෑණු අපි කොහොමත් පිරිමින්ට යටත්ව ඉන්න ඕනෑ. මහ ලොකු අඳුනා ගැනීමක් අවශ්‍ය නැහැ. ඔහොමයි ඔවා සිද්ධ වෙන්නේ."

"ඒ වුණත් අම්මා...."

ඔෂින් රැය පහන් කළේ අඬමින්, වැලපෙමින්. මවගේ හිත වේදනාවෙන් පිරී ගියා. ඔෂින් වාසනාවට පයින් ගහනවාද ? නැත්නම් ඇය ආදරයක් වෙනුවෙන් දුක් වෙනවාද ? මව නොයෙක් ආකාරයට හිතුවා.

පසුවදා වෙනත් සහල් ආයතනයකට ෆුජි රැකියාවට ගියා.

"අම්මා හාල් ගෝනි උස්සාගෙන යන්න අමාරුයි."

ඔෂින් කිව්වා.

"නෑ, ඔෂින් මට බර වැඩ කරලා පුරුදුයි. කොහොම උනත් ඔයා සකාටාවල ඉන්න නිසා මගෙ හිතට සැනසීමක්."

එදා දවසටම කායෝ දකින්න ලැබුණේ නැහැ. කාමරයට වෙලා චිත්‍ර අඳිනවා ඇති. එහෙමයි හැම දෙනාම හිතුවේ.

"මිස් කායෝ දැක්කෙම නෑ." මීනෝ හමු වී ඔෂින් කිව්වා.

"ඔය කාමරයට වෙලා ඉන්නේ. බලන්න ඔෂින් කතා කරලා චිත්‍ර අඳිනවා ඇති."

ඔෂින් කායෝගේ කාමරයට ළඟට ගියා.

"මිස් කායෝ..... මිස් කායෝ......"

"එන්න, ඔෂින්."

සිහින් හඬකින් ඔෂින් කායෝගේ කාමරයෙ දොර ඇර වසා දැමුවා. කායෝ හිටියේ මෙට්ටය මත.

"ඇයි මිස් කායෝ ඔයා අසනීපයෙන් ද ?"

කායෝ හිස පහත් කරගෙන අඬන්නට පටන් ගත්තා. ඔෂින් හොඳටම බය වුණා.

"ඇයි මිස් කායෝ. අපි හිතුවේ ඔයා චිත්‍ර අඳිනවා කියලා."

"ඔෂින් යශුඩා යන්න ගිහින්."

ඒ සමගම කායෝ ඉකිගසමින් අඬන්න වුණා. ඔෂින් ගල් ගැහුණා වගෙයි. කායෝට යශුඩාගේ පිටත්ව යාම මෙතරම් වේදනාවක් වූයේ කෙසේ ද ? මිස් කායෝ පිළිබඳ අනුකම්පාවකින් ඇයගේ සිත පිරී ගියා.

"ඉකිත් ආපිට එයිනේ මිස් කායෝ. දුක් වෙන්න එපා."

ඔෂින් මිස් කායෝගේ පිට පිරි මැද්දා.



"මම මෙච්චර එයාට හිතවත්ව ඉඳලත් යශුඩා මට නොකියාම ගියේ ඇයි ඔෂින්."

කඳුළු වැල් ගලායන මිස් කායෝගේ මුහුණ දකින ඔෂින් නැවතත් හිගැස්සුණා. ඔවුන්ගේ ආදරය ගැන මිස් කායෝ දන්නේ නම් තුමක් සිදුවිය හැකි ද ?

"අඬන්න එපා මිස් කායෝ. ඉන්න මම ඔයාට මූණ හෝදන්න උණු වතුර අරගෙන එන්නම්."

ඔෂින්ට අවශ්‍ය වුණේ ඒ මොහොතේ කායෝගෙන් ඈත් වෙන්න. ඔෂින් උණුවතුරින් පෙඟූ තුවා කීපයක් බන්දේසියක තබාගෙන කායෝගේ කාමරයට ගියා. කායෝ මෙට්ටය මත වැතිර හිටියා. ඔෂින් කායෝගේ මුහුණ උණුවතුරින් මිරිකූ තුවා වලින් සේදුවා. කායෝට එය අස්වැසිල්ලක් ගෙන දුන්නා. උයන ගෙට ගොස් කායෝ වෙනුවෙන් කැම බඳුනක් සදා ගෙනවිත් දුන්නා. හැන්දකින් සුප් ටික ටික කායෝට පෙව්වා.

"මිස් කායෝ ඔය සේරම අමතක කරලා දමන්න."

කායෝ කිසිවක් කීවේ නැහැ.

දින කීපයක් ගෙවී ගියා. එදා කගායා නිවසේ කලබලකාරී බවක් තිබුණා. ඒ ඔෂින් විවාහ ගිවිස ගැනීම නිසයි. ඔෂින්ට රෝස පාට කිමෝනාවක් අන්දවා තිබුණා. සාම්ප්‍රදායික ලෙස කොණ්ඩය සකස් කර තිබුණා. ලස්සන අවානක් ඇය අත තිබුණා. ඒත් ඔෂින්ගේ මුහුණේ නම් කිසිම සතුටක් තිබුණේ නැහැ. මේ උත්සවයට ඔෂින්ගේ මව පැමිණියේ නැහැ.

සකුරාකි හා ඇයගේ දෙමාපියන් පිටව ගියාට පසු යකිරෝ මැඩම් ඔෂින්ට කතා කළා.

"ඔෂින් ඔය ඇඳුම් පිටින්ම අම්මා මුණ ගැහිලා එන්න. එයාටත් ආසා හිතෙයි නේ. මතක ඇතිව අම්මාට කැවිලි පෙට්ටියක් අරගෙන යන්න."

"හොඳමයි." ඔෂින් හිස නමා ආචාර කළා. ඇය රස කැවිලි පෙට්ටියක් ද සකස් කරගෙන මව සොයා ගියා.

ෆුජි හාල් මිටියක් ගෙන ගොස් එළියට එන අකාරය ඔෂින් බලා හිටියා.

"අම්මා....."

ෆුජි හැරී බැලුවා.

"ඔෂින් ඔයා ද ? දුවගෙ ලස්සන."

මව කිවේ හිනැහෙමින්. දැඩි සතුටකින්.

"අම්මා මය හාල් මුට්ටා උස්සන් යන්න අම්මට අමාරුයි."

"නෑ ඔෂින් ළමයි කරේ එල්ලා ගෙන වැඩ කරනව වගේ අමාරු නැහැ."

ෆුජි කීවේ ඔෂින්ගේ අත අතගාමින්.

"මැඩම් මේ කැවිලි අම්මට දෙන්න කිව්වා."

"ස්තුතියි."

"අම්මා මම මේ කරන බොරුව ගැන මට බයයි අම්මා. මට ඕනෑ එයා ආපහු එනතෙක් ඉන්නයි."

"කෝ ඔයා මට මූණ ගැස්සුවේත් නැහැනේ. හිත හදාගන්න ඔෂින්."

"බඳින්න බෑ මට ආදරයක් නැති මිනිහෙක්."

ඔෂින් අඬන්න පටන් ගත්තා.

"ප්‍රේම අමතක කරන්න දුව. ඔයාගේ අනාගතය ගැන හිතන්න."

ඔෂින් නිහඬවම ආපිට හැරී ගියා.

මේ වෙලාවේ කායෝ චිත්‍ර ඇඳීමට සිතා කාමරයෙන් එළියට ආවා. එළියේ කුඩ මේසයක් මත ඔෂින් නමට ලිපියක් තිබුණා. කායෝ එය අතට ගත්තා. ලියා තිබෙන්නේ කවුරුන්දැයි ලිපියේ යට කොටසින් ටිකක් කඩා බැලුවා.

යශුඩා! කායෝගේ දැත් වෙව්ලුවා. ඇය අත වූ සියල්ල බිමට අතහැර ලිපිය රැගෙන ගෙට දුව ගොස් දොර වසා ගත්තා. ඇය ලිපිය කියෙව්වේ වෙව්ලන දෑතින්. දෙකකුල් ද වෙව්ලන්නාක් මෙන් දැනෙන නිසා ඇය බිම දණ ගසා ගත්තා.

ඒ සමගම සියල්ල පසෙක දමා විශාල බෑග් එකක් සොයා ගෙන එයට ඇයගේ ඇඳුම් කීපයක් දමා ගත්තා.



ඒ සමගම කාමරයෙන් එළියට විත්

"ඔෂින්........ ඔෂින්......"

"මිස් ඔෂින් තවම ගෙදර ආවේ නැහැ."

"ඇයි කොහේද ගියේ ?"

"අම්මා මූණ ගැහෙන්න යනවා කිව්වා."

කායෝ තව තවත් දේවල් බෑගයට දමා ගත්තා.

මේ අතර ඔෂින් නිවසට පැමිණියා.

"ඔයාට අම්මා මූණ ගැහුණාද ඔෂින්."

මිනෝ ඇසුවා.

"ඔව් මැඩම්."

"ඔෂින්..... ඔෂින්..... මෙහෙ එන්න ඉක්මනට."

"හොඳමයි."

ඔෂින් මිස් කායෝගේ කාමරයට ගියා. කායෝ ඔෂින්ගෙ අතින් ඇද කාමරයට තල්ලු කර දොර වසා දැම්මා.

"ඔෂින් මම හිතුවෙ ඔයා මගෙ යාළුවෙක් කියලා. ඒත් අද ඉඳලා ඔයා මගෙ යාළුවෙක් නෙමෙයි."

"මිස් කායෝ මම....."

"කතා කරන්න එපා. ඔයා යශුඩා එක්ක ඇවිදින්නත් ගිහිල්ලා තියෙනවා. මගෙ යාළුවෙක් කිව්වා ඔෂින් පිරිමියෙක් එක්ක ඇවිදිනවා දැක්ක කියලා. ඒත් මම හිතුවේ නෑ ඒ යශුඩා කියලා."

"මිස් කායෝ මට සමාවෙන්න. මම එයාට උදව්වක් කළා."

"උදව්වක් කළා ? මොකක්ද කියනව ඉක්මනට."

"ඒක මට කියන්න බෑ මිස් කායෝ."

"මොකද කියන්න බැරි. ඔයා අපේ සේවිකාවක්. අපට ඉහළින් වැඩ කරන්න ඔයාට බෑ. කියනවා."

"මිස්ට යශුඩාට ගෙදරින් මුදල් වගයක් මගේ නමට එව්වා. ඒක මම ගිහින් දුන්නා." ඔෂින් කීවේ බිම බලාගෙන.

"බොරුකාරයෝ..." කායෝ බෑගය උස්සා ගත්තා.

"මිස් කායෝ, කොහේද යන්නේ ?"

"මම ටෝකියෝ යනවා. කියන්නේ නැහැ දැන්ම ආච්චම්මාට, කියලා තිබුණොත් බලාගෙනයි." කායෝ කාමරයෙන් පිට වී ගියා.

"ඔෂින්."

"එනවා මැඩම්."

"ඔෂින් කායෝ දැක්කේ නැද්ද ? එයාගේ මනමාලයා එනවා කියලා දැන් පණිවිඩයක් එවලා තිබුණා."

"මැඩම් මිස් කායෝ.......... මිස් කායෝ."

"ඇයි ඔෂින්."

"මිස් කායෝ ටෝකියෝ යනවා කියලා යන්න ගියා."

"මොනවා ? ටෝකියෝ..."

මිනෝ එතනම බිම වාඩි වුණා.

"ඇයි මැඩම් යන බව දන්නේ නැද්ද ? මට කිව්වා මම හිතුවේ යශිරෝ මැඩම්ට කියන්න එපා කියලා කිව්වා."

"අම්මා..... අම්මා...."

මිනෝ යශිරෝ මහත්මිය සොයා ගෙන ගියා.

"ඔෂින් එන්න ඉක්මනට දුම්රිය පොළට යන්න."

"මැඩම් හෙමින් එන්න. මම දුවලා යන්නම්."

ඔෂින් දුම්රිය පළට දුවගෙන ගියා. එවිටම දුම්රිය කීපයක් නවතා තිබුණා. ඇය ටිකට් කවුන්ටරයට ගියා.

"කගායා තෝනා ටෝකියෝවලට ටිකට් එකක් ගත්තා. ඒ කෝච්චිය නම් පිටත් වෙලා විනාඩි 10 යකට වැඩියි." ඔෂින් සෙමෙන් පාර දිගේ ගෙදර ආවා.



ගෙදර සියල්ලෝම කලබලයෙන්.

"මිස් ඔයාට ලියුමක් තිබුණා. මම ඒක මේසය උඩ තිබ්බා."

"ලියුමක් ?"

"ඔව්! මේ මේසේ උඩ තිබ්බෙ. කෝ දැන් ඒක නැහැනේ." ඔෂින්ට තේරුණා ඒ ලිපිය කෝටාගෙන් බව. ඇය ආපිට හැරී කෝටාගේ නාතායමට ගියා. සීතුව නාද කරත්ම භාරකාරිය එළියට ආවා.

"මිස්ට යශුඩා ඉන්නවද ?"

"ඊයේ රෑ ආවා. අද උදේම ගියා."

කෝටා ලිපිය එවන්න ඇත්තේ තමාට බවත්, ඔහු සමග යාමට එන ලෙස ලියා තිබෙන්නට ඇති බවත්, ලිපිය කඩා කිය වූ කායෝ තමාගෙන් ප්‍රශ්න කළ බවත්, ඇය යශුඩා සමග දුම්රියට නැග්ග බවත් ඔෂින්ට තේරුම් ගියා.

හදවත පැලී යන තරම් විශාල වේදනාවක් ඔෂින්ට ඇති වුණා.

තමාට අහිමි වූ ආදරය මෙන්ම තමාට ආදරයක් නැති තරුණයෙක් සමග බලෙන් ම ගියපු මිස් කායෝ ගැනත් ඇයට ඇති වුණේ දුකක්.

කෝටා කායෝ ගැන දැරුව අදහස් ඔෂින් දැන සිටියා.

වරෙක ඔෂින්

"මිස් කායෝ, ඔයාට ගොඩක් හිතවත් නේද ?"

"ඒ වුණාට මම කායෝට කැමති නෑ. එයාගේ කතාබහ වලින් තේරෙනවා එයා දඩබ්බර කෙනෙක් බව. ඔෂින්, ගෑනු එහෙම දඩබ්බර උනාම කිසි වැදගත් කමක් නැහැ."

ඔෂින් කායෝගේ කාමරයට ගොස් ලිපිය තිබේ දැයි සොයා බැලුවා. කායෝ ආච්චම්මාට ලියූ ලිපිය ඇයට ලැබුණා.

"මැඩම්, මිස් කායෝ ලියුමක් තියලා ගිහින්."

"ගේන්න ඔෂින්."

මිනෝ අඬමින්ම ලිපිය කියෙව්වා.

"ආච්චම්මා, අම්මා, තාත්තා මාව සොයන්න එපා. මට දැන්ම බඳින්න බැහැ. මට කගායා භාරගන්නත් බැහැ. ටික දවසකින් ලිපියක් එවන්නම්. දූව, කායෝ"

"මේ කායෝ කොහේද ගියේ. අපි දැන් රට්වුන්ට මූණ දෙන්නේ කොහොමද ?"

"මිනෝ කියන්න කායෝ ළඟ මුදල් තිබුණාද ?"

"අම්මා එයා චිත්‍ර බඩු ගන්න කියලා මගෙන් මුදල් ඉල්ලා ගත්තා."

"එහෙම නම් ටික දවසක්වත් ජීවත් වෙන්න සල්ලි ඇති වෙයි නේ. ඔෂින් කායෝට පෙම්වතෙක් හිටියද ?"

ඔෂින් හිස දෙපසට වැනුවා.

සියල්ලෝම සිටියේ කනස්සල්ලෙන්. මේ වෙලාවේ කායෝ හිටියේ ටෝකියෝ බලා යන දුම්රියේ. ඇය ඉදිරියේ අසුන් ගෙන හිටියේ කෝටා. නිහඬවම කල්පනාවේ යෙදී සිටින කෝටා දෙස බලාගෙන කායෝ කල්පනා කළේ මීට ටික වේලාවකට පෙර මුහුදු වෙරළේදී කෝටා මුණ ගැහුණ ආකාරයයි.

කායෝ ඔෂින් නමට තිබූ ලිපිය එවා තිබෙන්නේ කවුරුන්දැයි ලිපිය මදක් ගලවා බැලුවා. එහි අවසානයේ සඳහන් වූයේ කෝටා කියලා. කායෝගේ දැත් වෙව්ලුවා. ලිපියේ තිබූ සියල්ලම දැනුත් ඇයට මතකයි.

ඔෂින්

මම ඊයේ රෑ ආපිට සකාටා ආවා. අපි එදා හමු වී කතා කරගත් විදිහට යමගාටා ගිහින් විවාහ වෙමු. යශිරෝ මහත්මියටවත් කියන්න එපා. ටික දවසකින් ආපිට ඇවිත් ඒ ගොල්ලන්ගෙන් සමාව ගනිමු. එහෙම නම් අද සවස 4 ට මුහුදු වෙරළේ සුපුරුදු තැන දී හමුවෙමු. ඔයා එනතෙක් මම බලාගෙන ඉන්නවා. නොවරදවාම එන්න.

යශුඩා

(කෝටා)



කායෝ ඇඳුම් බෑගය ගෙන කෝටා සොයා ආවා. මුහුදු වෙරළේ කිසිවෙක් දකින්නට සිටියේ නැහැ. ටිකකින් මුහුදු දැල් අසුරා තිබූ තැනක වාඩි වී සිටි කෝටා හිටගත්තා කායෝ දුටුවා. ඇය එතනට ගියේ දුවගෙන. කෝටා විමතියෙන් බලාගෙන හිටියා.

"ඔෂින්, අද විවාහ ගිවිස ගන්නවා මිස්ට සකුරාකි එක්ක. ඔෂින් දුප්පත් නිසයි එයා පොහොසත් කෙනෙක් විවාහයට තෝරාගත්තේ. මම ඔයාට ආදරේ කළා....."

කායෝ තවත් මොනවද කියවගෙන ගියා. කෝටා නිහඬවම ඒත් ඉක්මනින් දුම්රිය පොළට ගොස් ටෝකියෝවලට ප්‍රවේශ පත්‍රයක් ගත්තා. කායෝත් ප්‍රවේශ පත්‍රයක් ටෝකියෝවලටම ගත්තා. කෝටා නැග්ග දුම්රිය මැදිරියටම නැග්ග ඇය ඔහු ඉදිරියේ වාඩි වුණා. කෝටා සිටියේ තලලට අත තබාගෙන.

"මම ඔයාට කරදරයක් වෙන්නේ නෑ. මං සල්ලි ටිකක් ගෙනාවා. මගේ යාළුවෙක්ගේ අක්ක කෙනෙක් ටෝකියෝවල ඉන්නවා. අපිට එහෙන් කාමරයක් හොයා ගන්න පුළුවනි."

කායෝ කියන කිසිම දෙයක් කෝටාට ඇසුණේ නැහැ. එහෙත් සිදුවන්නට ඇත්තේ කුමක් දැයි ඔහුට තේරුම් ගියා. අහිංසක ඔෂින් එයා මම ගැන මොනව හිතයි ද ?

ඇත්තෙන් ම මේ වන විට ඔෂිනුත් දැනගෙන හිටියා සිදු වී ඇති දෙය. ඇය දුක් වුණා තමා ගැනම. අනිත් අතට කායෝ ගැන. අහිමි වූ ආදරය ගැන. ඒ දින ටිකම ගෙවී ගියේ එක් බලාපොරොත්තුවක් තබාගෙන. ඒ කෝටාගෙන් ලිපියක් ඔෂින්ට කොයි මොහොතේ හෝ ලැබෙතැයි සිතීමයි. කායෝගේ ගමන සේවකයන්ට වත් දැන නොගැනීම සඳහා ඔෂින් හා පවුලේ අය කටයුතු කළා. කතා බහ කර සිනාසී සිටියත් සියල්ලන් ම වෙස් මුහුණු බැඳගෙන කටයුතු කළා වගේ.

# නවය

සති දෙකක් ම ගත වී ගියා. කෝටාගෙන් ලිපියක් නොලැබුණ විට ඔෂින් හොඳටම කලකිරුණා. ඇයගේ දෛවය පිළිබඳවයි ඇය කලකිරුණේ. කායෝ නැති නිවස ඇයට විශාල පාළුවක් ගෙන ආවා. සියලු දෙනාම කාලය ගත කළේ කනස්සල්ලෙන්. කායෝ නිතර අක්කා සිහි කර හඬා වැටුණා.

මේ අතර දිනක් යශිරෝ මහත්මියට සකුරාකිගෙන් දුරකථන ඇමතුමක් ආවා. එයට පිළිතුරු දුන් ඇය,

"හොඳයි." කියා රිසිවරය තිබ්බා.

"ඔෂින්."

"එනවා මැඩම්."

"ඔන්න මිස්ට සකුරාකිගෙන් ඔයාට ආරාධනාවක්. එයාගේ මල් ප්‍රදර්ශනයට එන අමුත්තන්ගේ චාරිත්‍රය පවත්වන්නට ඔයාට එන්න කියනවා. මිස්ට සකුරාකි කියනවා එයාගේ යාළුවන්ට එයාගේ මනමාලි හඳුන්වලා දෙන්නත් මේක අවස්ථාවක් කර ගන්නවා කියලා."

සුගක් දවසකට පස්සේ යශිරෝ මහත්මිය හිනාවුණා.

ඔෂින් බිම බලාගෙන හිටියා.

"ඒත් මැඩම්, මට මිස් කායෝ මතක් වෙනවා. කොහොමද උත්සව වලට යන්නේ."

"ඔයා ඒ ගැන වද වෙන්න එපා. ඔයාගේ අනාගතය ගැන හිතන්න. ඇරත් ඒ ඔයාගේ අනාගත සැමියා. ඔයා දැන් එයාගේ ඉල්ලීම ඉෂ්ට කරන්න එපා...



"ඒත් මැඩම්...."

"ඔයා යන්නට ඕනෑ ඔෂින්. ඒවා යුතුකම්. එහෙනම් හෙට උදේ දහයට විතර ඔයා එහෙ යන්න. හොඳ කිමෝනාවක් ඇඳගෙන යන්න. කොණ්ඩය සකස් කරන්න එන්න කියලා මම ඔකිට පණිවිඩයක් අරින්නම්."

"හොඳයි." ඔෂින් හිස නමා ආචාර කළා.

මේ ගමන ඔෂින්ට හිතට වදයක් ගෙන ආවා. ඒ ගියාට ඇයත් ඒ ගමන ගියේ සෙමෙන්. ඕනෑවට එපාවට. මල් ප්‍රදර්ශන ශාලාවේ ඉදිරියෙ සිටි සකුරාකිගෙ මව ඔෂින් ව ආදරයෙන් පිළිගත්තා.

"එන්න ඔෂින් සකුරාකි ඔයා එනතෙක් බල බලා සිටියා."

"මේ කවුද?"

එතන සිටි කාන්තාවක් ඇසුවා.

"මේ අපේ දෙවැනි පුතාගේ මනමාලි."

"හරිම හැඩ තරුණියක්."

"ඒ වගේම තමයි හරිම දක්ෂයි."

ඔෂින් හිස පහත් කර ආචාර කළා.

සකුරාකිගෙ මල් ප්‍රදර්ශනයට පැමිණි අමුත්තන් සියලු දෙනා වෙනුවෙන් වරින් වර ඔෂින් තේ පිළිගැන්වීමේ චාරිත්‍රය කළා. හැම දෙනාම ඇයට ප්‍රශංසා කළා. මේ කිසි දෙයකින් ඔෂින්ට නම් සතුටක් ලැබුණේ නැහැ. ඇය කල්පනා කළේ මෙතැනින් ඉක්මනින් පිටවී යාමටය.

ඒ සඳහා ඇය කීප වරක් උත්සාහ ගත්තත් සකුරාකි එයට ඉඩ දුන්නේ නෑ.

"මම ඔෂින්ව ගෙදරට ඇරලවන්නම්. ඉන්න තව ටිකක්."

සකුරාකිගේ යහළුවන් පැමිණි පසු ඔවුහු සකේ පානය කළා. මත්වූ සකුරාකි ඔෂින් වැළඳගෙන

ඔෂින් සෙමෙන් අත ගලවා ගත්තා. එවර ඔහු ඔෂින්ව තදින්ම වැළඳ ගත්තා.

"ඉන්න ඔෂින් ඔයා මගෙ මනමාලි."

මෙවර ඔෂින් අතින් සකුරාකි තල්ලු වී ගියා. මත් බව නිසාම සමබරතාවය අඩුවී ගිය සකුරාකි එතැන වූ පොකුණට ඇදගෙන වැටුණා. හොඳටම බිය වූ ඔෂින් එතැනින්ම පාරට පැමිණ ගෙදර දුවගෙන ආවා. යශිරෝ මහත්මිය ඔෂින් එන පෙරමග බලාගෙන හිටියා.

"මිස්ට සකුරාකි මට ෆෝන් කළා. ඔෂින් දැන්ම ගිහින් සමාව ඉල්ලන්න."

"අනේ මැඩම් මම...."

"ඔයාට තනියම යන්න බැරිනම් මමත් එන්නම්. දැන්මම ගිහින් සමාව ඉල්ලන්න."

"මැඩම් අනේ මට සමාවෙන්න. මට නම් සමාව ඉල්ලන්න බැහැ."

"ඔෂින්, මේ වගෙ පොඩි දෙයකට ඇයි ඔයා ඔය තරම් හිතන්නේ. සකුරාකි ටිකක් මතවෙලා ඉදලා තියෙන්නේ. ඒකයි ඔයාව වැළඳ ගන්න ඇත්තේ. ඕක මහ වරදක් නෙමෙයි ඔෂින්."

"මැඩම්, මට මිස්ට සකුරාකි එක්ක විවාහ වෙන්න බැහැ. ඒක මගෙ හිතට එකඟ නෑ මැඩම්. මේ සිද්ධියෙන්ම මේ මඟුල කැඩෙනවා නම් හොඳයි මැඩම්. අනේ මට සමාවෙන්න මැඩම්."

ඔෂින් හිස බිම තියාගෙන සමාව ඉල්ලුවා.

"මට ඔෂින් හිතාගන්නවත් බැහැ ඔයාට මොකද සිද්ධ වුණේ කියලා. මේ තරම් හොඳ විවාහයක් ඇයි ඔයා අත් හරින්නේ?"

"මට සකුරාකි බඳින්න බැහැ මැඩම්."

"හොඳයි එහෙනම් ඔයා කාටද ආලය කරන්නේ. එයා සකාටාවල කෙනෙක්ද?"

''නැහැ මැඩම් එහෙම මොකවත් නැහැ. ඒත් දැන් හිතෙනවා මම මෙහෙන් යන එක හොඳයි කියලා. මම තව දුරටත් මෙහෙ හිටියොත්



මැඩම්ලට වදකාරයෙක් වෙනවා. මට ගමට යන්න අවසර දෙන්න මැඩම්.''

"හොඳයි දැන් ඔයා කාමරයට යන්න."

ඔෂින් කාමරයට ගොස් මෙට්ටය මත වැටී කල්පනා කළා. ඇයට එහෙමම නින්ද ගියා.

"මිස් ඔෂින්."

උට් කාමරයට පැමිණ කතා කළා.

"අන්න අම්මා ඇවිල්ලා."

අම්මා ඔෂින් සොයාගෙන කාමරයට ආවා.

"ඔෂින්, යශිරෝ මැඩම් මට විස්තරය කිව්වා."

"අම්මා මෙහෙ ආවේ?"

"යශිරෝ මැඩම් මට එන්න කියලා පණිවිඩයක් ඇරලා තිබුණා. ඇයි ඔෂින් මෙච්චර හොඳ විවාහයක් අත් අරින්නේ. ඔයා පුංචි කාලේ කීවෙත් මම නම් අද ගොවියෙක් වෙන්නේ නෑ. ව්‍යාපාර කරනවා කියලා. දැන් ඒකට හොඳ අවස්ථාව. ඇයි ඔයා මෙහෙම වෙනස් වුණේ."

ෆුජි වට පිට බැලුවා.

"අර මිනිහා නිසාද?"

"නෑ අම්මා එයා මෙහෙ නෑ. එයා ආපිට එන්නේ නෑ."

"එහෙනම් ඔයා හිත හදාගන්න."

"ඒත් අම්මා මට සකුරාකි එක්ක විවාහ වෙන්න බැහැ. සකුරාකි මාව වැළඳ ගත්තාම මට හරි පිළිකුලක් දැනුණා. මම කොහොමද එහෙම මිනිහෙක් එක්ක විවාහ වෙන්නේ."

"එහෙම නම් අපි යශිරෝ මැඩම්ට කියමු. එයා වෙන කෙනෙක් සොයලා දෙයි."

"එපා මම විවාහ වෙන්නේ නෑ."

"ඔෂින් මෝඩ වෙන්න එපා. ඔයාව දමලා ගිය එක්කෙනා ගැන මොනවටද දුක් වෙන්නේ. ඇයි තවත් බලාපොරොත්තු වෙන්නේ. මැඩම් හිතනවා ඔයා කාට හරි ආදරය කරනවා කියලා."

ඔෂින් නිහඬව අසාගෙන සිටියා. කායෝ නිසා ඔෂින්ගේ ජීවිතය කොයිතරම් වෙනස් වුණාද? ඒ වගෙම ඔෂින් නිසාත් කායෝට කරදර ගැටලු ඇති ඔෂින් සිතුවා. ඔෂින් එක දෙයක් පැහැදිලිව දැනගෙන සිටියා. ඒ කෝටා කවදාවත් කායෝට ආදරය නොකළ බව.

"ඔෂින් කතා කරන්න."

"අම්මා මිස් කායෝ ගියේ මම ආදරය කරපු කෙනා එක්ක."

"මොනවා."

ෆුජි ඇස් උඩ තියාගෙන කතා කළා.

"මට ඕවා මැඩම්ට කියන්න බෑ අම්මා."

ඔෂින්ගේ දෑසින් කඳුළු කඩා හැලුණා.

"මට මෙහෙ ඉන්න බෑ අම්මා. මට මේ සේරම අමතක කරලා දමන්න ඕනෑ. මම ගෙදර ගිහින් වෙන කොහේ හරි වැඩට යන්නම් අම්මා."

"මිස් කායෝත් ගෙදරින් ගිහින් ඔයත් ගියාම මේ ගෙදර අය හුගක් දුක්වෙයි ඔෂින්."

"ඒත් අම්මා මම යන්න තීරණය කළා."

"දුව, ඔයාට මට වඩා තේරුමක් තියෙනවා. ඔයාට හිතෙන දෙයක් කරන්න."

ෆුජි ඔෂින්ගෙ හිස අත ගෑවා.

පසු දින ඔෂින් කගායා නිවසින් සමු ගැනීමට සූදානම් වුණා. පවුලේ සියල්ලන්ම ඉදිරියේ ඔෂින් බිම වාඩි වී සිටියා. ඔෂින් සිටියේ හිස බිමට නැඹුරු කරගෙන. බොහෝ වේලාවකට පසුව යගිරෝ මහත්මිය කටහඬ අවදි කළා.

"ඔෂින් ඔබ මෙහෙ එනකොට වයස අවුරුදු නවයයි. වැඩ කළා බොහෝම. සායෝව බලාගත්තා. කායෝගේ ජීවිතය බේරා ගත්තා. ව්‍යාපාර වැඩවලට උදව් කළා. උයනගෙයි ප්‍රධාන සේවිකාව විදිහට ඔයා අපට රසට කෑම හදවලා දුන්නා. මට හැම වෙලාවෙම හිතෙන්නේ ඔයා අපෙත් මෙහෙම වෙන්වෙලා යන්නේ මිස්ට සකුරාකිව ඔයාට අඳුනලා දුන්න නිසානේ කියලා. නමුත් ඒවා වෙන්න තියන දේවල්."



"ආහ් ඔෂින්, අක්කත් මාව දාලා ගියා. ඔයත් ගියාම මට පාළුයි ඔෂින්. යන්න එපා ඔෂින්."

සායෝගේ හඬත් සමගම හැමෝගේම දෑස්වලින් කඳුළු ගැලුවා.

"ගෙදර ගියාම මොනවද කරන්නේ ඔෂින්.?"

මිනෝ සෙමෙන් ඇසුවා.

"මම... මම.. ගෙදරක වැඩ කරනවා මැඩම්."

"ඔෂින් ඔයා නුවණ තියෙන කෙල්ලෙක්. ඔයාගේ මේ වෙන්වීමට තව මොනවා හරි හේතු ඇති. ඒවා මම අහන්නේ නැහැ. නමුත් ඔයා කරදරයක් වුණොත් ආපිට එන්න. හැම දවසකම මේ ගෙදර දොරවල් ඔයාට විවෘතයි..."

"මං මෙහෙ යන එන එක නවත්තන්නේ නෑ මැඩම්. මැඩම් මට ජීවත්වන හැටි ඉගැන්නුවා. මම ඒවට ඔබතුමියට ණය ගැතියි."

"හොඳයි ඔෂින් මෙන්න ඔයාට මගෙන් තෑග්ගක්."

එහි වුණේ මුදල් සහිත කවරයක්.

"එපා මැඩම්. මම ඔබතුමියට පිටුපාලා යද්දි මුදල් ගන්නේ කොහොමද?"

"මම දන්නවා ඔෂින් ඔයා නම්බු කළ හැම සතයක්ම ඔයා ගෙදර ඇරියා. මේක ගන්න."

"ඔෂින් ඒක ගන්න. අම්මා හිත සතුටින් දෙන්නේ. මේ මගෙන් ඔයාට."

මිනෝත් ලියුම් කවරයක් දුන්නා.

යගිරෝ මහත්මිය පැත්තකට හැරී දෑසෙන් ගලන කඳුළු පිස දැම්මා.

"හොඳයි ගිහින් එන්න ඔෂින්."

සියලු දෙනාටම ආචාර කළ ඔෂින් නිවසින් පිටවී මඟ තොරා ගියා.

"යන්නද ඔෂින්? "

"ඔව් අම්මා."

Rangika

"අපි එක්වුණා විතරයි. ඉක්මනින්ම වෙන් වෙනවා. අමතක කරන්න මිස් කායෝව අර මිනිහව. හැබැයි ඔෂින් ඔයා ගෙදර යනවට තාත්තාවත් සෝජිවත් කැමති වෙන එකක් නම් නැහැ. ඒත් ඉක්මනින්ම වෙන තැනක වැඩට යන්න බලන්න."

ඔෂින් යමගාටා ගියා. නිවසට යන විටත් ඔෂින්ට අනාගතය ගැන කිසි සැලසුමක් තිබුණේ නැහැ. ඉදිරියට කුමක් සිදුවේ දැයි දැනගෙන සිටියෙත් නැහැ.

පියාත්, සෝජිත් සවස ගෙදර ආවා.

"ඔෂින් ඔයා ගෙදර ආවා ද?"

සෝජි ඇසුවා.

"පුදුම වෙනසක්, බොහෝම ලස්සන වෙලා. මට ආරංචි වුණා ඔෂින් පොහොසත් කෙනෙක් බඳිනවා කියලා."

තාත්තා කීවේ විස්මයෙන් මෙන් ඔෂින් දිහා බලාගෙන.

ඔෂින් ආච්චම්මාගේ සිහිවටනය ළඟට ගියා.

"ආච්චම්මා මම ගෙදර ආවා. සමාවෙන්න මට කලින් එන්න බැරිවුණාට." වැඳගෙන කිව්වා.

"තාත්තා මම ආපිට සකාටා යන්නේ නෑ."

"ඔෂින්......?"

"සමාවෙන්න තාත්තා ඒ මඟුල කැඩුණා. මට තාම වයස 16 යි. මට තව බඳින්න කල් තියෙනවා."

"එක අතකට ඒක හොඳයි. ඔය මිනිහා පෝසත් නිසා උඹෙන් වැඩ ගනියි. අපි හුඟාක් ණය වෙලා ඉන්නේ. මෙහෙ ඉඳලා වැඩ කරලා සල්ලි හොයන එක හොඳයි."

"මම ආයෙම වැඩට යන්න පොරොන්දු වෙනවා තාත්තා."

ඔෂින් ගෙදර වැඩ පටන් ගත්තා.

දිනක් සෝජි කරේ තබාගෙන එන කෙනෙක් දුටුව ඔෂින් ඉදිරියට දිව්වා.

"සෝජි කාවද ඔයා ඔය කරෙත් ගෙනෙන්නේ."



"හරුව."

"ඇයි හරුට මොකද?"

"ලෙඩ වෙලා. ඉක්මනට ස්ටෝරු කාමරේ මෙට්ටයක් එලන්න."

"ස්ටෝරු කාමරේ? මේ ලෙඩාට? ඔයාට පිස්සුද සෝජි. ගේන්න හරුව ගෙට."

"හරු මම ඔෂින්. මම ඔයාට කාමරේ නිදාගන්න හදලා දෙන්නම්."

"මේ ඔෂින් හරුට කාසෙ හැදිලා. ඔයාටත් බෝ වෙයි."

"අයියා අපි දොස්තර ගේමු. මා ළඟ සල්ලි තියෙනවා."

"එපා.. එපා...." හරුන් අමාරුවෙන් හිස ඔසවා ගත්තා.

"දොස්තර එපා... බෙහෙත් එපා..."

හරුන්ව අල්ලා ගත් ඔෂින්ව හරුන් තල්ලු කර දැම්මා.

"යන්න ඔෂින්. ඔයා මාව අල්ලන්න එපා. ඔයාටත් බෝවෙයි."

"ඒත් බෙත් බිව්වොත් හොඳවෙයි හරුන්."

"එපා ඔක්කොම ගඟේ දැම්මා වගෙයි."

"විවේක ගත්තොත්, හොඳ ආහාර ගත්තොත් ඔයාට හොඳ වෙයි හරුන්."

"මට නිදා ගන්න දෙන්න."

ඔෂින් දොස්තර ගෙන්නුවා.

ඔහු හරුන් පරීක්‍ෂා කළා. ඔෂින්ව එළියට කැඳවාගෙන ගියා.

"ළමයා, ඔය ලෙඩේට බෙහෙත් නෑ."

"එයාට කැමති දෙයක් කන්න බොන්න දෙන්න. හොඳින් බලා ගන්න. ඔයාලත් ප්‍රවේසම් වෙන්න."

"හොඳයි."

"මම අම්මාට පණිවිඩයක් යවනවා හරුන් අසනීපයෙන් කියලා."

"එපා.." සෝජි කෑ ගැහුවා.

Rangika

"එයත් ගෙදර ආවාම කවුද කියක් හරි හම්බ කරලා දෙන්නෙ. ඔෂිනුත් ආවා ගෙදර, හරුන් අසනීපයෙන්. මොන ඉලව්වකට ගිහින් ලෙඩ වුණාද මන්දා මම නම් ගෙයි නිදා ගන්නෙ නෑ."

"සෝජි." ඔෂින් කෑගැහුවා. හරුන් හිටියේ නින්දේ.

"දොස් කියන්න ඕනෑ සේද කම්හලටයි. මැරෙන කල් වැඩ අරගෙන ලෙඩ වුණාම ගෙවල්වලට ගෙනත් දමනවා."

රාත්‍රියේ ඔෂින් ඇහැරුණා. හරුන් මෙට්ටයේ හිටියේ නැහැ. ඔෂින් හොඳටම බය වුණා. ඇය ඉක්මනට ගබඩා කාමරයට ගියා. එහි පිදුරු කට්ටලයකට හේත්තු වෙලා හරුන් හිටියා. ඇය අවදියෙන්.

"හරුන්, ඇයි අක්කා මෙය එළියට වෙලා."

"ඔෂින්, මම ගැන වද වෙන්න එපා. කාස රෝගය හරි දරුණුයි."

"ගෙදර අයටවත් ඔයාටවත් බෝ වෙනවට මම කැමති නැහැ. මේක හැදුනම කහින්නවත් හොඳ නෑ. මම මරණය එනතෙක් බලා ඉන්නවා ඔෂින්."

ඔෂින්ට සෝජි සමග පුදුම කේන්තියක් ඇතිවුණා. ඔෂින් ගෙට ගියේ අඩි හප්පමින්. නිදාගෙන හිටිය අය මේ හඬට අවදි වුණා.

"මොකද ඔෂින්."

"හරුන් ගේ හිත හොඳටම රිදිලා. එයා ස්ටෝරුවට වෙලා ඉන්නවා."

"හරුන් අසනීප වුණේ වැඩ කරලා. හොඳට කෑවෙ බීවේ නැහැ. ගෙදරටම එව්වා. දැන් එයා අසනීප වෙලා ආවාම අනිත් අය එයාව පිළිකුල් කරනවා. හිත රිදවනවා. කොයිතරම් නපුරුකමක් ද?"

"සෝජි ඕවා කිව්වේ තරහට නෙමෙයි ඔෂින්. ඔයත් ප්‍රවේශම් වෙන්න." තාත්තා කිව්වා.

ඔෂින් හරුන්ගේ මෙට්ටය හා කොට්ට ගෙන එළියට ගොස් ගබඩා කාමරය අස් කර ඇයට නිදා ගැනීමට සලස්වා දුන්නා.

"හරුන් අයියා කියන දේවල් ගණන් ගන්න එපා. වැඩ කරලා සේරම මුදල් ගෙදර එව්වා. දැන් අපේ යුතුකම ඔයාව බලා ගන්න එක."



"ඔෂින් ඇයි ඔයා ආපිට ආවේ?"

"දෙවියෝ මාව ගෙදර එව්වේ හරුව බලා ගන්නයි."

"ඔයා කරුණාවන්තයි ඔෂින්. ඒත් අද ගොවියෙක් වෙලා නම් උපදින්න හොඳ නැහැ. දුප්පත්කම ගැන මම කළකිරිලා ඉන්නෙ ඔෂින්."

"දැන් නිදාගන්න හරුන්. මම ඔයාට උදේට පෝෂ්‍යදායී කෑමක් හදන්නම්කො."

ඔෂින් පාන්දරින්ම අවදිවෙලා හරුන්ට කෑම සකස් කළා. ඇය සුදු හාල් වලින් කැඳ හැදුවා. එයටම අඹු මාළු පෙත්තක් දමා මුහුදු පාසි වලින් සෑදූ සලාදයක් ද කෑමට එකතු කළා.

"සුබ උදෑසනක්."

ඔෂින් කෑම බන්දේසිය රැගෙන හරුන් සොයා ගියා.

"අද කොහොම ද?"

"හොඳයි ඔෂින්."

"හරුන් මේ කෑම කන්න. මම කැඳ ටිකක් හැදුවා. ඒක ඉස්සර වෙලාම කාලා ඉන්න."

ඔෂින්, හරුන්ට හැන්දෙන් කැඳ ටික ටික පෙව්වා.

"මේ සුදු බත් හරිම රසයි නංගි. අපිට නම් දුන්නෙ හිරිඟු බත්. ඇති තරම් කන්න දුන්නෙත් නෑ. නිදා ගත්තේ පැදුරු කබලක. දෙන්නා ගානේ එකට නිදාගත්තා. එක් කෙනෙක් ලෙඩ වුණොත් අනිත් කෙනාත් ලෙඩ වෙනවාමයි. පැය දොළහක් වැඩ කළා."

ඔෂින් කල්පනා කළා.

මම නගායාවල කොයි තරම් සතුටින්ද හිටියේ.

ඒත් ඒ සිතුවිලි හරුන්ට තිබ්බේ නැහැ.

"අක්කා, මේ වසර අටම දුකෙන්ද ගෙවුණේ?"

"එහෙමමත් නෑ ඔෂින්. අපි සමහර වෙලාවට සතුටින් හිටියා. අපට හොඳ කළමනාකාර මහත්මයෙක් හිටියා. එයාගේ නම හිරාගෝ. හිරාගෝ මහත්තයා,හරිම කරුණාවන්තයි. හරියට විහිළු කතා කියනවා.

මට ලෙඩ නූනා නම් මම හැමදාම හිරාගෝ මහත්තයා එක්ක වැඩ කරනවා. හිරාගෝ මහත්තයව මට ඇසට දකින්න ලැබෙන්නේ නැහැනේ. මම මොනවට මේවා කියනවද මන්දා."

"ඔෂින්."

ඒ ෆුජිගේ හඬ.

"අම්මා ඇවිල්ලා. අම්මා එන්න අපි ස්ටෝරු කාමරේ."

"කොහොම හරි ගෙදර ආවා නේද? කවුද ගෙදරට හම්බ කරලා දෙන්නේ. ඔෂින් ගෙදර ආවා. හරුන් ලෙඩ වෙලා ආවා. මෙයත් ගෙදර ඇවිත්." සෝජි කිව්වා.

"මම ආවේ මගෙ දරුවා බලන්න."

"මොනවා බලන්න ද මළ මිනියක්."

අම්මා සෝජිව තල්ලු කරලා දැම්මා.

"කිසිම කරුණාවක් නැති එකෙක්."

අම්මා හරුන් ළඟට ගියා.

"හරුන් මගෙ දුව. දැන් ඔයාට කොහොම ද? "

"දැන් මට හොඳයි අම්මා. ඔෂින් මට හොඳට සලකනවා. සෝජි කියන දේවල් මම ගණන් ගන්නේ නෑ අම්මා."

"අක්කා ඒක සෝජිගෙ වරද නෙමෙයි. අපි අඳ ගොවියො. අපිට අස්වැන්නෙන් තුනෙන් එකයි ලැබෙන්නේ. ඉඩම් හිමියාට තමයි වැඩි අස්වැන්නක් ලැබෙන්නේ. ඉඩම් හිමියා සුදු බත් කනවා. වගා කරන අපි කන්නේ රාබු බත්. ගොවියා හැමදාම දුකෙන්. මේවා හරිම අසාධාරණයි. අයියා දරුණු වෙලා ඉන්නේ ඒ නිසා. එයාට විවාහයක් කරගන්න මුදල් නෑ. ගෙයක් නෑ. මේවා සේරම විප්ලව කරලා හරි දිනා ගන්න ඕනෑ අයිතිවාසිකම්."

"ඔෂින් "

තාත්තා සොරෙන් කතා කළා.

"කවුද ඔය විකාර කතා කියලා දුන්නේ. ඉඩම් හිමියන් නැත්නම් අපි කොහොමද ජීවත් වෙන්නේ."



"ඔහොම කියන්න එපා තාත්තා. අද ගොවියො තමයි එකතු වෙලා විප්ලව කරන්න ඕනෑ."

"කට වහපන්."

තාත්තා ඔෂින්ට කම්මුල් පහරක් දුන්නා. ඇය කම්මුල අල්ලාගෙන බිමට නැඹුරු වුණා.

"අනේ තාත්තා ඔෂින්ට ගහන්න එපා."

එකවරම හරුන්ට කැස්සක් ආවා. කැස්සත් එක්කම කටින් ලේ ගලන්න පටන් ගත්තා.

"ඔෂින් ඉක්මනට උණු වතුර ටිකක් ගෙනෙන්න."

"දුව, හරුන් ඔයාට අමාරුද? අනේ මගෙ හරුන්."

හරුන් ටික ටික දුර්වල වී ගෙන යනවිට ඔෂින්ට මතක් වුණේ හිරාගෝ.

එහෙම නම් හරු හිරාගෝට ආදරය කරන්න ඇති. ඊදි හරු කීවේ..

"හිරාගෝ මහත්තයා මට දකින්න ලැබෙන්නේ නෑ කියලයි. ඔව් මම කොහොම හරි හිරාගෝ මහත්තයා එක්ක ගෙන එනවා. අක්කව සතුටු කරන්න."

ඔෂින් පසුවදා උදේම සේද කම්හල බලා ගියා. හරුන්ගෙ යෙහෙළියන් හරුන් ගැන තොරතුරු ඇසුවා. හිරාගෝ මහත්තයාව මුණ ගැස්සෙව්වා.

"මම හරුන්ගෙ නංගි ඔෂින්."

"දැන් හරුන්ට සනීපද? "

"නෑ මහත්තයා අසාධ්‍යයි. ඒකයි මම මෙහෙ ආවේ. හිරාගෝ මහත්තයා හරුට කරුණාවන්තයි. හරු ඒක මා එක්ක කිව්වා. අක්ක ආසාවෙන් බලාගෙන ඉන්නවා හිරාගෝ මහත්තයා දැක ගන්න. අනේ හිරාගෝ මහත්තයා කරුණාකරලා අපේ ගෙදර යන්න එන්න."

හිරාගෝ කල්පනා කළා.

"හොඳයි ඔෂින් ගෙදර යන්න. මම හවසට එන්නම්."

ඔෂින් නිවසට ගියේ දැඩි සතුටකින්. ඇය ගිය ගමන පිළිබඳ ඔෂින් කිසිවක් නොකියා සිටියා.

හැන්දෑවේ හිරාගෝ හරුන් බලන්න ආවා. ඔහු අත මත මල් කළඹක් ද තිබුණා.

"හිරාගෝ මහත්තයා පැමිණියාට බොහොම ස්තුතියි.. එන්න."

ඔෂින් හරු සිටි කාමරයට ගියා. හරු හිටියේ දෑස් පියාගෙන නින්දේ. ඔෂින් හරුන්ගේ මුහුණට සිය මුහුණ ළං කරමින් කතා කළා.

"හරු... හරු.. අක්කා මේ බලන්න කවුද ඔයාව බලන්න ඇවිල්ලා ඉන්නේ කියලා."

ඒත් හරුන් නිහඬය.

"අක්කා, ඇහැ අරින්න. මෙන්න හිරාගෝ මහත්තයා ඔයා බලන්න ඇවිල්ලා."

හරුන් සෙමෙන් ඇස් ඇරියා. ඇය දුටුවේ මල් කළඹක් ද අතැතිව ඇය දෙස බලා සිටින හිරාගෝ ය. හරුන්ගේ දෙතොල් මත මඳ සිනහවක් නැගුණි. එය වේදනාත්මකය.

"හිරාගෝ මහත්තයා."

ඇය සෙමෙන් කෙඳිරුවා.

"හරුන්, මට හිතුණා ඔයා බලන්න එන්න. දැන් ඔයාට සනීපයි නේද? එහෙන් එනවට වඩා මුහුණේ නීරෝගී බවක් පේනවා."

"ඇත්තටම හිරාගෝ මහත්තයාද? "

"ඔව්, මේ බලන්න. ඔයාගේ යාළුවෝ සේරම ඔයා සනීප වෙලා එනතෙක් බලාගෙන ඉන්නවා."

ඔෂින් සෙමෙන් එතනින් ඉවත් වුණා. හිරාගෝ පහතට නැමී හරුන් ළඟ වාඩි වී ඇයගේ අත අල්ලා ගත්තා. හරුන්ගේ දෑස් දීප්තිමත් වුණා.

"හරුන් මේ වන මල් දකින කොට මට ඔයාව මතක් වෙනවා. හොඳ වුණාම අපි වන මල් කඩන්න යමු."



"ඔව් හොඳයි. මම මැරෙන්නේ නෑ හිරාගෝ මහත්තයා. මම එනවා ආයම සේද කම්හලට වැඩ කරන්න."

"කොච්චර හොඳයි ද?"

"අමතක වෙන්නේ නෑ කවදාවත්. මාව බලන්න ආවා. ඒක සැනසීමක්."

මල් පොකුර ළඟට ගත් හරුන් සෙමෙන් නෙත් පියා ගත්තා. ඇයට නැවත නින්ද ගියා. හිරාගෝ ඇසට ආ කඳුළක් පිසදාගෙන එළියට ආවා.

ඔෂින් සමඟ එහි මවත් සිටියා.

"අම්මා මේ හිරාගෝ මහත්තයා. හරුන් වැඩ කළ සේද කම්හලේ මහත්තයෙක්."

ඇය හිස නමා ආචාර කළා.

"ඊයේ හුඟක් ලේ වමනය දැම්මා මහත්තයා."

"මෙච්චර අමාරුයි කියලා මම හිතුවේ නැහැ."

"ඒත් හිරාගෝ මහත්තයා ආපු නිසා අක්කා සතුටින් හිටියා. එයාගේ හිනාව දැක්කේ අපි හුඟක් දවසකින්. මහත්තයාට අපි ණය ගැතියි."

ඔෂින් හිස නැමුවා.

"සේද කම්හලේ ළමයි මෙහෙම ලෙඩ වෙනවා. සේවකයන්ගේ පැත්ත ගත්තොත් අපේ රස්සාව අහිමි වෙනවා. ඇත්තම කියනවා නම් ඒකට අපි බයයි. හැබැයි මේ තත්වය දිගටම තියෙන්නේ නැහැ. පොහොසතුන්ට විරුද්ධව ඉක්මනින් කම්කරුවෝ නැඟී සිටියි."

"අද ගොවියොත් අසරණ වෙලා මහත්තයා. හරුන් වුණත් ඒ දුක් ඉහිලුවේ ඔබ නිසා හිරාගෝ මහත්තයා. එයා ඒ නිසා සතුටින් හිටියා කියලා මට කිව්වා. අද පැමිණීමටත් බොහෝම ස්තුතියි."

ඔෂින් හිස නමා ආචාර කළා.

හරුන් නින්දෙන් අවදි වී ඔෂින්ට කතා කළා.

"නංගී හිරාගෝ මහත්තයා මාව බලන්න ආවා. මේ වන මල් එයා ගෙනාවේ. ඒවා මට පේන තැනක තියන්න. දැන්නම් මැරුණත් කමක් නෑ. මම මැරුණොත් මේ මල් මගෙ පෙට්ටියට දමන්න."

මේ වෙලාවේ අමුත්තෙක් සමඟ සකුයො නිවසට ආවා.

"ඔෂින්, මෙහෙ එන්න."

"මේ ඉන්නේ කන්රූෂි මහත්තයා. එයා ගෑනු ළමයිට රස්සාවල් හොයා දෙනවා. ගෙදරක වැඩට යනවට වඩා හෝටලයක වැඩ කරන එක හොඳයිනේ."

"ඔව්, මම මේ ළමයට හොයල තියෙන හෝටලේ හරියට ගෑනු ළමයි වැඩ කරනවා. ඔය ළමයට තියෙන්නේ එන අයට බීම අල්ලන්න. මේක අවුරුදු තුනක ගිවිසුමක්. මම හොඳටම දන්නවා අවුරුදු තුන ඉවර වෙනකොට ඔන්න කසාදයකුත් හරියයි."

"ඔව්, ඔෂින් අපිට ගොවිතැන් විතරක් කරලා ජීවත් වෙන්න බැහැ."

"මම එතන වැඩට යන්නම් තාත්තේ."

"හොඳයි එහෙම නම් සඳුදා යන්න සූදානම් වෙන්න කො. මම එන්නම්."

"හොඳමයි."

ටිකකින් හරුන් ඔෂින්ට කතා කළා.

"නංගි, මම දැක්කා අර මිනිහව. ඒ මිනිහා කතා කරන රස්සාවලට ඔයා යන්න එපා."

"ඇයි අක්කා."

"මම ඔය මිනිහව දන්නවා. ඔය මිනිහා ගෑණු ළමයි ගෙනෙහිල්ලා ගේෂා කාන්තාවෝ කරනවා. ඔයා යන්න එකඟ වුණාද? "

"තාත්තා බල කළා."

"ඔෂින්, මට සේද කම්හලේදී හොඳ නෝනා කෙනෙක් මුණ ගැහුණා. අර මගෙ ඇඳුම්වල එයාගේ ලිපිනය ඇති. ඒක ගන්න ඔෂින්." එකවරම හරුන්ට කැස්සක් ආවා. ඒ සමගම කටින් ලේ ගලා ගියා.

"අක්කා", ඔෂින් කෑ ගැහුවා.

"අම්මා උණු වතුර අරගෙන එන්න."



ඔෂින් හා අම්මා එකතුව ඇයගෙ කටින් ගලා යන ලේ පිසදා ඇඳුම් මාරු කළා. ටිකකින් හරුන් දෑස් හැරියා.

"මට දැන් හොඳයි. අඬන්න එපා අම්මා."

"ඔෂින්, නංගි ඔයා හරි කරුණාවන්තයි. මගෙ සිහිනය ඔයා සැබෑ කරනවා නේද? නංගි ඔයා ටෝකියෝ ගිහින් මැඩම් හසකාවා මුණ ගැහෙන්න. එයා... එයා.."

නැවතද ඇයට කැස්ස ආවා.

"කතා කරන්න එපා අක්කා. මම යන්නම් එහෙ."

"තාත්තාට හොරෙන්.. හෙට... හෙට ම...."

කැස්ස නිසා ඇයට කතා කිරීමට අපහසු වුණා. එදා රාත්‍රියේ හරුන් අන්තිම හුස්ම හෙලුවා. රාත්‍රියේම සකුසොත්, සෝජිත් ලෑලි පෙට්ටියක් හැදුවා. අම්මා ලොකු මල් රෙද්දකින් පෙට්ටිය වැසීමට ආවරණයක් හැදුවා. ඒ සෑම විටම අම්මා දුක් වුණා.

"අනේ හරුන් තවම ඔයාට වයස දහනවයයි. මොන වයසක් ද? අපේ දුප්පත්කම නිසයි මේ සේරම. ආයිම නම් ඔයා අද ගොවි පවුලක ඉපදින්න එපා." පසුවදාම මිනිය ආදාහනය කිරීමට ගෙන ගියා. මිනිය කරේ තබාගෙන ගියේ සෝජි. පවුලේ සියල්ලොම තුන් මුලස් කොඩි රැගෙන ගියා. ආදාහනයෙන් පසු අළු පෙට්ටියක තබා ගෙනෙමින් ආච්චම්මාගේ අළු බඳුන ළඟ තබා සියලු දෙනාම හඳුන්කූරු දල්වා ආගම සිහි කළා.

ඔෂිනුත්, අම්මාත් සෙමෙන් තඩා වැටුණා.

"ඔෂින්."

"ඇයි තාත්තා."

"හෙට උදේම යන්ඩ ලෑස්ති වෙන්න. කන්රූෂි උදේම එනවා කිව්වා."

ඔෂින් මව දෙස බැලුවා. මව ඇයට හොයන ලෙස ඉඟියක් දැන් වූවා.

"තාත්තා මළ ගෙයක් නිසා තව ටික දවස....."

Rangika

"ඕන නෑ. ඒවා සේරම ඉවරයි. හෙට උදේම යන්න ලෑස්ති වෙනවා."

ඔෂින් තනි වූ අවස්ථාවක් බලා අම්මා කතා කළා.

''ඔෂින්, මට හරුන් කිව්වා. කන්රුෂි නරක මිනිහෙක් කියලා. ඔයා යන්ඩ එපා. ඔයා හෙට කගායා යන්න. මැඩම්ලා සතුටු වෙයි ඔයා ආපිට ආවාම. මම ඔයාට හෙට පාන්දරම කතා කරන්නම්. පාන්දරම යන්න.''

ෆුජි වට පිට බැලුවා.

"හොඳයි." ඔෂින් සෙමෙන් කිව්වා.

''සෝජි, හරුන්ගේ ඇඳුම්, කොට්ට මෙට්ට සේරම පුලුස්සලා දමන්න. මරණයටවත් සේද කම්හලෙන් මුදල්වත් එව්වේ නැහැ. ආවේත් නැහැ.

සෝජි ගිනි පන්දමකුත් රැගෙන එළියට ගියා.

"දොස්තරට, කෑමවලට, බෙහෙත්වලට අපරාදේ වියදම් කළේ."

සෝජි කිව්වා.

ඔෂින් අම්මා ළඟට ගියා.

"අම්මා හරුන් මට කිව්වේ ටෝකියෝ යන්න කියලා. එහෙ ගිහින් කොණ්ඩා සැකසුම් ඉගෙන ගන්න කියලා. මම හරුන්ගේ සිහිනය සැබෑ කරනවා. පව් අම්මා හරුන්ගේ ජීවිතය දිහා බලන කොට දුකෙන්ම ගත වෙලා ගිහින්. සතුටකට තිබුණේ හිරාගෝ මහත්තයාගේ කරුණාව. මම කොහොම හරි කොණ්ඩා සැකසුම් ඉගෙන ගන්නවා."

"ඒත්, ඔෂින් ඔයා ඒ මැඩම් ගැන දන්නෙත් නැතිව?"

"නෑ, මට විශ්වාසයි."

"ඔෂින්, කැමති දෙයක් කරන්න. ඔයාට වරදින්නේ නැහැ."

අම්මා කිව්වා.

පසුවදා පාන්දරින්ම ෆුජි ඔෂින්ට කතා කළා.

"ඔෂින් යන්න සූදානම් වෙන්න තාත්තයි, සෝජියි නැගිටින්න ඉස්සර වෙලා."



ඔෂින් කැටුව අම්මා කන්ද උඩට ආවා.

"ඔෂින්, මේ සල්ලි ටික ගෙනියන්න."

"එපා අම්මා මා ළඟ සල්ලි ටිකක් තියෙනවා. හරුන් මට ඒ දවස්වල කෝච්චියට යන මුදල් දුන්නා."

"ඒත් ඔෂින්, ඔයාට කරදරයක් වුණොත්. මේ සල්ලි තියා ගන්න. ඔෂින් ඔයාට ආපිට එන්න බැහැනේ. මේ අපේ අන්තිම හමුවීම වෙන්නත් පුළුවනි. මම නම් කැමති ඔයා කගායා යනවා නම් තමයි."

"අම්මා මම ටෝකියෝ යන්නම් අම්මා."

"කොහෙ ගියත් කමක් නැහැ හරුන් වගේ දුක් විඳින්න සිද්ධ වෙන්න නම් එපා."

"අම්මා මම ආත්මාර්ථකාමියි නේද? "

"ඒකට කමක් නෑ ඔෂින්. ඔයා ප්‍රවේසම් වෙන්න දූව."

"අම්මා, මම දවසක අම්මාව මෙහෙන් නිදහස් කරගෙන යන්න එනවා එනවාමයි. අම්මා ප්‍රවේසමෙන් ඉන්න."

"හොඳයි."

ඔෂින් හිස නමා ආචාර කර පාන්දරම කන්ද බැස ගියා. අවිනිශ්චිත අනාගතයක් ගැන සිතමින් ඇය ඇවිද ඉක්මන් කළා. ඒ එළිය වැටෙන්න පෙර දුම්රිය පළට යාමටයි. තමන්ගේ නිවසට නැවත යාමට නොලැබීම ගැන ඇය දුක් වුණා. දුක් විඳින අම්මා ගැන ඇය දුක් වුණා.

'ඒත් මට මා ගැන විශ්වාසයි.' ඇය සිතුවා.

"මොකද මේ පාන්දරම ඇහැරගෙන."

සකුගෙයා ෆුජි වැඩ කරන දෙස බැලුවා.

"හරුන්ගේ දානය හදනවා."

"කෝ ඔෂින්."

"ඔය ගිව්වෙය."

ටිකකින් සෝජි ආවා.

"අම්මා.. ඔෂින් එක්ක යන්න ඇවිල්ලා."

"ඔෂින්. ආ... ඔෂින් එයාගේ යහළුවන්ට කියන්න යන්න ඇති. මට කිව්වේ නැහැ. කොයි වේලාවේ ගියාද දන්නේ නෑ. තව ටිකකින් එයි."

ෆුජි කෑම බඳුන් සකස් කළා.

දැන් ඔෂින් දුම්රියට ගිහින් ඇති.

ෆුජි ඒ අතරම සිතුවා.

# දහය

ඔෂින් ටෝකියෝ දුම්රිය පොළෙන් එළියට ආවා. කොයිතරම් විශාල නගරයක් ද ? මිනිස්සු එහෙ මෙහෙ යනවා. ඔෂින්ගේ හිතට බියක් ඇති වුණා. මම අතරමං වෙයි ද? මේ විශාල නගරයේ රැකියාවක් කිරීමට අවස්ථාව ලැබෙයි ද ? හසකාවා මැඩම් ගේ කොණ්ඩා සැකසුම් ආයතනයේ රැකියාවක් ලැබෙයි ද ? එම ස්ථානය සොයා ගැනීමට අපහසු වෙයි ද ? ඔෂින් ලිපිනය අතේ තියාගෙන කීප දෙනෙක්ගෙන්ම ඒ පිළිබඳ විමසුවා. ටෝකියෝවට ඈය මෙන් අමුත්තන් වූ අය හෝ ඉතිරි අය ඔෂින්ට උදව් කිරීමට ඉදිරිපත් වුණා. යායුතු මඟ පිළිබඳ කියා දුන්නා.

ඔෂින් අකුරු දැන සිටීම මේ අවස්ථාවේ ඇයට බෙහෙවින් ප්‍රයෝජන වුණා. අවසානයේ ඈය එම ආයතනය සොයා ගත්තා. ඔෂින්ගේ මුහුණේ සිනාවක් ඇඳී ගියා. ඈය සාප්පුව ඉදිරියේ සිටගෙන සිටියා. ඉතාමත් අලංකාර ඇඳුමින් සැරසුණ යුවතියන් දෙදෙනෙක් ඈය පසුකර ගොස් සාප්පුවේ දොර ඇරගෙන ඇතුල් වුණා. ඔෂින් හරුන් අක්කාව සිහිපත් කර ගත්තා. මව් මම හරුන්ගේ ප්‍රාර්ථනාව ඉෂ්ට කරනවාමයි.

එක් අයෙක් දොර ළඟ සිට ගත්තා.

"ආයුබෝවන්, එන්න මැඩම්. කොණ්ඩය සකස්කරන්න ද ආවේ."
සේවිකාවක් ඇසුවා.

"නැහැ... මම... මේ...."

"අපේ සේවය අවශ්‍ය නැද්ද ?"

"මම මැඩම් හසකාවා මුණ ගැහෙන්නයි ආවේ."

Rangika

"දැන් මැඩම් මුණ ගැහෙන්න බැහැ. කරුණාකරලා පාර වහගෙන ඉන්නේ නැතිව ඔතනින් අයින් වෙන්න."

"මම ආවේ හුඟක් ඈත ඉඳලා. රස්සාවක්...."

"මොන රස්සා ද ? මෙහෙ ඉන්න අය වැඩිත් තරම්."

"යනව යන්න, කරදර නොකර."

ඇය නොරිස්සුමෙන් කීවා.

"මට මැඩම් මුණ ගැහෙන්නම ඕනා."

"යනවා යන්ඩ. මෙහෙ කවුරුත් අඳුරන්නේ නැති අය ගන්නේ නෑ."

"මේ ළඟදී ඔය වගේ අඬාගෙන කෙල්ලක් ආවා. අපේ මැඩම්ගේ අනුකම්පාව නිසා නතර කර ගත්තා. කෙල්ල දවස් දෙකෙන් පැනලා ගියේ සල්ලිත් හොරකම් කරගෙන."

"ගම්වල කෙල්ලෝ මේ දවස්වල හරියට ටෝකියෝ එනවා, රස්සාවල් හොයාගෙන."

සේවාලාභී කාන්තාවන් සමග සේවිකාව කියෙව්වා.

"තවමත් ඉන්නවාද ? යනවා යන්න."

සේවිකාව ඔෂින්ව තල්ලු කරලා දැම්මා. ඔෂින් එළියට ගොස් බිම වාඩි වී සිටියා. පැය ගණනක් ගතවී ගියා. මැඩම් හසකාවා එළියට ආවා. ඇයගේ ස්වරූපයෙන්ම මේ මැඩම් හසකාවා යැයි සිතූ ඔෂින් ඇය ළඟට දිව ගියා.

"මැඩම්, මම ඔෂින්. හරුන් මගෙ අක්කා. මේ ලිපිනය මට දුන්නේ හරුන්. අනේ මැඩම් මම ආවේ මැඩම්ගෙන් කොණ්ඩා සැකසුම් ඉගෙන ගන්න."

"මේ දවස්වල නම් වැඩට කෙල්ලන් ගන්න අමාරුයි."

හසකාවා මැඩම් ලිපිනය ඔෂින් අතටම දී ආපිට හැරී ගියා.

"මෙහෙ කවුරුවත් ගන්නේ නැහැ. ඇඳිත්වීමක් නැතිව."

මැඩම් සමඟ සිටි සේවිකාව කිව්වා. ටිකකින් ඔෂින්ව තල්ලු කර දැමූ සේවිකාව පැමිණියා.



"මෙන්න මේ සල්ලි මැඩම් ඔයාට දෙන්න කිව්වා. මෙතන දුම්රිය ගාස්තුව තියෙනවා."

"මට සල්ලි එපා."

"සල්ලිත් එපා නම් අපට වද නොදී යනවා යන්න."

ඔෂින් ඇය දෙස නොසෙල් වී බලා සිටියා. තමාට වඩා අඩු වයස් යුවතියගේ ආඩම්බර බැල්ම විඳ ගැනීමට අපහසුව මෙන් ඔෂින් ආපිට හැරී වේගයෙන් ගමන් කළා. ඒත් ඇය මේ සවන ඇකෑරියෙ නෑ. ඔෂින් සෙමෙන්ම නිවසේ පිටුපසින් ගොස් උයන ගෙට ඇතුල් වුණා.

"කෝ මේ උණු වතුර නිවිලා නේ."

සාප්පුව තුළින් ඇසුණා. ඔෂින් ඇය අත වූ පාර්සලය පසෙක තබා ලිපට දර දමා බටයකින් පිම්බා.

"ඉන්න වතුර උණු කරගෙන එන්නම්."

කියමින් එක් සේවිකාවක් උයන ගෙට ආවා.

"මැඩම්, මෙන්න හොරෙක්. මෙන්න හොරෙක්."

ඇය කෑගැසුවා. සේවිකාවක් සමග හසකාවා මැඩම් ද උයන ගෙට ආවා.

"සමාවෙන්න මැඩම්, ලිප නිවිලා නිසා මම ඒකට දර දාලා පත්තු කළා."

සියල්ලන්ම ඇය දෙස බලා සිටියා. ඔෂින් මැඩම් ළඟට ගොස් දණ ගසා ගත්තා.

"අනේ මැඩම්, මට මෙහෙ ඉන්න දෙන්න."

"අන්න ගින්දර නිවිලා."

කී හසකාවා මැඩම් යන්න ගියා. සෙසු අයත් ගියා. ඔෂින් වතුර උණු කර තේ වත් කළා. ඇය දැක්ක සේවා ලාභී කාන්තාවන්ට සේවිකාවක් තේ දුන්නු ආකාරය. ඇය තේ කෝප්ප දෙකක් බන්දේසියක තියාගෙන ඉදිරිපස කාමරයට ගියා.

"බොන්න මැඩම් තේ එකක්. අපි ඉක්මණින්ම මැඩම්ලාට අවස්ථාව ලබා දෙන්නම්."

"ස්තූතියි ඔයාට."

ඔවුන් සෙමින් තේ බිව්වා.

"මෙක හරි රසයි. ඔයා අලුත් සේවිකාවක් ද ?"

ඔමින් කිසිවක් නොකියා යන්න ගියා. ඉන්පසු ඇය පැමිණ කාන්තාවන්ගේ ගෙටා සෙරෙප්පු පිස දමා පිළිවෙලකට තිබ්බා. නැවත උයන ගෙට ගොස් වතුර උණු කළා.

"ඉටිෂු, මේ තුවා හෝදලා වැලට දමන්න." සේවිකාවක් කිව්වා.

ඉටිෂුට පෙර ඔමින් තුවා ටික එකතු කර ගත්තා.

"මේවා සෝදන්නේ මොන සබන් දාලා ද ?"

ඔමින්ගේ ප්‍රශ්නට කිසිවෙක් පිළිතුරු දුන්නේ නැහැ. ඇය තුවා රැගෙන නළ ළිඳ ළඟට ගියා. එහි වූ සබන් සිඹ බලා සබන් කැල්ලක් තෝරාගෙන තුවා සෝදාවැලට දැම්මා. මේ වෙලාවේ සියලු දෙනාම දවල් කෑමට මේසයට පැමිණ සිටියා.

ඔමින්, ඉටිෂු සමග අඩුපාඩු ගෙනගොස් මේසයට තිබ්බා.

අන්තිමට කෑමට වාඩි වුණේ හසකාවා මැඩම්.

"කෝ අර ළමයා. එන්න කියන්න කෑම කන්න."

"මම පස්සේ කන්නම් මැඩම්."

"දැන් කෑවේ නැත්නම් බඩගින්නේ ඉන්න වෙයි."

"ඒකත් ඇත්ත. ඊයේ රෑ කෑවට පස්සේ මටත් කන්න බැරි වුණා."

ඔමින් මැඩමට අවශ්‍ය වතුර හා අත් පිස්නා ගෙන ගොස් තමා ඇයගේ කෝප්පයට බත් බෙදා ගත්තා.

"බත් නම් ඔනා තරම් තියෙනවා. අච්චාරු මදි ඇති."

"නෑ මැඩම්. මට මේ ඇති."

කෑම ගැනීමෙන් පසු ඇය සියලුම භාජන සෝදා පිරිසිදු කර පිස දැමුවා. උයන ගෙය බිමට වතුර දමා පිස දැමුවා. රාත්‍රී කෑම සකස් කිරීමට සූදානම් කළා. සුදු හාල් භාජනයට දමා ලිප උඩ තැබුවා.



"ඉටිෂු රෑට උයන්න ගන්න." මැඩම් කිව්වා.

"හොඳයි මැඩම්. ගේ අතුගාලා ඉන්නම්."

"එතකොට රෑ වෙනවා වැඩියි. ඔය අනිත් අයත් ඉටිෂුට උදව් කරන්න."

ඔමින් ඉටිෂුට කතා කළා.

"මම බත් නම් ඉව්වා. වෙන මොනවද හදන්නේ දන්නෙ නැති නිසයි බලාගෙන හිටියේ."

"ඒවා මගේ වැඩ. ඔයා ඇඟිලි ගහන්න ඕනෑ නෑ. පැත්තකට වෙන්න."

ඉටිෂු බැන වදිද්දිත් ඔමින් අත් උදව් දුන්නා.

"දැන් අර කෙල්ල කොහේද නිදාගන්නේ මැඩම්." ඔටායෝ ඇහුවා.

"ඇයි ඔයාලගේ කාමරේ."

"මැඩම්ගේ හිත හොඳ වැඩියි. ඒ ළමයට හෙට යන්න කියමු."

"මොනවද කියන්නේ ටාකා මම ඒ කෙල්ල මේ රෑ එළියට දැම්මොත් එයාගේ ජීවිතයට මොනවා වෙයි ද ?"

"ඒ වුණත් මැඩම් අර කෙල්ල මතකයින්නේ කරපු වැඩේ."

"හැම කෙල්ලම එහෙම නැහැනේ. මම තීරණය කළා තියා ගන්ට."

"මැඩම්ගේ හිත..."

"මේ ආයිම කුරු කුරු ගාන්ට එපා."

මෙවිටම ඔමින් සේදූ ලේන්සු ගෙන ගෙට ආවා.

"මෙහෙ එනවා. මොකක්ද නම කීවේ?"

"මැඩම්." ඔමින් එතනම දණගහ ගත්තා.

"මගෙ නම ඔමින්."

"ඔමින් මම කිව්ව ගමන් ආපිට යන්ට ඕනෑ තේරුණාද ?"

"එහෙමයි." ඇය හිස නමා ආචාර කළා.

"එහෙම නම් මේ ගොල්ලත් එක්ක නාන්න යන්න."

ඔමින් තුවා නවා තබා එළියට එන විට කිසිවෙක් සිටියේ නෑ.

ඔමින් හසකාවා මැඩම් සිටි තැනට ගියා.

"මැඩම් තේ එකක් ගෙනෙන්න ද ?"

"අනිත් අය ඔයාව දමලා ගිහින් නේද ?"

"නෑ මැඩම්. මම පමා වුණා. මම නාන කාමරයට යන්න දන්නේ නෑ."

"මෙහෙ නාන්න ලැබෙන්නේ සුමානෙට තුන් දවසයි. ඒක හරියටම දැන ගෙන අනිත් අය එක්ක යන්න ලෑස්ති වෙන්න. අනිත් එක ඔයා ඉක්මනින් වැඩ කරන්න ඉගෙන ගන්න. කාගෙන්වත් උදව් බලාපොරොත්තු වෙන්න එපා."

"මැඩම් මට මොනවද කරන්න වෙන්නේ මෙහෙ."

"ඒක අහන්න සුදුසු ප්‍රශ්නයක් නෙමෙයි. ඔයාම දැනගන්න ඕනෑ. එන්න නිදාගන්න කාමරය පෙන්වන්න."

මැඩම් ඔමින්ව කාමරයට එක්ක ගියා.

"මේ කාමරේ සේරම නිදා ගන්නේ. ඔය කබඩ් එකෙන් මෙට්ටයක් ගන්න. පොරෝනාවක් ගන්න. අන්න අර මුල්ලෙන් මෙට්ටය දමා ගන්න."

"ස්තුතියි මැඩම්."

"හොදයි" මැඩම් කාමරයෙන් පිටව ගියා.

පසුවදා උදේම අවදි වූ ඔමින් සාප්පුවේ සියලු කණ්ණාඩි පිහ දැම්මා. උයන ගෙට යන විට ඉට්නු කෑම පිසීමට සූදානම් වෙමින් හිටියා.

"ඉට්නුගේ වයස කීයද ?"

"මගෙ වයස 13 යි. ඔයා ?"

"මගෙ වයස 16 යි. ඔයා පොඩි ළමයෙක් මම ඔයාට උදව් කරන්න හදන්නේ ඒකයි."



"ඒත් මේවා මට නියමිත වැඩ. ඔයා මේවා කළාම මම මොනවද කරන්නේ. එතකොට මැඩම් කියයි දෙන්නෙක් අවශ්‍ය නෑ කියලා මට යන්න කියයි. මගෙ තාත්තා අද ගොවියෙක්. ගෙදර ඉන්නේ ලොකු අයියා. එයාගේ බිරිඳ හරිම නපුරුයි. මට ගෙදර යන්න ඉඩ දෙන්නේ නෑ. මම මෙහෙ ආවේ කොණ්ඩා මෝස්තර ඉගෙන ගන්ඩ. ඒත් ඊට ඉස්සර මෙහෙ අවුරුදු තුනක්වත් වැඩ කරන්න ඕනෑ. ඊට පස්සේ තමයි සහායිකාවක් වෙන්න පුළුවන් වෙන්නේ. මෙහෙ ඉන්න ඕනනුට, කයිකෝට තවම සහායිකාවෙවත් වෙන්න බැරි වුණා. මම හිතුවෙ දිගටම මේ වැඩ කරගෙන ඉන්නයි. ඔයා නිසා මටත් යන්න වෙයි."

"මම ඒ බව දැනගෙන හිටියේ නෑ ඉට්නු. මට සමාවෙන්න."

"ඔව් ඔමින්, ඔයාට මේ රස්සාව දීලා මාව එළියට දමයි."

ඔමින් ඉට්නු සමග එක්ව උදේ හා දවාලට කෑම සූදානම් කළා.

ඔමින්ගේ ඇඳුම් ලේන්සුවේ ඔතා පැත්තක තියා මැඩම් මුණ ගැසීමට කාමරයට ගියා.

"සුබ උදෑසනක් වේවා මැඩම්, මම අද යන්න කියලා. ඔබතුමියගේ කරුණාවට ස්තුතියි. මම කැමතියි මෙහෙ ඉන්න. නමුත් බැරි වෙයි."

"ආ.... දැන්මම එපා වෙලා ද? යන්න ඕනෑ නම් යන්න. මෙහෙ වැඩ ලෙහෙසි නැහැ."

"නෑ මැඩම් මම මීට වඩා වෙහෙස වෙලා වැඩ කරලා තියෙනවා. මේකයි කාරණය මම මෙහේ හිටියොත් ඉට්නුට යන්න වෙයිලු. ඔය කාරණය නිසා මෙහෙ ඉන්න අනිත් අයත් මා එක්ක කතා කරන්නේ නැහැ. ඒ ඉට්නුට මම නිසා අසාධාරණයක් වෙයි කියලා නේ. ඒකයි මම යන්නේ. මම මෙහෙ ආවේ මගෙ අක්කා හරුන්ගේ ප්‍රාර්ථනාව ඉෂ්ට කරන්න. මෙහෙ ආවාම මට හරි ආසා හිතුණා ඔබතුමියගෙන් කොණ්ඩා සැකසුම් ඉගෙන ගන්නත්. ඔබතුමියගේ කරුණාව මට කවදාවත් අමතක වෙන්නේ නෑ."

"ආ.... ඕවද කාරණාව. කෙල්ලෝ දෙන්නෙකුට කන්න දෙන්න කුම්මැහි වෙන්නේ නෑ මම. ඉට්නු ගැන වද වෙන්න එපා. එයාට වයස 13 යි. එයා පොඩි ළමයෙක්. ඔමින්ට පුළුවනි එයාටත් වැඩ කියා දෙන්න. දෙන්නා වැඩ බෙදාගෙන කරන්න. ඒ වගේම ඔමින් මතක

තියා ගන්න අනුන් ගැන සිතා මෝඩ වැඩ කරලා තමන්ගේ ජීවිතය අවුල් කරගන්න එපා. මීට පස්සේ උදේම ඇවිත් මෙවා කියන්න එපා. යනව යනවා ගිහින් කණ්ණාඩි ටික පිහදමනවා."

මැඩම් නැගිට සාප්පුව ඉදිරියට ගියා. ඇය කණ්ණාඩියට එබී බැලුවා. ඉතාමත් හොඳින් ඒවා පිරිසිදු කර තිබෙන අයුරු දැක මැඩම්ට හිනා ගියා.

ඉටිපු ඇවිත් ඔමින්ට හිස නමා ආචාර කළා.

"ඔයා හරිම හොඳයි ඔමින්, ඔයා මා ගැන මැඩම්ට කිව්වා. දැන් මට බය නෑ. අනිත් එක දැන් ඔයා මට කියලා දෙන්න වැඩ කරන්න."

"හොඳයි" ඔමින් හිනැහුණා.

"ඉන්න මම අනිත් අයටත් මේ විස්තරය කියා එන්නම්."

ඔමින් ඉතාමත් සතුටින් දවස ආරම්භ කළා. ඇය තේ සාදා ඉටිපුට දුන්නා.

"මේවා අර නෝනලාට ගිහින් දෙන්න. ඒ ගොල්ලත් එක්ක හොඳට කතා කරන්න."

"හොඳයි."

ඔමින් අනිත් අයගේ මෙට්ට රැගෙන ගොස් අව්වට දැම්මා. දොර ජනේල සියල්ල වතුර දමා පිස දැම්මා. කිළිටි තුවා ඉටිපු ලවා ගෙන්වා සෝදා දැම්මා.

"මේ කෑම හරිම රසයි."

දවල් කෑම මේසයේ දී හැමෝම එහෙම කියලා ඔමින්ට ස්තූති කළා. ඔමින්ට හරිම සතුටුයි. රෑ නින්දට ගිහින් ඔවුන් නැවත ද ඔමින්ට ස්තූති කළා.

"අද මෙට්ටත් උණුසුම්. ඔමින් මෙට්ට අව්වට දනවා මම දැක්කා."

"ඕක අපටත් කරගන්න තිබුණා. ඒත් ඔමින් දවසම වැඩ කරලා රෑ වෙලා නින්දට වැටෙනවා. මොනවත් කෙරෙන්නේ නෑ හිතුවට."

"අනේ ඔව්, ඔමින් ඔයා නම් හොඳ යෙහෙළියක්."



"අපි හැමෝම ඔයාට ස්තූතිවන්ත වෙනවා."

"කමක් නෑ මම දන්නවනේ ඔයාලා වැඩ බව. වද වෙන්න එපා. මට පුළුවන් උදව්වක් කරන්නම්. මහන්න එහෙම තියනවානම් මට දෙන්න. මට මහන්නත් පුළුවනි. මම මීට ඉස්සර හිටියේ සකාවාවල. ඒ ගෙදර ලොකු මැඩම් මට හුඟක් දේවල් ඉගැන්නුවා. මම එතුමියට ණය ගැතියි."

"පේනවා ඔයා හොඳට වැඩ ඉගෙන ගෙන කියලා. මැඩම් කිව්වා ඔයා හොඳට පිළිවෙළට වැඩ කරනවා කියලා."

"අපි පිට ගෙවල්වලටත් යනවානේ කොණ්ඩ සකසන්ඩ. ඒ ගෙවල්වල ඔයා වගේ පිළිවෙළට වැඩ කරන අය නෑ. වැඩී දෙනා හරිම කම්මැලියි."

ඔමින් සියල්ල හිනැහෙමින් අසා සිටියා.

ඔමින් හැම විටම වැඩ නිමාකර සාප්පුව තුළට ගොස් සේවිකාවන්ට උදව් කළා. ඒ ගමන් ම කොණ්ඩා සකස් කරන අයුරු බලා සිටියා. කොණ්ඩා සැකසීමට එන කාන්තාවන්ගේ හිස සෝදන්න ඉටිපුට පැවරී තිබුණා.

ඔමින් තුවා සෝදමින් හිටියා.

"ඔමින්." ඉටිපු තුවයක් රැගෙන ඇය ළඟට ආවා.

"ඔමින්, අද තිකෝ පිට වැඩට ගිහින්. මැඩම් මට කිව්වා කඩපිලට ගිහින් බඩු ගේන්න කියලා. අනේ ඔමින් මට බඩු ගන්න තේරුමක් නෑ. හුඟක් වියදම් කළොත් මැඩම් මට බනියි. අනේ ඔමින් ඔය සේරම අද මම කරන්නම්. ඔයා බඩු ගේන්ඩ යනවද ?"

"වද වෙන්න එපා ඉටිපු. මේ වැඩ කරලා මම යන්නම්. මට පුළුවනි ලේසියෙන් කරලා බඩු ගන්න."

ඔමින් කඩපිලට ගොස් බඩු ගෙන ආවා. එදා රාත්‍රී කෑම ගැනීමට ගියා මැඩම්.

"කවුද දැන් කෑම උයන්නේ ඔමින් ද ?" ඇසුවා.

"ඔව් මැඩම්."

"එන්න කියන්න ඔෂින්ට."

"මැඩම් මම ආවා."

ඔෂින් එතනම දණ ගසාගෙන කිව්වා.

"ඔෂින් දන්නවද අපි එක්කෙනෙකුට කෑමට වියදම් කරන ගණන කියද කියලා."

"එහෙමයි මැඩම්."

"ඒත් මේ කෑම, මේ බෝංචි ඇට මාළුව. මේ දවස්වල බෝංචි වගේ මිල අධික එළවළු පාවිච්චි කළාම ලොකු වියදමක් යනවා."

"මැඩම් මම ඔය බෝංචි ගත්තේ හුඟක් අඩු මුදලකට. ඔවා තෝරිච්ච බෝංචි. මම ඒවා ගෙනැල්ලා ඇට ටික වෙන් කරලා ගත්තා. ඒ නිසා ලොකු වියදමක් ගියේ නෑ."

මැඩම් එතැනින් එහා කතා කළේ නැහැ. ඇය මඳ සිනහවකින් සිහිපත් කළේ ඔෂින්ගේ දක්ෂතාවය ගැනයි.

රාත්‍රියේ නින්දට ගිය විට සේවිකාවන් විවිධ මාතෘකා ඔස්සේ කතා කරන කතා ඔෂින් අසා සිටිනවා.

"ඔෂින්, අපි හිතුවා ඔයාව දැනුවත් කරන්න ඕනෑ කියලා. මේ කොණ්ඩා සැකසුම් ගැනත් අපි නිතරම උණු වතුර පාවිච්චි කරන නිසා මේ බලන්න අපේ අත් තැම්බිලා තියෙන්නේ." ඔෂිකෝ කිව්වා.

"ඒ විතරක් නෙමෙයි කොණ්ඩා ගැට ගහන නූල්වලට අත කැපිලා. ඉතින් මෙහෙම වැඩට එන්නත් අවුරුදු පහක් විතර යනවා. සමහර විට ඊට වඩා. මේ ඉන්න ඔතාෂු, කයිකො එහෙම තවමත් සහායිකාවන්වත් වුණේ නෑ."

"අපි පිට ගිහින් හොයන සල්ලිත් මැඩම්ට ගෙනත් දෙන්න ඕනෑ."

"ඔවා තමයි තියෙන ගැටළු. ඒ මදිවට දැන් අපි විවාහ වෙන වයස ගෙවීගෙන යනවා. බලන්න මැඩම්, මැඩම්ටත් විවාහ වෙන්න බැරි වුණා නේ."

"විවාහයක් ඕනෑ නෑ. මගෙ පියා අද ගොවියෙක්. ආච්චම්මත් දුක් විඳලයි මැරුණේ. අම්මා තවමත් දුක් විඳිනවා. මට ඕනෑ වුණේ අද ගොවි ජීවිතයක් නෙමෙයි. වෙනත් විදිහකට ජීවත් වෙන්න. ඒ නිසා ස්වාධීනව ජීවත් වෙන්න නම් මෙහෙම රැකියාවක් ඉගෙන ගන්න එක හොඳයි. මම තව අවුරුදු දහයක් හරි මැඩම් ළඟ ඉඳලා කොණ්ඩා සැකසුම් කරන්න ඉගෙන ගන්නවා."



ඔෂින් කිව්වා.

"ඔෂින්ගේ කැමැත්තක්."

ඔෂින් නිවසේ බොහෝ වැඩ කටයුතු කළත් සාප්පුව තුළට ගොස් සහායිකාවන්ට උදව් කරමින් කොණ්ඩා සැකසුම් කරන ආකාරයද හොඳින් බලා ගත්තා.

"ඔෂින්," ඔත්සු කතා කළා.

"මේ රෙදි ඇඳුම් මහන තැනට දීලා එන්න. මැඩම්ට කිමෝනාවක් මහන්න කියන්න. ඉක්මනට ඕනෑ කියන්න."

"මැඩම්ට කිමෝනාවක් ද ?"

"ඔව්, ඇයි ?"

"ඔත්සු මටත් කිමෝනා මහන්න පුළුවනි. මම මේක මහන්න ගන්න ද ?"

"ඔෂින්, ඔයාට මහන්ව පුළුවන් ඇති. හැබැයි මතක තියා ගන්ව. මේක හොඳ වටිනා රෙද්දක්. නාස්ති වුණොත්."

"මේ වගේ සේද රෙදි මම මහලා නම් නැහැ තමයි. හැබැයි මට මහන්ඩ පුළුවනි. මැඩම් මේක මහන්ඩ දෙන සල්ලිත් ඉතුරු වෙයි."

"ඔෂින්, මතක තියාගන්ඩ ඔයා මේ ගන්නේ ලොකු අවදානම් වැඩක්."

"නෑ මට විශ්වාසයි."

"එයාට මහන්ඩ පුළුවනි නම් දෙන්ඩ ඔත්සු."

මැඩම් පිටුපසට වී සියල්ල අසා සිට අවසානයේ කිව්වා.

"ස්තුතියි මැඩම්. මා ගැන විශ්වාස කළාට."

"හැබැයි ඔෂින් මට ඉක්මනට මහල ඕනෑ හොඳද ? අන්න මගේ කාමරේ මැහුම් පෙට්ටියේ ඕනෑ උපකරණ සේරම ඇති."

හසකාවා මැඩම් හිනැහෙමින් පිටව ගියා.

"ඔෂින්, වැරදුණොත් වෙන දේ දන්නවද ?"

ඔෂින් කිසිවක් නොකියා රෙදි රැගෙන කාමරයට ගියා. ඔෂින් වෙනදා මෙන් ගෙදර වැඩ කළා. නිදහසක් ලැබුණ ගමන්ම මැහුම් වැඩ කළා. රාත්‍රී කාලයෙත් නොනිදාම මැහුවා.

දින කීපයට පසුව ඔෂින්, ඔත්සුට කතා කළා.

"ඔත්සු, මේ කිමෝනාව මැඩම්ට දෙනවද ?"

"ඇයි මම දෙන්නෙ. ඔයා මහන්සි වෙලා මැහුවා. ඔයාම ගිහින් දෙන්න."

ඔෂින් සමග ඔත්සුත් මැඩම් සොයා ගෙන ගියා.

"මැඩම්, මෙන්න හොඳද බලන්න."

"කෝ බලන්න."

මැඩම්, කිමෝනාව ඇඳ බැලුවා. කණ්ණාඩිය ඉදිරියට ගියා.

"හොඳයි ඔෂින්, ඔයාට ස්තුතියි. හැබැයි මම මේක මැහුවට ඔයාට ගෙවනවා."

"එපා මැඩම්, මම මේක හරිම ආශාවෙන් මැඩම්ට මැහුවේ."

"හොඳයි, එහෙම නම් ස්තුතියි ඔෂින්."

ඔෂින් හිස නමා ආචාර කර යන්න ගියා.

දැන්නම් අම්මට ලියුමක් ලියන්න ඕනෑ. දැන් මෙහෙ රස්සාව ස්ථිර නිසා ඒ ගැන අම්මට ලියන්න ඕනෑ. ඔෂින් මවට දිග ලිපියක් ලිව්වා. හැබැයි ඇය එය ගෙදර ලිපිනය නොදමා රිකි ගෙ නමින් තැපැල් කළා.

රිකි ලිපියක් රැගෙන ෆුජි සොයා ගන්න ඔෂින්ගේ ගෙදර ගියා.

"ෆුජි, ඔයා කොහේ ද ?"

"ආ.... කවුද බැලුවා. රිකි නේ. ඔයා හුගක් දවසකින් දැක්කේ."

"ෆුජි සකුසො ගෙදර ඉන්නව ද ?"

"නෑ. කුඹුරට ගිහින්."



"මෙන්න ඔයාට ඔෂින්ගෙන් ලියුමක්. මගෙ නමට එවලා තියෙන්නේ."

"මට අකුරු කියවන්න බැහැ නේ."

"දෙන්නකෝ මට නම් ටිකක් කියවන්න පුළුවනි."

"ඔෂින් කොණ්ඩා සැකසුම් සාප්පුවේ වැඩ කරන්නේ. එහෙ මැඩම් හොඳයි. කරුණාවන්තයිලු. එහෙ වැඩ කරන අයත් හොඳයිලු. ෆුජි ගැන එයාට දුකයිලු. එයා කවදාහරි කොණ්ඩා සැකසුම් කරන්නියක් වෙලා හරි හම්බ කරගෙන ඔයාව ටෝකියෝ එක්කරගෙන යන්ව එනවාලු."

රිකි ලිපිය කියවා ෆුජිට තේරුම් කර දුන්නා.

"ඔයේ ලිපිනය ලියල ද රිකි."

"ඔව්, මේ තියෙන්නේ."

"ඒ කෑල්ල ඉරලා ගන්වකෝ."

ෆුජි ඉතිරි ලිපි කෑල්ල ලිපට දැම්මා.

"ඒ ඇයි ෆුජි."

"සකුසො, සෝරි. ඔෂින් එක්ක තරහින් ඉන්නේ. ඔෂින්ට ලියුමක් ලියලා දෙන්න."

"හොඳයි, මම හෙට කඩදාසි, තීන්ත එහෙම අරගෙන එන්නම්."

"හොඳයි."

එවිටම සකුසො පැමිණියා.

"මොකද රිකි."

"නෑ සකුසො ෆුජි මුණ ගැහෙන්න ආවා. පිදුරු සෙරෙප්පු දෙකක් ගන්න."

"එහෙමද ? රිකි, ඔෂින් සකාටා ගිහින් ද ?"

"සකාටා, ආ.... නෑ... මට නම් මුණ ගැහුණේ නෑ."

"ඔකි අපිට සල්ලි එවන්න වෙයි කියලා හැංගිලා ඉන්නවා. හැබැයි එයාට [illegible] දන්නේ නෑ මම."

Rangika

සකුසො ළඟ වූ කූඩයට පයින් ගසා යන්න ගියා.

"ඔෂින් මෙන්න ඔයාට ලිපියක්."

"ස්තුතියි. ඉට්සු."

"අම්මා ද එවලා තියෙන්නේ ?"

"ඔව්."

ඔෂින් ලිපිය ඉක්මනින් විවෘත කර කියෙව්වා. නිවසේ සැම දෙනාම සනීපයෙන් ඉන්න බව කියවා සතුටු වුණත් ඊළඟ ආරංචියෙන් ඔෂින් තිගැස්සුණා.

"ඔෂින් රිකි සකාටා ගිහින් ඇවිත් කීවා මිස් කායෝගේ නංගි සායෝ නිව්මෝනියාව හැදිලා මිය ගිය බව."

අම්මා ලියලා තිබුණේ එහෙමයි. සායෝ බබා. මං කොයි තරම් කාලයක් එයාව බලා ගත්ත ද ? මගේ නංගි කෙනෙකුට වගේ ආදරය කළා. ඔෂින් ගේ ඇස් වලින් කඳුළු කඩා හැලුණා. ඔෂින් සෙමෙන් වැලපුණා. ඉට්සු මේ බව හසකාවා මැඩම්ට කීවා.

"ඇයි ඔෂින් මොකක් ද ප්‍රශ්නය ?"

ඔෂින් අඩමින්ම මැඩම්ට විස්තරය කීවා.

"ඔය දරුවා බලා ගත්තේ මම මැඩම්. මට හරි වේදනාවක් එයාගේ මරණය අහන්න ලැබීම."

"මම හිතනවා ඔෂින් කගායා ගිහින් එනවා නම් හොඳයි කියලා."

"ඔව්, මැඩම් මම යන්නම ඕනෑ."

"එහෙම නම් හෙට උදේ ම යන්න."

උදේම ඔෂින් ගමනට සූදානම් වුණා. හසකාවා මැඩම් හමු වී අවසර ගත්තා.

"ඔෂින් මේක තියා ගන්න."

මැඩම් මුදල් කවරයක් ඔෂින්ට දුන්නා.

"ඒත් මැඩම්, මං මේ සල්ලි ගන්න මොනවත් කළේ නැහැනේ."



"ඇයි නැත්තේ ? ඔයා ගෙදර වැඩ කළා. මගෙ ඇඳුම් මැහුවා. පුරිමහලා කෑම වේල් හැදුවා. ඔයාට මේ මුදල් අයිතියි. මට දුකයි මට තවම ඔයාට කොණ්ඩා මෝස්තර කියලා දෙන්න බැරි වුණාට. ටිකක් ඉන්න ඔෂින් මෙන්න මේ කිමෝනාව ඇඳගෙන යන්න. ඔයා ලස්සනට ඉන්නවා දැක්කහම මිසිස් යශිරෝට සතුටු හිතෙයිනේ."

"ස්තුතියි මැඩම්." ඔෂින් හිස නැමුවා.

"දවස් පහක් හයක් හිටියට කමක් නෑ."

"හොඳයි. ඒත් මම ඉක්මනට ආපිට එන්නම්."

ඔෂින් දුම්රියෙන් බැස කගායා ආයතනයට ගියා. යශිරෝ මහත්මිය ඔෂින් දැක බෙහෙවින් සතුටු වුණා. ඔෂින් තමන් පිළිබඳ විස්තර මැඩම් සමග කිව්වා.

"ඔෂින්, ටෝකියෝවලදී ඔයාට කායෝ මුණ ගැහුණේ නැද්ද?"

"නෑ, මැඩම්. ආරංචියක්වත් නෑ."

"ඔෂින් කොහොම හරි කායෝ ගෙන්න ගන්න ඕනෑ."

"ඔව්, මැඩම්. මම පුළුවන් තරම් උත්සාහ කරන්නම්."

ඔෂින් ඒ දවස්වල වැඩියෙන්ම ගත කළේ යශිරෝ මහත්මිය සමගයි. ඇය නිතරම කීවේ කායෝ ගෙන්වාගෙන කගායා ආයතනය භාර දී ඇය විවාහ නොවී සිටී නම් සුදුසු විවාහයක් කර දෙන බවයි.

"ඔෂින් මේ දවස්වල ඔයාමාවල සහල් විප්ලවයක් පැවැත්වෙනවා. ඇමරිකාව, ජර්මනිය වගේ රටවල් යුද්ධ ප්‍රකාශ කරලා. මෙහෙ හාල් ගාන වැඩිකරලා. හාල්වලට පාලන මිලක් ඉල්ලනවා. එක අතකට මේ හාල් වෙළඳාමත් හොඳ නෑ. කොච්චර සල්ලි හම්බ කළත් හිතට කිසිම සැනසීමක් නෑ. කායෝ නෑ. සායෝ නැහැ. මොකක්ද මේ ජීවිතේ කියලා හිතෙනවා. දැන් නම් ජීවත් වුණා ඇති කියලත් හිතෙනවා."

යශිරෝ මහත්මිය හිතේ තියෙන සෑම දෙයක්ම ඔෂින් සමග කිව්වා. ඔෂින් ආපසු එන දවසේ ඇය සමුගත්තා මෙහෙමත්

"ඔෂින්, ආපිට යන්න එපා. ඔෂින් ඔයා මේ පවුලේ කෙනෙක් වගේ. ඔයා ඉන්න. අපිට හරි පාළුයි ඔෂින්."

මිනෝ දෙනෙතේ කඳුළු පිස දැම්මා. ඔෂින් කිසිවක් කීවේ නැහැ. එහෙත් ඇය ආපසු යා යුතු බව යගිරෝ මහත්මිය වටහා ගත්තා.

"ඔෂින්, කායෝ මුණ ගැහුණොත් කොහොම හරි ගෙදර එක්කගෙන එන්න."

"හොඳමයි මැඩම්. ඒක මගෙ වගකීමක් නේ. මට හැකි හැම විටම මම මැඩම්ලා බලන්න එනවා. ඒ වගේම කොහොම හරි මිස් කායෝ හොයා ගන්නවාමයි."

ඔෂින් කගායා නුවරින් සමුගත්තේ දුකින්. ඇය තරයේම සිතා ගත්තා කෙසේ හෝ මිස් කායෝ සොයා ගන්නා බව.

ඔෂින් ටෝකියෝ දුම්රිය පලට පැමිණි විගසම ඇයට විශාල ඝෝෂාවක් ඇසුණා. සියල්ලන්ම එදෙසට දිව ගියා.

"සහල් විප්ලවයට ජය වේවා !" හඬ පැතිර ගියා.

# එකොළහ

ඒ 1918 අගෝස්තු 03 වෙනිදාය.

"සහල් විප්ලවයට ජය වේවා."

විශාල ජන සමූහයක් සටන් පාඨ කියමින් ඉදිරියට යන අයුරු ඔෂින් බලා සිටියා. විප්ලවය යන වචනය සමග ඔෂින්ට මතක් වුණේ කෝටා. මේ ජන සමූහයේ මුල් පෙළේ කෝටා සිටිනවා වන්නට නොහැකිද? ඔෂින්ට හිතුණා මේ මෙහෙය වීමේ කෝටා ඇති බව. ඒ සමගම ඔෂින් ඉක්මනින් ඒ ජන ගඟට එකතු වුණා. ඔෂින් නොදැනීම ඉදිරියට තල්ලු වී ගියා. ඇයට අවශ්‍ය වුණේ පෙළපාලියේ ඉදිරියට යෑමටයි. එහෙත් එය ඔෂින්ව කරදරයකට මුල පිරීමක් වුණා. පොලිසියෙන් ඉදිරියෙන් ගිය අය අල්ලා පොලිසියට ගෙන ගියා. පොලිස් නිලධාරීන් අහසට වෙඩි තබමින් සෙසු අය පන්නා දැමුවා.

හසකාවාගේ කොණ්ඩා සැකසුම් සාප්පුවට රැස්වූ අයත් එහි සේවිකාවෝත් මේ පිළිබඳව කතා කරමින් හිටියා.

"මේක හරිම භයානක කාලයක්."

"ඔව්, මේ කාලේ රුසියාවෙත් විප්ලවයක් පැවැත්වෙනවා."

"ජපානෙත් විප්ලවයක් වෙයි කියලා තමයි මිනිස්සු කියන්නේ."

"ඔවා සේරම කරන්නෙ කොමියුනිස්ට් කාරයෝ නේ."

"ඔව්, ඔය පොලිසියෙන් ඒ ගොල්ලන් හොයනවා කියන්නේ."

"හාල්වල නම් මිල වැඩියි තමයි. හාල්වල මිල පාලනයත් පොහොසතුන්ට ඕනෑ විදිහටයි කෙරෙන්නේ."

Rangika

මේ සියල්ල අසා සිටි හසකාවා මැඩම් කිව්වා.

මේ විටම ඉටිනු මැඩම් ළඟට ආවා.

"මැඩම්, පොලිස් නිලධාරියෙක් ඇවිල්ලා මැඩම්ට එන්න කිව්වා."

"ඒ මොකද බලමු."

හසකාවා එළියට ගොස් පොලිස් නිලධාරියාට ආචාර කළා.

"ඔබද මේ ආයතනයේ භාරකාරිය?"

"ඔව් මහත්මයා."

"මෙහෙ වැඩ කරනවද ඔමින් ටකමුරා කියලා කෙල්ලෙක්."

"ඔව්, ඇයි එයාට කරදරයක්ද?"

"ඔමින් හාල් පෙළපාලියේ ගිහින් පොලිසියෙන් ඇල්លුවා. ඔබට ඇයට ඇප වී බේරාගන්න පුළුවනි. එයා නම් වරදක් කළ කෙනෙක් නෙමෙයි. ඒත් ඔබ පැමිණියොත් හොඳයි."

"හොඳයි." ඇය ඔහුට ආචාර කළා.

හසකාවා මැඩම් කාමරයට ගොස් එළියට යෑම සඳහා සූදානම් වුණා. ඔටෝයෝ කාමරයට පැමිණියා.

"මැඩම්, ඔමින් සකායා යනවා කියලා නේද ගියේ. එයා මොකටද පෙළපාලි ගියේ. ඒකෙන්ම තේරෙනවා නේද? එයා කොමියුනිස්ට්කාරියක් බව. ඕනෑ නෑ එයා බේරා ගන්න."

හසකාවා නිහඬව සූදානම් වුණා.

"යන්න එපා මැඩම්, එයා නිසා අපට කරදර වෙයි."

"එහෙම කරන්න බෑ. එයා මම ළඟ අවුරුදු දෙකක් හොඳට සේවය කළා. ඔමින් කරදරයක වැටිලා නම් එයාට පිහිට වෙන එක මගේ යුතුකම."

හසකාවා මැඩම් සාප්පුවෙන් බැහැරව ගියා.

සියලු දෙනාම ඔමින්ට දොස් කිව්වා.

"ඒත් එයා අහිංසකයි කියලා පොලිස් නිලධාරියෙක් කිව්වා."

ඉටිනු කිව්වා.



"අහිංසකකම නෙමෙයි කපටිකම. ඔය මැඩම්වත් මුලා කරගෙන ඉන්නේ."

"මටත් ජේන්න බෑ වෙලාවකට."

ටික වේලාවකින් ඔමින් මැඩම් සමග සාප්පුවට පැමිණියා. ඇය සෙසු අය ළඟට ගියා.

"ඔන්න මම ආවා."

ඔවුන් අහක බලා ගත්තා.

"මට සමාවෙන්න" ඇය හිම දණ ගසා කිව්වා.

"එන්න ඔමින් කෑම කන්න."

ඉටිනු කතා කළා.

"ඉස්සර වෙලා මැඩම්ගෙ කෑම ටික දීලා ඉඳිමු."

ඔමින් කෑම බඳුන් රැගෙන මැඩම්ගෙ කාමරයට ගියා.

"සමාවෙන්න මැඩම් කෑම කන්නත් මම නිසා පරක්කු වුණා නේද?"

ඔමින් කෑම බඳුනක් රැගෙන මේසය මත තිබ්බා.

"ඔමින් ඔයා ගියා ද සකාටා."

"ඔව් මැඩම්, මාව දැකලා යශිරෝ මැඩම්ට එහෙම හරි සතුටුයි. මම මැඩම් ගැනත් කිව්වා. මැඩම්ටයි මෙහෙ අනිත් අයටයි ජේරටම තෑගි දුන්නා දෙන්න කියලා. මෙන්න තියෙනවා මැඩම්ගෙන් ගත්ත මුදල්. යශිරෝ මැඩම් මට මුදල් ටිකක් දුන්නා."

ඔමින් මුදල් කවරයක් මේසය මත තබා මැඩම්ට ආචාර කළා.

"කියන්න එහෙම නම් ඔයා පෙළපාලියේ ගියේ ඇයි කියලා."

"මිනිස්සු කෑ ගහගහ දිව්වා. මමත් බලන්න ගිහින් නොදැනීම සෙනග අතරට මැදි වුණා. ඊට පස්සේ පොලිසියෙන් අත්අඩංගුවට ගත්තා."

"ඔෂින්, මට ඇත්ත කියන්න ඕනෑ. එහෙම පෙළපාළියට එකතු වෙන්න මොකක් හරි හේතුවක් ඇති. මම දන්නවා ඔෂින් ගැන. ඔෂින් එහෙම මෝඩ වැඩ කරන කෙනෙක් නොවෙයි නේ."

ඔෂින්, හසකාවා මැඩම් දෙසම බලාගෙන හිටියා.

"මැඩම් මම හාල් විප්ලවයට එකතු වෙන්න නෙමෙයි ගියේ. එක්කෙනෙක් හොයන්නයි ගියේ. ඒත් එයා මුණ ගැහුණේ නැහැ."

ඔෂින් හිස දෙපසට වැනුවා.

"හොඳයි, ඇත්ත කිව්වට ස්තුතියි. මට ඒත් හිතුණා ඔයාට මෙහෙන් අස්වෙන්න වත් හිතුණද කියලා."

"නෑ, කවදාවත් නෑ."

"හොඳයි ඔයත් කෑම කන්න."

"ඉන්න මැඩම් මේ සුප් එක නිමිලා.. මම ඒක රත් කරලා ගෙනැත් දෙන්නම්."

"හොඳයි."

ඒ දින කිහිපයේ අනිත් සේවිකාවන් ඔෂින් සමග කතා කළේ නැහැ.-ඉට්සු වෙනදාටත් වඩා ඔෂින් එක්ක කතා බහ කළා. මැඩම් මේ සියල්ලම නිරීක්ෂණය කළා නිහඬවම.

මේ දිනවල සාප්පුවට පැමිණි අය අඩුවුණා.

"මැඩම් බලන්නකො අපේ කස්ටමර්ස්ලා අඩුයිනේ මේ දවස්වල."

ඔටෝයෝ කිව්වා.

"මට නම් හිතෙන්නේ අපි කොමියුනිස්ට්කාරයො කියලා හිතලද දන්නේ නෑ."

"ඔෂින්ගේ වැඩ නිසා අපිටමයි කරදර."

මැඩම් නිහඬව අසා සිටියා.

"ඕක නෙමෙයි හේතුව දැන් වැඩි දෙනා කැමති අපරදිග මෝස්තරවලට. අපේ සාප්පුවේ එහෙම කරන්නේ නැහැනේ."

"ඒ ඉතින් අපේ [illegible]



දවල් කෑම වෙලාවේදි ඔෂින් කෑම සෝදමින් හිටියා.

"ඔෂින් නිසා මැඩම්ටත් කරදරයි." තිශෝකි කිව්වා.

"මොකද්ද ඔෂින් කළ වරද?"

ඉට්සු ඇහුවා.

"ඇයි සැකපිට අත්අඩංගුවට ගැනීම. ඒ නිසා අපේ කස්ටමර්ස්ලා එනවත් අඩුයි."

"ඔෂින් රසට උයලා දෙනකොට, කොට්ට මෙට්ට අව්වට දානකොට ඔෂින් හොඳයි. දැන් නරකයි." ඉට්සු කිව්වා.

"ඉට්සු ඒපා මොනවත් කියන්න." ඔෂින් සෙමෙන් පැවසුවා.

අන්න ඔෂින්ව මැඩම් කතා කරනවා. එන්න අපි නාන කොටුවට යමු.

"ඉට්සු එන්න."

"නෑ, මම ඔෂින් එක්ක පස්සෙ එන්නම්."

ඉට්සු වගේම ඔෂිනුත් බය වුණා. මාව අස් කරයිද දන්නේ නෑ.

"මැඩම් මම ආවා."

"එන්න ඔෂින් කාමරය ඇතුළට."

මැඩම් දුම් වැටියක් දල්වා ගත්තා.

"මේ දවස්වල හිතට කරදරයි නේද ඔෂින්. අපිට මිනිස්සුන්ගේ කටවල්වලට වැට බඳින්න බැහැනේ. ඔයා මේවට දුක් වෙන්න එපා."

"නෑ මැඩම්, මට මොනවා කිව්වත් එකයි."

"ඔෂින්ගෙ හොඳ කාලය ඉදිරියට තියලා හිතන්න. ඔයා අපරදිග මෝස්තර ඉගෙන ගන්න ඕනෑ අද ඉඳලම්."

"මැඩම්, මම."

"ඔව්, ඇයි?"

"[illegible]"

"ඒවා අමතක කරන්න. මෙහෙ නම් සම්ප්‍රදායානුකූල මෝස්තර විතරයි කරන්නේ. ඔයා ඒවා ඉගෙන ගෙන පිට ගිහිල්ලා කරන්න. එහෙම හොඳයි නේද ඔෂින්."

ඔෂින් මැඩම් දෙස පුදුමයෙන් බලා ගෙන හිටියා.

"එන්න, එන්න ඔෂින් අපි දැන්ම ම පටන් ගනිමු."

ඔෂින් මැඩම් පසු පස ගියේ විමතියෙන්.

"අන්න හොඳයි ඉට්ෂුත් ඉන්නවා. ඒක හොඳයි. අපි ඉට්ෂුගෙ කොණ්ඩය සකස් කරලා බලමු."

ඉට්ෂු සතුටින්ම ගිහින් කණ්ණාඩිය ළග වාඩි වුණා. හසකාවා මැඩම් ඔෂින්ට කොණ්ඩා මොස්තරය සකස් කරන හැටි කියා දුන්නා. ඔෂින් කිමෝනාව පටිවලින් බැඳගෙන මැඩම් කී ආකාරයට ම කොණ්ඩය සකස් කළා.

"අන්න හොඳයි, තව ටිකක් මේ කන් වැහෙන විදිහට සකස් කරන්න."

මේ අතර අනිත් සේවිකාවෝ නා ගෙන පැමිණියා. ඔවුන් කාමරය දෙස බලා ගෙන හිටියේ විමතියෙන්.

"ඔන්න ඔහොම බටහිර මෝස්තර ඉගෙන ගන්ඩ. දක්ෂ මෝස්තරකාරියක් වෙන්න බලන්න."

"මැඩම් එතකොට මැඩම්ගෙ බිස්නස්වලට...."

"නෑ නෑ ඒ ගැන ඔයා වද වෙන්න එපා. එකක් කියන්නම් හිතට ධෛර්ය ගන්ඩ.. දැන් ජපන් මෝස්තරවලට ඉල්ලුම අඩු වෙලා. මේවා ඉගෙන ගන්න පහසුයි. ජපන් මෝස්තරවල නීති රීති වැඩියිනේ. බටහිර මෝස්තරවල තියෙන්න ඕනෑ නිර්මාණාත්මක බවකුයි. ඔෂින් දක්ෂ නිසා ඒ ක්‍රම ඉගෙන ගන්න. ඔෂින්ට පුළුවනි අනිත් සාප්පුවලට ගිහින් ඒ මෝස්තර ඉගෙන ගන්න."

මැඩම් යන්න ගියා. සේවිකාවෝ නිහඬවම කාමරයට ගියා.

"ඉට්ෂු, මට පුළුවනි ඔයාගේ කොණ්ඩයෙන් මෝස්තර දමලා ඉගෙන ගන්න."



"ඔව් පුළුවනි. මම කැමතියි. මමත් ඔෂින් බටහිර මෝස්තර ඉගෙන ගෙන සල්ලි හම්බ කරනවා. මොකද මගෙ අම්මා සතුටු කරන්න සල්ලි දෙන්න පුළුවනි නේ මට."

ඔෂින් ඉට්ෂු දෙස ආදරයෙන් බලා හිටියා.

"මැඩම් හරියට වෙනස් වෙලා." සේවිකාවෝ කතා වුණා.

"මැඩමට පිස්සු. ඔය බටහිර මෝස්තර කරන්න ඔෂින්ට පුළුවන්ද? අඩුගානේ සහයිකාවක් වෙලාවත් නැතිව."

"ඔෂින් තමයි ඔය අදහස් මැඩමට දෙන්නේ."

සේවිකාවෝ ඔෂින් සමඟ කතා නොකර සිටීමට උත්සාහ ගත්තා.

හසකාවා මැඩම් ඔෂින්ට මුදල් දුන්නා වෙනත් මෝස්තර සාප්පු වලට ගොස් බටහිර නිර්මාණ බලා ගැනීම සඳහා ඔෂින්ටත් කොණ්ඩා සකස් කර ගැනීමට. එවැනි සාප්පුවකට ගිය ඔෂින් තමන්ට වාරය එනතෙක් බලා සිටින අතර එම කොණ්ඩා මෝස්තර බලා ගෙන හිටියා.

"එන්න මැඩම්."

ඔෂින්ගේ අවස්ථාව ආවා.

"නෑ මට හදිසි නැහැ. මගෙ යාළුවෙක් එනතෙක් මම ඉන්න ඕනෑ. ඔයා යන්න."

"බොහෝම ස්තූතියි."

ඊළඟට හිටි කාන්තාව ඔෂින්ට ආචාර කර කණ්ණාඩිය ළඟට ගියා. ඔෂින් රාත්‍රියේ ඉට්ෂුගෙ කොණ්ඩය මෝස්තර කිහිපයකටම සකස් කළා.

"ඉතින් අන්තිමට ඔෂින්ගේ අවස්ථාව ආවාම."

"මට කෝල් එකක් ගන්න තියෙනවා කියලා මම ආපිට ආවා."

"ඔයා නම් හරිම කපටියි."

දෙන්නාම හිනැහුණා.

දිනක් දිග ගවුමක් ඇඳගත් තරුණියක් පැමිණියා.

"එන්න මැඩම්" ජපන් මෝස්තරයක් ද?

"පිස්සුද මේ ඇඳුමට ඒවා ගැලපෙනව ද?"

"සමාවෙන්න මෙහෙ බටහිර මෝස්තර දමන්නේ නෑ."

"ඉට්සු, ඔය මැඩමට එන්න කියන්න."

හසකාවා මැඩම් කිව්වා.

"වාඩි වෙන්න මැඩම්, ඉට්සු ඔෂින්ට එන්න කියන්න."

ඔෂින් කාමරයේ පඩි මදිමින් හිටියා.

"ඔෂින්, එන්න අන්න ඔයාගෙ පළමුවෙනි කස්ටමර් ඇවිල්ලා."

"අනේ මට බෑ. මට තවම පුහුණුවක් නෑ."

"ඔෂින්, මොකද පමාවෙන්නේ."

"එනවා මැඩම්."

ඔෂින් බියෙන් සාප්පුව තුළට ගියා. දිග ගවුමක් ඇඳි තරුණිය නොඉවසිල්ලෙන් වරින්වර පිටුපස බැලුවා. ඉට්සු වෙවුලන ඔෂින්ට නිල ඇඳුම අන්දුවා. ඔෂින් බිය රැඳි දෙනෙතින් තරුණිය දෙස බලා හිටියා. වරින් වර හසකාවා මැඩම් දෙසත් බැලුවා.

"මෙයාද සේවිකාව."

තරුණිය නොඉවසිල්ලෙන් ඇසුවා.

"ඔව්, ඔව් මම. මොකද්ද මැඩම් මෝස්තරය."

"දැන් විදිහට... කන වැහෙන විදිහෙ මෝස්තරයක්."

"හොඳයි."

ඉට්සු උණුවතුර භාජනයක් ගෙනත් තිබ්බා. ඒ සමගම ගින්දර භාජනයෙන් ඔෂින් කූරක් රත් කර කොණ්ඩය එතුවා.

"මේ මොකද? මගෙ කොණ්ඩය කර්ල් කරන්න එපා."

"නෑ, මැඩම් වද වෙන්න එපා. මම ලස්සන මෝස්තරයක් දමන්නම්."

ඉට්සු එළියට දුව ගියා.



"අනේ දෙවියනේ ඔෂින්ට හොඳ මෝස්තරයක් දමන්න පුළුවන් වෙන්න ඕනෑ."

ඇය ප්‍රාර්ථනා කළා.

ඔෂින් ප්‍රවේසමට කොණ්ඩා මෝස්තරය සකස් කරන විට තරුණියට නින්ද ගියා. ඔෂින් කන දෙපැත්තෙන් කොණ්ඩා කැරලි දෙකක් දැම්මා. කටු ගසා අවසන් කර ඇයට කතා කළා.

"මැඩම් බලන්න. මූණට ගැලපෙනවද කියලා."

තරුණිය දෑස හැර කණ්ණාඩිය දෙස බැලුවා.

"අනේ දෙවියනේ මේ මොකද? මගේ කොණ්ඩය කාලා. මේවා මෝස්තරද? මේ මෝඩ කෙල්ලගෙ වැඩ."

"සමාවෙන්න මැඩම්. මේ මෝස්තරය හොඳ නැත්නම් ඉක්මනට වෙන මෝස්තරයක් දමන්න පුළුවනි."

හසකාවා කිව්වා.

"ඔයා ද මේ ආයතනයේ භාරකාරී. මෙහෙම තකතීරු මෝඩ කෙල්ලෝ ලවාද ඔයා මේ මෝස්තර හදන්නේ."

"ඉන්න මැඩම්."

ඔෂින්ට කතා කරන්න ලැබුණේ නෑ.

"මට පාටියකට යන්න තියෙනවා. තවත් වෙලා නැහැ." ඇය උර රැඳි රෙද්ද අල්ලා විසිකර දැම්මා.

"කමක් නෑ මැඩම් අපි අය කරන්නේ නැහැ."

"මම ගෙවන්නෙත් නෑ. මගෙ කොණ්ඩය කාලා." ඇය මැත වදිමින් යන්න ගියා.

ඔෂින්, හසකාවා මැඩම් ළඟ දණ ගසා ගත්තා.

"මැඩම් මට සමාවෙන්න. මම නිසා මැඩමට කරදර වීකරයි."

"නෑ ඔයා වද වෙන්න එපා. තව උත්සාහ ගන්න. ඒක අමතක කරන්න."

"මැඩම්, මම නිසා මේ ආයතනයට අපහාසයක්."

ඔෂින් අඬමින් එළියටම ගියා.

"ඒ ගැනි මහ එපා කරපු එකියක්. ඔහොමත් බනිනවද. අහිංසක කෙල්ල."

පැමිණ සිටි කාන්තාවක් කිව්වා.

"ඔෂින් නළ ළිඳ ළඟට ගොස් අඬමින් සිටියා. ඉට්සු එතනට වී ඇය සැනසුවා." "අඬන්න එපා ඔෂින්. මම නම් ඒ මෝස්තරයෙ වැරැද්දක් දැක්කේ නෑ.

"ඒ වුණාට ඉට්සු මම හැම වෙලාවෙම මැඩම්ට කරදර කරනවා. මැඩම් ගැන මට දුකයි."

ඔෂින් මුහුණ වසා ගෙන හඬා වැළපුණා.

"ඔෂින්, ඔච්චර දුක් වෙන්න එපා ඔෂින්."

"ඔය අපරදිග මෝස්තර මට බැහැ. ජපන් මෝස්තර හොඳයි. මම කළේ මෝඩ වැඩක් අපරදිග මෝස්තර දමලා. මම හොඳට ජපන් මෝස්තර ඉගෙන ගන්නවා."

ඔෂින් අධිෂ්ඨානයෙන් කිව්වා.

සවස ඔටායෝ මැඩම් මුණ ගැසුණා.

"ඇයි මැඩම් ඔෂින්ට බටහිර මෝස්තර දමන්න ඉඩ දුන්නේ. ඕකෙන් වෙන්නේ අපේ ආයතනයට අවනම්බුවක්."

මේ වෙලාවේ ඔෂින් තේ රැගෙන ආවා.

"මැඩම් මම එන්නද?"

"එන්න ඔෂින්."

"ඔෂින් කන් වැහෙන මෝස්තර ඔයා දන්නේ නැහැනේ. ඇයි නොදන්න දේවල් කරන්න ගියේ? "

"මම හිතුවා මම කරපු මෝස්තරය ඒ තෝනට ගැලපෙයි කියලා."

"ගැලපෙන දේ නෙමෙයි අපි දන්න මෝස්තරයි කරන්න ඕනෑ."

ඔටායෝ කීවේ කේන්තියෙන්.



"නැහැ එහෙම නැහැ ඒ ගොල්ලන් ඉල්ලන මෝස්තරය දෙන්නයි අපි ලෑස්ති වෙන්න ඕනෑ."

ඔෂින් කිව්වා.

"ඔෂින් හරි. අපි ඔෂින් තව ටිකක් පුහුණු වෙමුකෝ. ඔයා අද කළ එකෙත් මම නම් වැරැද්දක් දැක්කේ නැහැ. අනික් එක බටහිර මෝස්තරවල නීති රීති නැහැ. ඒවා කරන්න ලෙහෙසියි. අද ඔෂින් පුරුදු වෙන්න ඔටායොගෙ කොණ්ඩය දමලා."

"මගෙ."

ඔටායො ඇනුවේ කරමින්.

"මොකද ඉතින් වෙන්නේ."

මැඩම් කියා දුන් මෝස්තරය ඔෂින් ඔටායොගේ හිසකෙස් උපයෝගී කරගෙන අපූරුවට නිම කළා.

"ඔය තියෙන්නේ, බලන්න. ඔයාව අඳුනගන්නවත් බැහැ."

"ඇත්ත තමයි හරිම ලස්සනයි."

සෙසු සේවිකාවන් ද කීවා.

කිසිවක් නොකී ඔටායෝ කාමරයට ගොස් කොණ්ඩා මෝස්තරය ගලවා දැම්මා.

"අනේ ඇයි ගලවන්නේ? "

"මේ විකාර මට එපා. ඔෂින්, නපුරුකමටයි මෙහෙම කරන්නේ."

පසුවදා උදේ වරුවේ පෙර දින දොස් කියූ තරුණිය සාප්පුවට ආවා.

ඉට්සු ඉදිරියට ගියා.

"ඇයි?"

"අර ළමයා ඉන්නවා ද?"

"කවුද? ඔෂින් ද?"

"ඔව්, මගෙ කොණ්ඩය සකස් කළේ. මට එයා මුණ ගැහෙන්න ඕනෑ."

මේ අතර හසකාවා එළියට ආවා.

"අනේ, මට සමාවෙන්න. ඊයේ මම හැසිරුන ආකාරය ගැන මම දුක් වෙනවා. ඊයේ ඔමින් දමපු කොණ්ඩා මෝස්තරය හරිම ලස්සනයි කියලා හැමෝම මට කිව්වා. මම අද ආවේ ඊයේ මුදල් ගෙවලා අදත් කොණ්ඩා මෝස්තරයක් දමා ගන්න."

"කණගාටුයි. මෙහෙ බටහිර මෝස්තර දමන්නේ නැහැ."

"එහෙම නම් ඊයේ සකස් කළේ?"

"අපි ඊයෙම තීරණය කළා බටහිර මෝස්තර නොදමන්න. කණගාටුයි."

"අනේ එහෙම කියන්න එපා. මට අදත් පාටියක් තියෙනවා. මට සමාවෙන්න ඔමින්ට දොස් කිව්වට."

"මෙහෙ නම් බටහිර කොණ්ඩා මෝස්තර කරන්නේ නැහැ. නමුත් මට පුළුවන් ඔමින්ව ඔයාගේ තාවාතැනට එවන්න."

"කොයි තරම් දෙයක් ද? එහෙම නම් මම ලිපිනය කියන්නම්. හතට එවන්න."

"ඉට්ෂු කඩදාසියක් දෙන්න ලිපිනය ලියන්න."

ඉට්ෂු කඩදාසියක් කාන්තාවට දුන්නා.

"අනේ මම ලියන්න දන්නේ නැහැනේ."

"ආ ඒකට කමක් නෑ. ඔමින් එන්න. මේ ලිපිනය ලියාගන්න."

ඔමින් කඩදාසිය ගෙන ලිපිනය ලිව්වා.

"ඔයාට ලියන්නත් දන්නවා නේද? මගෙ නම සුමිකො. සවසට එන්න මම මග බලාගෙන ඉන්නවා. මෙන්න ඊයේ කොණ්ඩා සැකසීමේ ගාස්තුව. නොවරදවාම එන්න ඔමින්."

දෙදෙනාම හිස් නමා ආචාර කළා.

"මැඩම් ඇයි මාව එවනවා කීවේ?"

"පැහැදිලියි නේ එයා ඒ කොණ්ඩා මෝස්තරයට කැමති වෙලා. ඔයා යන්න තවත් හොඳට මෝස්තරයක් දමන්න."



"ඒත් මැඩම් මට පුහුණුවක් නැති නිසා..."

"ඔයාට අවශ්‍ය දේවල් උගන්වලා තියෙන්නේ. මේ යන්නෙත් පුහුණුවකට කියලා හිතන්න. තමන් ගැන විශ්වාසයෙන් ඉන්න. මගෙන් සුබ පැතුම්."

ඉට්ෂු ඔමින්ව දිරිමත් කළා.

"මේක ඔයාට හොඳ අවස්ථාවක්. යන්න මගෙන් සුබ පැතුම්."

ඔමින් ලිපිනය සහිත කඩදාසිය කියවමින් ගියා.

"ඇතැන්ස් විවේකායතනය" ඔමින් එහි දොරකඩ නතර වුණා.

"ඇයි මොකද්ද උවමනාව?"

මහත්තයෙක් ඇහුවා.

"මට මිස් සුමිකො එන්න කිව්වා."

"හොඳයි පිටි පස්ස දොරෙන් යන්න."

ඔමින් පිටිපස්ස දොර ඇරගෙන තරුණියන්ගේ විවේකාගාරයට ඇතුල් වුණා.

"ඔමින්, ඔයා ආවා ද?"

"මෙයාද ඔමින්."

"ඔව්, මෙයා මගේ කොණ්ඩය ලස්සනට හැදුවා. එක් කෙනෙක් ඇහුවා මගෙ වයස විස්සද කියලා."

හතර දෙනාම හිනැහුණා.

"අනේ, මටත් ඔමින්ට කියලා කොණ්ඩය දමා ගන්න ඕනෑ."

"අද බෑ. අද මට විතරයි."

"ඔව්, මම මැඩම්ගෙන් අහලා ඉන්න ඕනෑ."

"ඔයා මැඩම්ට කියන්න කීප දෙනෙක්ම ඉන්නවා කියලා."

මීත්ෂු කිව්වා.

"ඔමින් කොණ්ඩා මෝස්තරයට කීයක් අය කරනවා ද?"

"මම දන්නේ නෑ. මැඩම් මට ගානක් කිව්වේ නැහැ."

Rangika

"ඒ වුණාට කමක් නෑ මේ සල්ලි තියා ගන්ඩ. මේක ඔයාට." සුමිකො දුන්නා.

"එපා මට එහෙම මුදල් ගන්න බැහැ."

"මේක ඔයා මැඩම්ට නොකියා තියා ගන්න."

"බැහැ. එහෙම වංචා කරන්න හොඳ නැහැ. එහෙම නම් මම යන්නම්."

"ඔෂින් මතක තියා ගන්න. දවස් තුනකින් ආයෙ එන්න. මැඩම්ගෙන් ගාන අහගෙන එන්න."

ඔෂින් හිස නමා ආචාර කළා.

"හරි අවංක කෙල්ලක් නේද?"

"හරි පුදුම කෙල්ලෙක්. මම නම් දැකලා නැහැ ඔහොම කෙල්ලෙක්."

"මෝඩකම. ඔය ගම්වල කෙල්ලෝ නේ." නමිකො කිව්වා.

"ඔෂින් නම් වෙනස්." සුමිකො යෙහෙළියන් දෙස බලා හිනැහුණා.

"හොඳයි නේද මෝස්තරය?"

"හරි අගෙයි. අපට ඊරිසියාත් හිතෙනවා." සියලු දෙනාම හිනැහුණා.

ඔෂින් නිවසට යන විට ඔටායෝ, මැඩම් සමග ඔෂින් ගැන කතා කරමින් හිටියා.

"ඇයි මැඩම් ඔෂින් පිටට යැව්වේ. එයා වරදක් කලොත් ඒකේ අවනම්බුව මැඩම්ට නේ."

ඔෂින් කාමරයට එබුණා.

"මැඩම්, මම ආවා."

"කොහොමද ඔෂින් වැඩේ හොඳට කළා ද? "

"ඔව් මැඩම්. ඒත් මැඩම් මට කීවේ නැහැනේ අය කරන මුදල ගැන. ඒ නිසා මුදලක් ගත්තේ නෑ."

"මෝඩ වැඩ. මෙච්චර දුර ගිහිල්ලාත් සල්ලි ගත්තේ නෑ."

"ඔෂින්, මම සල්ලි ගැන නොකීවේ ඔයාට ඔය වැඩත් පුහුණුවක් විදිහට කෙරුණ නිසයි. මම කියන කල් මුදල් අය කරන්න එපා."



"මැඩම්, තව කිහිප දෙනෙක්ම කොණ්ඩා මෝස්තර දමන්න කිව්වා. ඒත් මම මැඩම්ගෙන් අවසරයක් නොගත් නිසා කරන්න බැහැ කිව්වා."

"ඒ ගොල්ලන්ගේ වැඩත් කරන්න. ඔයාට කස්ටමර්ස්ලා වැඩි කර ගන්න. ඒක තමයි කෙරෙන්න ඕනෑ."

"මැඩම් සමාවෙන්න. මම කෑම හදන්න යන්නම්."

දින තුනක් ගෙවී ගියා. ඔෂින් පුරුදු විදිහට ගෙදර වැඩ කළා.

"ඔෂින් ඔයාට පරක්කු වෙනවා. යන්න මම ඕවා කරන්නම්."

ඉට්සු කිව්වා.

"ඔෂින් මොනවද කරන්නේ. ඔයාට අද එන්න කිව්වා නේද? දැන් ඒ ගොල්ලන් බලාගෙන ඇති. විශ්වාසය කඩ කරන්න එපා."

"මැඩම් මම මේ වැඩ ටික ඉවර කරලාම යන්නම්."

"නෑ, නෑ දැන්ම යනවා."

# දොළහ

ඔෂින් ඇතැන්ස් විවේකාගාරයේ සේවය කරන සුමිකො, නමිකො, තොෂිකො, ඉරොෂි යන සේවිකාවන්ගේ යෙහෙළියෙක් වුණා. මෙතෙක් ඔවුන්ගේ කොණ්ඩා සැකසූ ඔත්මිනො ඔෂින් සමග සිටියේ තරහින්. ඒත් ඇය කැවිලි හදාගෙන ඇවිත් තරුණියන්ගෙ හිත් ගන්න හැදුවා.

"මේ ඔත්මිනෝ ඔයත් ඔෂින් වගේ බටහිර මෝස්තර පුරුදු වෙන්න."

"අපෝ මම කැමති නැහැ. කිසිම ලස්සනක් නෑ ඒ මෝස්තරවල."

"ඔය බොරු. ඔයා ඊරිසියාවට කියන්නේ. අපි යනවා. සුමිකො?"

"මම ටිකක් පරක්කුයි."

සෙසු තරුණියන් ගිය පසු සුමිකො ඔෂින් ළඟ වාඩි වුණා. ඔෂින් උපකරණ ලේන්සුවේ ඔතමින් හිටියෙ වැඩ නිමකර පිට වී යාමටයි.

"ඔෂින්, ඔයාට යන්න හදිස්සි ද?"

"ආ... නෑ.. ඇයි?"

"ඔෂින්, මට පොඩි උදව්වක් කරන්න."

සුමිකො ලියන පුවරුව ළඟ වාඩි වී කඩදාසියක් ඔෂින්ට දුන්නා.

"මගෙ යාළුවෙකුට ලියුමක් ලියලා දෙනව ද?"

"හොඳයි."

"ඉන්න මම හිතන ටික හදලා දෙන්නම්. දැන් මෙතන වාඩි වෙලා ලියන්න. මම කියන්නම්."



"කොහේද? කොහෙද ගියෙ මගෙ ආදරවන්තයා. නුඹ දවසකින් දැක්කේ නෑ. ඉක්මනින් ඇවිත් මාව හමුවෙන්න."

ඔෂින් ඒ සියල්ල ලිව්වා.

"හරිද ඔෂින්?"

ඔෂින් හිස සෙලෙව්වා.

"මෙන්න ලිපිනය. මේකත් ලියලා ඔයාම තැපැලට දමන්න. හැබැයි ඔෂින් මේක මගෙ යාළුවන්ට නම් කියන්න එපා හොඳ ද? මේ මුදල් ඔයා ලිවුම ලිව්වාට."

"එපා, එපා. මම මෙහෙම උදව් කරන්න කැමතියි. සුමිකො නිසානේ මට අතීත් අය මුණ ගැහුණේ."

"හොඳයි. මේකට උත්තර ආවාම මම ඔයාව කැමකට ගෙන යනවා හොඳ ද?"

ඔෂින් ඒ යෙහෙළියන්ට පොඩි පොඩි උදව් කර දෙමින් සතුටු වුණා.

"ඔෂින්, මටත් ලියුමක් ලියන්න ඕනෑ මගෙ අම්මට..."

නමිකො කිව්වා.

"හොඳයි."

සියල්ලන් බැහැරව ගියාම නමිකො කඩදාසියක් රැගෙන ඔෂින් වෙත ආවා.

"ඇත්තම කියනවා නම් ඔෂින් මම මේක ලියන්නේ මගෙ යාළුවෙකුට."

"හොඳයි කියන්නකො..."

"ආදරණීය රූසෝ."

ඔෂින් නමිකො දෙස බැලුවා.

"එයා මෙහෙට එන වෙළෙන්දෙක්."

"රූසෝ ඔයා මට අරගෙන දුන්න ඉංගු කෑම් වෙලට ස්තුතියි. එදා මට ඕනෑ කළේ ඔයා එක්ක තනියම කෑමට යන්නයි. ඒත් සුමිකොත්

Rangika

ඉරෝෂිත් අපි එක්ක ආවානේ. වෙන දවසක අපි දෙන්නා විතරක් හමුවෙමු."

"මෙන්න ඔෂින් ලිපිනය."

ඔෂින් ලිපිනය දෙස බැලුවා. සුමිකෝගේ පෙම්වතාගේ ලිපිනයමයි.

"ඔෂින් ඔයාගෙ අත් අකුරු හරිම ලස්සනයි."

ලිපිය දෙකට නමා සිපගත් නමිකො..

"ඔෂින්, මේ ලිපිය ගැන අනිත් අයට කියන්න එපා හොඳ ද? මේ මුදල් ඔයාට. මට කරපු උදව්වට."

ඔෂින් "ස්තූතියි" කියා මුදල ලබා ගත්තා. ඇයගේ මුහුණ උපහාස හිනාවකින් පිරී ගියා. ඔෂින්ට තව දවස් දෙකකින් තුන්වන ලිපියත් ලියන්න සිදු වුණා. ඒ තොෂිතො වෙනුවෙන්. ලිපිය රූසෝට.

ඔෂින් සිනහව තද කරගෙන ලිපිය ලිව්වා.

"ආදරණීය පෙම්වත රූසෝ" යනුවෙන් ඇරඹි ලිපිය ලියන ගමන් ඔෂින් කල්පනා කළේ මේ රූසෝ කවර වර්ගයේ පුද්ගලයෙක්ද ඔහු නම් සල්ලාලයෙක්. මට දුක සුමිකො ගැන. ඔෂින් මේ මිතුරියන් අතර බෙහෙවින් ජනප්‍රිය වුණා. ඇය ඔවුන්ගේ කිමෝනා මසා දුන්නා. ඔවුන්ගේ පණිවිඩ ගෙන ගියා. ඇයට ලැබෙන සෑම මුදලක්ම ඇය මැඩම් අතට දුන්නා.

"ඔෂින් අනේ මට සෙනසුරාදාට ගමනක් යන්න තියෙනවා. ඔයා මට අනිද්දට මේ කිමෝනාව මහලා ගෙනැත් දෙනව ද?"

"හොඳයි උත්සාහ කරන්නම්."

ඔෂින් නිදි වරාගෙන කිමෝනාව මැහුවා.

රාත්‍රියෙ ඇහැරුන ඔටායෝ ඔෂින් ළඟට ආවා.

"ඔෂින්, මොකද ඔය කරන්නේ."

"මේ යාළුවෙක්ගෙ හදිසි ඇඳුමක් මහනවා."

"මොකටද නිදිමරාගෙන ඇඳුම් මහන්නේ."

"එයාලා මට හොඳට සලකනවා."



"ආරංචියි මට ලියුම් ලියනවා, ඇඳුම් මහනවා, ආරංචි ගෙනියනවා. ඔවා කරන්න අපි වහල්ලු යැ.."

"කස්ටමර්ස්ලා සතුටු කිරීමේ වරදක් නෑ."

"කට වැඩියි. ආයෙත් මෙහෙම දේවල් කරන්න එපා. ඕවා කරන්න ඕනෑ නම් යනවා මෙහෙන් යන්ව." ඔටායෝ කෑ ගැහුවා.

"මොකද, මොකද මේ කෑ ගහන්නේ."

"සමාවෙන්න, මැඩම්ගෙ නින්ද කැඩුණා නම්. මට මේ ඔෂින්ගෙ වැඩ අල්ලන්නේ නෑ. මට තවත් ඉවසන්න බෑ."

"හරි, හරි, දැන් ඔටායෝ ගිහින් නිදාගන්න."

"සමාවෙන්න මැඩම්, මම කළේ මෝඩ වැඩක්."

"නෑ, ඔෂින් මට හිතෙන්නේ ඔයා දැන් මෙහෙන් ගියොත් හොඳයි."

"මැඩම් මම.. මම..."

"මේ අහන්න. ඔයා දැන් සල්ලි හම්බ කරනවා. එතකොට මෙහෙ ඉන්න බැහැනේ. එතකොට ඔයා යටත් සේවකයෙක් වෙනවා. ඒත් ඔයා ස්වාධීන වෙන්න ඕනෑ. මම ඔයාව පන්නනවා නෙමෙයි. මම දන්නවා ඔයා දක්ෂයි. මම ඒක අගය කරනවා. ඒත් ඔයා දන්නවා මෙහෙ අය මැසිවිලි කියන බව. මම ඔයාට ඉන්න සුදුසු තැනක් හොයලා දෙන්නම්. ඔයා තව කස්ටමර්ස්ලා හොයා ගන්න. ඔය යන ගමනේදී කම්කටොලු හමුවෙයි. ඒවාට පැලෙන්න එපා."

"නෑ, මැඩම්. දැන්ම වෙන් වෙන්න බැහැ. මම ප්‍රතිඋපකාර කරලා නැහැ පුහුණුවට, ඔබේ කරුණාවට."

"නෑ ඔෂින් ඔයා මේ ගෙදර, සාප්පුවේ මොන තරම් වැඩ කළා ද? ඒවාට මිලක් නියම කරන්න බැහැනේ. ඔයා මට ඕනෑ තරම් ප්‍රති උපකාර කළා. යන්න සූදානම් වෙන්න."

"මැඩම්ට මම ණය ගැතියි." ඔෂින් මැඩම් ඉවත්ව යන තෙක් හිස බිම තබාගෙන ඇයට ගෞරව දැක්වුවා.

ඔෂින් ස්වාධීනව කොණ්ඩා සකසන්නියක් ලෙස කටයුතු කළා.

"මේ හැමෝම අහන්න. ඔෂින් දැන් තනියම පිට වැඩ. හැම දෙනාම ඔයාලා අඳුරන අයට ඔෂින් ගැන කියලා එයාට තව වැඩ

හොයලා දෙන්න ඕනෑ. එයාට කාමරයක් හොයලා දෙන්නත් ඕනෑ" සුමිකො කිව්වා.

"ඇයි බඩුත් ඕනෑ."

ඒක නම් අපට ලෙහෙසියෙන් කරන්න පුළුවනි. මෙතනට වෙළෙන්දෝ එනවා. ඒ ගොල්ලන්ගෙන් උදව් ගනිමු. නොමිලේම බඩු ටික ගන්න පුළුවනි."

ඔෂින් හිනැහෙමින් සියල්ල අසා සිටියා.

සුමිකො දිනක් ඔෂින් සොයා පැමිණියා.

"ඔෂින්, මම මේ ඔයාව හොය හොයා හිටියේ."

"කියන්න සුමිකො මොකද්ද ඕන උදව්ව?"

"නෑ, මට නෙමෙයි. මගෙ අර යාළුවා කිව්වා ගීහා නිවාඩු නිකේතනයේ ඉන්න සේවිකාවන්ගේ කොණ්ඩා සකසන්න ඔයාට අල්ලා දෙන්න පුළුවන් කියලා. එතන මෙහෙට වඩා සේවිකාවෝ ඉන්නවා. හැබැයි ඉතින් එයාලා හරිම ආඩම්බරයිලු. මොකද ඒ සේවිකාවෝ වැඩි දෙනෙක් උපාධිධාරී අයලු. හොඳට ගෙවයි කිව්වා. ඔයා කැමති නම් සෙනසුරාදාට එහෙට යන්න. මෙන්න ලිපිනය."

"හොඳයි.. සුමිකො ඔයාට ස්තුතියි."

ගීහා යාමට ඔෂින් මැඩම්ගෙන් අවසර ඉල්ලුවා.

"ඒකට කමක් නෑ. ටිකක් මුදල් හොයා ගන්න එපායෑ. ඔෂින්ට ළඟදීම මම කාමරයක් හොයලා දෙනවා. එතකොට කාමරයට, කෑමට මුදල් ඕනෑ වෙනවා නේ. අනිත් එක එතකොට හැමදේටම මගෙන් අවසර ඕනෑ නැහැ."

"එහෙම නෑ මැඩම්. මැඩම්ගෙ අවවාද, මඟ පෙන්වීම මට හරි වැදගත්."

"හොඳයි එහෙම නම් ගිහින් එන්න."

ඔෂින් අවශ්‍ය උපකරණ ලේන්සුවක ඔතා ගත්තා. ඔෂින් ගීහා නිවාඩු නිකේතනය සොයා ගියා. එය විශාල ආයතනයක්. ඔෂින් පසෙක තිබූ දොර ළඟට ගියා. දොරට තට්ටු කළා. දොර ඇරගෙන එළියට ආවේ ඔත්ෂිනෝ.



"ආ උඹ මෙහෙත් ආවා ද? අර කෙල්ලෝ ටිකත් අල්ලා ගත්තා. මේ මෙහෙ කොණ්ඩා මෝස්තර දමන්නේ මම. තේරුණා ද? ආපිට පලයන්."

"මම ආවේ මිස්ට ටනකුරා මට එන්න කිව්ව නිසා. අනිත් එක ඔහේ දමන්නේ ජපන් ස්ටයිල්. මම ආවේ බටහිර ස්ටයිල් දමන්න. ඔහේට ප්‍රශ්නයක් නැහැනේ."

"මේකිගෙ කට හරි වැඩියි. මම උඹව ඇදලා එළියට දමන්න ඉස්සර වෙලා මෙතෙන් පලයන්."

"එහෙම ඇදලා දාන්න ඔහේ මේකෙ අයිතිකාරයා ද?"

"අයිතිකාරයා ද? නැද්ද? බලන්න හිටපන්කො හොඳ වැඩක් කරන්න. ඔතොෂි මහත්තයා... ඔතොෂි මහත්තයා, ඉක්මනට එන්න."

ඇරී තිබුණ දොරෙන් පිරිමියෙක් එළියට ආවා.

"මෙන්න මේ කෙල්ල බලෙන්ම මෙහෙට ඇතුල් වෙන්න හදනවා."

"ළමයින්ට මේකට ඇතුල් වෙන්න බැහැ. ඔහු දොරට අතක් තබා ගත්තා."

"ඇයි ඔහේ මගෙ ගමන නතර කරන්නේ."

කෝප වී සිටි ඔෂින් ඔහුගේ අත අයින් කිරීමට උත්සාහ ගත්තා.

"කෙල්ලේ පලයන් යන්ඩ එළියට."

"බැහැ මම මෙහෙ ආවේ වැඩකට. මට යන්න දෙනවා."

"මේකිගෙ කට වැඩියි."

"ඔතොෂි මහත්තයා, මේකිගෙ කට වැහෙන්න හොඳ පාරක් දුන්නා නම් හරිනේ."

"වැඩිහිටියෙකුට කතා කරන්නවත් දන්නේ නැති එකියක්."

ඔතොෂි ඔෂින් අල්ලා එළියට ඇදගෙන ගොස් එතන වූ බිත්තියට හේත්තු කර ඇයගේ මුහුණටම පහර කීපයක් දුන්නා. මේ වෙලාවෙම මෙතනට පැමිණි කාන්තාවක් කෑ ගැහුවා.

"ඇයි ඔය මොකද කරන්නේ? නතර කරන්ඩ ඔය වැඩේ."

ඇය ඇතුළට දිව ගොස් තරුණයෙක් සමග පැමිණියා.

"මය ළමයා අත අරිනවා. මොකද ඔය කරන්නේ." ඔහු ඇසුවා.

ඔහොම ඔෂින්ව තල්ලු කර දැම්මා. ඇය එතන වූ ගලක හැපී මුනින් අතට වැටුණා.

"මෙකිගෙ කට වැඩියි."

තරුණිය ඉක්මනින්ම ඔෂින්ගේ හිස එසෙව්වා.

"ඔයාට හුගක් තුවාල ද? "

බිම වැටී හිටියත් ඔෂින්ට ඒ හඬේ පුරුදු බවක් දැනී ඉක්මනට හිස එසෙව්වා.

"මිස් කායෝ.... ඔයා...? "

"ඕ.. ඔෂින් ඔයා ද? "

කායෝ ඔෂින් අතහැර දැම්මා. ඒ සමගම ආපිට හැරී දුවන්න පටන් ගත්තා. ඔෂින් ඉක්මනින් නැගිට කායෝ පසුපසින් දිව්වා. කායෝ වීදියේ එහෙ මෙහෙ යන මිනිසුන්ගේ ඇගේ හැප්පෙමින් දිව්වා. ඔෂින් ඇය පසු පස දිව්වා. මේ තරුණියන් දෙස මිනිසුන් පුදුමයෙන් බලාගෙන හිටියා.

හති දමමින් දුව ගිය කායෝ පාලමක් මත නතර වුණා. ඇය පාලමේ ඇන්ද අල්ලාගෙන හති ඇරියා.

ඔෂින් කායෝ පිටුපස හිට ගත්තා.

"ඒ කාලයේ අපි දෙන්නා වෙරළේ දිව්ව හැටි මට මතක් වුණා." කියමින් ඔෂින් අපහසුවෙන් හිනාවුණා.

කායෝ හිටියෙ හිස බිමට නැඹුරු කරගෙන.

"මිස් කයෝ පුදුමයි ඔයා මෙච්චර වේගයෙන් දිව්ව හැටි. එක සපත්තුවක තියෙන අඩියත් ගැලවිලා අපරාදේ."

කායෝ ඒ දෙස බැලුවා.

"ඔව් ම තමයි, මේක පිටරට කුට්ටමක්."

ඔෂින් තමන්ගේ කකුල අත ගෑවා.



"ඔෂින් ඔයාට තුවාල ද? මේ ලේත් එනවා. කෝ බලන්න."

කායෝ ඔෂින්ගේ කිමෝනාව මෑත් කර කකුල දෙස බැලුවා. කකුල හොඳටම තුවාල වී ලේ ගලා ගියා.

"ඔෂින් ඔයාට හොඳටම තුවාල වෙලා. මෙහෙම තියාගෙනත් ඔයා දිව්වා නේද? "

"මිස් කායෝ ඔයා වෙනස් වෙලා නැහැ."

"ඔෂින්..."

දෙදෙනාම මොහොතක් එකිනෙකා දෙස බලා හිටියා. එකට වැළඳගෙන බිම වාඩි වී අඬන්න පටන් ගත්තා. ටිකකින් දෙන්නාම හිනා වුණා.

"ඔෂින් යමු මගෙ කාමරයට ඔයාට බෙහෙත් දමන්නම්. එන්න."

කායෝ ඔෂින්ව වැළඳගෙනම හිට ගත්තා.

"ඔයාට පයින් යන්න අමාරුයි. අපි වාහනයක යමු."

කායෝ කාමරයට ගොස් ඔෂින්ගේ තුවාලය පිරිසිදු කර බෙහෙත් දැම්මා.

"දැන් ඕක ඔතනම හොඳ වෙයි."

"ඔව්, ඔව් මේකනම් හොඳ වෙයි."

දෙන්නා විහිළු කළා. ඊත් ටිකකින් කායෝ ජනේලය ළඟට ගොස් සෙමෙන් වැළපුණා.

"ඔෂින් මට ඔයාගේ මූහුණ බලන්නත් ලැජ්ජයි. මට සමාවෙන්න ඔෂින්."

"ඇයි මිස් කායෝ එහෙම කියන්න අවශ්‍ය නැහැ. කෝ මිස්ට කෝටා? "

කායෝ වැළපෙන හඬ වැඩි වුණා.

"මිස්ට කෝටා කොහේ හරි ගිහින් ද? "

ඊත් කායෝ නිහඬයි.

Ranjika

"මම, මිස්ට කෝටා එන්න ඉස්සර වෙලා මෙහෙන් ගියොත් හොඳයි."

"එපා."

කායෝ පැමිණ ඔෂින් වැළඳ ගත්තා.

"ඔෂින් මට සමාවෙන්න. එදා කෝටා ඔයාට එව්ව ලිවුම මම කඩලා බැලුවා. ඒකේ තිබුණේ ඔයාට එයා එක්ක යන්න එන්න කියලයි. ඒත් මම එනකොටත් කෝටාට ආදරේ කළා. මට එයාව අයිති කරගන්න ඕනෑ වුණා. ඒ නිසයි ඔයාටත් බැනලා මම කෝටා සොයා ගෙන මුහුදු වෙරළට ගියේ."

"දැන් ඒවා අමතක කරන්න මිස් කායෝ. මේ කාමරේ හුඟක් හැඩි වෙලානේ. අපි මේක අස් කරමු. කෝටා එන්න ඉස්සර අස් කරමු."

"එපා ඔෂින් මෙහෙ කවුරුත් එන්නේ නැහැ."

"ඇයි.. ඇයි කෝටාට මොකද වුණේ?"

ඔෂින් ඇසුවේ විමතියෙන්.

ඔෂින් මම කෝටාගෙ ආදරය වෙනුවෙන් මගේ අම්මා, තාත්තා, ආච්චම්මා, සායෝ ඒ සේරම අතහැර දැම්මා. මට ඕනැ වුණේ කෝටා එක්ක එකට ජීවත් වෙන්නයි. ඒකයි ඔයාටත් හොරෙන් කෝටා හමුවුණේ. මම එයාට ඔයාවත් පාවා දුන්නා. ඒත් කෝටා නම් මගෙ ගමන වලක්වන්න හුඟක් උත්සාහ කළා.. ඒත් මම කොහොම හරි එයත් එක්කම ගියා. මට වැරදුණා ඔෂින්, කෝටා මට ආදරය කළේ නැහැ. එයා වරින් වර මාව දමලා ගියා."

මේ කාමරයට ආවෙත් එයාගේ රහස් වැඩවලට."

"ඕවා සේරම අමතක කරලා හොඳින් ඉන්න බලන්න."

"ඔෂින් කෝටා මගෙන් වෙන්වෙලා ගියා. දැන් අවුරුදු දෙකක්. මම එයා කොයි වෙලාවේ හරි එයි කියලා බලාගෙන ඉන්නවා."

"මිස් කායෝ මිස්ට කෝටා විප්ලව සංවිධානයක සාමාජිකයෙක්."

"ඒක මම දන්නවා ඔෂින්."

"එයාට වැඩ ඇති. කවදා හරි ආපිට එයි."



"ඒ දවස එනකල් මම බලාගෙන ඉන්නවා."

"එයාට විවාහයක් කරගෙන ඒ කටයුතු කරන්න අමාරු නිසා...."

"ඔයා හරි ඔෂින්, මම එයාට මාව විවාහ කර ගන්න කිවේ නැහැ ඔෂින්. එයා මට ආදරේ කළේ නැහැ කවදාවත්. මේක මට හොඳ පාඩමක්. මම කළ හිතුවක්කාර වැඩවලට ආච්චම්මාට, තාත්තාට, අම්මාට වන්දි ගෙවන්න වෙලා මට. ඔෂින් ඔයා මුණ ගැහීම මට සතුටක්."

"කායෝ ඔයාට මුදල්..."

"ඔව් ඔෂින් මම නිවාඩු නිකේතනවල සේවිකාවක් ලෙස සේවය කළා. ජීවත් වෙන්න මුදල් සොයා ගත්තේ එහෙමයි. කොණ්ඩා මෝස්තර සකස් කරන තරුණියක් ගැන අහන්න ලැබුණා. නමත් ඔෂින් කියලා දැන ගත්තා. ඒත් ඒ ඔයා කියලා මම හිතුවේවත් නැහැ."

කායෝ ඔෂින්ගේ අතින් අල්ලා ගත්තා.

"ඔෂින්, මට ඇත්ත කියන්න. ඔයා ටෝකියෝ ආවේ කෝටා නිසා ද?"

"නෑ මිස් කායෝ. මම සතුරාකිට කැමති නැති නිසා. ඒ නිසාමයි මම කගායා ආයතනයෙන් සමු ගත්තේ. කොහොම හරි කොණ්ඩා මෝස්තර ඉගෙන ගන්නවා කියලා හිතාගෙනයි ටෝකියෝ ආවේ."

"අම්මෝ, ඔයාගේ හිතේ තියෙන ධෛර්ය. මට හෙට දවසක් නෑ ඔෂින්. මට යන්න තැනක් නෑ ඔෂින්."

"ඇයි ආපිට කගායා නොයන්නේ."

"ඒක මට අයිති නැහැ. සායෝ ඒක බලා ගනියි."

"සායෝ...? එහෙම නම් ඔයාට ආරංචි වෙලා නැහැ."

"මොකද්ද ඔෂින්? "

"මිස් කායෝ...... මිස් සායෝ නිව්මෝනියාව හැදිලා නැතිවුණා."

"මොනවා ? මගෙ නංගි මැරුණා. අයියෝ.."

කායෝ බිම වැටී අඬන්න පටන් ගත්තා. ඔෂින් ඇයගේ පිට පිරිමැද්දා. "හිතන්න මිස් කායෝ ගෙදර අය සේරම ඉන්නේ හරිම

දූකෙන්. යශිරෝ මැඩම්ගෙ එකම බලාපොරොත්තුව ඔයා කවදා හරි ගෙදර එයි කියලයි. මට කීවෙත් කොහොම හරි ඔයාව හොයලා එවන්න කියලයි. මම පොරොන්දු වුණා ඒක. ඔයා ආපිට යන්න ඕනෑ. ඔයා මෙහෙ අවන්හලේ සේවිකාවක් වෙනවට මම නම් කැමති නැහැ. ඔයා කගායා ආයතනයේ අයිතිකාරී. ඇයි මේ දුක් විඳින්නේ ? අමතක කරලා දාන්න කෝටාව."

"බැහැ ඔෂින් මට කෝටා මොන තරම් වෙනස්කම් කළත් මම එයාට ආදරෙයි. මගෙ හැම දෙයක්ම අත හැරියෙ එයා නිසා. එයා ආපිට එයි කවදා හරි. එතකල් මම බලා ඉන්නවා. ඔයා මාව දැක්ක බව අමතක කරන්න. අපි නැවත මුණ නොගැසී ඉඳිමු. මේ මගේ දෛවය. මම අවුරුදු දෙකක් කෝටා එනතෙක් බලා හිටියා. මම කගායා ගියොත් ඒ කාලය අපතේ ගියා වෙනවා. කවදා හරි කෝටා මගේ ආදරය වටහා ගනියි."

ඔෂින් ආපිට ආවේ කායෝ පිළිබඳව සිතමින්. ඔෂින්ට වැටහුණා කායෝ කෝටාට කොතරම් ආදරය කරනවාද කියා. ඇය ප්‍රාර්ථනා කළා කෝටා ඉක්මනින් ආපිට එන්න ඕනෑ කියලා.

සුමිකො පසුවදාම ඔෂින් හමු වුණා.

"අනේ ඔෂින්, මට සමාවෙන්න. ඔයාට ගිහාවලදී කරදර වුණා කියලා මට ආරංචි වුණා. මම කිව්ව නිසානේ ඔයා ගියේ."

"කරදර වෙන්න එපා සුමිකො. මමත් ටිකක් ආවේගශීලීව කතා කළා. මගෙත් වැරැද්ද. මට එතනින් එන්නයි තිබුණේ."

"මගෙ යාළුවා ඔයා දාලා ආව බඩු අරගෙන ඇවිත්. ඔයා හමුවෙලා දෙන්නම් කිව්වා."

"ස්තුතියි. හැබැයි මිස්ට ටනකුරා මම නම් දැක්කේවත් නැහැ. හැබැයි ඒ ගමනින් මට නම් හොඳක් වුණා. මොකද මම මගේ පුංචි කාලේ මිතුරියක් මුණ ගැහුණා."

"මිස්ට ටනකුරා කිව්වා ඔයාට ආයිම එන්න කියලා. මේ සැරේ කරදර වෙන්නේ නෑ කිව්වා. එයාම ඔයාව අඳුනලා දෙන්නම් කිව්වා."

"එපා සුමිකො මට මෙහෙ හොඳයි. ඔයාලා වගේ යාළුවෝ එක්ක ඉන්න එක මට සතුටක්."

"හොඳයි ඔෂින්, අපි මෙහෙන්ම ඔයාට තව වැඩ හොයලා දෙන්නම්කො."

"හොඳයි." ඔෂින් හිස නමා ආචාර කළා.

"ඔෂින් ඔයාව මුණ ගැහෙන්න අමුත්තෙක් ඇවිල්ලා. අන්න පාරේ ඉන්නවා." නමිකො කිව්වා.

"හොඳයි, මම ඉක්මනට එන්නම්."

ඔෂින් දොර වසාගෙන පිටවුණා.

"පිරිමි යාළුවෙක් ද?" සුමිකො ඇහුවා.

"නෑ, තරුණ ගැණු කෙනෙක්."

ඔෂින් පාරටම යන විට ම එහි හිටියෙ කායෝ.

"මිස් කායෝ, ඔයා කොහොම ද මම ඉන්න තැන හොයා ගත්තේ. මම හිතාගෙන හිටියෙ ඔයාව මුණ ගැහෙන්න යන්න."

"ඔෂින්, මම තීරණය කළා කගායා යන්න."

"හැබෑට කොයි තරම් හොඳයි ද? "

ඔෂින් ඉක්මනින් කායෝගේ අත අල්ලා ගත්තා.

"මම මගේ කාමරේට අවුරුද්දටම සල්ලි ගෙව්වා. මොකද කොයි මොහොතේ හරි කෝටා එන බව මට විශ්වාසයි. මම කගායා යන්නේ ඉක්මනින් ආපිට එන්න බලාගෙන."

"ඒත් මිස් කායෝ මම නම් කියන්නේ ඔයා කගායා භාර අරගෙන එහෙ ඉන්න කියලා."

"බැහැ ඔෂින් කෝටා නැතිව මට ඔය මොනවත් අවශ්‍ය නැහැ. මම කාමරයේ ලියුමක් ලියලා තිබ්බා මේ දවස්වල කෝටා ආවොත් ඔයාව මුණ ගැහෙන්න කියලා. ඔයා එතකොට මට ඉක්මනට කෝල් කරන්න. මම ආපිට එනවා."

ඔෂින් දිග සුසුමක් පිට කළා.

"ඔයාගේ කැමැත්තක් මිස් කායෝ."

"ඔයා මට උදව් කරනවා නේද ඔෂින්."

Rangika

කායෝ ඔෂින්ගේ අත අල්ලා ගත්තා.

"ඔව්, මිස් කායෝ ඒ ගැන වද වෙන්න එපා."

"එහෙම නම් මම යන්න ද? අද හවස දුම්රියෙන් යන්නයි හිතාගෙන ඉන්නේ."

"හොඳයි මම එන්නම් ඔයාට බඩු අස් කරන්න."

"එහෙම නෑ ඔෂින් මම ඇඳුම් දෙක තුනක් විතරයි ගෙනියන්නේ."

"ඒත් මම එන්නම්කො. යශිරෝ මැඩම්ට කෑම ටිකක් හදලා ඔයා අතේම අරින්නයි මම හිතුවේ."

"හොඳයි හවසට මුණ ගැහෙමු."

දෙදෙනාම හිස් නමා ආචාර කර වෙන්ව ගියා.

ඔෂින් හසකාවා මැඩම් සමග මිස් කායෝ ගැන විස්තර කිව්වා. ඒත් කෝටා ගැන නොකියා. ඒ සමගම කඩපළට ගොස් බඩු ගෙන විත් යශිරෝ මහත්මියට ගෙන යාමට කෑම පෙට්ටියක් සූදානම් කර ගත්තා.

එයත් රැගෙන කායෝ ගේ කාමරයට ගියා.

"මම ඔෂින්."

"එන්න ඇතුළට ඔෂින්."

"මම ඔයාට උදව් කරන්නයි ආවේ. මේ කෑම එක යශිරෝ මැඩම්ට දෙන්න."

"හොඳයි. ඔෂින් මේ කාමරේ යතුර මෙන්න. මේක ඔයා ළඟ තියා ගන්න."

"ඔයාට නිවාඩු තියෙන වෙලාවල ආවිත් මේ කාමරේ පිරිසිදු කරන්න පුළුවන් ද? "

"අපෝ පුළුවනි මම මේ කාමරේ හොඳට පිරිසිදු කරන්නම්."

"මේ කසල ගොඩ කොහොම පිරිසිදු කරන්න ද ඔෂින්."

"ඔයාට මේ වැඩ පුරුදු නැහැනේ. මට පුළුවනි. බලන්නකො ඔයා ආපිට ආවාම."



"මම දන්නවානේ ඔෂින්ගේ වැඩවල පිළිවෙල."

එවිටම දොරට තට්ටු කරන හඬ ඇසුණා.

"බලන්න ඔෂින් කවුද කියලා."

ඔෂින් දොර ඇරියා එළියෙ හිටියේ රූසෝ ටනකුරා.

"ආයුබෝවන්, ඔයා මෙහෙ?"

ඔෂින් මොනවත් කීවේ නැහැ.

"ඔෂින්, මේ මිස්ටර් ටනකුරා. එයා බොහෝම හොඳ මහත්මයෙක්. මට හුඟක් උදව් කරලා තියෙනවා."

"මම ආවේ මිස් කායෝව කැම්පට එක්ක යන්න. ඔයා අද සකාටා යනවා කිව්වා නේද? මිතුරියන් එක්කගෙනම යමු."

"නෑ මිස් කායෝ මම ඉක්මනට ආපිට යන්න ඕනෑ."

"නෑ, නෑ, ඔෂින් එන්නම ඕනෑ." කායෝ කිව්වා.

ඔෂින්ගේ හිතේ කිසිම පැහැදීමක් තිබුණේ නැහැ රූසෝ ගැන. ඔහු සල්ලාලයෙක්. එහෙම කෙනෙක් එක්ක කැම්පට යාමට සිදුවීම ගැන ඔෂින් හිටියේ නොසතුටින්.

අවන්හලේ මේසය ළඟ තිදෙනාම වාඩි වී සිටියා.

"ඔෂින්, මේ මිස්ටර් ටනකුරා හරිම හොඳයි. සිත්තර වැඩවලට එයා මට හුඟක් උදව් කළා."

"මිස් ඔෂින් මම නිසා එදා ඔයා කරදරේ වැටුණේ. ඒ ගැන මට සමාවෙන්න."

ඔෂින් කිසිවක් කීවේ නැහැ.

"ඔෂින් හොඳ දක්ෂ කොණ්ඩා සැකසුම් කරනවා කියලා මෙහෙ බොහෝම ප්‍රසිද්ධයි." ටනකුරා නැවත කිව්වා.

ඒත් ඔෂින් නිහඬයි.

"මම ඉක්මනට ආපිට එන්නයි හිතාගෙන ඉන්නේ."

"ආපහු මෙහෙ එන්න එපා මිස් කායෝ. ගෑණු කෙනෙකුට ආරක්ෂාවක් ඕනෑ. ඔයාලගේ සහල් ආයතනය දියුණු කරන්න."

සේවකයෙක් පැමිණ ටනකුරා ඉදිරියේ වූ වීදුරුවට බීම ටිකක් දැම්මා. ඔහු එය බී හිස සෙලෙව්වා. සේවකයා කායෝගේත්, ඔෂින්ගෙත් වීදුරු පිරෙව්වා.

"කායෝට සැපවේවා."

තිදෙනාම වීදුරු එකට තබා බීමට ගත්තා. කායෝත්, ටනකුරාත් ඒවා ඉක්මනින් බීවත්, ඔෂින් නම් එහි සැර ගඳටම මුහුණ අකුලා ගත්තා. අමාරුවෙන් ටිකක් බිව්වා.

ටනකුරා මිස් කායෝත් සමග හිනැහෙමින් කතා කරමින් හිටියා.

"මෝඩයෙක්" ඔෂින් තමන්ටම කියා ගත්තා.

එදින රාත්‍රියේ දුම්රියෙන් කායෝ සකාටා ගියා. පසුවදා උදේත්ම, ඔෂින් අසකුසා පන්සලට ගියා. ප්‍රාර්ථනා කොළයක් ගෙන පුවරුවේ එල්ලුවා. 'අනේ දෙවියනේ කායෝගේ ගමන සාර්ථක වේවා. දෙමාපිය සෙනෙහස නැවත ලැබේවා.' ඔෂින් දෑත් බැඳගෙන ප්‍රාර්ථනා කළා.

ගෙදර යන විටම මැඩම් ඔෂින්ට කතා කළා.

"ඔෂින් මම ඔයාට කාමරයක් හොයා ගත්තා. වයස ජෝඩුවක් ඉන්න ගෙදරක ඔයාට එක කාමරයක් දෙන්නම් කිව්වා. කාමරේ තියෙන්නේ උඩු මහලේ. ඒ කාමරය ගනිමු නේද? "

"මැඩම් දාලා යන්න මට දුකයි මැඩම්."

ඔෂින් බිම බලාගෙන කිව්වා.

"වැඩි ඈතක නෙමෙයි. මේ ළඟම නේ. ඉක්මනට තීරණයක් ගන්න. මෙහෙ කාමර හොයන්න හරිම අපහසුයි."

"හොඳයි."

ඔෂින් කඩපළට ගොස් බඩු ගෙනාවා. ඉට්සු සමග ගෙදර වැඩ කළා.

"මට මැඩම් දමලා යන්න දුකයි ඉට්සු."

පසුවදා ඇය තම ඇඳුම් ටික ලොකු ලේන්සුවක එතුවා. උපකරණත් තවත් ලේන්සුවක එතුවා. ඇය මැඩම් හමුවීමට ගියා.

"මැඩම්, ඔෂින්."



"එන්න ඔෂින් ඇතුළට "

ඔෂින් හිස පහළට නැඹුරු කරගෙන වාඩි වී හිටියා. ඇයගේ දෑසින් කඳුළු කඩා හැලුණා.

"ඔෂින්, සමුගන්න ඕනෑ නෑ. අපි වෙන් වෙන්නේ නෑ. ඔයා ඉන්නේ මේ ළඟ නේ."

හසකාවා මැඩම් ලියුම් කවරයක් මේසය මතින් ඔෂින් වෙත තල්ලු කළා.

"මේ ඔෂින් හම්බ කළ මුදල්. මම ඒ සේරම ඔයාටම දෙන්න අරගෙන තිබ්බා. ගන්න ඔෂින්. ඔයා හිතන්න ඔයා අද ඉඳලා තනියම තේරුණා ද? හොඳ කල්පනාවෙන් වැඩ කරන්න. කොහොම හරි දියුණු වෙන්න ඒකයි මගෙ පැතුම."

මැඩම් අනිත් පැත්තට හැරී කඳුළක් පිසදා ගත්තා. ඔෂින් සැම දෙනාගෙන්ම සමු ගත්තා.

ඉට්සු ඉකි ගසමින් ඇඬුවා.

"ඔෂින් ඔයා මගෙ සොයුරිය."

ඔෂින් හිස නමා ගෙන යන්න ගියා. ඇයගේ කාමරය තිබූ නිවසට ආවා.

"කවුද ගෙදර? "

මහලු කාන්තාවක් එළියට ආවා.

"මම ඔෂින්."

ඔෂින් ඇයට ආචාර කළා.

"ඔෂින්, අන්න ඔයාගේ කාමරයට යාළුවො වගයක් ඇවිත් ඉන්නවා. ඒ ගොල්ලන් ඔයා එනතෙක් බලා ඉන්නවා."

"හොඳමයි."

ඇය උඩුමහලට නැග කාමරයේ දොර ඇරියා.

සුමිකො සහ ඇගේ මිතුරියන් එහි වාඩි වී සිටියා.

"ඔෂින් ඔච්චරද බඩු?"

"ඔව් මෙච්චරයි." ඔමින් හිනැහුණා.

"ඔන්න මගෙන් මේ මේසය, තේ පෝච්චි, කෝප්ප" තොම්කො කිව්වා.

සුමිකො නැග එහි කබඩ් එක ඇරියා.

"මෙන්න ඔමින්ට මෙට්ටයක්, කොට්ට, ෂීට්."

"අනේ ඔයාලා මම වෙනුවෙන් සේරම ලෑස්ති කරලා."

"මේ කෑම උයන බඳුන් කට්ටලය මගෙ යාළු වෙළෙන්දෙක් දුන්නේ."

"මෙච්චර බඩු. ඔයාලා හැමෝටම මම ණය ගැතියි. ස්තූතියි බොහෝම."

"ඒත් ඔමින් ඔයාට අවශ්‍යම දෙයක් අපට ගන්න බැරිවුණා." සුමිකො කිව්වා.

"ඔව්, අපි කතා වුණේ ඔයාට කණ්ණාඩි මේසයක් ගන්න විදිහක්."

"මොකටද කණ්ණාඩි. මම ගෙවල්වලට ගිහින්නේ කොණ්ඩා සකසන්නේ."

"හැමදාම එහෙම බෑ. ඔයා පොඩි සාප්පුවක් දමා ගන්න ඕනෑ."

"ඔයාලා හිතලා තියෙන දුර."

"බලමු බලමු කණ්ණාඩි මේසයකට මම පොඩි ප්ලෑන් එකක් දමලා තියෙන්නේ."

"ඔව්, ඔව්, සුමිකො දස්සයි ප්ලෑන් දාන්න."

සියලු දෙනාම සතුටින් හිනැහුණා.

මේ අතර ඉට්ෂු පැමිණියා.

ඔමින් මේ ලිපිය ඔයාට අද ආවේ. මැඩම් මට කිව්වා ගිහින් දෙන්න කියලා.

"හුඟක් ස්තූතියි ඉට්ෂු."

"මම යන්නම්."



"හොඳයි."

ලිපිය එවා තිබුණේ කායෝ. ඔමින් එය කිමෝනාවේ රඳවාගෙන යෙහෙළියන්ට සංග්‍රහ කිරීමට සූදානම් වුණා.

කායෝ සකාටා දුම්රිය පළෙන් බැස පයින් ම ගෙදර ගියා. ඇය කගායා නිවස අසල නැවතී බලාගෙන හිටියා. අම්මා, තාත්තා, ආච්චම්මා තමා පිළිබඳ කුමන තීරණයක් ගනී ද ? පන්නා දමයි ද ? ඇයට මොහොතකට හිතුණා. කමක් නෑ මම ගෙට යනවා.

කායෝ ගේ තුළට ගියා.

"කවුද ඔයා ? මොකද ? මොනවද ඕනෑ ?"

මෙහෙකාරියක් ප්‍රශ්න කිහිපයක්ම ඇහුවා. කායෝ ඇය තල්ලුකර දමා ගේ ඇතුළටම ගියා.

"මැඩම්, මෙන්න කවුද කෙල්ලක් ගේ ඇතුළට එනවා."

"මොකද ? මොකද ඔය ? කවුද ඔය?"

මිනෝ එළියට ආවේ ප්‍රශ්න කරමින්. ඇය මොහොතකට එතනම නතර වුණා.

"කා........යෝ.. ?"

"අම්මා, ආවා ගෙදර, කොහොමද දැන් ආව එක හොඳයි නේද ?"

"අම්මා, ජිරෝ අනේ එන්න අපේ කායෝ ඇවිල්ලා."

තාත්තා පැමිණ විමතියෙන් බලාගෙන හිටියා. අවසානයට ආවේ ආච්චම්මා.

"ආච්චම්මා මට සමාවෙන්න."

කායෝ ආච්චම්මා ළඟට ගියා. යශිරෝ මහත්මිය අත දිගහැර කම්මුල් පහරක් දුන්නා කායෝගේ මුහුණ හරහාම. කායෝ බිම දණගහගත්තා.

"අම්මා, මොනවද මේ කරන්නේ කායෝ ආපිට ආවානේ."

"නෑ අම්මා මට එහෙම කරන්න ඕනෑ. තව ගහන්න ආච්චම්මා. මට ආදරය කළ අයට පිටුපා මම ගියා නේ. මට සමාවෙන්න කියන එකත් අසාධාරණයි. මට දඬුවම් දෙන්න ආච්චම්මා."

යශිරෝ මහත්මිය කායෝ දෙස ටික වෙලාවක් බලා හිටියා.

"මට ඔෂින් හම්බ වුණා. මම හිත සනසාගෙන හිටියේ ඔයාලට සායෝ ඉන්නවා කියලා. ඒත් නංගි නැතිවුණා කියලා ඔෂින් කිව්වට පස්සේ මට නින්ද ගියේ නෑ. නැවිත් ඉන්න බැරි වුණා. ආච්චම්මා මම ආපිට යන්නම්."

"කායෝ පස්සේ කතා කරමු. දැන් මූණ කට හෝදාගන්න. ඔයාට මහන්සිත් ඇතිනේ." ආච්චම්මා කීවා.

"එන්න දුව."

මිනෝ කායෝ තුරුළු කර ගෙනම ගෙට ගියා.

"ඔයාගේ කාමරේ ඒ වගේම තියෙනවා. මම හිතුවා කවදා හරි ඔයා ආපිට එයි කියලා."

සවස සියලු දෙනාම කෑම කාමරයට එකතු වුණා. මිනෝ තේ වත්කළා.

"කායෝ ඔයාට ඔෂින් මුණ ගැහුණා ද ?"

"ඔව් ආච්චම්මා ඔෂින් තමයි මට කිවේ නංගි නැතිවුණා කියලා. ඒකයි මම ආවේ. ඒත් අම්මා, තාත්තා මම ආපිට ටෝකියෝ යන්න ඕනෑ."

"ඒකට කමක් නෑ කායෝ. දැන් ඔයා මේ ආපු එකේ තව සති දෙකක්වත් ගෙදර ඉඳලා යන්න. තේරුණා ද ?"

කායෝ සෙමෙන් හිස වැනුවා. ගෙදර අයගේ සතුට දැන් ඔවුන්ට පිටුපා යන්න සිතුණේ නෑ. කායෝ ඔෂින්ට ලිපියක් ලිව්වා.

"ඔෂින්, ඔයා හිතුවා හරි. මම ආවාම මේ ගොල්ලන් හරියට සතුටු වුණා. ඒ සතුට නැතිකරලා ආපිට දැන් මට එන්න හිතුණේ නෑ. තව සති දෙකක් විතර ඉඳලා මම එන්නම්. නමුත් ඔෂින්, කෝටා කාමරයට ආවොත් මට ෆෝන් කරන්න. මම ආපිට එනවා ඉක්මනින්ම."

කායෝ අම්මාත්, තාත්තාත්, ආච්චම්මාත් සමගම දවස ගත කළා.

නිවැසියන් හිටියේ හරිම සතුටින් සැනසීමෙන්. ඒත් කායෝගේ හිත කීවේම කෝටා කාමරයට ඉක්මනින්ම එයි කියලා. එදා හවස ඇය කෑම කාමරයේ දී කතා කළා.



"මම ආපිට යන්න ඕනෑ අම්මා. මට රස්සාව කරන්න තියෙනවා."

"මොනවද ඔයා එහෙදි කළේ."

"සාප්පුවක වැඩ කළා."

"ඔයා අපිට කීවේ සිත්තර වැඩ කරන්න යනවා කියලානේ. කායෝ හොඳට අහගන්න ඔයා සිත්තර වැඩට දක්ෂ නැහැ. ඒ නිසා ඒ රැකියාව ගැන හිතන්න එපා. මම එක කාරණයක් දන්නවා. ඔයාට ආදරවන්තයෙක් ඉන්නවා නේද ?"

ආච්චම්මා ඇහුවා.

"මම නම් හිතන්නේ නෑ. කායෝ එහෙම ළමයෙක් නෙමෙයි." අම්මා කීවා.

"කායෝ ලොකු ළමයෙක්. එහෙම දෙයක් තිබුණත් පුදුම වෙන්න දෙයක් නෑ. මිනිහෙක් ගැහැනියෙක් බඳින්න ඕනෑ. මේක ඔයාගේ අනාගතයට බලපානවා. මතක තියාගන්න. පවුලේ ව්‍යාපාර අයිති ඔයාට."

"ඒ වුණාට ආච්චම්මා මම ආපිට යන්න ඕනෑ."

"මම දන්නවා ඔයාට එහෙ ආදරවන්තයෙක් ඉන්නවා. ඒකයි ඔයා යන්න හදන්නේ. කෝ එයාගෙන් දුරකතන ඇමතුමක්වත් ලැබුණ ද ? මම ඔයාට එදා සති දෙකක් ඉන්න කීවේ ඒක බලන්න තමයි. කෝ කවුරුත් ආවේ නැහැනේ. මම හිතාගෙන හිටියේ ඔයාගේ පෙම්වතා ආවානම් එයා මොන තත්ත්වයේ කෙනෙක් වුණත් කමක් නෑ ඔයාගේ විවාහ උත්සවය අරගෙන කගායා ආයතනය ඔය දෙන්නාට භාර දෙන්න. දැන් ඔයාට පැහැදිලියි නේද ? ඔයාගේ ආදරවන්තයා ඔයාට ආදරේ නැහැ."

කායෝ හඬමින් ම ඇයගේ කාමරයට දිව ගියා. ආච්චම්මා කියන දේ ඇත්ත. කෝටා මට ආදරේ නැහැ. නැතිනම් දැන් වසර තුනකට කිට්ටු වෙන්න ආවා. එයා මාව අත ඇරලා ගිහින්. මම ජීවත් වෙන්නේ කොහොමද කියලවත් එයා හිතුවද ? ඒත් හැම දවසක් ම මම එයා එනකල් බලාගෙන හිටියා. කායෝ හිතුවා නෑ මම ආපිට ටෝකියෝ යන්නේ නෑ.

කායෝට එහෙමම නින්ද ගියා.

ඇය පසුවදා සිට කගායා ආයතනය පිළිබඳව ආච්චම්මා, හා තාත්තා සමග කතා කළා. කායෝගේ අදහස්වලට ආච්චම්මා මුල්තැන දී කටයුතු කළා. මේ අතර ඔෂින් ගෙන් ලිපියක් ලැබුණා.

"මිස් කායෝ,

තොරතුරු කොහොමද ? මම නිවාඩුවක් ලැබුණ ගමන් ඔයාගේ කාමරේ පිරිසිදු කරනවා. ඒත් තවමත් කෝටා ආව බවක් පෙනෙන්නේ නෑ. ඔයාගේ ලිපියත් මේසය උඩ තිබුණා. කෝටා ආවොත් මම ඔයාට ෆෝන් කරන්නම්.

ඔෂින්."

"කාගෙන් ද ලියුම."

මිනෝ අහුවා.

"මේ ඔෂින් ගෙන්."

"කායෝ ඔෂින්ට ටෝකියෝවල ආදරවන්තයෙක් ඉන්නවද?"

"නෑ අම්මා ඇයි ?"

"මම නිකමට ඇහුවේ. එයාට කියන්න කාරණයක් තියෙනවා. කායෝ ඔයාට ගැලපෙන මනමාලයෙක් ලැබුණා. අන්න ආච්චම්මා එන්න කීවා ඔයාට."

මිනෝ කායෝ කැටුව ගියා.

"වාඩි වෙන්න කායෝ. විස්තරය කියන්නයි එන්න කීවේ. මනමාලයා හෙට ඔයා බලන්න එනවා. ඔයා විරුද්ධ වෙන්න එපා."

ආච්චම්මා කිව්වා.

"විරුද්ධ වෙන්න කිසි හේතුවක් නැහැනේ. එයා මේ අවුරුද්දේ ටෝකියෝ සරසවියෙන් උපාධියත් ගත්ත කෙනෙක්." තාත්තා පැවසුවා.

"ඔව් බොහොම නිව්ච්ච ළමයෙක්."

"ලෝක යුද්ධය අවසන් වෙන්නයි යන්නේ. ජපන් ආර්ථිකය ඉහළ යයි. ඒ නිසා කගායා ආයතනය හිමිකාරයා උගත් කෙනෙක් වෙන්න එපෑ යැ."

තාත්තාත් පැහැදිලි කළා.



"කායෝ, ඔයාගේ ආදරවන්තයා අමතක කරලා දමන්න. ඔය වගේ කෙනෙකුට ආදරේ කරන එක කාලය නාස්ති කර ගැනීමක් විතරයි. ඔයා මේ විවාහයට කැමති වෙන්න."

කායෝ කිසිවක් කීවේ නැහැ. ඇය නැගිට කාමරයට ගියා.

මේ තරම් ඉක්මනට විවාහයක්! විවාහයක් වෙනවා කියන්නේ කෝටා අතහැර දමනවා කියන එක. මට පුළුවන් ද කෝටා අහිමි කර ගන්න. කෝටා ආපිට එනවාමයි. මට හොඳටම විශ්වාසයි මට බැහැ මෙහෙ ඉඳලා මගෙ නිදහස නැති කර ගන්න. යනවා මෙහටම යනවා. කායෝ කාමරයේ දොර වසා දමා ඇඳුම් පෙට්ටිය සකස් කළා. එදා මුළු රැයක් ම කායෝ හිටියේ අවදියෙන්. ඇය පාන්දරම ඇඳුම් බෑගය ගෙන කාමරයෙන් පිට වුණා. බරාදයට එන විටම එහි විදුලි බුබුල පත්තු වුණා. කායෝ ගැස්සුණා. එතන හිටියේ ආච්චම්මා.

"මම හිතුවා කායෝ මෙහොම කරයි කියලා. ඒත් මේ දවස්වල අපි ලබපු සතුට ගැනවත් හිතන්න කායෝ."

"බැහැ ආච්චම්මා, අනුන් වෙනුවෙන් මගෙ ජීවිතයට කැප කරන්න."

"මම දන්නේ නෑ කායෝ ඔයාලා අතර මොන සම්බන්ධයක් තිබුණ ද කියලා. ඒත් ඔයා ගියොත් මයා දුකට පත්වෙයි."

"මම ඒක දන්නවා ආච්චම්මා. ඒ වුණාට මට එයා අමතක කරන්න බැහැ."

"ඔයා කාගායාවල අයිතිකාරිය."

"මම කිව්වේ නෑ කගායා මට ඕනෑ කියලා. කගායා ඕනෑ කෙනෙකුට අයිති වුණා වේ."

"කායෝ මම මහන්සිවෙලා මේ කගායා ආයතනය දියුණු කළේ ඔයාට දෙන්නමයි."

"ඒත් කගායාවලට මගෙ ජීවිතය හිර කරන්න බෑ ආච්චම්මා."

"අනේ දුව, යන්න එපා. යන්න එපා කායෝ."

ඒත් කායෝ ආච්චම්මාගෙ අත තල්ලු කර දමා එළියට ගියා.

"අයියෝ, අයියෝ..."

ආච්චම්මා පපුවට අත තියාගෙන බිමට පාත් වුණා. ආච්චම්මා බිම වැටෙන හඬ කායෝට ඇහුණා. ඇය ආපසු දුව ගියා.

"ආච්චම්මා......... ආච්චම්මා නැගිටින්න."

ඒත් ඇය නිහඬයි. ආච්චම්මාගේ හිස ඇකයේ තබාගත් කායෝ කෑගැහුවා.

"අම්මා, තාත්තා, ඉක්මනට එන්න. ආච්චම්මා අසනීප වෙලා. ඉක්මනට අනේ කවුරු හරි එන්න."

කායෝගේ කෑගැසීමට නිවැසියන් අවදිව දුව ආවා.

වෛද්‍යවරයා යශිරෝ මහත්මියට ප්‍රතිකාර කර ආපසු ගියා. මීනොත් ජිරොත් ඇය දෙපස හිටියා. යශිරෝ මහත්මිය සිටියේ තද නින්දක.

"ඔයා තාම කල්පනා කරන්නෙ ටෝකියෝ යන්න ද ? ආච්චම්මාට මෙහෙම වුණේ කාගේ වරදින් ද? ඇහුණා නේද දොස්තර කියපු දේ. මේ සේරම හිතේ නිස්කලංකයක් නැතිකම නිසාලු. සායෝ නැති වුණාම අම්මාගේ කම්පනය අඩු වුණේ ඔයා ආවාම. එයාට ඕනෑ වුණේ කගායා ආතනයේ වගකීම ඔයාට භාර දෙන්නයි. ඒක ඔයාගේ පුතුකම. ආච්චම්මා සනීප කරගන්න එක තියෙන්නේ කායෝ අතේ."

මීනෝ පැහැදිලි කළා. කායෝ කල්පනා කළා.

ඇත්ත තමයි ආච්චම්මා ලෙඩ වුණේ මම නිසා. ගෙදර අයට දුක්දීම විතරමද මගෙන් සිද්ධ වෙන්නේ. කගායා ආයතනය භාර ගත්තොත් ආච්චම්මාගේ අසනීපය හොඳ වෙයි. එක අතකට මාව අමතක කළ කෝටා ගැන හිතාගෙන මම මොකට ද ටෝකියෝ යන්නේ. මම කොහොම හරි ආච්චම්මාව සනීප කර ගන්නවා. කායෝ වැඩිපුර දවස ගත කළේ ආච්චම්මා සමග. ඇය ආච්චම්මාගේ බෙහෙත් වෙලාවටම පෙව්වා. සුප් හැන්දෙන් හැන්ද පොවන විට ආච්චම්මා ඇස්වල කඳුළු පුරෝගෙන කායෝ දිහා බලාගෙන හිටියා. විටෙක ඇය ගණන් හිලව් පොත් රැගෙන පැමිණ ආච්චම්මාගෙන් ගැටළු තැන් පිළිබඳ විමසුවා.

ඒ වෙලාවට ආච්චම්මාගේ දෙනෙත් දිලිසුණා.

"ස්තුතියි කායෝ."



ඇය සැම විටම කිව්වා.

ආච්චම්මාට මඳ සුවයක් ලැබුණ විට කීවේ,

"කායෝ මනමාලි වෙනවා බැලුවට පස්සේ මම මැරුණත් කමක් නැහැ" කියලා.

අම්මා නිතරම මේ වචන කෙරෙහි කායෝගේ අවධානය යොමු කළා.

"කායෝ ඔයා තේරුම් ගන්න. අපතේ යවන්න කාලයක් නෑ. මුළු ජීවිත කාලයම අපි වෙනුවෙන් කැප කළ ආච්චම්මාගේ ආශාව ඉෂ්ට කරන්නේ නැද්ද ඔයා ?"

කායෝ විරුද්ධව කිසිවක් කීවේ නෑ. කායෝ සැම විටම හිටියේ දෙගිඩියාවෙන්. කෝටා අමතක කරන්නේ කොහොමද? මම මේ කරන කැපවීම කෝටා දන්නවාද? එයා කවදාවත් ආපිට නාවොත් මේ බලාගෙන ඉඳීමේ ප්‍රතිඵලය කුමක් ද?

# දහතුන

ඔමින් කාමරයට වී මැහුම් වැඩක යෙදුණා.

"ඔමින්," ඒ නිවසේ අයිතිකාරියගේ හඬ.

"මම ඉන්නවා."

"ඔන්න ඔයාට කණ්ණාඩි මේසයක් ගෙනල්ලා. ඔන්න මම උඩට එව්වා."

ටිකකින් සේවකයෝ දෙන්නෙක් කණ්ණාඩි මේසයක් කාමරයට ගෙන ආවා.

"ඔබ මිස් ඔමින් නේද ?"

"ඔව් මේක මට කියලා විශ්වාසද ?"

"ඔව් මිස් ඔමින්ට දෙන්න කීවේ මිස්ට ටනකුරා."

"ටනකුරා ?"

"ඔව් මේ තියෙන්නේ මිල ගෙව්ව රිසිට් එක."

ඔමින් කල්පනා කළා.

ටනකුරා කියන්නේ අර සල්ලාලයා. එහෙම අයගෙන් තෑගි භාරගන්න මට බෑ.

"ආ.... බෑ... බෑ... මට මේක භාරගන්න බෑ. එහෙම කෙනෙක් මම අඳුරන්නේ නෑ. කරුණාකරලා මේක ආපිට ගෙනියන්න."

"එහෙමද ?"

"අනේ අරගෙන යන්න."



"හොඳයි."

ඔමින් සේවකයන්ට හිස නමා ආචාර කළා. සේවකයන් කණ්ණාඩි මේසය අරගෙන ගියා. පසුදින සුමිකෝ හමු වූ ඔමින්

"සුමිකෝ, මිස්ට ටනකුරා කොහොම කෙනෙක්ද ?"

"ඇයි එහෙම ඇහුවේ ?"

"එයා මට කණ්ණාඩි මේසයක් එවලා තිබුණා."

"එහෙමද එහෙම නම් මගෙ ඉල්ලීම ඉෂ්ඨ කරලා තියෙනවා. කොහොමද ඔමින් කණ්ණාඩිය හොඳද ?"

"මං දන්නේ නෑ හොඳද කියලා. මං ඒක ආපිට ඇරියා."

"මොනවා මොකක් ද ඔයා ඒ කළේ."

"මම මිස්ටර් ටනකුරා ගැන දන්නේ නෑ. නොදන්න අයගෙන් එහෙම වටිනා තෑගි භාරගන්න බැහැ."

"ඒත් ඔමින්. එයාට ඒක එවන්න හේතුවකුත් තිබුණා."

"මොන හේතුවක් ද ?"

"එයා නිසයි ගීසාවලදී ඔයාට තුවාල වුණේ. ඔය ගැන නිතරම කියවනවා."

"ඒ වුණාට..."

"ඔමින් අපි වගේ නැති බැරි අය ඒ වගේ පොහොසත් උදවියගෙන් උදව්වක් ගන්නට තමන් නෑ."

ඔමින් කිසිවක් කීවේ නෑ. සුපුරුදු ලෙස කායෝගේ කාමරය පිරිසිදු කිරීමට ගිය ඔමින් සෙමෙන් සෙමෙන් ගෙදර ආවා.

"ඔමින්."

ඒ ගෙදර අයිතිකාරිය.

"අන්න ඔයාට අමුත්තෙක් ඇවිල්ලා ඉන්නවා. එයා හරි හොඳයි. මටත් තෑග්ගක් ගෙනත් තිබුණා. මං කීවා ඔයා එනකම් ඔයා ගේ කාමරේ ඉන්න කියලා."

ඔමින් ඉක්මනින් පඩිපෙළ නැග්gා.

අමුත්තා කවුද ?

ඇය දුටුවේ මෙට්ටය මත වාඩි වී සිටි ටනකුරායි.

"ආයුබෝවන්, මම ඔයා මුණ ගැහෙන්න ආවා. සමාවෙන්න ඊයේ සිද්ධ වුණ දේට. මට තිබුණේ කෝල් කරලා කණ්ණාඩි මේසය එවන්නයි. එහෙම නේද ?"

ඔෂින් නොපහන් මුහුණින්

"නෑ... නෑ.... එහෙම වටිනා තෑගි භාරගන්න මම කැමති නෑ."

"මම ඒක එව්වේ ඔයාට වන්දියක් වශයෙන්."

"වන්දියක් ඒ මොකට ද ?"

"ඇයි ගීසාවලදී ඔයාට කරදර සිද්ධ වුණේ මම නිසයි."

"එහෙම අවශ්‍ය නෑ. ඒක මගේ ජීවිතේ තවත් එක සිද්ධියක් විතරයි."

"මිස් ඔෂින් මට හරි සතුටුයි ඔයා ගැන."

"මොනවටද මා ගැන සතුටු වෙන්නේ."

"විශේෂයෙන් ඔයාගේ ධෛර්යය ගැන. හැම ගැහැණියක් ම ඔයා වගේ වෙන්න ඕනේ. කායෝ මට ඔයා ගැන විස්තර කියලා තියෙනවා. මම කායෝට පොරොන්දු වුණා ඔයා බලාගන්නවා කියලා."

"ඒ වුණාට මිස්ට ටනකුරා මා ගැන වදවෙන්න එපා."

"හොඳයි මෙවර නම් මේ කණ්ණාඩි මේසය ආපිට එවන්න එපා."

කණ්ණාඩි මේසය කාමරයේ පසෙක තිබෙනවා ඔෂින් දුටුවේ මේ අවස්ථාවේ.

"ඒත් මිස්ට ටනකුරා..."

"නෑ මිස් ඔෂින් දැන් ඒ ගැන වදවෙන්න එපා. එහෙම නම් මම ගිහින් එන්නම්."

ඔහු නැගිට දොර දෙසට ගොස් නැවත ආපසු පැමිණියා.



"මිස් ඔෂින්ගේ අත් අකුරු නම් හරිම හැඩයි. මොකද මට ලියුම් තුනක්ම ලැබෙනවා. තුනේම එකම අකුරු."

මෙවර ඔෂින් බිම බලාගත්තා.

"ඔයා මාව පිළිකුල් කරනවා ඇති. මේක මිනිස්සු පොළඹවන උපායක්. ඒ ගොල්ලන්ට මා ගැන කිසිම හැඟීමක් නෑ. එයාලට ඕනෑ මගෙ සල්ලි විතරමයි. හොඳයි මම යන්නම්."

ඔහු පඩිපෙළ බසින හඬට ඔෂින් කන් දී සිටියා.

ඇය එවලේම කායෝට ලිපියක් ලිව්වා.

"මිස් කායෝ,

ඔබ සකාටා ගිහින් මාසයක් පමණ ගත වුණා. ඇයි ලිපියක් නොලිව්වේ. කෝටා ආපිට ආව බවක් පේන්න නෑ. දන්නවද මිස් කායෝ මිස්ට ටනකුරා මට කණ්ණාඩි මේසයක් එවලා තිබුණා. මම ඒක ආපිට ඇරියාම එයාම ආපසු ගෙනත් දුන්නා. ඔහු මෝඩයෙක් ද? කපටියෙක් ද මට හිතාගන්න බැහැ. මට ඉක්මනින් පිළිතුරක් එවන්න."

ඔෂින් තනිවම කොණ්ඩ මෝස්තර දමා සොයා ගත් සල්ලි වලින් හසකාවා මැඩම්ට කිමෝනාවක් මැහුවා. ඒ තෑග්ගක් වශයෙන් දෙන්නයි. අනිත් අය සඳහා කැවිලි පෙට්ටියක් ගත්තා. ඒවා රැගෙන හසකාවාගේ සාප්පුවට ගියා.

"මැඩම් මම ආවා."

"අනේ ඔෂින් ඔයා. ඔයා ගිහින් මාසයයි. අපිව බලන්න ආවා නේද ?"

"ඔව්, මැඩම්."

"ඉතිං ඔෂින් ඔයාට වාසියි වගේ. කොහොමද ඔයා අය කරන්නේ."

"මැඩම් මාසෙටම කොණ්ඩ දමලා යෙන් 32 විතර හම්බ කළා. මැහුම්වලටත් එක්ක යෙන් 65 විතර හම්බ වුණා. ඉතිං ගෙවල් කුලීත් ගෙවලා යෙන් 10 විතර මට ඉතුරු වුණා."

"හොඳයි නේ."

"මේ ජේරම මැඩම් නිසා නේ. මෙන්න මගෙන් පුංචි තෑග්ගක්."

ඔෂින් ලේන්සුව දිග හැර කිමෝනාව මැඩම් අතට දුන්නා දෝතින්ම.

"මම දන්නෑ මැඩම් මේකට කැමති වෙයි ද කියලා. මේක මමමයි මැහුවේ."

"ස්තුතියි, ඔෂින්. ඒත් ආයිම මේව කරන්න එපා. මේවා අවශ්‍ය නැහැ. ඔෂින් මා ළඟ බොහොම හොඳට හිටියා. උදව් කළා. ඒව මට අමතක නැහැ."

හසකාවා මැඩම් කිමෝනාව අඳින අයුරු ඔෂින් සතුටින් බලාගෙන හිටියා.

"ඔෂින්, ඔයා මෙහෙම දියුණු වෙලා ඉන්නවා දැක්කම ඔයාගේ අම්මත් හුඟක් සතුටු වෙයි. ඔයා අම්මටත් ඇඳුමක් අරින්න. මුදල් ටිකක් යවන්න. ඒක ඔයාගේ යුතුකමක්."

"හොඳමයි."

"ඔෂින්, ඔයාට මතකද ඔයාගේ අක්කට දුන්න පොරොන්දුව. ඔයා ඒක ඉෂ්ඨ කළා නේද ? තවත් හොඳට දියුණු වෙන්න ඒක මගේ ප්‍රාර්ථනාවක්. "

"ස්තුතියි, මැඩම්" ඔෂින් හිස නමා ආචාර කළා.

එදා නිවසට පැමිණි විගසම ඔෂින් අම්මාට ලිපියක් ලිව්වා. ඒ සමඟම යෙන් 20 මුදලක් අම්මට යැව්වා. ඔෂින් තමන්ගේ අත ඉතිරි වූ මුදල් දෙස බලාගෙන කල්පනා කළා. වසරකට හාල් මලු පහකට තමා සේවිකාවක් ලෙස සේවය කළ බව ඇයට මතක් වුණා. ඇය ලිපියත් රැගෙන තැපැල් කාර්යාලයට ගියා. ඇය තැපැල් කාර්යාලයෙන් පිටතට එන විට පාර ළඟ ටනකුරා ඇය බලාපොරොත්තුව සිටියා.

"ආයුබෝවන් ඔෂින්."

ඔෂින් හිස නමා ආචාර කළා.

"ඔයා තැපැල් කන්තෝරුවට ගියා කියලා ගෙදරින් කිව්වා. ඉතිං මම ඔයා මුණ ගැහෙන්න මෙහාට ආවා."

"ඇයි මිස්ට ටනකුරා ?"



"මිස් කායෝ මගේ සාප්පුවට කෝල් කළා. ඔයාට කතා කරන්න ඔනේ කිව්වා. තව ටිකකින් කෝල් එක ගනියි. මිස් ඔෂින් මගෙ සාප්පුවට එන්න. එහෙම නැත්නම් මාත් එක්කම යමු."

"ස්තුතියි, ඔයාට. මං ඔබෙ සාප්පුව දන්නෙත් නැහැනේ."

"අපි යමු, රික්ෂෝ එකක."

"එපා, පයින් ඇවිදගෙන යමු."

ඔෂින් හා රුසෝ ටනකුරා රෙදි සාප්පුවට ගියා. එහි සීප දෙනෙක්ම සේවය කළා. එක් මහලු සේවකයෙක් ද සිටියා.

"ගෙන්ජි, මේ මිස් ඔෂින්. ඇයගේ යෙහෙළියකගේ ෆෝන් කෝල් එකක් බලාපොරොත්තුව ඉන්නේ."

"හොඳයි ඔතනින් වාඩි වෙන්න."

ඔෂින් හිස නමා ආචාර කර වාඩි වුණා.

දුරකතන ඇමතුම් කීපයක් ම ආවා. ඒ ව්‍යාපාර සම්බන්ධයෙන්. ටනකුරා සාප්පුව පුරාම තිබුණේ ලොම් රෙදි. ඒවා රාත්‍ර පුරවා තිබුණා. හොඳ ව්‍යාපාරයක් වගේ ඔෂින් සිතුවා. එවර දුරකථන ඇමතුම ඔෂින්ටයි.

"මිස් ඔෂින්, මෙන්න මිස් කායෝ."

"හරි..." ඔෂින් දුරකථනය ගත්තා.

"ඔෂින්, මම කායෝ. මම තීරණය කළා විවාහ වෙන්න ඔෂින්."

"කොච්චර හොඳයි ද ? යශිරෝ මැඩම්ට හරියට සතුටු ඇති."

"ඔව්, කගායා ආයතනයක් මට භාරදෙන්න ආච්චම්මා ඉන්නේ නොඉවසිල්ලෙන්. ඉතිං ඔෂින් මං කල්පනා කළා තව එක සැරයක් කෝටා මුණ ගැහිලා සමුගන්න. ඒ නිසා කෝටා ආවොත් මට මුණ ගස්වන්න නොවරදවාම."

"හොඳයි."

කතාව නිමකර ඔෂින් රිසිවරය තිබ්බා.

"මිස් ඔෂින්, මම උවමනාවකට එළියට යන්නයි හදන්නේ."

"මමත් දැන් යනවා මිස්ට ටනකුරා. මට උදේට තමයි හුගක් වැඩ තියෙන්නේ."

"එන්න එහෙමනම් යමු."

ඔෂින් ගෙන්ජි ළගට ගියා.

"ගෙන්ජි, මහත්තයා. ස්තූතියි යන්නම්."

"හොදයි."

දෙන්නාම හිස නමා ආචාර කර ගත්තා.

"මිස්ට ටනකුරා. මිස් කායෝ විවාහ වෙන්න යනවා."

"එහෙමද ඒක හොදයි. එයාගේ පෙමවතා විප්ලවීය කම්කරු නායකයෙක් නේද ?"

"මිස්ට ටනකුරා ඒ බව දන්නවද ?"

"කායෝ මට කියලා තියෙනවා. මට හිතෙනවා මිස් කායෝට හොදම දේ විවාහ වී කගායා ආයතනය භාර ගැනීමයි. හොද පැලයකට හොද පරිසරයක් අවශ්‍යයි නේ."

"මම යන්නම් මිස්ට ටනකුරා ඔබට ස්තූතියි."

"හොදයි ආයිම මුණගැහෙමු."

ඔෂින් හිස නමා ආචාර කර වෙන්ව ගියා. ඔෂින් නොදැනීම කායෝගේ කාමරය ළගට ගියා. ඇය කාමරයේ දොර ඇරියා. ඇයට අමුත්තක් දැනුණා. ඇය ඇතුල් කාමරයට එබී කතා කළා.

"කවුද ඉන්නේ ගේ ඇතුලේ."

ගේ ඇතුලෙන් එළියට ආවේ කෝටා.

"ඕ... ඔෂින්...... ඔයා."

"කෝටා මම හිතුවෙවත් නෑ ඔයා ඇති කියලා. මිස් කායෝ....."

"මම දන්නවා ඔෂින් මම ලිපිය කියෙව්වා."

"ඉන්න මම මිස් කායෝට ෆෝන් කෝල් එකක් දීලා එන්නම්."

"එපා."



කෝටා ඔෂින්ගෙ මග අහුරාගත්තා.

"මම පොලිසියට හැංගි හැංගී ඉන්නේ. කායෝගේ අනාගතය දැන් සුරක්ෂිතයි. ඔෂින් ඇයි එයා අමාරුවේ දමන්නේ."

"ඒත් මිස් කායෝ ඔයා එනතෙක් මග බලාගෙන හිටියා. ඔයා අවුරුදු දෙක තුනක් ඇයි මිස් කායෝ මුණ නොගැහුණේ. ඒක හොද නැහැනේ."

"මම මාස හයක් විතර හිරේ හිටියා ඔෂින්. ඒක නෙමෙයි ඔයා ටෝකියෝවල ඉන්නවා කියලා මම දැනගෙන හිටියේ නැහැ. ඔයා මෙහෙ මොනාද කරන්නේ."

"කොණ්ඩා සකසනවා."

"පුහුණුවක් එහෙම ලබලා ද ?"

"ඔව්. මෙහෙ ඇවිත් දැන් අවුරුදු තුනක් විතර වෙනවා."

කෝටා ඔෂින් දෙස බලාගෙන හිටියා.

"ඔෂින් මට සමාවෙන්න මෙහෙම ඔයා එක්ක කතා කරන්නවත් මට අයිතියක් නෑ. මට ඔයාට මූණ දෙන්නත් ලැජ්ජයි."

"නෑ එහෙම නෑ. ඒ ගැන වද වෙන්න එපා. දැන් ඔයාට බඩගිනි ඇතිනේ. ඉන්න මම තෑම ටිකක් හදාගෙන එන්නම්."

කෝටා එවිට ජනේලයෙන් එපිට බලාගෙන තමාටම කියා ගත්තා.

"එදා මම ඔෂින් ඔයා එනතෙක් බලාගෙන හිටියා. මට ඕනෑ වුණේ ඔයා එක්කගෙන යන්නයි. ඒත් ආවේ කායෝ. ඔයා එදා පෝසත් මිනිහෙක් එක්ක නම් දාන බව කායෝ කිව්වා. මම කල්පනා කළා ඔයාට සැප දෙන්න මට බැරිවෙයි කියලා. ඒක අතකට මම සතුටු වුණා."

"ඒවා වලින් වැඩක් නෑ මම දැනගත්තා කායෝ ඔයාට කොයි තරම් ආදරේද කියලා. අනේ කෝටා මට අවසර දෙන්න කායෝට ඔයා ආවා කියන්න."

"එපා ඔෂින් එයා සකාටා ගියානේ."

"ඒ ගියේ එයා ගේ නංගි සායෝ මිය ගිය නිසා."

"ඒක තමයි දැන් එයාට කගායා භාර අරගෙන ඒක දියුණු කරන්න පුළුවනි. සමහර විට විවාහයක් කරලා දේවි වැඩිහිටියෝ."

"ඒක වැරදියි ගැණියෙකුට අගනාම දේ ආදරය. ඔයා විප්ලව කරන නිසා ඔයාට ගැණියෙකු ගෙ ආදරය තේරුම් ගන්න බැහැ."

"ඔෂින්, මම ආවේ කායෝ බලන්න නෙමෙයි. සංවිධානේ වැඩ වගයකට. කායෝගේ ලිපිය දැක්කාම මම හරි සතුටු වුණා. එයාට ආරක්ෂාව තියෙනවා කගායාවල."

"ඒත් මිස් කායෝට ඔයාගෙන් තොර ජීවිතයක් නෑ."

"ඔෂින් මේක තේරුම් ගන්න. මම කායෝට ආදරේ කරන්නේ නැහැ. ඔයා දන්නවා ඔෂින් මම ආදරය කළේ ඔයාට. අදත් මම ඔයාට ආදරෙයි. ඒත් එහෙම ආදරේ කරලා සතුටු වෙන්න පුළුවන් කමක් අපට නැහැ. හිතන්න ඔයා වෙනුවට කායෝ මාව හොයා ගෙන ආවාම මට මොනවා වෙන්න ඇතිද කියලා."

කෝටා නිහඬව මොහොතක් ගත කළා. ඔෂින් ශෝකයෙන් බිම බලාගෙන හිටියා.

"ඔෂින්, ඔයාගේ ධෛර්ය මම අගය කරනවා. ඉදිරියට කාන්තාවන්ට මීට වඩා නිදහස ලැබෙයි. ඔයා තවත් දියුණු වෙන්න. ඒකයි මගෙ පැතුම. මට දැන් හරි මහන්සියි. මට ටිකක් නිදාගන්න ඕනෑ."

"මම යන්නම් කෝටා."

"අමතක කරන්න එපා. කායෝට මම ගැන කියන්න එපා. මම හෙට ඔයාව මුණ ගැහෙන්නේ නෑ. මම පාන්දරම යනවා."

"හොඳයි."

ඔෂින් හිස නමා ආචාර කළා. කෝටා ඔෂින් යන දෙසම බලාගෙන හිටියා.

ඔෂින් කල්පනා කළා, මම කෝටා ගේ පැමිණීම මිස් කායෝට නොකීව එක වැරැද්දක්ද කියලා. ඒත් මිස් කායෝ දැන් විවාහ වෙන්න ඉන්නේ. එතකොට කගායා ආයතනය එයාට. සේරම කරදර ඉවර වෙයි. ඒ නිසා මම කරන්නේ වැරැද්දක් නෙමෙයි. මිස් කායෝගේ අනාගත දියුණුව සලකා මෙහෙම නොකියා ඉන්නේ. ඔෂින් හිත සනසා ගැනීමට උත්සාහ ගත්තා.



පසුදින ඇය සුමිකෝ ඇතුළු යෙහෙළියන්ගෙන් සමු ගත්තා.

"මම යනවා සකාටා. සතියක් විතර ගත වෙයි. මිස් කායෝගේ විවාහ මංගල්‍යයටයි මම යන්නේ."

ඔෂින් එදාම දුම්රියෙන් සකාටා බලා පිටත් වුණා.

මීනෝ ඔෂින්ව කැඳවා ගෙන ගියේ යශිරෝ මහත්මිය ළඟටයි.

"අම්මා මෙන්න ඔෂින් කායෝගේ විවාහ උත්සවයට ඇවිල්ලා."

"කෝ බලන්න." යශිරෝ මහත්මිය අමාරුවෙන් නැඟිටින්න හැදුවා.

"එපා මැඩම්, මම දැනගෙන හිටියේ නැහැ මැඩම් අසනීප වෙලා කියලා. මට සමාවෙන්න මුලදී නොපැමිණියාට."

"වද වෙන්න එපා. දැන් මට වැඩිය අමාරු නැහැ ඔෂින්."

"ඒත් මහන්සි වෙන්න එපා."

"මට කායෝ මනමාලි වෙලා ඉන්නවා බලන්න ලැබුණොත් ඇති. ඊට පස්සේ මැරුණත් කමක් නෑ."

"මොනවද මැඩම් කියන්නේ. ඔබතුමිය ඉක්මනින් සුව වෙනවා."

"ඔෂින් කායෝට සොයුරියක් නැහැනේ. ඔයා ආව එක හොඳයි."

"ඔෂින් ඔයා ආවද ?"

කායෝ කාමරයට ආවා.

"ආවච්චම්මා අපි එළියට ගිහින් එන්නම්."

"හොඳයි."

කායෝ ඔෂින්ගෙ අතින් අල්ලාගෙන මුහුදු වෙරළ තෙක් ගියා.

"එහෙම නම් කෝටා ආවේ නැහැ නේද ඔෂින්."

ඔෂින් සෙමෙන් හිස වැනුවා.

"කමක් නෑ. එයාට මාව අමතක වෙලා. මගේ විවාහයෙන් පස්සේ එයා ආවොත් ඔෂින් එයාව තනි කරන්න එපා. මම දන්නවා කෝටා ආදරේ කරන්නේ ඔයාට."

"ඔය කතා ඕනෑ නෑ. මිස් කායෝ මම කැමතියි ඔයාගේ මඟුල් දවසේ ඔයාගේ කොණ්ඩය සකස් කරන්න. මට ඉඩ දෙන්න."

"හොඳයි."

කායෝ ඔෂින්ගේ අත අල්ලා ගත්තා.

"ඔෂින් මම මගේ ටෝකියෝ සිහිනය බිඳ දමනවා. ඔයා එහෙ තියෙන මගේ සේරම දේවල් විනාශ කරලා දමන්න."

කායෝ ඔෂින්ගේ අත තදින් අල්ලා ගත්තා. මංගල දිනයේ කායෝගේ හිසකෙස් ජපන් මෝස්තරයට සකස් කළා ඔෂින්.

"හරිම ලස්සනයි කොණ්ඩා සැකසුම."

වැඩි දෙනා කිව්වා. කායෝ ඇඳ සිටියේ සිල්ක් කිමෝනාවක්. එය සුදු පාටයි. පරම්පරාවෙන් හිමි වූ "ඔබි" පටිය බැඳ තිබුණා. මනමාලියන්ව සැරසෙන හිස් වැස්ම යොදා තිබුණා. ඇය පැළැඳ සිටියේ ගෙතා සෙරෙප්පු දෙකක්. ඇය ආච්චම්මා ළඟට ආවා.

"ආච්චම්මා මම ඔය ගොල්ලන්ට හරියට කරදර දුන්නා. ඒ ගැන මට සමාවෙන්න."

"නෑ කායෝ ඔයා නිසා අපේ හිතට සැනසුමක් ඇති වුණා. දැන් කගායා ආයතනයේ අනාගතය සුරක්ෂිතයි."

"ආච්චම්මා මම කගායා දියුණු කරනවා. පොරොන්දු වෙන්න ආච්චම්මා ඉක්මනින් සුව වෙනවා කියලා."

"ඔව් කායෝ මම ඉක්මනින් සනීප වෙනවා."

මේ පවුලේ සතුට දෙස බලාගෙන සිටින විට ඔෂින්ට හිතුණා තමා නිවැරදි බව. කායෝට ද්‍රෝහි වුණා යැයි සිතුවිල්ල අමතක කරන්න ඔෂින්ට හැකි වුණා. කායෝ ඔෂින්ගේ අත අල්ලා ගත්තා.

"ඔෂින් ඔයා තීරණයක් ගන්න කොට ඒක නිදහස් තීරණයක් ගන්න. ඒක තමයි මට කියන්න තියෙන්නේ."

කායෝ මනමාලයා සමග වේදිකාවේ වාඩි වී සිටියා. ඔෂින් යශිරෝ මහත්මිය ළඟට වී ඇයට ඇප උපස්ථාන කළා.

"ඔෂින් ඔයා හොඳ කෙල්ලක්. බලන්න ඔයා අපේ අමුත්තෙක් වගේ ඇවිදින් අපට වැඩ කරලා දෙනවා. ඒක ගැලපෙනවද මන්දා."



"නෑ මැඩම් මම මෙහේ සේවිකාවක්."

"ඔෂින් ඔය කිමෝනාව ඔයාට හොඳට ගැලපෙනවා."

"මේක මට දුන්නේ මිනෝ මැඩම්."

"ඔෂින් දැන් ඔයත් බඳින වයසේ. කායෝගේ ආදරවන්තයා ඔයා දන්නවද ඔෂින්."

"ත්... නැහැ මැඩම්."

"මට හරි දුකයි ඔෂින් කායෝ ගැන. එයාට කැමති විවාහයක් කරගන්න බැරි වුණා. ඒ කගායා ආයතනය නිසයි. මේ මනමාලයා පෙළපතින්, අධ්‍යාපනයෙන් කායෝට ගැලපෙනවා. ඒත් මේ විවාහයට ඔය මනමාලයා පෙළඹුණේ මේ විශාල දෑවැද්ද නිසයි. කර්මය අනුව තමයි ඔෂින් සැම දෙයම සිද්ධ වෙන්නේ."

ඔෂින් විවාහ උත්සවයේ සංග්‍රහ කටයුතුවලට උදව් කළා. මේ අතර රිකි ඔෂින්ව දැක්කා.

"ඔෂින්."

ඔෂින් වට පිට බැලුවා. ඇය ළඟට ආවේ රිකි.

"රිකි නැන්දා, හුගක් කාලෙකින් දැක්කේ."

"මම මේ උත්සවයට උදව් කරන්න ආවා. මට ඔෂින් ගැන අම්මාත් කිව්වා. ඔෂින් බොහොම දක්ෂ කොණ්ඩා මෝස්තර සකස් කරන කෙනෙක් කියලා. අම්මට යෙන් 20ක් ම යැව්වා නේද ?"

"ඔව් රිකි නැන්දා අම්මා මට හුගක් උදව් කළා. තාත්තාට හොරෙන් ටෝකියෝ යන්න කිව්වා. මට සල්ලි දුන්නා."

"හැබැයි ඔෂින් තාත්තා නම් ඉන්නේ හරිම තරහින්. ඔයා ටෝකියෝවල කියලා දැන ගත්තේ ඔයා යැව්ව මනි ඕඩර් මාරු කර ගන්න තැපැල් කන්තෝරුවට ගියාම. තාත්තා ඒ හැම යෙන් එකක්ම උදුරා ගත්තා."

"මම හිතුවා ඔහොම වෙයි කියලා."

"පුදුම විදිහට හාල්වල මිල ගණන් වැඩියි. ආර්ථිකය හොඳයි කිව්වට අද ගොවියා ඉන්නේ දුකෙන්, බඩගින්නෙන්. ඉතින් පුදුමයක් නෙමෙයි ඔෂින්ගේ තාත්තාට වුණත් තරහ යන එක."

"අම්මා මට ලිපියක් වත් එව්වේ නෑ."

"නෑ ඔෂින් අම්මා මට කිව්වා ලිපියක් ලියන්න කියලා ඔයාට. ඒත් මට බොරු බැහැනේ ඔෂින්. ඒක නිසා ඒක මග ඇරුණා."

"රිකි නැන්දා ආපිට යන්නේ කවදා ද ?"

"උත්සවය ඉවර වුණ ගමන් යනවා."

"මාත් එනවා රිකි නැද්දා එක්ක යන්න."

"එපා දරුවෝ තාත්තා ඔයා දැක්ක ගමන් හොඳට පහර දෙයි. අම්මා වුණත් කැමති වෙන එකක් නෑ එහෙ යනවට."

"මම යන්නේ අම්මාව ටෝකියෝ එක්ක එන්න. අම්මා දුක් වින්දා ඇති."

ඔෂින් යශිරෝ මහත්මියගෙන් සමුගෙන යමගාටා ගියා.

අම්මා රාබු අල සෝදමින් හිටියා. ඔෂින් එතනම නතර වී අම්මා දෙස බලාගෙන හිටියා.

ෆුජි, ඔෂින්ව දැක්කේ අහම්බෙන්.

"අම්මා, අනේ අම්මගෙ කොණ්ඩෙත් සුදු වෙලා."

"ඔෂින්, ඇයි මෙහෙ ආවේ. යන්න යන්න ආපිට. ඔයා අපි එක්ක සම්බන්ධයක් ඕනෑ නෑ."

"ඇයි ඒ මොකද ?"

"තාත්තා, සෝජි ඔයාව අමතක කරලා ඉන්නේ. මමත් එහෙමයි."

"අම්මා...."

"මේ ඔෂින් ඔයා දැන් හොඳට ඉන්නවා. මට ඒ ඇති. ඔයා ආපිට යන්න. තාත්තා, සෝජි දැන් එයි. හොඳයි ඔයා ඊය කලින් යන එක."

"මම ආවේ අම්මාව එක්ක ගෙන යන්න."

එවිටම කන්දෙන් බැහැගෙන තාත්තාත්, සෝජිත් ආවා.

"ආ ගෙදර ආවා ද ?" තාත්තා ඇහුවා. ඔෂින් හිස නමා ආචාර කළා.



ඔෂින් ගෙට ගොස් වාඩි වුණා. සෝජි ආව ගමන් ම සකේ බඳුන ළං කර ගත්තා.

"උඹ සැප විඳිනවා එහෙට වෙලා. මම මෙහෙ මැරෙනවා. අයියලා නංගිලා කවුරුවත් උදව් කරන්නේ නැහැ. අද ගොවියෙක්ගේ වැඩිමල් පුතා වෙන එකත් කරුමයක්."

"අපට ගෙවන්න තියෙන ණය ගොඩ ගැහිලා. ඇහුණ ද ඔෂින් අපට සල්ලි එවන්න ඕනෑ." තාත්තා ඔෂින්ට පැවසුවා.

"දැන් ඔෂින් බඳින වයස."

ෆුජි කිව්වා.

"මට ගෙයක් හදාගන්න සල්ලි නෑ. කොයි තරම් වැඩකරත් ණය. ගෙයක් නැතිව ගෑනියෙක් ගන්න බෑ. මම කැමතියි නගරයට ගිහින් වැඩ කරන්න." සෝජි කියන විටම

"ඉතින් කැමති නම් මම නම් නතර කරන්නේ නෑ."

ෆුජි කරගින් කිව්වා.

"කට වහපන්." තාත්තා අම්මාට පහර දුන්නා.

"සේරම ගෙදරින් ගිහිල්ලා. කාගෙන්වත් නෑ උදව්. ඒ අසරණ කොල්ලා විතරයි අපට උදව් කරන්නේ. උඹ මෙතන බත් හිල හිල ඉන්නවා විතරයි."

සකුශෝ නැවතත් ෆුජිට පයින් ගැහුවා.

"තාත්තා නවත්වන්න ඕක."

"මට නම් මේවා එපා වෙලා. මේ නාකිච්චි එක්ක ගෙදර ඉන්න බැහැනේ."

සෝජි අම්මාට බනිමින් යන්න ගියා.

"සෝජි ඔහොම හිටපන්." සකුශෝත් ඒ පස්සෙන් ගියා.

ෆුජි එතනින් ඉවත්ව ගබඩා කාමරයට ගොස් පෙට්ටි අවුස්සන්න පටන් ගත්තා.

"මොනවද අම්මා කරන්නේ ?"

"ඔෂින්, හුග දවසකින් ගෙදර ආවේ. මම මේ බෝංචි ඇට ටිකක්වත් තියෙනවද බැලුවා. ඔයාට තම්බලා දෙන්න."

"ඕන නෑ අම්මා. රාබු බත් හොඳයි."

ඔෂින් කල්පනා කළා. රටේ ආර්ථිකය කොතරම් හොඳ වුණත්, අද ගොවියා දුකෙන්, බඩගින්නෙන් බව. අම්මා රාබු අල ගලවමින් හිටියා. ඔෂින් අම්මා ළඟ දණ ගසා වාඩි වුණා.

"අම්මා, මා එක්ක ටෝකියෝ යමු."

"බැහැ ඔෂින් ඔයාට බරක් වෙන්න මට බැහැ."

"එහෙම නෑ අම්මා."

"මම ඔයා එක්ක හිටියොත් ඔයාට බඳින්න ලැබෙන්නේ නෑ. මේ මගෙ ගෙදර. මම බැඳලා ආවේ මේ ගෙදරට. මම මේ ගෙදර දාලා යන්නෙ නැහැ. ඔයා වද වෙන්න එපා මට මේ හැමදේම විඳගන්න පුළුවනි දුව. දැන් ඔයා ඔයා ගැනම හිතන්න පුරුදු වෙන්න. මම සතුටු වෙනවා දුව ගැන. ඔයාගේ දියුණුව ගැන. ඒක මගෙ ඉහටත් උඩින්. මගෙ ගෙදර තියෙන නිදහස මට කොහෙවත් ගිහිල්ලා ලබාගන්න බැහැනේ දුව."

එදා රාත්‍රියේ ඔෂින් තාත්තා ළඟට ගියා.

"තාත්තා මම ටෝකියෝ ගියාම ගෙදරට මුදල් එවන්නම්."

තාත්තා හිටියේ පිදුරු තලමින්. ඒ පිදුරු සෙරෙප්පු සෑදීමට.

"පුජ් ඇහෙනවද ඔෂින් සල්ලි එවනවාලු."

"අනේ තාත්තා ඔයා අම්මට වද දෙන්න එපා. ගෙදර ඉන්නේ ඔයාලා තුන් දෙනයි. ඔයාලා සතුටින් ඉන්නවා නම් මම ඕනෑ දෙයක් කරන්නම්."

ඔෂින්ගෙ කතාව තාත්තාත්, සෝජිත් අසාගෙන හිටියා.

"මේ ළමය අවුරුදු 7 ඉඳලම වැඩ කළා. ඔහොම ශ්‍රමය සූරා ගන්න මම ඉඩ දෙන්නේ නෑ."

"අයියට උදව් කරන එක ශ්‍රමය සූරා ගැනීමක් ද ගෑනියේ."

"අනේ තාත්තා රණ්ඩු නොවී ඉන්නකෝ."



අම්මා එළියට දුව ගියා. ඔෂින් ඒ පසුපස ගියා.

"අම්මා ඕකනේ මම කියන්නේ මගේ එක්ක ටෝකියෝ යමු."

"ඒක නම් කරන්න බෑ ඔෂින්. මේ මගෙ ගෙදර. මගෙ ගොවිපල මෙහෙ තියෙන්නේ. මම හැදුණෙ වැඩුණේ ගොවිපලක. බැන්දෙත් ගොවියෙක්. මගෙ ඇටකටු ටිකත් මේ පොළොවටම පොහොර වෙන්න ඕනෑ. ඔයා මා ගැන වද වෙන්න එපා දුව. මම ඔයා හිතන තරම් දුර්වල නෑ. සෝජි බඳිනකල් මට නිදහසේ ඉන්න පුළුවනි. දුව දැන් ඔයා ගැන හිතන්න. දෙමාපියෝ විදිහට අපි කරපු දෙයක් නෑ. ඔයා උත්සාහයෙන් දියුණු වුණේ. දුව ගැන මට ආඩම්බරයි දුව."

ඔෂින් දුකෙන් අම්මා දෙස බලා සිටියා.

"ඒත්, මම ගෙදරට මුදල් එවන්නම් අම්මා. ඒක මගෙ යුතුකම."

ඔෂින් සෙමෙන් කිව්වා.

# දාහතර

ඔමින් නැවත ටෝකියෝ පැමිණියා. ඇය මුලින් ම ගියේ සුමිකෝ ඇතුළු යෙහෙළියන් දකින්නයි.

"මම ආවා."

"ආ ඔමින් ඔයා ආවා ද ?"

"එන්න ටිකක් පමාවුණා සමාවෙන්න. මේවා අම්මා හදලා දුන්නා."

"ආ රස අච්චාරුවක්."

"හරිම රසයි හරියට කියතෝවල අච්චාරු වගෙයි."

"ඔමින් නැතිව අපිට හුඟක් වියදම් වුණා නේ. කොණ්ඩා මෝස්තරවලට. ඒවා ඔයා දානවා වගේ ලස්සනත් නැහැ. මගෙ වයස අවුරුදු දහයකින් වැඩිවෙලා පෙනෙන්නේ මේ බලන්න."

සියලු දෙනා හිනැහුණා.

එදා කෝටා ගියාට පස්සේ ඔමින්ට ඒ කාමරයට යන්න බැරි වුණා. ඔමින් එදා සවසම කායෝගේ කාමරයට ගියා. ඇය තමා ළඟ වූ යතුරින් දොර ඇරියා. ඇතුළට ගොස් ඇඳේ වාඩි වී වට පිට බැලුවා. ඒ සමගම ඇය ස්විචයෙන් විදුලි බුබුල දැල්වූවා. කාමරයේ තිබූ තොප්පියක් වෙත ඇයගේ නෙත යොමු වුණා. එකවරම කාමරයට ඇතුල් වූවෙක් ඔමින්ගේ මුව වසා අල්ලා ගත්තා. ඒ සමගම විදුලිය විසන්ධි කළා.

"කෑගහන්න එපා ඔමින් මම කෝටා. පොලිසිය මා පිටුපස පන්නනවා. සද්ද කරන්න එපා."



ඔහු ඔමින් අතහැර ගොස් ජනේල රෙද්ද මෑත් කර පාර දෙස බැලුවා. ඉන්පසු ඇඳේ වාඩි වුණා.

"ඔමින්, අද ගොවියෝ, කම්කරුවෝ ඉන්නේ කරහින්. අපේ ඉල්ලීම්වලට රජය කන් දෙන්නේ නැහැ. රජය ඒ ඉල්ලීම් යටපත් කරනවා. ඉල්ලීම් ඉල්ලන අපිව අල්ලාගෙන හිර කරනවා."

ඔමින් හිතාවුණා.

"ඇයි ඔමින් ?"

"නෑ මුහුදු වෙරළේදී ඔයා එදා බේරුන හැටි මතක් වුණා."

දෙන්නාම හයියෙන් හිනා වුණා.

"මම මෙහෙ එන්න හිතුවේ නෑ ඔමින්. බේරෙන්න යන්න තැනක් නැති නිසාම පුරුද්දට වගේ මෙහෙට ආවා. මම යන්න ඕනෑ."

"නෑ ඔයා ඉන්න මම ඉක්මනට පිට වෙන්නම්."

ඔමින් කිව්වා.

"මංගලය හොඳට කෙරුණ ද ඔමින් ?"

"ඒත් මිස් කායෝ හිටියෙ දුකින්. මම කීවේ නැහැ ඔයා කාමරයට ආව බව. ඒත් දැන් හිතෙනවා මම කළේ වරදක් කියලා."

"නෑ ඔයා කළේ හොඳක්. දැන් කායෝට සැමියෙක් ඉන්නවා. එයාව බලාගන්න කෙනෙක්. මෙහෙ වගේ දුක් විඳගෙන සාප්පුවල වැඩ කරන්න ඕනෑ නෑ. එයාගේම ආයතනයක් පාලනය කරගෙන සැප විඳගෙන ඉන්න පුළුවනි."

"ඔයා මේ කාමරේම ඉන්න. මම කාමරේට ගෙවලා මෙහෙම තියන්නම්."

"එපා ඔමින් කායෝ කිව්ව විදිහට කරන්න. මම දැන් යනවා."

"එපා යන්න." ඔමින් කීවේ හිස බිමට හරවාගෙන රහසින් වගෙයි.

"අඳුගාගෙන් අදටවත් නතර වෙන්න. මම ඔයාට කෑම හදාගෙන එන්නම් උදෙන් ම."

ඔමින් හිස නමා යන්න පිටත් වුණා.

"ඔමින්."

Rangika

කෝටාගේ හඬින් දොර ළග සිටි ඔෂින් හැරී බැලුවා.

"ඇයි ?"

"මොහොතක් මෙහෙ බලන්න. මම ඔයාව දකින අන්තිම අවස්ථාව වෙන්න පුළුවනි."

ඔෂින් මොහොතක් කෝටා දෙස බලා හිටියා.

"මම එන්නම් හෙට උදේම ඔයාට කෑම අරගෙන."

ඔෂින් නොපෙනී ගිය විට කෝටා දිග සුසුමකින් ළය සැහැල්ලු කරගත්තා. ඔෂින් පාන්දරම උයන ගෙට ගොස් කෑම වර්ග කීපයක් ම හැදුවා. තුනීයට කැපූ අමු මාළු විනාකිරිවල පොගවා බත් ගුලිය මත තබා සජිම් සාදා එක් පෙට්ටියක දැම්මා. තෝෆු සමග බෝංචි ඇට සමග වේලුණ මුහුදු පාසිවලින් සරසා භාජනයකට දැම්මා.

"ඔෂින්."

උයන ගෙට ආවේ ගෙදර අයිතිකාරිය.

"ඔයා උදෙන්ම නැගිටලා වැඩ."

"සමාවෙන්න මම ඔයාගේ නින්දට බාධා කළා ද ?"

"නෑ ඔෂින් මේ වයසක අපට නින්ද හොරයි නොවැ. මොකද ඔයාලා විනෝද ගමනක්වත් යන්නද ?"

"ආ... නෑ. මේ මගෙ යාළුවෙකුට ගෙනියන්න දෙන්න."

ඔෂින් සියලු භෝජන ලේන්සුවක ඔතාගෙන ඉක්මනින් ගියා. ඇය කාමරයේ දොරට තට්ටු කළා.

"මම ඔෂින් මේ දොර අරින්න."

ඒත් කිසිම සද්දයක් ඇසුණේ නෑ. ඔෂින් තමා ළග වූ යතුරෙන් දොර ඇර ඇතුළට ගියා. ජනේලය වෙත ගොස් ඇර බැලුවා. මේසය මත කුඩා කොල කැල්ලක් මත පවුන්ටන් පෑනක් තිබුණා. ඔෂින් එය අතට ගත්තා.

"මේ පෑන මගෙ. ඔෂින්ට" සඳහන්ව තිබුණා.

එකවරම කීප දෙනෙක් කාමරයට කඩා වැදුණා.



"යශුඩා ටනමුරා කෝ ?"

ඔවුන් ඔෂින් වටකර ගත්තා.

"කියනවා කෝ යශුඩා."

"මම දන්නේ නෑ. මම කොණ්ඩා සකස් කරන කෙනෙක්."

"මේ කාමරේ කාගේ ද ?"

"මගෙ යාළුවෙක්ගේ."

"ඒ කෙල්ල කෝ. ඒකි තමයි යශුඩාගේ කෙල්ල. ඒකි දන්නවා යශුඩා ඉන්න තැන. ඒකි ඒ ව්‍යාපාරයටත් උදව් කරනවා."

"උඹත් ඒ ව්‍යාපාරයට සම්බන්ධයි. යමන් පොලීසියට. කොහේද ඉන්නේ දෙනවා ගෙදර ලිපිනය."

ඔෂින්ගේ නිවසේ ලිපිනය ලියා ගත් එක් නිලධාරියෙක් පිට වී ගියා. ඔෂින්ගෙන් ප්‍රශ්න කිරීම ඇරඹුණා.

සියල්ලටම ඇය කීවේ තමා නොදන්නා බවයි.

"එහෙම නම් ඒ කාමරයට ගියේ ඇයි ?"

"ඒක විකුණන්න තිබුණේ. ඒක නිසා කාමරය පිරිසිදුව තියා ගන්නවා."

"මොනවද ඔච්චර අහන්නේ."

"ඇයි ගෙදර යන්න එපා ද ? ඇත්ත හංගන්නේ."

මෙවිටම එක් අයෙක් පැමිණ නිලධාරියා ගේ කණට ළංව කතා කළා.

"එහෙමද ගෙදර මොනවත් නැහැ. හොඳයි තමාට යන්න පුළුවනි."

"ඔච්චරද කියන්න පුළුවන්. සමාව ගන්නවා මිගෙන් ප්‍රශ්න ඇහුවට."

"යනවා යන්ඩ. ඇපකාරයා නිසයි තමන්ව නිදහස් කරන්නේ."

ඔෂින් එළියට ආවා.

රුසෝ ටනකුරා ඇය එනතෙක් බලා හිටියා.

"මිස්ට ටනකුරා ?"

"ඔව් ඔයාගේ යාළුවෝ මට කිව්වා ඔයාව පොලිසියට ගෙනාවා කියලා. මම ඔයාට ඇප වෙලා නිදහස් කර ගත්තා."

"යාළුවෝ දැන ගත්තේ කොහොම ද ?"

"එක නිලධාරියෙක් ඔයාගේ කාමරයට ගිහින් සේරම සෝදිසි කරලා. ගෙවල් අයිති කාන්තාව හොඳටම බය වෙලා. එතකොට සුමිකෝ ගිහින් ඔයා මොකද ප්‍රමාද කියලා බලන්න. එතකොට තමයි විස්තරය දැනගෙන තියෙන්නේ. සුමිකෝ මාව මුණ ගැහිලා විස්තරය කිව්වා."

ඔෂින් හිස නමා ආචාර කළා.

"ස්තූතියි මිස්ට ටනකුරා. මට සමාවෙන්න කරදර කළාට."

"වදවෙන්න එපා."

"එහෙම නම් මම එන්නම් මිස්ට ටනකුරා."

"ඔෂින්, මම ආවේ ඔයා එක්ක යන්න. දැන් ඔයාට හොඳටම බඩගිනි ඇති. එන්න මේ අවන්හලට."

ඔෂින් රූසෝ පිටුපස ගියා. ඔවුන් අවන්හලට ඇතුල් වුණා. කෑම සකස් කරන තෙක් රූසෝ ඔෂින්ට කතා කළා.

"ඔයාව ගෙනිහින් තියෙන්නේ සැකේට. ඒත් කාමරයේ මොනවත් සැක හිතෙන දෙයක් නොලැබුන නිසාත්, මම ඇප වුන නිසාත් ඔයාව නිදහස් කළා. අල්ලා ගන්න අයට පොලිසියෙන් දඬුවම් කරනවා."

"මම මීට ඉස්සරත් පොලිස් අත්අඩංගුවට ගත්තා. හාල් විප්ලවයට පෙළපාලියකට ගිහින් ඊ එළිවෙනකල් හිරේ හිටියා. එදා මගේ ඇඟ රත්වුණා."

"එහෙනම් ඔයා රත්තෙක්, ලෙනින් ගැන අහලා තියෙනවද ?"

"එයා කොණ්ඩා මෝස්තර දමන කෙනෙක් ද ?"

රූසෝට හිනාව නවත්වා ගන්න බැරි වුණා.

ඔෂින්ට කුසගිනි දැඩිව දැනුණා. ඇය ඒ කෑම ඉක්මනින් ම කෑවා.

"මේ කෑම හරිම රසයි."

"මට හරි සතුටුයි ඔයා මේ කෑමවලට ප්‍රිය කිරීම ගැන."



"මිස්ට ටනකුරාට ස්තූතියි."

"මම ඔයා බලාගන්න එපා යැ. කායෝ වෙනුවෙන්. කායෝගේ පෙම්වතා නිසානේ ඔයා අමාරුවේ වැටුණේ. කායෝ ගැනත් පොලිසියෙන් ඇහුව ද ?"

"ඇහුවා මම මොනවත් කිවේ නෑ. දැන් ඇය විවාහකයි, ඔහු මිස් කායෝ ටෝකියෝ ගත කළ ජීවිතය දැන ගත්තොත් ඒ විවාහයත් ඉවර වෙයි."

"ඔයා හිත හොඳ කෙල්ලක්."

"මම කගායා ගෙදර අයට විශේෂයෙන් මිස් කායෝගේ ආච්චම්මාට ගරු කරනවා. මගෙ ජීවිතය හැඩ ගස්සවා ගන්න ඒ මැඩම් හරියට උදව් කළා. මම එහෙ හිටියේ වයස අවුරුදු හතේ දී. මිස් කායෝ මගේම ජීවිතයේ කොටසක්."

රූසෝට අද දැනුණේ විශාල සතුටක්. ඔෂින් සමග නිදහසේ කතා කිරීමට හැකිවීම ගැන ඇයට සංග්‍රහයක් කිරීමට හැකි වීම ගැනයි ඒ.

ඔෂින් ගෙදර ගියා. ඇය පියගැට පෙළට සමීපවෙත් ම,

"ඔෂින්, ඔහොම නතර වෙන්න."

ඒ නිවාසයේ අයිතිකාරියයි.

"ඔයාට කරදරයක් වුණා නේද ? මට කණගාටුයි මෙහෙම කියන්න. ඔයා රත්තෝ එක්ක සම්බන්ධයි නම් අපට ඔයාව මෙහෙ නතර කර ගන්න බැහැ. මගෙ මහත්තයා විශ්‍රාම ගිය රජයේ සේවකයෙක්. ඒ නිසා රජයට විරුද්ධ අය එයාට පෙන්වන්න බැහැ. මට කණගාටුයි මෙහෙ ඉන්න බැහැ. ඉක්මනින් නතර වෙන්න තැනක් හොයා ගන්න. ඔෂින් හොඳ ළමයෙක් නිසයි ටික දවසක්වත් මෙහෙම ඉඩ දෙන්නේ."

ඔෂින් හිස නමාගෙන ඇයගේ කාමරයට ගියා.

රූසෝ සාප්පුවට ගියෙත් හරිම සතුටින්.

"ඇති යන්නම් ආවා."

ගෙන්ජි කිව්වා.

"මොකටද ඇහැරගෙන හිටියේ. නිදාගන්න එපැයි. බිස්නස්-කාරයෝ, ගණුදෙනුකාරයෝ මුණ ගැහෙන්නේ ක්ලබ්වල දී බාර්වලදී. එහෙම නැතිව ඒ මිනිස්සු අපේ ගෙදර එනවායැ."

"ඒක එහෙමයි කියමුකෝ. මේ ගෑනු ඔයාව හොයාගෙන සාප්පුවට එන එක පරම්පරාවට ම ලැජ්ජාවක් නේද ?"

"මම අලුත් පරම්පරාවේ කෙනෙක්. ?"

"ඔයා ඔයාලගේ වැදගත් පවුල ගැන හිතන්න. අම්මා මාව මෙහාට එව්වේ ඔයාව බලා ගන්න කියලා."

"භාරකාරයෝ යටතේ ඉන්න මම ලොකු වැඩියි."

"ඔයාගේ වයස අවුරුදු විසි හතයි. දැන් ඔයා විවාහ වෙන්න හොඳ කාලේ. අම්මා නම් ඒ ගැන කල්පනා කරලා තියෙනවා. මෙන්න පින්තූර මෙන්න විස්තර."

"මේ මට ඕවා බලන්න වෙලාවක් නෑ."

"ඕවා කියලා හරි යන්නේ නෑ. අම්මාත් එනවා කිව්වා."

"ගෙන්ජි, මේ සාප්පුව දියුණු කළේ මම. මට ඕනෑ මනමාලියක් හොයා ගන්නත් මට පුළුවනි."

"සාප්පුව රූසෝ මහත්තයා දියුණු කළ බව ඇත්ත. ඒ වුණාට මේක පටන් ගන්න මුදල් දුන්නේ ඒ අය නොවැ. විශේෂයෙන් තාත්තා. එතකොට ඒ අයගේ බහටත් කන්දෙන්න වෙනවා."

"ගෙන්ජි මම පවුලේ තුන් වැනියා. මට නිදහස තියෙනවා මම කැමති දෙයක් කරන්න. මට නිදිමතයි."

"අපොයි දැන් ඉන්නේ මහ මුරණ්ඩු එවුන්."

පසුවදා සවස ඔෂින් ටනකුරාගේ රෙදි සාප්පුවට ගියා.

"සුබ සන්ධ්‍යාවක් වේවා."

ඇය ගෙන්ජිට සුබ පැතුවා.

"මිස්ට ටනකුරා මුණ ගැහෙන්න ඕනෑ."

"එයා සාප්පුවේ නැහැ නේ. පණිවිඩයක් තියෙනවා නම් දෙන්න."



"හොඳයි එහෙම නම් මේ තෑග්ග එයාට දෙන්න." ඔෂින් සකේ බෝතලයක් ගෙන්ජිට දුන්නා.

"නම මොකක් ද කීවේ ?"

"මගෙ නම ඔෂින්. එහෙම නම් ස්තුතියි ඔබටත්."

ඔෂින් ගෙන්ජිට ආචාර කර සාප්පුවෙන් පිට වීමට යන විටම.

"මිස් ඔෂින්, ඔයා මෙහෙ ඉන්න. ඇයි යන්නේ ?"

"මම ඔබට ස්තුති කරන්න ආවේ. පුංචි තෑග්ගක් ගෙනාවා. එහෙම නම් මම යන්නම්."

"ඉන්න මිස් ඔෂින්, මමත් එනවා."

රූසෝ ඔෂින් සමග පෙළට වැටී ගමන් ගත්තා.

"මොකටද ඔයා තෑගි ගේන්න වද වුණේ."

"ඔයා මම නිසා වද වුණා නේ."

"මිස් ඔෂින්, මේ අවන්හලේ කෝපි හරිම රසයි. අපි කෝපි එකක් බීලා ම යමු ද ?"

ඔෂින් හිස සලා කැමැත්ත ප්‍රකාශ කළා. කෝපි බොමින් දෙදෙනාම කතා බහ කළා.

"මම ඉක්මනට යන්න ඕනෑ මිස්ට ටනකුරා. මොකද මට ඉන්න ගෙයක් හොයාගන්නත් ඕනෑ."

"මම කියන්නද මිස් ඔෂින්. ඔයා කොණ්ඩා සැකසුම් සාප්පුවක් දමාගන්න. එතකොට ඒකෙම ඔයාට ඉන්නත් පුළුවනි."

"එහෙම බෑ මිස්ට රූසෝ මට ගෙදරට මුදල් යවන්න තියෙනවා. මගෙ තාත්තා අද ගොවියෙක්. අපේ ගේ පරණ නිසා මගෙ අයියට විවාහයක් කර ගන්න බැහැ. ඒ නිසා එයාට අලුත් ගෙයක් හදන්න මුදල් යවන්න ඕනෑ. ඒ නිසා මට පුංචි කාමරයක් හොයා ගත්තම ඇති."

"ඉතින් මිස් ඔෂින්, මම ඔයාට සාප්පුවක් දමන්න මුදල් ණයට දෙන්නම්."

"එපා මිස්ට ටනකුරා. එහෙම කිව්වට ස්තුතියි."

Ranga

"ඔයා සාප්පුවක් දමා ගන්න."

"අපෝ හවුලේ නම් බැ."

"නෑ ණයක් දෙන්නේ."

"ඒ වුණාට මිස්ට ටනකුරා. සාප්පුවක් දැම්මොත් සේවකයෝ ගන්න වෙනවා. එහෙම කඩයකට හිර වෙලා බැහැ. උදේම රවුමක් ගිහින් කොණ්ඩා දහයක් දැම්මාම යෙන් දහයක් අතේ."

දෙන්නාම හිනාවුණා.

"මිස්ට ටනකුරා මම ඇත්තම කියන්නද මම කෝපි බොන්න කැමති නැහැ. මිස්ට ටනකුරාගේ හිත රිදෙයි කියලයි මම ආවේ. පේනවා නේද අපි දෙන්නා ලෝක දෙකක."

දෙදෙනාම අවන් හලෙන් එන විටම සුමිකෝ සහ නගෝජි මුණ ගැහුණා.

"මේ දෙන්නා මොකද ?"

"නෑ සුමිකෝ මිස්ට ටනකුරා කළ උදව්වට මම ස්තුති කරන්න ආවා."

"අවන්හලට. හා ඔන්න හොර අහුවෙනවා."

"එහෙම නෑ. මම යන්නම්."

හිස නමා ආචාර කළ ඔෂින් වීදිය දිගේ යන්න ගියා. ඒ අතර ඔෂින් කල්පනා කළේ කෝටා ගැන. කෝටා එදා රැම යන්න ඇති. මගෙ කිම අහලා නතර වුණා නම් එයාව පොලිසියෙන් අල්ලා ගනියි. ඇය සෙමෙන් කිමෝනාව තුළින් කෝටා අවසානයට ඇයට තබා ගිය පැන එළියට ගත්තා. මොනවා වුණත් ආයිම කෝටා ගැන බලාපොරොත්තු තමා තුළ ඇතිවන බව ඔෂින්ට දැනුණා. කායෝ මනාමාලිය වූදා ඇය කීවේත්,

"ඔෂින් ඔයා හොඳටම දන්නවා කෝටා ආදරය කළේ ඔයාට. තාමත් ඒක වෙනස් වෙලා නැහැ. ආයිම කෝටා ආවොත් එයා තනිකරන්න එපා. ඔෂින් එයා එක්ක එකතුවෙලා ජීවත් වෙන්න. මම ඔයාට සුභ පතනවා."

"ඔය කතා ඕනෑ නෑ."



එදා ඔෂින් එහෙම කිව්වත් කෝටා පිළිබඳව ඔහු අයිතිකර ගැනීම පිළිබඳව ඔෂින් ගේ හිතේ හීතියට බලාපොරොත්තු ඇති වීම ඇයටම වළක්වා ගන්න බැරි වුණා. ආයිම අපි මුණ ගැහෙයි. ඔෂින් ප්‍රාර්ථනා කළා.

ඔෂින් සුමිකෝ ඇතුළු මිතුරියන් ගේ කොණ්ඩා සකස් කිරීමට ගිය සැම විටම කිව්වේ,

"ගෙදරට සල්ලි අරින්න තියෙනවා. මට තව වැඩ අල්ලලා දෙන්න කියලයි."

"මගෙ මිතුරියකට ඔයා ගැන කිව්වා. එයා හෙට එන්න කිව්වා. මෙන්න ලිපිනය."

"හුඟක් ස්තුතියි සුමිකෝ."

"එහෙම නම් ඔයා අද මට ලිපියක් ලියලා දෙන්න ඕනෑ."

"හොඳයි, සතුටින් ම ඒක කරලා දෙන්නම්."

මෙසේ වරින්වර සුමිකෝ හා ඇයගේ යෙහෙළියෝ රූසෝ ටනකුරාට ලිපි ලියවා කැපැලට දැම්මා.

රූසෝ මේ දිනවල හිටියේ කනස්සල්ලෙන්. ගෙන්ජි ලිපි ගෙන ගොස් රූසෝට දුන්නා.

රූසෝ ඒ කිසිවක් නොබලාම ඉරා විසි කළා.

"මොකද ඔය ලියුම් ඉරන්නේ."

"පහුගිය කාලේ කෙල්ලන්ගෙන් ලියුමක් ආවාම මට බැන්නා. ක්ලබ් යනවා කියලා මට බැන්නා."

"ඔහොම මූණ එල්ලාගෙන ඉන්නවට වඩා ක්ලබ් යන එක හොඳයි එක අතකට."

"ඔය කතා ඇති මට පාඩුවේ ඉන්න දෙනවා."

"දැන් හොඳ කාලයක් කසාදයක් කර ගන්න. හැබැයි මේ ලියුම්වල අත් අකුරුවල හැඩ. මේවා නම් හොඳ උගත් පිරිමියෙක්ගේ අත් අකුරු."

"ඒවා ලියන්නේ ගෑණියෙක්."

"කොහේ ලියන්නද ගෑණියෙක් මෙහෙම ලස්සනට."

"තමුසෙ කන වෙලාද ? ඔය අත් අකුරු හොයන්න බැරිද ?"

"මෙහෙ ගෑණියෙකුට කවදාවත් මෙහෙම හැඩට ලියන්න බෑ."

මේ වෙලාවේ සාප්පුවේ දොරට තට්ටු කරන හඬ ඇසී ගෙන්ජි දොර ළඟට ගියා.

"මැඩම්, ඇයි එන බව නොකීවේ. ඉස්ටේෂමට යන්න තිබුණා නොවැ."

"ආ, ඒකට මක් වෙනවද ?"

පැමිණ තිබුණේ රූසෝගේ මව ඔකියෝ.

"මැඩම් සනීපයෙන් නේද පවුලේ අය."

"ඔව්, ඒත් ඉතින් රූසෝගේ තාත්තා දැන් දුර ගමන්වලට කැමති නෑ."

රූසෝ මව දැක ඉක්මනින් ඉදිරියට ආවා.

"මොකද කරදරයක් ද අම්මා."

"නෑ එහෙම නෑ."

"ඇයි මේ හදිස්සියේම ආවේ. කිවේ නෑ නොවැ එන බව."

"මට එන්න හිතුණා රූසෝ."

ඇය සාප්පුව දෙස හොඳට බැලුවා.

"පුතාගේ බිස්නස් එකට පස් අවුරුද්දයි. හොඳට දියුණු කරගෙන තියෙන්නේ. මම රික්ෂෝකාරයගෙනුත් ඇහුවා. ඔහු කිව්වා බොහොම ප්‍රසිද්ධ සාප්පුවක් කියලා. මට හරිම සතුටුයි රූසෝ."

"ඒ වුණත් අම්මා එන බව දන්වන්න තිබුණා නේ."

"ගෙන්ජි මට ලියනවා මෙහෙ විස්තර. ඉතින් මටම හිතුණා ඇවිල්ලා බලන්න. ඔකියෝ රෙදි රාක්ක ළඟට ගිහින් රෙදි දෙස හොඳට බැලුවා."

"හොඳම ලොම් රෙදි නේද ?"

"ඔව් අම්මා අපි මේවා එංගලන්තයෙන් ගෙන්වන්නේ."

"මේ දියුණුවට ගෙන්ජිත් උදව් වුණා නොවැ."



"ඔව්, ඉතින් වෙලාවකට කට කැඩෙනකල් අවවාද කරන අවස්ථාත් තියෙනවා."

"ගෙන්ජි පුතාට එහෙම කියන්න එපා. එයාට දැන් අවුරුදු විසි හතයි. එයාට දැන් විවාහයක් කරගන්න වයස. ගෙන්ජි කිව්වා නේද මගේ යෝජනාව ගැන. මට ලියලා එවලා තිබුණා එකගයි කියලා නේද ?"

"ගෙන්ජි....." රූසෝ කෑගැහුවා.

"මනමාලි ළඟදි ටෝකියෝ,එනවා කිව්වා තේ පිළිගැන්වීමේ උත්සවයකට. ඒ වගේම මල් සැකසුම්වලටත් දක්ෂයි."

"මොකට ද එහෙම කෙනෙක් වෙළෙන්දෙකුට. වෙළෙන්දෙකුට ඕනෑ බිස්නස් ගැන දන්න කෙනෙක්."

"මෙයා ඒවා ඉගෙන ගනියි."

"පුළුවන් මටම බිරිඳක් හොයා ගන්ට."

"මොනවද ඔයා කියවන්නේ රූසෝ මහත්තයා. අම්මා ගමේ ඉඳලා ආවේ ඔයාගේ මුරණ්ඩුකම් බලන්න ද ?"

ගෙන්ජි ඇසුවා.

"ආ ඒකෙන් කමක් නෑ. මම යන්න ඕනෑ ඒ ළමයගෙ නෑයෝ වගයක් ඉන්නවා මෙහෙ ඒ ගොල්ලන් මුණ ගැහෙන්න."

ඔකියො කාමරයේ කැඩපතට එබී බැලුවා.

"මගෙ කොණ්ඩෙ නම් හොඳටම අවුල් වෙලා. ගෙන්ජි තැද්ද මේ ළඟක කොණ්ඩා සකස් කරන කෙනෙක්."

අහක බලාගෙන තරහෙන් හිටිය රූසෝගේ මූණේ හිනාවක් ඇඳී ගියා.

"ඉන්නවා මම දන්න තරුණියක්. ඉන්න මම එයාට පණිවිඩයක් යවන්නම්."

ටික වෙලාවකින් ඔහින් ආවා. සාප්පුව ඉදිරිපස දී ඇයට මුණ ගැසුණේ ගෙන්ජි.

Rangika

"ඇයි මොකද අදත් ? මොකටද මෙහෙ ආවේ. රූසෝ මහත්තයා නෑ. ආපිට යනවා නම් තමයි හොඳ."

"නෑ මට එන්න කියලා පණිවිඩයක් යවලා තිබුණා."

"එයා එහෙම තමයි. අද රූසෝ මහත්තයගෙ අම්මත් ඇවිල්ලා ඉන්නේ."

"අන්න හරි එහෙම නම් ඒ මැඩම්ගෙ කොණ්ඩෙ සකස් කරන්න තමයි එන්න කිව්වේ."

"ආ එහෙමද ? ඔය ළමයා කොණ්ඩා සකසනවාද ? අන්න අර කාමරේ මැඩම් ඉන්නවා."

"හොඳයි."

ඔෂින් ඔකියොගෙ කොණ්ඩය බටහිර ක්‍රමයට සකස් කළා.

"හරි, බලන්න මැඩම් මේ කණ්ණාඩියෙන්."

"කෝ බලන්න. හොඳයි හරිම පහසුයිනේ. ඔලුවට බරත් නෑ. රූසෝ බලන්න හොඳද කියලා."

රූසෝ කාමරයට පැමිණියා.

"හරි හැඩයි. අම්මා පොඩි කෙල්ලක් වගෙයි නේ."

"විහිළු කරන්න එපා රූසෝ. මේක ටෝකියෝවලට හොඳයි. අපේ ගම්වලට නම් ගැලපෙන්නේ නෑ. "

"මේ ළමයට වැඩි වයසක් නැති වුණාට හොඳට වැඩ පුළුවන් වගෙයි."

"මෙන්න සල්ලි."

රූසෝ මුදල් ගෙනැවිත් දුන්නා.

"ස්තූතියි, එන්නම් මැඩම."

"හොඳයි, ආයිම ඕනෑ වුණොත් එන්න."

"හොඳමයි" ඔෂින් හිස නමා ආචාර කර බැහැරව ගියා.

"බොහෝම හොඳ ආචාරශීලී කෙල්ලක්. සැර ගුරුවරු යටතේ ඉගෙන ගන්න ඇති. ඒ නිසාද කොහේද බොහෝම නිමිලා."



"ඔබ කැමති ද ඇයට?"

රූසෝ ඉක්මනින් ඇහුවා. ඔකියෝ රූසෝ දෙස බැලුවා.

"අම්මා. එයා තමයි මම බඳින්න ඉන්නේ."

"මොනව ද රූසෝ කියන්නේ. ඔයා විහිළු කරනවද ?"

"අම්මා දැන් එයා ගැන වර්ණනා කළේ බොරුවට ද ?"

"හොඳයි කියන එක වෙනම කතාවක්. මම කිව්වද එයා මගෙ ලේලි කරගන්න හොඳයි කියලා."

රූසෝ හා ඔකියෝ අතර ගැටුමක් හට ගත්තා. ඔෂින් මේ කිසිවක් දැන හිටියේ නැහැ. එහි සිට ඇය ගියේ සුමිකෝලාගේ කාමරයට.

සුමිකෝගේ කොණ්ඩය සකස් කරන විට,

"මොකද දන්නේ නෑ දැන් රූසෝ මෙහේ එන්නේ නැත්තේ."

"එයාගේ බිස්නස් බංකොලොත් වෙලාද දන්නේ නෑ."

"එයාට අපි එපාවෙලා වගෙයි."

"මොකද අපි කියන්නේ රූසෝ ඔය ගොල්ලන්ගෙත් යාළුවෙක් ද?"

"මේ දවස්වල නම් මිස්ට ටනකුරාගේ අම්මා ඇවිල්ලා."

ඔෂින් කිව්වා.

"ඔයා දන්නේ කොහොමද ?"

"ඒ මැඩම්ගේ කොණ්ඩය සකස් කරන්න මට එන්න කියලා මම එහෙ සාප්පුවට ගියා."

"හැබැට එයා කොහොම කෙනෙක් ද ?"

"එයා ආඩම්බර ඇති. ඉඩම හිමියෙක්ගෙ බිරිඳක් නේ."

"හොඳට ගෙව්වද ?"

"ඉල්ලපු ගාන ගෙව්වා." ඔෂින් කීවේ හිනැහෙමින්.

"රූසෝ ඒ පවුලේ තුන්වෙනි පුතා නේ. කසාදයක් කතා කරන්නවත් අම්මා එන්න ඇති."

මේ කතා බහ ඔස්සේ ටනකුරා කෙබඳු කෙනෙක් දැයි ඔමින් කල්පනා කළා. ඒ සමගම ඇයට සිහිවුණේ මිස් කායෝ ගැනයි. ඇයගෙන් ලිපියක්වත් නොලැබීම ගැන දුක් වුණා. විවාහය නිසාත් කගායා ආයතනය නිසාත් ඇයට විවේකයක් නැතිව ඇති. කොහොම හරි මිස් කායෝ සතුටින් ඉන්නවා නම් ඒක ලොකු සැනසීමක්. ඔමින් එහෙම හිතුවත් මිස් කායෝ ගේ ජීවිතය සම්පූර්ණයෙන් වෙනස් මගකට යොමු වෙලා තිබුණා.

# පහලොව

කායෝ ආච්චම්මාගේ අම්මාගේ, තාත්තාගේ සිත් සතුටු කිරීමට මේ විවාහය කර ගත්තත් ඇය හදවතින් බැඳී සිටියේ කෝටා සමගයි. කායෝට හැම අවස්ථාවකම කෝටා සිහිපත් වුණා. මේ නිසාම ඇය සැමියාට සතුට ගෙන එන බිරිඳක් වුණේ නෑ. සැමියාට අවශ්‍ය කෑම බීම සකසා දුන්නත් ඔහු සමග විනෝදයෙන් හිටියේ නැහැ. ඔහු සමග විනෝද ගමනක් ගියේ නැහැ. ඔහු කගායා ආයතනයේ පාලනය භාරගෙන කටයුතු කළා. ඒ සමගම මත්පැන්වලට ඇබ්බැහි වුණා. බොහෝ විට වෙනත් කාන්තාවන් සමග විනෝද චාරිකා ගියා. ඔහු ඒවා කළේ ඔහු නොතකන බිරියගේ හිත රිදවීමටයි. ටික කලක් යනවිට ඔහුගේ මේ අපචාරී ක්‍රියාවන් ආච්චම්මාත්, අම්මාත්, තාත්තාත් දැන ගත්තා. මින් වැඩිපුර කෝපයට පත් වුණේ අම්මායි.

මීනෝ සැම විටම කායෝ පිළිබඳව සොයා බැලුවා. කායෝ හිටියේ මෙට්ටය මත වැතිර ඇය සිතුවම් කළ චිත්‍රයක් දෙස බලාගෙනයි.

"කායෝ එන්න පහළට අපි තේ බොමු. ආච්චම්මායි, තාත්තායි බලාගෙන ඉන්නවා. ඔයා තනියම මෙහෙම ඉන්නකොට අපිට දුකයි."

කායෝ උඩු මහලෙන් බිමට බැස තේ මේසයට ආවා.

"කෝ අදත් මාෂෝයි එන්න පරක්කු ද ?"

"අද තේ පැන් සංග්‍රහයකට යනවා කිව්වා."

කායෝ තේ පෝච්චිය ගෙන ආච්චම්මාගේත්, තාත්තාගේත් කෝප්ප පිරෙව්වා.

" හැමදාම සංග්‍රහ එක්කෝ විනෝද චාරිකා." මීනෝ කිව්වා.

Rangika

"කායෝ තනියම, හරි වැරදි කියලා දෙන්නවත් කෙනෙක් නැහැනේ."

මිනෝ එසේ කීවේ සැමියා දෙස බලමින්.

"අම්මා දැන් එයානේ කගායාවල ලොක්කා."

කායෝ හිනාවුණා. ඒත් ඇය හදවතින් හඬන බව ආච්චම්මා දැනගෙන හිටියා.

"එයා සුදනා කරන්න එපා කායෝ. මට ආරංචියි එයා දැන් ගේෂා කාන්තාවෝ පස්සෙත් යනවාලු."

"මිනෝ, මොනවද ඔය කියවන්නේ."

තාත්තා අම්මාට සැර කළා.

"කායෝ දැන් ඔයා දරුවෙක් ගැන හිතුවොත් හොඳයි නේද දුව."

ආච්චම්මා ආදරෙන් කිව්වා.

කායෝ හිස වැනුවේ ඔව් කියන්නා වගෙයි.

මාෂෝයි එදත් නිවසට පැමිණියේ හොඳටම රෑ වෙලා.

"අන්න ආවා. අදත් හොඳටම බීලා ඇති."

මිනෝ මෙට්ටය මත ඉඳ ගත්තා.

"මට හිතෙනවා හොඳට දෙකක් කතා කරලා එන්න."

"මිනෝ, ඒවා කායෝ බලාගනියි. ඇත්ත කතා කළොත් වැඩේ දුරදිග යයි. ඔයා නිදාගන්න."

කායෝ දොර හැර එහෙ මෙහෙ වැනෙමින් පැමිණි මාෂෝයිගේ උරහිසින් අල්ලා ගත්තා.

"නාන්න ලෑස්ති කරන්න ද ?"

"ඕනෑ නෑ."

"එහෙම නම් කෑම කාලා ඉන්න."

කායෝ පවසන විට මාෂෝයි කායෝව වැළඳ ගත්තා. කායෝ ඔහුගෙන් මිදී පැත්තකට පැන්නා.



"දන්නවද කායෝ මම අද ගේෂා කෙල්ලක් එක්ක හොඳට විනෝද වුණා. සල්ලි හොඳට වියදම් කළා."

"කෑගහන්න එපා. අම්මලට ඇහෙයි."

"ඇහුණාම මට මොකද ? ඔය දුවෙක් හදලා දුන්නේ මහ ලොකු අම්මලා. දර කොටයක් වගේ කිසිම හැඟීමක් නැති දුවෙක්."

ඔහු කායෝට බැන වදිමින් මෙට්ටය මත වැතිර නින්දට වැටුණා.

කායෝ ඔෂින්ට ලිපියක් ලිව්වා.

"ආදරණීය ඔෂින්,

ඔයාගේ ලිපි කීපයක් ම ලැබුණා. ඔයාට බෝඩිමෙන් යන්න වීම ගැන දුකයි. මා හිතාගන්නවත් බැරි තරමට මම නැත්පත් වෙලා ඔෂින්. ඒ දඟකාරකම්, මුරණ්ඩුකම් දැන් නැහැ. වැඩත් වැඩියි. අපි සතුටින් ඉන්නවා.

කායෝ."

ඔෂින් කායෝගේ ලිපිය කියෙව්වේ අසාවෙන්. සැම විටම කෝවා මුණ නොගැස්වීම ගැන ඇයගේ හිතේ කොනක තිබූ පසුතැවිල්ල මේ නිසා තුනී වී ගියා. ඔෂින් කිසිවක් නොදැන සිටියත් මේ වන විට ඔෂින් නිසා රූසෝත් ඔහුගේ මවත් අතර විශාල ගැටුමක් හට ගෙන තිබුණා.

"අම්මා ඔෂින්ට හොඳ කෙල්ලක් කිව්වා නේද එදා ?"

"ඒ මම කීවේ කොණ්ඩා සකස් කරන්ඩ. ටනකුරා පුතෙකුට ගැලපෙනවද කොණ්ඩා සකස් කරන කෙල්ලක්."

"කවුද ටනකුරා කියන්නේ. ගමෙන් නගරයට ආව ගොවියෙක් නේ. ඒක මහ ආඩම්බරයකට කාරණයක් නෙමෙයි. මම හුගක් කල් හිතුවා. මම නගරයේ දී කෙල්ලෝ කීප දෙනෙක් ම ආශ්‍රය කළා. ඒත් ඒ සේරම අයට ඕනෑ වුණේ මගෙ සල්ලි. ඔෂින් එහෙම කෙල්ලක් නෙමෙයි. ධෛර්යයෙන් දියුණු වුන තවත් දියුණු වන කෙල්ලක්."

"උඹ හොඳටම ආලෙන් මත් වෙලා. ඔය කෙල්ල උඹව රවටනවා."

"ඔයා ගේ අම්මා කියන දේ ඇත්ත. ඇයි ඔයා කොණ්ඩාකාරියක් බඳින්නේ." ගෙන්ජි ඇසුවා.

"මේක ගෙන්ජිගෙත් වරද. මම ගෙන්ජි වගේ වයසක මිනිහෙක් රූසෝ බලාගන්න එව්වේ එයාට හරි වැරැද්ද කියා දෙන්න. දැන් ජේනවා නේද ?"

රූසෝ යන්න ගියා.

"නෑ මැඩම්, ඔය රූසෝ මහත්තයා විහිලු කරන්නේ. ඔය කෙල්ලෝ ලියුම් එවන්නේ. එයාව හම්බවෙන්න එන්නේ. ඔය කෙරෙන දේවල් නෙමෙයිනේ. මැඩම් බය වෙන්න එපා. මම ඕක නතර කරලා දෙන්නම්."

"පිරිමි හොඳ වුණාට ඔහොම ගෑනුන්ගෙන් බේරෙන්න බැහැ."

"මම අදම යනවා ගෙන්ජි. මේවා එකලාසයක් වුණාම මට දන්වලා එවන්න."

"හොඳමයි. මැඩම් මම ගැන විශ්වාසය තියන්න. මම සේරම ඉවර කරන්නම්."

ඔෂින් පොදු නාන කාමරයට ගොස් ඇඳුම් සේදුවා. ඇය ලාබයට ගත් කාමරයේ ජල පහසුකම් තිබුණේ නැහැ.

"ඔයාට හොඳට මුදල් ලැබෙනවානේ කොණ්ඩා දමලා ඉතින් පහසුකම් තියෙන කාමරයක් හොයා ගන්ඩකෝ."

එතනට පැමිණි කාන්තාවක් කිව්වා.

"මෙතැනත් හොඳයි." ඔෂින් හිනැහුණා. ඇය ඉදිරියේ පිරිමියෙක් සිට ගත්තා. ඔෂින් හිස ඔසවා බැලුවා.

"සුබ උදෑසනක් වේවා. ඔබ ටනකුරා සාප්පුවේ ඉන්න ?"

"ඔව්" ගෙන්ජි කිව්වා.

"ඇයි කොණ්ඩා සකස් කරන්න ද ? අර මැඩම්ගෙ."

"නෑ වෙන වැදගත් කතාවකට."

ඔෂින් ගෙන්ජිව නිවසට කැඳවාගෙන ගියා.

"සමාවෙන්න කෑමට නම් දෙයක් නැහැ. තේ එකක් බොමු."



"අවශ්‍ය නැහැ. මෙතන යෙන් දෙසීයක් තියෙනවා. මේ වැඩේ නතර කරන්න."

ඔෂින් පුදුමයෙන් බලාගෙන හිටියා.

"අපට අනුකම්පා කරලා රූසෝ මහත්තයා අමතක කරන්න. අනේ කරුණාකරලා."

ඔෂින් හිනාවුණා.

"මම හිතන්නේ ඔහෙට මාව වෙන කෙල්ලෙකුට මාරුවෙලා."

"බොරු කරන්න එපා. රූසෝ මහත්තයාමයි කිව්වේ ඔෂින්ව බඳිනවා කියලා."

ඔෂින් පුදුමයෙන් බලාගෙන හිටියා.

"ඔෂින් නම තියෙන තව අය ඉන්නවා නේ."

"නෑ ඒ ඔබමයි."

"මම මිස්ට ටනකුරාව එහෙම ආශ්‍රය කරලා නැහැ."

"එහෙම නම් මොකට ද තෑගි බෝග ගත්තේ. අර තියෙන කණ්ණාඩි මේසය කොහෙන් ද ? ඕකේ බිල මට හම්බවුණා. මට නිදහසට කාරණා ඕනෑ නෑ. රූසෝ මහත්තයා වෙන කෙනෙක් බඳින්න කතා කරලා ඉන්නේ. තව සල්ලි ඕනෑ නම් කියන්න."

"දැන් හොඳටම ඇති අපහාස කළා. මගේ එළියට යනවා. වයස නිසා බේරුණා කියලා හිතා ගන්නවා. ඔය සල්ලිත් අරගෙන යනවා."

ඔෂින් කෝපයෙන් කෑගැහුවා. ගෙන්ජි සාප්පුවට ගියා.

"කොහේද ගෙන්ජි ගියේ ?"

"මම ගියා අර කෙල්ලට සල්ලි දීලා ඔහේව බේරා ගන්න."

"මොනවා තමුසෙ මහ බූරුවෙක්. ඔෂින් මේ මොනවත් දන්නේ නෑ. මම ගිහින් කතා කරන්නයි හිටියේ. තමුසෙ මාව විනාශ කළා. අයියෝ."

රූසෝ හිසට අත තබාගෙන මොහොතක් ගත කළා.

"ගෙන්ජි ඔෂින් මට බැන්න ද ?"

"එයා මහ ගිනිකාරියක්. ඔහොම ගෑනු අරගෙන කොහොමද බිස්නස් දියුණු වෙන්නේ."

"ආයිම කෙහෙල්මල් බිස්නස් එකක් ගැන කතා කරනවා. මම යනවා ඔෂින්ගෙන් සමාව ගන්න."

"ඔහොම ඉන්න රූසෝ මහත්තයා. මෝඩ වැඩ කරන්න එපා. ඕක ඔහොම කැඩිලා ගියා වේ."

රූසෝ ඔෂින් හමු වීමට යන අතර කෝපයට පත්ව සිටි ඔෂින් රූසෝ සොයා එමින් සිටියා.

"මම මේ මිස්ට ටනකූරා ගේ සාප්පුවට යන්නයි ගියේ."

"මම ඒ ගැන කතා කරන්න තමයි ආවේ. මම ඔයාට පැහැදිලි කරලා දෙන්නම්. එනවද අවන්හලකට යන්න."

"බැහැ මට වැඩ."

"අදට විතරක් නිවාඩු ගන්න බැරිද ?"

"බැහැ කස්ටමර්ස්ලා මම එනකල් බලාගෙන ඉන්නවා."

"එහෙම නම් ඔයාට වැඩ ඉවර වෙන්නේ කීයට ද ?"

"රෑ හත විතර වෙනවා."

ඔෂින් සියල්ල කිවේ අහක බලාගෙන.

"හොඳයි ඒ වෙලාවට මම එනවා. අපි ටිකක් කතා කරමු."

රාත්‍රියේ අවන්හලකට ඔෂින් හා රූසෝ කෑමකට ගියා.

"මොකක්ද මේ කරන්නේ. ඇයි මගෙ නම පාවිච්චි කළේ. ඒවා විහිළුද ? මිස්ට ටනකූරා. අම්මට කියන්න ඒක බොරුවක් කියලා."

"බොරුවක් නෙමෙයි මිස් ඔෂින් ඒක ඇත්තක්. මිස් කායෝ මට ඔයා ගැන කීවා. සුමිකෝ ඔයා ගැන කිව්වා. කොහොම හරි ඔයා ගැන මගේ හිතේ තියෙන හැඟීම් මම තේරුම් ගත්තේ ඔයා පොලිසියට අහුවුන බව දැනගත් දවසේ. එදා පුදුම දුකක් ඔයා ගැන මට ඇති වුණේ. ඔයා දකින්නේ කොයි වෙලාවේද කියලා නොඉවසිල්ලෙන් හිටියේ. ඊට පස්සේ වෙනත් කාන්තාවන් මුණ ගැසීමට යාම ප්‍රිය නැති වුණා. මට තේරුණා ඔෂින් මම ඔයාට ආදරය කරන බව."



මෙ වන විට මේසය මත කෑම තමාටම සකසා ගැනීමට අවශ්‍ය දේවල් තිබුණා.

ඔෂින් කිසිවකට පිළිතුරු දුන්නේ නැහැ.

"දැන් අපි කෑම කමු. ඒත් මේවා සකස් කරන්න නම් මම දන්නේ නැහැ. සේවිකාවකට කතා කරන්නම්."

"එපා." ඔෂින් භාජනයට අවශ්‍ය දෑ දමා හිබචිය (ලිප) මත තැබුවා. රූසෝ ඒ දෙස බලා හිටියා.

"ඔන්න ඕවා නිසා තමයි ඔෂින් මම ඔයාට කැමති."

"අවුරුදු හතේ ඉඳලම මම මේ වැඩ ඉගෙන ගත්තා. කෑම කන්න හොඳ ද දන්නේ නෑ."

රූසෝ දැඩි උනන්දුවකින් කෑම කෑවා.

"හරිම රසයි. ඔයත් කන්න. ඔෂින් අහන්න හිටියේ ඔයා පහුගිය කාලයට වඩා කෙට්ටු වෙලා. අසනීපයෙන් ද ?"

"ආ..... නැහැ."

"ඔෂින් ඔබට අනුන්ගේ හැඟීම් හොඳට තේරෙනවා. ඔෂින් මගෙ ජීවිතයට සම්බන්ධ වුණොත් ජීවිතය සතුටින් ගත කරන්න පුළුවන් වේවි."

"ඔබ නගරයේ හොඳ ව්‍යාපාරිකයෙක්. මම දෙපාරක් ම පොලිසියට අහුවුන කෙල්ලක්. ඒක නම්බුවක් ද ?"

"ඒකයි ඔබ වැනි කාන්තාවකගේ විශේෂත්වය. ඔයාගේ වටිනාකම ඔයා දන්නේ නෑ ඔෂින්. මම කැමතියි ඔයාව බඳින්න."

"මේකත් විහිළුවක් ද මිස්ට ටනකූරා. මට හිතන්න අමාරුයි."

"දැන්වත් හිතන්න ඔෂින් මට අකමැති ද ?"

"කැමති වුණත්, අපි ගැලපෙනව ද ? ගෙන්ජි, ඔයාගේ අම්මා අපිට විරුද්ධ වෙයි. මටත් මගෙ දෙමාපියන් බලාගන්න තියෙනවා. ගෙදරට සල්ලි යවන්න තියෙනවා. ඒ නිසා මම නිදහස් කෙනෙක් නෙමෙයි. ඔබ මට කරුණාවන්ත වුණා. ඒ ගැන ඔබට ස්තූතියි. අපි යාළුවෝ වගේ ආශ්‍රය කරමු. ඉන් එහාට හිතන්න එපා."

"ඒත්, ඔෂින් මට ඔයා අමතක කරන්න බෑ. අපි කාලයට ඉඩ දීලා බලමු. එතකොට ඔයා මගේ යෝජනාව ගැන හිතන්න."

ඔෂින් රූසෝගේ යෝජනාව ගැන හිතමින් නිවසට ගියා. ඇයට නිවසින් ලිපියක් එවා තිබුණා.

"ඔෂින්, සෝජි බඳින්න යන්නේ. ගෙයි වැඩ ඉවර නෑ. තව මුදල් එවන්න වැඩියෙන්."

කිසිම තෙතමනයක් නොමැති ඒ ලිපිය කියවූ ඔෂින්ට දැඩි පාළුවක් දැනුණා. තවත් මුදල් සෙවීමට නම් තමාගේ වියදම් අඩුකර ගත යුතු බව ඔෂින් සිතුවා. ඇය කෑම බීම බෙහෙවින් අඩු කළා. බොහෝ රෑ වන තෙක් ඇඳුම් මැසුවා. මුදල් ඉතිරි කර වැඩියෙන් නිවසට යැවීමට ඇය උත්සාහ ගත්තා.

ඔෂින් ගේ පැරණි නිවස පැත්තක නව නිවසක් ඉදිවෙමින් තිබුණා.

"යෙන් 300 කට ගේ හදලා ඉවර කරන්න පුළුවන් වුන එක හොඳයි. ඔෂින් හොඳ කෙල්ල අපට සල්ලි එවනවානේ."

සකුයො කිව්වා. ෆුජි නම් මේ කතාවලින් සතුටු වුණේ නැහැ. ඇයට ඔෂින් පිළිබඳ දැඩි දුකක් තිබුණා.

"ඒ ළමයාගෙන් මුදල්  ඉල්ලන්න එපා. මාසෙකට යෙන් 20ක් එවන්න ලෙහෙසි නෑ. ඒක එයාට අමාරු වැඩක්."

"කට වහගන්නවා. ගෙයක් නොසාදා කොහොමද සෝජි කසාදයක් කර ගන්නේ."

"ඔය සෝජි ගේන ගෑණිට ඉන්න ගේ හදන්න ඔෂින් මහන්සි වෙන්න ඕනැයැ. ඒක වැරදියි. මම බැඳලා ආවේ මේ ගෙදරට."

"සෝජි කෙල්ලට කැමතියි. මේ ගේත් රෙපයාර් කර ගනිමුකො."

"ඒ සේරටම ඔෂින්ට වද දෙන්න එපා. පොඩි කාලේ ඉඳලා අපි ඇයට වද දුන්නා."

"සෝජිට සල්ලි හොයා ගන්න බැරි කමක් නෑ. ඒකට නගරයට යන්න එපායැ."

"සෝජි දෙමාපියන් නිසයි නගරයට නොයන්නේ."



"ඒක නෙමෙයි හේතුව. නගරයට යන්න තියෙන බය."

"ෆුජි, ඔයා සෝජිට සලකන්නේ නැද්ද ?"

"එහෙනම් ඔයා ඔෂින් ගැන සලකන්නේ නැද්ද ?"

"සෝජි අපිව බලාගන්නවා."

"ලොකු පුතා විදිහට ඒක එයාගේ යුතුකම."

මේ කතා බහවලින් පස්සේ ෆුජි ඔෂින්ට ලිපියක් ලියෙව්වා පිසි ලවා.

"මෙහෙ ගෙවල් හදන්න ඔෂින් මුදල් එවන්න එපා. ඔයාට මොකක් ද ඇති වැඩේ. සල්ලි ඉතිරි කර ගන්න. හොඳ විවාහයක් කර ගන්න."

තාත්තා එවන ලිපිවලට වඩා අම්මා එවන ලිපි ඉඳුරාම වෙනස් බව ඔෂින් තේරුම් ගත්තා. ඒත් මුදල් යැවීම තම යුතුකම බව ඔෂින් හිතුවා. ඔෂින්ගේ දවස ගෙවුණේ වැඩ කිරීමෙන්. ඇයට රූසෝගේ යෝජනාව ගැනවත් හිතන්න වෙලාවක් තිබුණේ නැහැ. ඒත් එදා ඔෂින් තැපැල් කන්තෝරුවට ගොස් එන විට රූසෝ මුණ ගැසුණා.

"ඇයි ඔෂින් මහන්සියෙන් වගේ, ඔයා අසනීපයෙන් ද ?"

"නෑ, එහෙම නෑ."

"ටිකක් කතා කරමුද ?"

"සමාවෙන්න මට හදිසි මැහුම් වැඩ වගයක් තියෙනවා. ඉක්මනට මහලා දෙන්න යන්න ඕනෑ."

"හොඳයි පස්සේ වෙලාවක හමුවෙමු."

දෙන්නාම හිස නමා ආචාර කර යන්න ගියා.

එදා සුමිකෝලාගේ කොණ්ඩා සකස් කරන විට,

"මොකද ඔෂින් ඔයා රූසෝගේ යෝජනාවට අකමැතියි කියන්නේ? මට එහෙම ඔයා යෝජනාව ආවා නම් මම කොයි තරම් සතුටු වෙනවද?"

"ඕවා කියන්න එපා. ඔෂින් කැමති නැහැ." තාගොෂි කිව්වා.

"ඒ වුණාට රූසෝ නම් ඉන්නේ ඔෂින් ගැන පිස්සු වැටිලා."

"ඔමින් මොකද කතා නැත්තේ. ඔයාට දාඩිය දමලා. අසනීපයෙන් ද ?"

"ආ..... නෑ......"

"ඔමින් ඔයා රුසෝගේ යෝජනාවට කැමති වෙන්න. අපි ඔයා ලවා ලිපි ලිව්වා තමා. ඒවා විහිළුවට ලිව්ව ඒව්වා. එයාගේ හිතේ අපි ගැන කිසිම හැඟීමක් නෑ. රුසෝගේ හිත ගියේ ඔයාට."

"මට ඕනෑ මට ඇත්තට ම ආදරය කරන කෙනෙක්. නැත්නම් මම නොබැඳම ඉන්නවා."

යෙහෙළියෝ නොයෙක් දේවල් කතා කළා. ඒවා අසමින් සිටි ඔමින්ගේ දෑස වැසී ඇය බිමට ඇදගෙන වැටුණා.

"අනේ ඔමින්.... අනේ ඔමින්.."

"මේ ඔමින්ට සිහිය නෑ. අපි ඉක්මනට රෝහලට අරගෙන යමු."

"කෝකටත් මම රුසෝට පණිවිඩය කියන්නම්."

"හොඳයි ඒක."

යෙහෙළියන් ඔමින්ව රෝහලට රැගෙන ගියා.

සුමිකෝ රුසෝ සොයා වනකුරා සාප්පුවට ගියා.

මේ අවස්ථාවේත් රුසෝගේ මව හා රුසෝ අතර ගැටුම ඇරඹී තිබුණා.

"මම දන්නවා. තොරතුරු හොයා බැලුවා. ඔමින් අද ගොවියෙක්ගේ දුවක්. පාසල් ගිහිල්ලාවත් නෑ."

"එයාට හොඳට ලියන්න, කියවන්න, ගණන් හදන්න හොඳට පුළුවනි."

"පොලිසියට අහුවෙලා හිරේ ගිහිල්ලත් තියෙනවා."

"ඒ වුණාට ඒ ඔමින්ගේ වරදක් නිසා නෙමෙයි. මමයි වරක් ඇය වෙනුවෙන් ඇපවුණේ. ඇයගේ යෙහෙළිය ආරක්ෂා කරන්න ගිහින් පොලිසි යන්න වුණේ."

"එයා කොමියුනිස්ට්කාරියක්."



"අම්මා නොදන්න දේවල් කතා කරන්න එපා අම්මා."

"රුසෝට මේවා තේරුම් ගන්න බෑ."

"අම්මා මොනවා කිව්වත් මම ඔමින්ව විවාහ කර ගන්නවා."

"එහෙම නම් මේ ව්‍යාපාරයෙන් අයින් වෙන්න වේවි. රුසෝ මට බොහෝම ලැජ්ජා කළා. එදා මංගල්‍ය සාකච්ඡාවට ආවේ නැහැ. දැන් සේරම අත ඇරලා කොණ්ඩාකාරියක් බඳින්න යනවා."

මේ අතර සාප්පුවේ ඉදිරි දොරට ගසන ශබ්දයක් ඇසුණා.

"කවුද මය දොර කඩන්න හදන්නේ."

ගෙන්ජි ඉදිරිපසට ගියා.

"රුසෝ මහත්තයා, රුසෝ මහත්තයා."

"මොකද මේ රුසෝ මහත්තයා නෑ පිටට ගිහින්."

"කොහේද ගියේ. මට එයා දැක්ම මුණ ගැහෙන්න ඕනෑ. ඔමින් අසනීප වෙලා."

මෙවිටම රුසෝ එතනට ආවා.

"මේ ඉන්නේ රුසෝ. අනේ රුසෝ ඔමින් අසනීප වුණා. අපි රෝහලට ගෙන ගියා. රුසෝ ඔමින්ට කවුරුත් නෑ. අපි පිහිට වෙන්න ඕනෑ."

රුසෝ ඉක්මනින් වෙනත් ඇඳුමක් ඇඳ ගත්තා.

"යමු සුමිකෝ. අපි ඉක්මන් කරමු."

"කොහේද ඔයා යන්නේ රුසෝ මහත්තයා?"

"ගෙන්ජි මම ඔමින් බලන්න යනවා. ඇය අසනීපයෙන්. ඒ මගෙ අනාගත බිරිඳ. එයාව බලාගන්න එක මගෙ යුතුකමක්."

"රුසෝ මහත්තයා."

ගෙන්ජි කෑගැහුවා.

"ඔහෙ ගියදෙන්. එයාට වනකුරා ව්‍යාපාරයත් ඒ වගේම අත අරින්න වේවි."

Rangika

ඔකියෝ කෝපයෙන් යුතුව මෙට්ටය මත වාඩි වුණා.

ඔෂින් හිටියේ දැඩි නින්දකයි. රුසෝ සහ සුමිකෝ වෛද්‍යවරයා මුණ ගැසීමට ගියා.

"කොහොමද අපේ රෝගියාගේ තත්වය."

"එයාට, මන්ද පෝෂණය. මෙය හඳුන්වන්නේ බෙරි බෙරි රෝගය කියලා. වාසනාවට අපි එයාගේ රෝගය හඳුනා ගත්තා. තව කලක් ගියා නම් මේ තත්ත්වයෙන් මරණයට පත්වෙන්නත් තිබුණා. මෙයා රැකියාවක් කළේ නැද්ද ?"

"රැකියාවක් කළා කොණ්ඩා මෝස්තර සකස්කරන්නියක් විදිහට. ඒත් එයා එයාගේ ගෙදරට මුදල් යැව්වා. ඒ සඳහා රාත්‍රී කාලවල නිදිමරාගෙන මැහුම් මැහුවා."

සුමිකෝ කිව්වා.

"විටමින් ඊ අඩුවෙලයි තියෙන්නේ. එයාට විටමින් ඊ දෙන්න ඕනෑ. පෝෂ්‍යදායක ආහාර දෙන්න ඕනෑ. ඒ වගේම විවේකයත් අත්‍යවශ්‍යයි."

"දොස්තර මහත්මයා එයා වෙනුවෙන් හැම දෙයක් ම කරන්න. ඒවාට මම ගෙවන්නම්."

"මම හිතන්නේ මිස්ට රුසෝ මෙයා කෑම කන්න ඇත්තේ අඩුවෙන්. සල්ලි ඉතිරි කරන්න එහෙම කරන්න ඇති. බත්, අච්චාරු විතරක් කන්න ඇති."

"අසරණ කෙල්ල."

"සුමිකෝ මම අද රෑ ඔෂින් ළඟ නතර වෙනවා. ඔයා යන්න."

"ස්තූතියි මිස්ට රුසෝ. ඒක ලොකු උදව්වක්."

රුසෝ රාත්‍රිය පුරාවට ඔෂින් ළඟ නතරව ඉන්න විට ගෙන්ජිත් නොනිදා සාප්පුව ඉදිරිපසට වී සිටියා. පාන්දර ඔකියො ගෙන්ජි සිටි තැනට ආවා.

"එහෙම නම් රුසෝ ඊයේ රෑ ගෙදර ආවේ නැහැ නේද ?"

"මැඩම් ඇයි පාන්දරම ඇහැරගෙන."



"ඔහේ නිදාගත්තේම නැහැ නේද ?"

"මම හිතන්නේ, කෙල්ල අසනීප නිසා රුසෝ මහත්තයා රෝහලේ නතර වෙන්න ඇති."

"ඔය කෙල්ල එක්ක ඔච්චර පැටලුණේ කොහොමද ?"

"දෙසැරයකට වඩා මෙහෙ ඇවිල්ලත් නම් නැහැ."

"යමු අපි එයාලව හොයාගෙන."

"එපා මැඩම් මම රුසෝ මහත්තයා හොයා ගන්නම්."

"නෑ ගෙන්ජි මාත් එන්නම ඕනෑ."

උදේම ඔවුන් රුසෝ සෙවීමට ගියා.

ඔෂින් ඇස් ඇරියේ පාන්දර. ඇය වටපිට බැලුවා. කොහේද ඉන්නේ ඇය කල්පනා කළා. එවිට ඇය දුටුවා රුසෝ පුටුවක ඇන්දට හේත්තු වී නිදන අන්දම. නින්දත් නොනින්දත් අතර සිටි රුසෝ ඔෂින් දෙස බැලුවා. ඇය හිස එසෙව්වා.

"එපා ඔෂින් නැගිටින්න එපා. ඔයා අසනීපයෙන්."

"අසනීපයෙන් ?"

"ඔව් ඔයාට මන්දපෝෂණය. හොඳට විවේක ගන්න ඕනෑ. ඒ වගේම පෝෂ්‍යදායී ආහාර ගන්න ඕනෑ."

"ඒත් ටනකුරා මහත්තයා."

"කතා කරන්න එපා. ඔයාගේ පපුව හිරවෙයි. දොස්තර මහත්තයා කිව්වා මහන්සි කරන්න එපා කියලා."

"ඒත් දැන් මට සනීපයි."

"මන්දපෝෂණය ගැන සුළුවෙන් හිතන්න එපා මිස් ඔෂින්. මොනවද ඔයාට ඕනෑ."

"දැන් මට හොඳයි. මෙතන හිටියොත් ඔයාගේ වැඩ පාළුවෙයි."

"ඇයි මිස් ඔෂින් මම මෙතන ඉන්නවට ඔයා අකමැති ද ?"

"නෑ එහෙම නැහැ. කිසිම කෙනෙක් නැති මට මගෙ යාළුවෝ වගේම මිස්ට ටනකුරා මෙහෙම පිහිට වුණොත් ඒක මට සතුටක්."

Rangika

සුප් කෝප්පයක් රැගෙන හෙදියක් පැමිණියා.

"මිස් ඔෂින් නැගිටලා සුප් එක බොන්න පුළුවන් ද ?"

"තියන්න මිස් මම එයාට පොවන්නම්."

රූසෝ සුප් කෝප්පය ගෙන හැන්දෙන් ඔෂින්ට සුප් පෙව්වා.

"ස්තුතියි ටනකුරා මහත්තයා. මම හිතුවේ නැහැ මට මන්දපෝෂණය හැදෙයි කියලා. අපි පුංචි කාලේ කෑවේ රාබු බත්."

මෙවිටම ඔකියෝ හා ගෙන්ජි රෝහල් කාමරයට පැමිණියා.

"රූසෝ ගෙදර එන්න. ඔයා පොරොන්දු වුණා මේ කෙල්ල අත අරිනවා කියලා."

ඔකියෝ කීවේ ඔෂින්ට තරහ මුහුණක් පෙන්වමින්.

"මම අම්මාට කවදාවත් එහෙම පොරොන්දු වෙලා නෑ."

"අහගන්නවා ඔයාටයි රූසෝටයි බඳින්න දෙන්නේ නෑ මම. රූසෝ ඔයාව බැන්දොත් එයාට ටනකුරා ව්‍යාපාරය අත් අරින්න වෙනවා."

ඔකියෝ ඔෂින්ට කිව්වා.

"නෑ මම ඔෂින්ව බඳිනවාමයි."

"එහෙම නම් බිස්නස් එක දාලා යන්න වෙයි."

"අම්මා, මේ රෝහලක්. ඔෂින් ලෙඩින්. අම්මා යන්න. මොකටද ගෙන්ජි අම්මාව මෙතනට ගෙනාවේ."

"මොකටද ගෙන්ජි මාව ගේන්නේ. මමමයි ඔයාව හොයාගෙන ආවේ. මම යනවා ආපිට සාගාවලට."

"හොඳයි ගිහින් එන්න."

ඔකියෝත්, ගෙන්ජිත් කෝපයෙන් පිටව ගියා.

"මිස්ට ටනකුරා ඇයි අම්මට එහෙම කතා කළේ."

"ඔයාම තේරුම් ගන්න. මම බොරු කීවේ නැහැ. මම අවංකව ම කිව යුතු දේ කිව්වා. ඔයා ඕවා හිතන්න එපා. විවේක ගන්න මම සාප්පුවට ගිහින් එන්නම්."



"හොඳමයි."

ඔෂින් දින දහයක් ම රෝහලේ නතර ව සිටියා. සුමිකෝ සහ යෙහෙළියෝ නිරතුරුව ඔෂින් සමග ගත කළා. ඔවුන් බැහැර වුණේ රූසෝ ඔෂින් බැලීමට පැමිණියාම. රූසෝ ඔෂින්ට පෝෂණදායි ආහාර පාන ගෙනැවිත් දුන්නා. ඔෂින් රෝහලෙන් බැහැරව යන දින රූසෝ පැමිණියා.

"යන්න ලෑස්තිද මිස් ඔෂින්."

"ඔව් මිස්ට ටනකුරා. තව තියෙන්නේ බිල ගෙවන්න විතරයි."

"ඒ ගැන වද වෙන්න එපා. මම බිල ගෙව්වා. මම නර්ස්ලාටත් තෑගි ගෙනැත් දුන්නා."

"මිස්ට ටනකුරා බිල ගෙවුව එක නම් වැරදියි."

"ඔයාට ගෙදරට මුදල් යවන්නත් තියන නිසයි මම බිල ගෙව්වේ."

"ඔයා මම අසනීපව ඉන්න මේ දවස්වල මා සමග හිටියා. ඉතින් මම ඔයාට ණය ගැතියි. ඔයා මගේ මිතුරෙක් නම් හුවමාරුව සමබරව තබා ගනිමු. මම කැමති එහෙමයි."

"හොඳයි එහෙම නම් ඔයා මේ ටිකිට් තියාගෙන මුදල් ලැබුණ වෙලාවක මට දෙන්න."

"නෑ දැන්මම දෙන්නම්. මෙන්න සල්ලි ගන්න."

ඔෂින් කිමෝනාව තුළින් ගත් මුදල් නෝට්ටු රූසෝ අතට දුන්නා.

"හොඳයි එහෙම නම් යමු. මම ඔයාව කාමරයට ඇරලවන්නම්."

රූසෝ ඔෂින් කාමරයට ඇරලා ආපසු කාමරයට ගියා. ගෙන්ජි හිස ඔසවා බලා අහක බලා ගත්තා.

"මොකද නිහඬ. ඩීලවරී යැව්වද ? අලුතින් මොනවද ආවේ."

"එංගලන්තයෙන් බඩු ආවේ නෑ. ඇයි රූසෝ මහත්තයා සේප්පුවෙන් මුදල් ගත්තේ. පවුලෙන් අස්කරලා සමෝරුවත් වකලා දමයි. ඔයාට ඕනෑ නම් ඔෂින් හිතවතියක් විදිහට ආශ්‍රය කරන්න. හැබැයි විවාහ වෙන්න බෑ."

"ඔමින් ගැන ඔහොම හිතන්න එපා ගෙන්ජි."

රුසෝ සාක්කුවෙන් මුදල් රැගෙන මේසය මත තිබ්බා.

"මෙන්න සල්ලි. මම මේවා ගත්තේ රෝහල් ගාස්තු ගෙවන්න. ඒත් ඔමින් ඒකට මට ඉඩ දෙන්නේ නෑ. එයා මම ගැන හිතන්නේ යාළුවෙක් විදිහට නෙමෙයි. බිස්නස්කාරයෙක් විදිහට."

# දහසය

ඔමින් ගේ අසනීප තත්වය නිසා මෙවර ගෙදරට මුදල් යැවීමට හැකි වුණේ නැත.

"මොකද ඔමින් සල්ලි එව්වේ නැත්තේ. මම කොහොමද බාස්උන්නැහේලාට සල්ලි දෙන්නේ. තව ලීක් ගන්න තියෙනවා. වැරදි වැඩක් නේ එයා මුදල් එව්වේ නැති එක."

"දුවගෙන් සල්ලි අරගෙන ගේ හදන එක නේ වැරදි වැඩේ."

"ඔයා මුදල් එවන්න එපා කිව්වා ද ?" සකුයො ඇසුවා.

"අනේ ඔමින් අසනීපයකින් ද දන්නේ නෑ." පුර් කිව්වා.

"හොඳයි, මම අද හෙටම එයා බලන්න යන්නම්කෝ. එතකොට මට මුදල් ටිකක් ඉල්ලා ගෙනම එන්න පුළුවනි."

රුසෝ අලුත් මාළු සහ බිත්තර රැගෙන ඔමින් බැලීමට කාමරයට ගියා.

"ඔමින්."

"කවුද ? මිස්ට ටනකුරා මයා."

"ඔව් මම මේ බිත්තර වගයක් ගෙනාවා. සමාවෙන්න ඔයා බලන්න එන්න වෙලාවක් තිබුණේ නෑ."

"එන්න ගේ ඇතුලටම. ගෑනු ළමයෙක්ගේ කාමරේ රෑ ඉන්න හොඳ නෑ ඔමින්. මම යන්නම්."

"ඉන්න මමත් මිස්ට ටනකුරා එක්ක ටිකක් දුර එන්නම්." ඇය දොර වසා දමන විටම සකුයො එතනට පැමිණියා.

Rangika

"තාත්තා !! ගෙදර කරදරයක් ද ?"

"මෙයා කවුද ?" සකුසො ඇසුවේ කේන්තියෙන්.

"මගෙ යාළුවෙක් තාත්තා. මේ මිස්ට රුසෝ... ටනකුරා."

"ඒ කියන්නේ මේ මිනිහා එක්ක රවුම් ගහනවා රෑ වෙලා තියෙද්දීත්."

"සමාවෙන්න මම යන්නම්."

රුසෝ සකුසොට ආචාර කර යන්න ගියා.

"නැහැදිච්ච එකෙක්."

"නෑ තාත්තා එයා එහෙම නැහැ. නගරයේ ඉන්න ප්‍රසිද්ධ වෙළෙන්දෙක් එයා. එන්න තාත්තා ඇතුළට. මහන්සි ඇතිනේ. මම ඉක්මනට කෑම සූදානම් කරන්නම්."

"මේ කිරිබත් අම්මා දෙන්න කිව්වා." සකුසො කුඩා පාර්සලයක් ඔමින්ට දුන්නා.

සකුසො දුන්න පාර්සලය ඉක්මනින් ලෙහා ගත් ඔමින් එයින් එක් කිරිබත් කෑල්ලක් ගෙන කෑවා.

"අම්මා හදන කිරිබත් හරිම රසයි. තාත්තා ගේ හොයා ගන්න කරදර වුණාද ?"

"නෑ අහගෙන අහගෙන ආවා."

"තාත්තා මම ඉක්මනට මාළු ටිකක් හදන්නම්. නූඩ්ල්ස් තියෙනවා."

"මම ආවෙ කන්න බොන්න නෙමෙයි. සල්ලි අරගෙන යන්ඩ. මොකද සල්ලි එව්වෙ නැත්තේ. ඒක වැරදි වැඩක් නේ."

"තාත්තා පහුගිය මාසේ වැඩ කරගන්න බැරි වුණා."

"ඇයි දැන් කම්මැලි වෙලා වගේ මට පේන්නේ. කන්ඩ බොන්ඩ නම් හොඳට තියෙනවා. මාළු, බිත්තර."

"වැඩ නොකළ නිසා මුදල් ලැබුණේ නෑ තාත්තා."

"සල්ලි නැති වුණාට අලුත් අලුත් කිමෝනා මහන්න පුළුවනි. මෙතනම කපාපු කිමෝනා තුනක්. ඔව් ඉතින් අලුත් කිමෝනා ඕනෑ



නේන්නම් මිනිස්සුත් එක්ක රෝන්දෙ යන්ඩ. මම ගේ හදන්ඩ ගත්තෙත් එකමයි. ඇහැට කනට පේනවා. මෙහෙ නිදහස වැඩියි. ගෙදර හියාම කුඹුරු වැඩ කරලා එහෙ ඉන්න පුළුවනි. අයියට උදව් කළාට මොකද වෙන්නෙ. ඒ කොල්ලා අපිව බලාගන්නවා. උඹලා මෙහෙට වෙලා මිනිස්සුත් එක්ක රෝන්ද ගහනවා."

"තාත්තා එහෙම කියන්න එපා. ඒ මිස්ට රුසෝ හොඳ වෙළෙන්දෙක්. එයා මට විවාහ යෝජනාවක් කළා."

"ඉතින් කසාද බැන්ද ද ?"

"නෑ මම කැමැත්ත දුන්නා."

"වැඩිහිටියෝ නැතිව එහෙම යෝජනා ගේන්න බැහැ නේ. මම ඔයාගේ තාත්තා. මට ඒ මිනිහා මුණ ගැහෙන්න ඕනෑ."

"මේ රෑ යන්න බෑ තාත්තා."

"නෑ, නෑ, රෑ වුණාට කමක් නැහැ. එනවා යන්න එහෙ."

"මම ආපිට යන්න ඉස්සර වෙලා මේක ගැන තීරණයක් ගන්න ඕනෑ. මාව දැක්ක නිසා මය මිනිහා හෙට ඉඳලා හැංගෙයි ද කවුද දන්නේ. එනවා ඔමින් මාව කේන්ති නොකර."

සාප්පුව ඇතුළේ හිටියේ ගෙන්ජි.

"මේ මොකද මේ කෙල්ලවත් ඇදගෙන."

"මට මෙතේ මහත්තයා මුණ ගැහෙන්න ඕනෑ."

"ඔහේ කවුද ?"

"මම ඔමින්ගේ තාත්තා. මේ මහත්තයා ඔමින්ට විවාහ යෝජනාවක් කරලා තියෙනවා."

"ඔව් ඉතින් රුසෝ මහත්තයා යෝජනා කළා. මෙයා බෑ කිව්වා නොවැ."

එවිට ම රුසෝ ඉදිරියට ආවා.

"මොකක් ද මේ කතාව ඔමින් කියනවා ඔහේ බඳින්න කැමතියි කියලා. මෙයා කියනවා ඔමින් කැමති නෑ කියලා."

රුසෝ ඔෂින් දෙස පුදුමයෙන් බලාගෙන හිටියා.

"ඔෂින් කොණ්ඩා දමා හම්බ කරනවා. ගෙදර මුදල් යවනවා. ඔහේ මෙයා බැන්දම කොහොමද ගෙදරට මුදල් එවන්නේ."

"මේ උන්නැහේ තේරුම් ගන්නවා. ඔහේ අද ගොවියෙක්. ඔෂින් ඔහේගේ දූව. රුසෝ මහත්තයා මධ්‍යම පංතියේ. ඉතින් ගැලපෙන්නේ නෑ නොවැ." ගෙන්ජි කිව්වා.

"ඔෂින්, පේනවා නේද අහංකාර කතා. ඕනෑ නෑ ඔයා නගරයේ ඉන්න. අපි යමු ගෙදර. අම්මත් ඉන්නේ දුකෙන්. එහෙ ගිහින් කොණ්ඩා සකස් කරලා මුදල් හොයා ගන්න පුළුවනි. මම කැමති නෑ මේ විවාහයට. මේ මිනිහා ඔයාව වහලියක් කර ගනියි. යමු ගෙදර."

ගෙදර ගිය සකුයෝ ඔෂින්ට බල කළා යමගාටා යමු කියා. ඒත් ඔෂින් කැමති වුණේ නෑ. සකුයො පාන්දරම යන්න ගියා.

ටික වෙලාවකින් රුසෝ ආවා.

"සමාවෙන්න පාන්දරම ඇවිල්ලා කරදර කළාට. මම ආවේ ඔයාගේ තාත්තා මුණ ගැහිලා සමාව ගන්නයි. විවාහයට අවසර ගන්නයි."

"තාත්තා පාන්දරම ගියා."

"මට සමාවෙන්න ඊයේ සිද්ධ වුණ දේට. ඔෂින් මට පුදුම හිතුණා තාත්තා කිව්ව කතාවට. ඔයා එහෙම කිව්වද ? මාව බඳින්න කැමතියි කිව්වද ?"

"තාත්තා ඔයා ගැන වැරදි විදිහට හිතුවා. සල්ලාලයෙක් විදිහට හිතාගෙන කතා කළාම මම එහෙම කිව්වා."

"ඔහොම හිත වෙනස් වෙනවා. ඔයා මගේ උදව් නොගත්තාම මම හිතුවේ ඇත්තටම ඔෂින් ඔයාට මාව වදයක් කියලා."

"එදා රෝහලේ දී ඔයා අම්මා එක්ක මගෙ පැත්ත අරගෙන කතා කළාම මගේ හිත ඇදිලා ගියා. ඒත් මම ඒ හිත යටපත් කර ගත්තා."

"ඒක තමයි බිල ගෙවන්න නොදුන්නේ නේද ? ඔෂින්."

"අනිත් එක මට දැන්ම විවාහ වෙන්න බැහැ. මම ගෙදරට මුදල් යවන්න ඕනෑ දිගටම."



"ඉතින්, ඒක වරදක් නෙමෙයි නේ. දෙමාපියන්ට උදව් කරන්න එපායැ. මම හණමිටි අදහස් දරන කෙනෙක් නෙමෙයි. ඔයා හම්බ කරලා ගෙදරට මුදල් යැව්වට කමක් නෑ. ඒක වරදක් නෙමෙයි. කියන්න ඔෂින් ඔයා මගෙ අත ගන්න කැමති නේද ?"

"එතකොට ඔයාට ස්ටෝරුව අත් හරින්න වෙයි."

"ඒකට කමක් නෑ. මම මෙහෙ ව්‍යාපාරිකයො හුගක් අඳුනනවා. මම තනියම බිස්නස් එකක් පටන් ගන්නවා. යාළුවෝ උදව් කරයි මට."

"ඒත් රුසෝ ඔයාට දුක් විඳින්න වෙයි."

"ඒක මට දුකක් නෙමෙයි. ඔයා මා එක්ක ඉන්නවා නම්. මම දන්නවා ඔයා ධෛර්යවන්තයි, වාසනාවන්තයි මට වරදින්නේ නෑ. බයවෙන්න එපා අපි එකට ඉමු. මමත් උදව් කරන්නම් ඔයාට."

"ඒත් ගේ හදලා ඉවර වෙනකම් මට නිදහසේ තීරණ ගන්න බෑ." ඔෂින් කිව්වා.

"එහෙනම් අපේ විවාහය කල් දමමු."

"එහෙම පුළුවන් ද ?"

"ඇයි බැරි.... දෙමාපියන්ට උදව් කරන්නේ. ඊට පස්සේ අපි නිදහස්."

"හැබැයි අපේ මංගල්‍යයට කවුරුවත් එන එකක් නෑ."

"අපිට මොකට ද කවුරුවත්. ඔෂින් ඔයාට මම ඉන්නවා. මට ඔයා ඉන්නවා."

"ඔයාට කාලයක් බලා ඉන්න වෙයි."

"කමක් නෑ. අපි දෙන්නම ඒ කාලය තුළ අපේ බිස්නස් දියුණු කර ගනිමු."

ඔෂින්ගේ අත අල්ලා ගත්තු රුසෝ සෙනෙහසින් ඇය දෙස බලා සිටියා. සෙමෙන් ඔෂින්ගේ හිස එසෙව්ව රුසෝ ඔෂින්ගේ නළල සිප ගත්තා.

රුසෝ, ඔෂින් දෙදෙනාම විවාහ ජීවිත ගැනීමෙන් පසු දවස ගෙව්වේ සතුටින්. ඔෂින් ගෙදරට මුදල් යැව්වා.

"රුසෝ මහත්තයා වෙලේලා කියනවා සුට් මහන්න බැරිලු. ආර්ථික ප්‍රශ්න උග්‍රවෙලා. අපට වෙන්නේ රෙදි ආපිට එංගලන්තයට යවන්නයි."

"ගෙන්ජිට කමැති දෙයක් කර ගන්න."

"ඇයි එහෙම කියන්නේ රුසෝ මහත්තයා. ?"

"මොකද ළඟදීම මම ඔය ස්ටෝරුව අත අරිනවා නේ."

"ඒ මොකද ඒ ?"

"ඇයි ඔෂින්, මගෙ බිරිඳ වුණාම මේවා මට අහිමි වෙනවානේ."

"රුසෝ මහත්තයා ඔච්චර ආලයෙන් අන්ධ වෙන්න එපා. ඔයාගේ උරුමය කොහෙවත් ඉන්න අද ගොවියෙක්ගේ දුවක් වෙනුවෙන් අත අරින්න පුළුවන් ද ඔයාට."

"ඔය සේරටම වඩා මට ඔෂින් වටිනවා."

"මේ නගරයේ ම කොයිතරම් ගැලපෙන තරුණියෝ ඉන්නව ද?"

"ගෙන්ජි ඔබ ඔෂින් ගැන දන්නේ නෑ."

"දැක්කා නේද අර මිනිහා එදා රෑ කතා කළ නැහැදිච්ච විදිහ. කොහොමද ඔහොම මිනිස්සු එක්ක පැහිලා ඉන්නේ. අපි කොහොමද සගයාවලට මූණ දෙන්නේ."

"ගෙන්ජි ඔය කතාව නවත්වා ගත්තොත් හොඳයි. වැඩිය කියෙව්වොත් මම හෙටම ඔෂින්ව බැඳලා මෙහෙ පදිංචියට එනවා"

"අනේ රුසෝ මහත්තයා මොනවද ඔයා මේ කරන්න හදන්නේ."

ගෙන්ජි අඬන්න පටන් ගත්තා. පසුවදා රුසෝ අලුත් ඇඳුමකින් සැරසී ඔෂින් හමුවෙන්න ගියා. දොරට තට්ටු කරන හඬට කන් දුන් ඔෂින් මැහුම බිම තබා හිට ගත්තා.

"කවුද ?"

"මේ මම."

ඔෂින් දිවගෙන ගොස් දොර ඇරියා.

"රුසෝ ඔයා ?"



"ඔව්, අපි අද විවාහ වෙනවා."

"අද ?"

"ඔව්, මේ දැන් පොඩි දෙව් මැදුරකට යමු. මොනාද ඔයා හිතන්නේ."

"හිතන්න දෙයක් නෑ රුසෝ. කවදා විවාහ වුණත් ඒ ඔයා එක්කනේ. ඒත් මට කියන්න ඇයි හදිස්සියේම කියලා."

"අපි විවාහ වුණාම ගෙන්ජි සාගා යනවා. මට ගෙන්ජිට පෙන්වන්න ඕනෑ ඔෂින්, ඔයා කොහොම කෙනෙක් ද කියලා. ඒත් ඔයාට ඕනෑනම් තව හිතන්න. කලබලයක් නෑ."

"නෑ හිතන්න දෙයක් නෑ. මට ඕනෑ ඔයත් එක්ක එකට ජීවත් වෙන්නයි. ඕනෑම වෙලාවක එන්නම්. එතකොට මේ ගෙට කුලී ගෙවන්න ඕනෑත් නැහැනේ."

"හරි, ඔයා හරි. එහෙම නම් එන්න දෙව් මැදුරකට යමු."

ඒ 1921 වසරයි. ඔෂින්ගේ වයස අවුරුදු විසි එකයි. රුසෝ පසු කරන්නේ විසි නය වන වසරයි. දෙදෙනාම කුඩා දෙව්මැදුරකට ගියා. ඔෂින්ට කායෝගේ මංගල්‍යය මතක් වුණා.

අපේ විවාහය හරිම අහිංසක උත්සවයක් ඇයට හිතුණා. ඒ පිළිබඳ ඔෂින් දුක් වුණේ නෑ. රුසෝ ඇයට හිමි වීමේ සතුට උපරිමයෙන්ම විඳ ගත්තා. දෙව් මැදුරේ පූජකයෙක්වත් හිටියේ නෑ. දෙදෙනාම වැඳගෙන ඔවුන්ගේ දියුණුව ප්‍රාර්ථනා කළා. ඔෂින් හොඳටම නැමී රුසෝට ආචාර කළා. දෙදෙනාම එකට නිල් අහස දෙස බලා සිටියා. ඔවුන්ගේ මුහුණු සතුටින් පිරී තිබුණා.

ඔෂින්ගේ කාමරයේ තිබුණු බඩු කරත්තයක දමාගෙන දෙදෙනාම රෙදි සාප්පුවට පැමිණියා. ඔෂින් එළියේ රඳවා රුසෝ ඇතුළට ගියා.

"රුසෝ මහත්තයා කොහේද මටත් නොකියා ගියේ."

"මංගල්‍යයකට."

"මංගල්‍යයකට ?" ගෙන්ජි එයම උච්චාරණය කළා.

"ඔව්, ඔෂින්ගෙයි, මගෙයි. අද ඉඳලා අපි මෙහෙ පදිංචි වෙනවා. එන්න ඔෂින් ඇතුළට."

ගෙන්ජි හිස බදාගත්තා.

"සමාවෙන්න." ඔෂින් ඔහුට ආචාර කළා. ගෙන්ජි අනිත් පැත්ත හැරුණා. ඔෂින්ගේ බඩු පොදියත් රැගෙන ඇතුළට පැමිණි සේවකයාට ගෙතුළට යන්න නොදී ගෙන්ජි පාර අවහිර කළා.

"මෙහෙ බෑ. මෙහෙ බෑ."

ගෙන්ජි කම්කරුවා තල්ලු කර දැමුවා. බඩු පොදි ගත් අනිත් කම්කරුවා ඒ අතරතුර කාමරයට ගෙන ගියා. ඒ දඟකාරකමට ම ඔෂින්ට හිනා ගියා.

"අපිට නිදන කාමරය ඕනෑ."

"මම.... මම මොනවද දෙමාපියන්ට කියන්නේ."

"මොනවා කියන්නද ? මම ස්ටෝරුව අත අරිනවා. ගෙන්ජිට ප්‍රශ්නයක් නැහැ. අම්මා කවුරු හරි මෙහෙ එවයි. ගෙන්ජි එයත් එක්ක වැඩ කරගෙන යන්න. හැබැයි අපි නවාතැනක් හොයා ගන්න තෙක් ගෙන්ජි අපි එක්ක මෙහෙ ඉන්න ඕනෑ."

"මට ඉන්න නෙමෙයි මැරෙන්නයි වෙන්නේ."

ගෙන්ජි හිස බදාගෙන එළියට ගියා. ඔෂින් උයන ගෙට ගොස් පළමුව එය පවිත්‍ර කළා. ඉන්පසු කෑම සූදානම් කළා.

"ඔෂින් අපි එළියට ගිහින් කමු. ඔයා මහන්සි වෙන්න එපා."

"නැහැ ආයිම අපි එළියෙන් කෑම කන්නේ නෑ. අපි තුන්දෙනා ම ගෙදර උයලා කමු."

"අපි තුන්දෙනා ?"

"ඔව්, ගෙන්ජි මහත්තයයි අපි දෙන්නයි."

ඔෂින් කෑම ගෙනවිත් මේසය මත තැබුවා. තුන්දෙනාටම කෑම ගන්නා භාජන ගෙනවිත් තිබ්බා. හඹ කූට්ටම් තුනක් තියා රූසෝට කතා කළා.

"ගෙන්ජි මහත්තයාටත් කතා කරන්න."

"ඔෂින් ඔයාම කතා කරන්න බලන්න."



"මට බනියි ද ?"

"එහෙම උනොත් ඔයාට තරහ යනවද ?"

"එහෙම නෑ. මම කතා කරන්නම්කො."

ගෙන්ජි සාප්පුවේ බංකුවක වාඩි වී ඇත බලාගෙන හිටියා.

"සමාවෙන්න කරදර කරනවා නම්. කෑම කන්න එන්න ගෙන්ජි මහත්තයා. රූසෝත් බලාගෙන ඉන්නවා."

ගෙන්ජි බංකුවට පයින් ගහගෙන යන්න ගියා. ඔෂින්ට දුක හිතුණා.

"රූසෝ පවී නේද අද ගෙන්ජි මහත්තයා බඩගින්නේ. එයා ඔයාව හුගක් කල් බලා ගත්තා නේ. එයා අපේ තාත්තා වගේ නේ."

"අනේ ඔය ටික අහගන්න ගෙන්ජි මෙතන හිටියා නම් කොයි තරම් හොඳද ?"

"එන්න ඔෂින් ගෙන්ජි පස්සේ කෑම කයි. අපි කෑම කමු."

"රූසෝ කෑම කාලා අපි එළියට ගිහින් බඩු ටිකක් ගෙනෙමුද? හෙට සුමිකොලට රස කැවිලි ටිකක් හදාගෙන ගියොත් හොඳයි."

සුමිකෝ සහ අනිත් යෙහෙළියන් ඔෂින්ට සුභ පැතුවා.

"අපට හරිම සතුටුයි. ඒත් ඔෂින් මංගල උත්සවයක් ගත්තේ නැද්ද ?"

"රූසෝ කිව්වා එයාලගේ අම්මලා කැමති වුණොත් උත්සවයක් ගනිමු කියලා."

"ආ...... එහෙනම් අපි උත්සවයක් ලෑස්ති කරනවා. ඔෂින් අපේ හොඳම යෙහෙළිය. ඒ වගේම අපේ බාල සොයුරිය."

"නංගිගේ මංගල උත්සවය අක්කලා සංවිධානය කරනවා හොඳද?"

"හොඳයි, හොඳයි."

ඔෂින් කීවේ හිනැහෙමින්.

ඔෂින් නිවසට යන විට ගෙන්ජි සාප්පුවෙන් බැහැර ගියා. සමහර දිනවල ඔහුට කෑම සකස්කර තිබුණා. ඔෂින් ඇය සාදන කෑම ඔහුගේ

කෑම බඳුන්වලට දමා තිබ්බා. මුල් දවස්වල ගෙන්ජි ඒ කෑම කෑවේ නැහැ. ඒත් පසුව ඒවා කෑමට ගෙන තිබුණා.

ඔෂින් පිළිබඳ ගෙන්ජිගේ පළමු පැහැදීම ඇතිවුණේ එක්තරා සිද්ධියකින්.

ඔෂින් එදා වැඩ නිමකර ගේ දෙසට එමින් සිටියා. මේ වෙලාවේ ගෙන්ජි දුරකතනයෙන් රූසෝ සමග කතා කළා.

"මට මොකද මම කියන්නම්. ඔවා කෙරෙන වැඩයැ."

ඔෂින් සාප්පුවට ඇතුල් වුණා.

"අන්න රූසෝ මහත්තයා කතා කළා. අවන්හලට එන්න කිව්වා. එයාගේ හොඳම ව්‍යාපාරිකයෝ දෙන්නෙක් ඇවිල්ලාලු එංගලන්තයෙන් ඒ ගොල්ලන්ට තේ චාරිත්‍රය පෙන්වන්න එන්නලු."

"මට ?"

"ඔව්, මම මුලදිම රූසෝ මහත්තයාට කිව්වා බඳින්න ඔනෑ බිස්නස්කාරයෙක් ඔවා දන්න බිරිඳක්වයි. දැන් ඉතින් ගිහිල්ලා පෙන්වන එකයි තියෙන්නේ තමන් දන්න තේ චාරිත්‍ර."

ඔෂින් කගායාවලදී මිස්ට සකුරාකිගේ මල් ප්‍රදර්ශනාගාරයේ තේ චාරිත්‍රය පැවැත් වූ අයුරු සිහි කළා. දැන් ඒවා මතක නැහැ. ඒත් මට බැරිද ?

ගෙන්ජි අපහාසයට හිනැහුණා.

"කොණ්ඩා අත ගානවා වගේ ලේසි නෑ ඔවා. මම ගේෂා කෙල්ලෙකුට කතා කරනවා. අරමහ රූසෝ මහත්තයා බලාගෙන ඇති. අපරාදේ කියන්න බෑ ගේෂා කෙල්ලන්ට තේ චාරිත්‍රය පුළුවනි."

ගෙන්ජි දුරකතනය වෙත ගියා.

"එපා. මම යනවා."

"ඔව්, ඔව් ගිහින් රූසෝ මහත්තයාගේ නම්බුවත් කන්න බැරියැ. නෑ නෑ යන එක හොඳයි. රූසෝ මහත්තයත් ඔහේව ඔළුව උඩතේ තියාගෙන ඉන්නේ."



ඔෂින් හිතට ධෛර්ය ගෙන ආපන ශාලාවට ගියා. ගෙන්ජිත් දොස් කියමින් ඇය පිටුපසින් ගියා.

ඔෂින් කාමරයේ දොරට තට්ටු කළා.

ඇය සෙමෙන් දොර තල්ලු කළා. රූසෝ මෙට්ටය මත වාඩි වී සිටියා.

ඔහු ඉදිරියේ බ්‍රිතාන්‍ය ජාතික යුවලක් හිටියා.

"සමාවෙන්න පරක්කු වුණාට. මගෙ නම ඔෂින්."

ඇය තමා හඳුන්වා දුන්නේ ඉංග්‍රීසියෙන් කතා කරමින්. ගෙන්ජි විමතියෙන් බලාගෙන හිටියා.

බ්‍රිතාන්‍ය ජාතික යුවළ තමන්ගේ නම් කිව්වා. ඔෂින් තේ චාරිත්‍රයට සූදානම් වුණා. ඇය පළමුව බිම වාඩි වීම පස්සට ගියා. ඊළඟට ඇය පැමිණියේ තේ කෝප්පයක් රැගෙන. එය රැගෙන ආවෙත් සෑහු ගමනින්. ඉන්පසු එය බිම තබා තේ කුඩු භාජනයට දමා කම්බිවලින් සාදා තිබූ උපකරණයෙන් තේ මිශ්‍ර කළා. ඉන් පසු එහි තේ කොළ පහළට බසින තෙක් සංයමයෙන් බලා සිටියා. ඉන්පසු භාජනයට ගෙන අමුත්තන් ගේ තේ බඳුන් වලට තේ දමා ගෞරවයෙන් පිළිගැන්වූවා. මේ චාරිත්‍රය ඔෂින් සිදු කළ ආකාරය දෙස විදේශීය යුවළ සතුටින් බලාගෙන හිටියා. රූසෝගේ මුහුණ සතුටින් පිරිලා. ගෙන්ජිගේ මුහුණේ විමතිය තවම පහවෙලා නැහැ. ඒ සමගම ඔහු අපූරු වින්දනයකින් මේ චාරිත්‍රය දෙස බලා හිටියා. රූසෝ ගෙන්ජිගේ මුහුණ බලා ආඩම්බර සිනාවක් මුහුණට නගා ගත්තා.

මේ වන විට සාප්පුවේ සේවකයන්ගෙන් ඉතිරිව සිටියේ ගෙන්ජි පමණයි.

"මේ වැඩ කටයුතු තනියම කරගන්න හරිම අමාරුයි." ගෙන්ජි කිව්වා.

"ස්ටෝරුව ගැන මම හිතන්නෙත් නැහැ ගෙන්ජි."

"කොහේද උගත් කෙනෙක් වත් කැන්දා ගෙන ආවානම් මට උදව් ගන්න තිබුණා. ඒ කාලේ නම් කිව්වා හෝද ලියන්න පුළුවනි ගණිත් හදන්න පුළුවනි කියලා."

"ඔව් පුළුවනි ඉතින් මොකට ද ගෙන්ජි ඒ ගැන අහන්නේ."

"බලමුකෝ ඕවා ඇත්ත ද කියලා."

එදා සවස ඔෂින් වැඩ නිමකර නිවසට පැමිණි විට,

"මේ මිසිස් ටනකුරා ඇබකසයක් පාවිච්චි කරන හැටි දන්නවද?"

"ඔව්."

"එහෙම නම් එමුකෝ මාත් එක්ක මේ ගණන් එකතු කරන්න."

ගෙන්ජි මේ වන විට එහි එකතුව සාදා තිබුණත් ඔෂින්ගේ දැනුම මැන බැලීමට ගණන් කීපයක් කිව්වා එකතු කිරීමට. ඔෂින් අපූරුවට ඒ ගණන් එකතුකර අඩු කර උත්තරය කිව්වා. ඒ උත්තරය නිවැරදි බව දැනගත්ත ගෙන්ජිට සතුටක් දැනුණා. මේ වන විට ඔෂින් උයන කෑම ගැනීමට ගෙන්ජි හුරු වුණා. ඔෂින් පිටත ඇතක ගිය දිනවල පාන්දරම ආහාර සකස් කර,

"දවල්ට රත් කරගෙන කන්න."

කුඩා තුන්ඩුවක් ඒ මේසය උඩ තියා ගියා. රුසෝ නම් බොහෝ විට දවල් කෑමට නිවසේ රැඳුණේ නැහැ.

රුසෝ නිවසේ සිටින අවස්ථාවල ඔහු ගේ අවතේව කිරීමට ගෙන්ජි යොමු වුණාම,

"ඕනෑ නෑ ගෙන්ජි දැන් ඔයා වද වෙන්න එපා. ඔෂින් ඉන්නවා නේ ඔය සේරම බලා ගන්න."

රුසෝ එසේ පැවසූ විට ගෙන්ජි නොමනාපයෙන් ඉවත්ව ගියා. ඔෂින් එවැනි අවස්ථාවල රුසෝට ළංවී,

"රුසෝ ඔයා එහෙම කතා කරන එක වැරදියි. ගෙන්ජි අවුරුදු ගණනක් ඔයාව බලා ගත්තා. තවමත් එයා හිතන්නේ ඔයාව බලා ගන්න එක එයාගේ යුතුමක් කියලා."

"මට ඕනෑ ඔයා කොහොම කෙනෙක් ද කියලා ගෙන්ජිට ඒත්තු ගන්වන්නයි."

"ඒකට තව කල් තියෙනවා. ඒ වයසක මනුස්සයාගේ හිත රිදවන්න එපා රුසෝ."



"මිසිස් ටනකුරා ඔයාට පුළුවන්ද මේ පොත්වල ගණන් ලියන්න. පැහැදිලිව ලියන්න ඕනෑ." විටෙක ගෙන්ජි ඔෂින්ට වැඩ පැවරුවා.

"හොඳයි උත්සාහ කරන්නම්."

රුසෝ රාත්‍රියේ නිවසට පැමිණෙන විටත් ඔෂින් ගණන් පොත්වල වැඩ කරමින් හිටියා.

"ඔෂින් මොකද කරන්නේ."

"මම මේ ගණන් පොත්වල වැඩ වගයක්."

"ගෙන්ජි." රුසෝ තරහින් කෑගැහුවා.

"මොකද රුසෝ මහත්තයා කෑගහන්නේ."

"ඇයි ඔෂින්ට මේ වැඩ කරන්න කියන්නේ."

"එයාගේ අත්අකුරු හොඳ නිසයි ලියන්න කීවේ."

"ඔෂින් මේ ගෙන්ජි දෙන වැඩ ඔයා කරන්න එපා. ඔය හදන්නේ ඔයාගේ වැරැද්දක් අල්ලා ගන්න. කොහොමටත් ස්ටෝරුවේ වැඩ කරන්න එපා. අපි ළඟදීම ඕවා සේරම අත ඇරලා යනවා. "

රුසෝ කෙසේ කීවත් ඔෂින් ගෙන්ජිට උදව් කළා. මේ සමගම ඇය තේරුම් ගත්තා රෙදි හොඳින් විකුණුවත් වැඩිපුරම ණයට දී තිබෙන නිසා ව්‍යාපාරයෙන් ලාභයක් ලැබී නැති බව. ඒ නිසා දිගටම පාඩු විඳිමින් එංගලන්තයෙන් බඩු ගෙන්වා ඇති බව. මේ පිළිබඳ රුසෝ සමග කතා කිරීමට ඔෂින් තීරණය කර ගත්තා.

# දෑහත

එක දවසක් ටනකුරා සාප්පුවට අමුත්තෙක් පැමිණියා. දොරින් ඇතුළු වූ අමුත්තා දැක ගෙන්ජි අසුනින් නැගී සිට හිස නමා ආචාර කළා. වැඩක නිරත වී සිටි රූසෝ හිස එසෙව්වා. ඔහුත් හිට ගත්තා.

"තා... ත්තා..."

ඒ රූසෝ ගේ තාත්තා ඩයිකෝරු ටනකුරා.

"එන්න තාත්තා වාඩි වෙන්න. මහන්සිත් ඇතිනේ. ගෙන්ජි තේ ලෑස්ති කරන්න."

ඔෂින්ට ඇහුණා සාප්පුවේ කතා බහ. ඔෂින් දැනගෙන හිටියා මෙහෙම අවස්ථාවකට කොයි මොහොතේ හෝ මුහුණ දීමට සිදුවන බව. ඇය ඉක්මනින් දුරකතනය වෙත ගියා.

"මිස් සුමිකෝ මට අද එන්න බැරිවෙයි. මට කණගාටුයි. අද විතරයි. අනේ බොහොම ස්තුතියි."

ඔෂින් කෑම බීම සකස් කළා. ඒ සමගම ඩයිකෝරු ටනකුරා සමග කතා බහ කරන ආකාරය හිතුවා. තනියම කතා කරමින් පුහුණු වුණා.

ඔෂින් සාප්පුව තුළට ගොස් ඩයිකෝරුට ආචාර කර මෙට්ටය මත ඉඳ ගත්තා.

"මගෙ බිරිඳ, අපි මාසෙකට පෙර විවාහ වුණා."

ඔෂින් හිස නැමුවා.

"මගෙ නම ඔෂින්."



"ඉතින් ඔෂින් ඔයා අද ගොවියෙක්ගේ දුවෙක්."

"ඔය කතා මෙතනට ඕනෑ නෑ තාත්තා. ඔෂින් මට වටිනවා."

"ගෙන්ජි මට ලියලා එව්වා."

"තාත්තා ගෙන්ජිට ඔෂින් පේන්න බෑ."

"මොනවද රූසෝ ඔයා ඔය කියන්නේ. ඉන්න මම පහදලා දෙනකල්."

"කල් හොඳටම ඇති ගෙන්ජිට ඔෂින් ගැන දැනගන්න. ඒත් ගෙන්ජි බලන්නෙම ඔෂින්ගෙ වැරැද්දක් අල්ලා ගන්න."

"මේ අහන්න ඔෂින් ගෙන්ජි මට ලියලා තිබුණා ඔයා හරිම කරුණාවන්තයි කියලා. අනුකම්පා සහගතයි කියලා. ලියා තිබුණා අත් අකුරු හොඳයි බිස්නස්වලට දක්ෂයි. හොඳට උයන්න පුළුවනි. තේ චාරිත්‍රය දැකලා පුදුම වුණා කියලා. ගෙන්ජි මේවා ලිව්ව නිසා මම විශ්වාස කරනවා. ඒත් මගේ බිරිඳ කියනවා ගෙන්ජි ඔය පැත්ත අරගෙන බොරු ලියනවා කියලා."

"නෑ ටනකුරා මහත්තයා මම ඇත්තමයි ලීවේ."

ඔෂින්ගේ දෑසින් කඳුළු කඩා හැලුණා. රූසෝ තවමත් විමතියෙන්.

"ගෙන්ජි මට ලියලා තිබුණා ඔෂින් අද ගොවියෙක්ගෙ දුවෙක් කියලා වෙනස්කම් කරන්න එපා කියලා. ඒකයි මම ආවේ. ස්තූතියි ගෙන්ජි මම ඔබේ ඉල්ලීම ඉටු කරනවා. මම කැමැත්ත දෙනවා මේ විවාහයට. ස්ටෝරුව රූසෝම තියාගන්න. දෙන්නා එක්ක ඒක දියුණු කරගන්න. මම අම්මාට තේරුම් කරලා දෙන්න බලන්නම්."

ගෙන්ජි එතැනින් ඉවත් වුණා.

"ගෙන්ජි කොහෙද යන්නේ යන්ඩ එපා." රූසෝ කිව්වා. ඔෂින් ඒ පිටුපස ගියා. ගෙන්ජි රෙදි රාක්කයක් ළඟට වී අඬන්න පටන් ගත්තා. ඔෂින් ගෙන්ජි ළඟ දණ ගසා ගත්තා.

"ගෙන්ජි මහත්තයා...."

"එපා මිසිස් ටනකුරා මට ගෙන්ජි කියන්න. මම ඔබ ගැන දැන ගත්තා. මෙහි ආව පළමු දවසේ ඉඳලා ඔබ පියෙකුට වාගෙ මට

සැලකුවා. මට කෑම හදලා දුන්නා. ඔබ ඈතක ගියොත් ආහාර රත් කරගෙන කන්න කියලා ලියලා ගියා. කලින් මම ඔබට සලකපු විදිහට මට සමාවෙන්න ඕනෑ. ඔබ වගේ කිසිම කෙනෙක් මට කරුණාවන්ත වෙලා නෑ. මම මෙහෙන් ගියත්...."

"ගෙන්ජි, කොහේවත් යන්න එපා. අපි තුන්දෙනාම මේ ව්‍යාපාරය දියුණු කරමු. යමු තාත්තාට සංග්‍රහ කරන්න."

මේසය මත වූ සකේ බොමින් තුන් දෙනාම දොඩමලු වුණා. ඔෂින් අවශ්‍ය කෑම බීම ගෙනවිත් මේසය මත තැබුවා.

"මේ කෑම හරිම රසයි රූසෝ. රූසෝ බොහෝම වාසනාවන්තයි. තුන් වේලම හොඳට කන්න පුළුවනි."

"හා..... හෑ හා..."

ගෙන්ජි වෙරිමතින් හයියෙන් දිගටම හිනා වුණා.

"මට නම් එකම කෑම ජාති කාලා එපා වෙලා."

"අම්මා ළඟ නැති නිසා තාත්තා ඔහොම කියන්නේ."

"හා....... හෑ හා" තුන්දෙනාම හිනාවුණා.

"උඹ හරි වාසනාවන්තයි රූසෝ. හොඳට උයන්න හැකි බිරිඳක් ලැබීම ලොකු වාසනාවක්. ගෙන්ජි රූමත් ළඳක් එක්ක ඉන්න එකත් වාසනාවක්. එහෙම නේද ?"

"ඔෂින් සකේ බොන්න."

"එපා තාත්තා මම බොන්නේ නෑ."

"රූසෝ මීට පස්සේ ගෙදරට සල්ලි එවන්න ඕනෑ නෑ. හොඳට දියුණුවෙන්න. ඔෂින් මේ සල්ලි අරගෙන විවාහ සාදයක් පවත්වන්න."

ඔෂින් ඇය වෙත දිගු කළ ලිපි කවරය දෙස බලා ගෙන හිටියා.

"ගන්න ඔෂින් ඇයි ලැජ්ජා වෙන්නේ."

ඔෂින් කවරය අතට ගෙන හිස නමා ආචාර කළා.

"දැන් මගෙ වැඩ කොටස ඉවරයි." ගෙන්ජි කිව්වා.

"ගෙන්ජි මාත් එක්ක සගායා යමු." ඩයිකෝරු යෝජනා කළා.



"නෑ නෑ ගෙන්ජි අපිව දමලා යන්න එපා ගෙන්ජි. ගෙන්ජි ඉන්න ඕනෑ අපි එක්ක. අනේ යන්න එපා."

ඔෂින් හිස බිම තබා ආචාර කරමින් ඉල්ලා සිටියා. මෙවිටම සාප්පුවේ ප්‍රධාන දොරට තට්ටු කරන සද්දය ඇහුණා.

"ටෙලිග්‍රෑම් ටෙලිග්‍රෑම්."

"ඉන්න එනවා."

ඔෂින් දොර ඇරියා.

"ඔෂින් ටනමුරා ඔබ ද ?"

"ඔව්, මම."

"මේ ලිපිනයට ඒ කාමරයට ගියාම අසල් වැසියෙක් කිව්වා ඔබ දැන් ඉන්නේ මෙතෙන කියලා."

"එහෙමද අනේ ඔබට හුඟක් ස්තූතියි."

"එන්නම් නෝනා."

"හොඳයි."

ඔෂින් ඔහුට හිස නමා ආචාර කළා. ඔෂින් විදුලි පුවත ගලවා බැලුවා. ඇය ගේ මුහුණ අඳුරු වුණා.

"ඇයි ඔෂින්."

රූසෝ අතනට පැමිණ ඇහුවා.

"තාත්තාට අසාධ්‍යයිලු."

"එහෙම නම් ඔෂින්ට යමගාටා යන්න වෙයි."

"ඒත් එයාගේ තාත්තා ගෙදර ආවා විතරයි. මම කොහොමද යන්නේ ?"

මේ ගැටලුවට ඩයිකෝරු මෙහෙම කිව්වා.

"ඔෂින් තාත්තා බලන්න යන්න. කොහොමත් මම හෙට යන්න තමයි හිටියේ."

"තාත්තා ගෙන්ජිත් ඉන්න නිසා මෙහෙ ඉන්න."

"රූසෝ ඔයත් ඔෂින් එක්ක යමගාටා ගියොත් හොඳයි නේද?"

"එතකොට ස්ටෝරුව බලාගන්න."

"ගෙන්ජිත් මා එක්කම සගායා යනවද ?"

"අනේ ගෙන්ජි යන්න එපා. අපිව දාලා යන්න එපා. රූසෝ මා එක්ක රණ්ඩු වුණාම මගෙ පැත්ත ගන්න ඔයා ඉන්න." ඔෂින් කිව්වා.

"ඔව් ගෙන්ජි හැම විටම ඔෂින්ගේ පැත්ත ගන්න."

"රූසෝ ඔයයි ගෙන්ජියි තාත්තාව බලාගන්න. මම යමගාටා යන්නම්."

"ඒත් රූසෝත් ගියොත් හොඳයි. ඔයාගේ මාමණ්ඩිනේ."

"තාත්තා ඔෂින්ගේ පියා අපේ මඟුලට විරුද්ධයි. ඒ නිසා ඔෂින් ගිහින් මට ටෙලිග්‍රෑම් එකක් එවන්න. එතකොට මම එන්නම්."

"හොඳයි."

එදා රාත්‍රියේ රූසෝ ඔෂින්ගෙ අතකින් අල්ලා ගත්තා.

"අපේ තාත්තාට හරි සතුටුයි ඔෂින්. මය ගොල්ලන්ගේ තාත්තාත් කැමති වුණොත් හොඳයි. හැබැයි දැන්ම විවාහ වුණා කියන්න එපා. මේ සල්ලි තියා ගන්න ගමන් වියදම්වලට. තාත්තාට හොඳට වෙදකම් කරන්න."

"එපා රූසෝ මා ළඟ මුදල් තියෙනවා."

"නෑ ඔයාට මුදල් දෙන එක මගෙ යුතුකම. මේක දුන්නෙ ගෙන්ජි. තව මුදල් ඕන වුණොත් මට කෝල් කරන්න."

"හොඳයි."

ඔෂින් ගමනට අවශ්‍ය ඇඳුම් සූදානම් කර ගත්තා.

ඔෂින් දුම්රියෙන් බැස ගෙදර ගියේ දුවමින්. ඇය කන්ද බහින විටම අම්මා වෛද්‍යවරයා සමග එළියට ආවා. ඇය වෛද්‍යවරයාට ආචාර කළා.

"අම්මා."

"ඔෂින් ඔයා ආවාද. හොඳයි ඉක්මනට ආව එක."



"තාත්තට හුගක් අමාරුද අම්මා."

"අක්මාව ඉදිමිලා."

"අම්මා මේ අලුත් ගේ නේද ?" ඔෂින් අලුත් නිවස ළඟට ගියා.

"මට සතුටුයි අම්මා ගේ හදලා ඉවර වෙලානේ නේද ?"

එවිටම සෝජි මහුගේ බිරිඳ ටෝරා සමග එතනට ආවා.

"මොකට ද ඔෂින් ගෙන්නුවේ?" සෝජි ඇසුවා.

"ඔෂින් මේ ටෝරා සෝජිගේ බිරිඳ."

ඔෂින් හිස නමා ටෝරාට ආචාර කළා.

"ටෝරා මය අලුත් ගේ හදන්න මුදල් එව්වේ මේ ඔෂින් තමයි." අම්මා කීවා.

"මය කතා මොකට ද මෙතනට"

ටෝරා ගස්සාගෙන යන්න ගියා. සෝජිත් ඒ පස්සෙන් වැටුණා.

"කිසි හැදිච්ච කමක් නැති එකියක්. එන්න දුව ඇතුළට."

ගේ ඇතුලේ මිටිනු අත්තාත් පුපුතේ මල්ලීත් පැමිණ සිටියා.

"එයාලා ඊයේ ආවේ. තාත්තා ඒ ගොල්ලන් දැකලා හරියට සතුටු වුණා. දොස්තර නම් කිව්වේ සුවකරන්න බැහැ කියලා."

ඔෂින් තාත්තා ළඟට ගියා. සකුයො තද නින්දක. එහෙත් මුහුණේ විඩාබර බව පහවෙලා තිබුණේ නැහැ. ඔෂින්ට තාත්තා දිගා වී සිටි තතිනි පැදුරේ පැරණි බව මෙන්ම ඒවල සීතලද දැනුණා.

"අම්මා, ඇයි තාත්තව සීතලේම මෙහෙ තියාගෙන. මම අලුත් ගේ හැදුවේ අම්මාටත් තාත්තාටත් ඉන්න නේ."

"සකුයො මෙහෙ ඉන්න කැමතියි. අලුත් ගෙදරට ලෙඩෙක් ගෙනියනවට ඒ අය අකමැතියි දුව."

"ඒක හරි වැඩක් නේ. තාත්තාගේ ගේ හැදුවේ. එහෙම කොහොමද."

"ඔෂින් ඔයා මේ ප්‍රශ්නවලට මැදි වෙන්න එපා දුව. ඔයාල මේවා කතා කරලා යයි. මං මේ ගෙදර සැනසීමෙන් ඉන්න ඕනෑ."

"මිට්ෂු ඔයාලා ඊයේ නේද ආව කීවේ?"

"ඔව් ඔමින්."

"කොහෙද ඔයාලා නිදා ගත්තේ. මේ ගෙදරමද ? මම බොහොම මහන්සි වෙලා අලුත් ගේ හදන්න මුදල් එව්වේ. ඉන්න මම අහල එන්නම්."

"ඔමින් ඔය කොහෙද යන්නේ. යන්න එපා."

ඔමින් අලුත් නිවසට දුවගෙන ගියා. ටෝරා සහ සෝජි කෑම ගන්නවා.

"මේ ගෙට තාත්තාව ගේන්න ඕනේ. මිට්ෂුලාට නිදාගන්න දෙන්න ඕනා මෙහේ. මමයි මේ ගේ හදන්න මුදල් එව්වේ."

"ඔයා මුදල් එව්වට ශ්‍රමය මගේ. කොහෙවත් ඉඳලා ඇවිල්ලා අයිතිවාසිකම් කියනවද ? ටෝරයි මමයි තව ඉවසනවා."

"එතකොට මම දුක්විඳලා එව්ව මුදල් කෝ."

"ඒවා තාත්තාගේ ණය ගෙවන්න වියදම් කළා. අනිත් එක තාත්ත මට මේ අලුත් ගේ දුන්නා. නගරයේ ඉඳල ආව කියලා ඕනවට වඩා පිම්බෙන්න එපා."

"ඔය මොනව කිව්වත් මම තාත්තව මේ ගෙට ගේනවා. ටෝරා ඔයාට යුතුකමක් තිබුණා තාත්තා බලාගන්න. පැත්ත පළාතේ ගියේ නෑ නේද ?"

"ආ.... කටකාර ගෑනියෙක් නංගි බව දැනගෙන උන්නේ නැතෙ."

"කලබල වෙන්න එපා ටෝරා තාත්තා මළාම එයා යයි යන්න."

ඔමින් කෝපයෙන් පරණ ගේ දෙසට ගියා.

"ඔමින්, ඔමින්. මෙන්න තාත්තා කතා කරනවා."

ඔමින් තාත්තා ළඟ දණ ගහගත්තා. සකුසො සෙමෙන් ඔමින් ගේ මූණ අතගෑවා.

"ඔ...මින්... ආව එක හොඳයි."

"තාත්තා ඇයි මෙතන ඉන්නේ. අපි අලුත් ගෙට යමුද තාත්තා."



"නෑ මෙහෙ හොඳයි. මම ඒ ගේ සෝජිට දුන්නා. නැත්නම් එයාට විවාහයක් කරගන්නත් නැහැනේ. මට මෙහෙ හොඳයි. මෙහෙ ඉපදුණා, හැදුණා, වැඩුණා. ඔමින්ගේ සීයා ආච්චම්මා හිටියෙත් මෙහෙනේ. ඔමින් මම ඔයාට හුගක් වද දුන්නා. ඒවට සමාවෙන්න මට. ඔබ කළ දේවලට අපි ණය ගැතියි. මගේ ඇස් පියවෙන්න ඉස්සර එපායෑ මේව කියන්න. දුප්පත් මිට්සුට බඳින්න බැරි වුණා. ඔයාටත් බඳින්න බැරි වෙයි. ඔයා අර රෙදි වෙළෙන්දා බඳින්න. වරද මගේ. මම හිය නිසයි ඒ විවාහය කැඩුණේ. එහෙම නේද ? ඔයා ඉන්නේ දුකින් නේද ඔමින්."

"සකුසො වැඩිය කතා කරන්න හොඳ නෑ." ෆුජි පැවසුවා.

"තාත්තා මම ඉන්නේ සතුටින්. මම මිස්ට ටනකුරව බැන්දා. මඟුල් උත්සවයක් ගත්තේ නෑ. තාත්තා අකමැති නිසා කිවේ නෑ."

සකුසො හිස ඔසවා නැගිට්ටින්න තැත් කළා.

"ෆුජි මට හරි සතුටුයි. අපි ඔමින්ගේ විවාහය සමරන්න ඕනෑ. කෑම ලෑස්ති කරන්න. සකේ බෝතලයක් ගෙනෙන්න."

"තාත්තා, තාත්තාට සකේ බොන්න හොඳ නෑ."

"කමක් නෑ දුව. තාත්තා කැමති දේ දෙන්න ඕනෑ. ඒ එයාගේ සතුට නේ." ෆුජි කිව්වා. සකුසො සකේ බෝතලය රැගෙන වීදුරුවක් පුරවා ඔමින් දෙසට හැරී,

"මෙන්න මංගලපයට මගේ සුභ පැතුම්." පවසා සකේ වීදුරුව බීගෙන ගියා.

"මේ සකේ හරි රසයි. ආ... ඔව්... රසම සකේ. මෙහෙම රසට සකේ බිව්වේ අද'' කියමින් සකුසො හිනැහුණා.

එදා රාත්‍රියේ සකුසො මිය ගියා. සෝජි කිවේ මළ මිනියකට මුදල් වියදම් කිරීමේ තේරුමක් නෑ කියලා. 'කමක් නෑ මං වියදම් කරනවා' ඔමින් හිතා ගත්තා.

"එක අතකට මැරුණ එක හොඳයි. මම නම් ඔහොම මැරෙන්නේ නෑ. අද ගොවියන් වෙනුවෙන් සටන් කරලයි මැරෙන්නේ."

සෝජි කීවා.

"උඹේ නපුරුකම් නම් කවදාවත් නැති වෙන එකක් නෑ. තමන්ගේ තාත්තාට නේද එහෙම කියන්නේ." ෆුජි සෝජිගේ කමිස අතින් අල්ලාගෙන කම්මුලට පාරක් ගැහුවා.

"අතෑරිනව මට යන්න. මගේ යාළුවෝ වගයක් එනවා."

"ඔව් අර බොරු තර්ක කාරයෝද උඹේ ඔය යාළුවෝ."

"කවුද අම්මා?" ඔෂින් ඇහුවා.

"අර කතාකාරයෝ වගයක්. කොච්චර හරි දොර වහගෙන කතාව. මං හිතන්නේ ඔෂින් මේ රත්තෝ. ඒ කතා වැඩක් නෑ ඔෂින්. දැන් ගෙදර ගියොත් හොඳයි. මෙහෙම සැමියා දමලා ඉන්න එපා."

"අම්මා, අපි යමු අම්මා ටෝකියෝ. රූසෝ හරිම හොඳ කෙනෙක්."

"ඔය වෙන්නැති දේවල් කතා කරලා වැඩක් නෑ. මේ මගෙ ගෙදර. මම මෙහෙ ඉන්නවා."

"අම්මා ටෝරා එක්ක කරදර වෙයි."

"නෑ මම එහෙ යන් නැහැනේ. මම ඉන්නෙ මගෙ ගෙදර. එක අතකට සෝජි වෙනම ඉන්න එකත් හොඳයි. නැත්නම් මේ ගෙටනෙ රත්තො දමා ගන්නෙ. මම කැමති නෑ ඒකට."

"ඒ කියන්නේ සෝජි ඒ සංවිධානයට බැඳිල ද ?"

"වෙන්න ඇති. කොච්චරවත් තරුණයෝ ඔය ගෙට රිංගන්නෙ වටපිට බල බලා."

"කෝටා....?" ඔෂින්ගේ සිහියට ආවා. ඇය සෙමෙන් එළියට ගොස් සෝජිගේ නිවසේ දොර ඇර බැලුවා. කීප දෙනෙක්ම ලොකු සාකච්ඡාවක. ඔෂින් එළියට ආවා.

හොඳටම හඳ පායලා. හුගක් දවසකට පස්සේ නිදහස් පරිසරයක. ඔෂින් හඳ දෙස බලාගෙන හිටියා. සඳ රැස් මුහුණ සිඹින සේ මුහුණ උඩට හරවා ගත්තා. එකවරම ඇය ළඟ කෙනෙක් නතර වුණා. ඔෂින් තිගැස්සී බැලුවා. කෝටා !!!

"මේ කොහේද ඔයා යන්නේ?"

"ඔෂින් මහ පුදුම හමුවීමක්නේ ඔයා."



"මේ මගේ ගම. මේ මගේ ගෙදර."

"එතකොට ඔයා සෝජිගේ නංගි ද ?"

"හුගක් කාලෙකට පස්සේ. ඔයා මෙහෙම දැක්කාම මට හරි සතුටුයි. ඔයාට කරදරයක් නැති එක ගැන."

"මුළු ජපානයේම දුක්විඳින ගොවියෝ වැඩිපුර ඉන්නේ මේ ගමේ. ඉතින් අපි කීප දෙනෙක්ම මේ ගමට ආවා ගොවියෝ දැනුවත් කරන්න. ඉතින් ඔෂින් මොනවද ඔයාගේ තොරතුරු."

කෝටාගේ මුහුණ සඳ එළියෙන් දීප්තිමත්ව තිබුණා.

"මම ළඟදී බැන්දා."

ඔෂින්ගේ වචන සමඟ කෝටාගේ මුහුණ වෙනස් වුණා.

"මම දැන් ඔෂින් වනතුරා. මම දැන් වෙළෙන්දෙක්ගෙ බිරිඳක්."

"හොඳයි ඔෂින් මගේ සුභ පැතුම් ඔයාට. මට වාසනාවක් නැති වුණා. ඒත් ඔයා සතුටින් නම් ඒක මටත් සතුටක්. එන්නම්...."

ඔහු නොපෙනී යන තෙක් බලාසිටි ඔෂින් ඇයගේ පළමු පෙම්වතාගෙන් එක සිහිනම සමු ගත්තා. මීට පස්සේ මම ආදරය කරන්නේ රූසෝට විතරයි. ඒ ඇයගේ හැඟීම වුණා. ඔෂින් පියා වෙනුවෙන් දානමය පිංකමක් නිම කර නිවසින් සමු ගැනීමට සූදානම් වුණා.

"මට දුවට දෙන්න දෙයක්වත් නෑ. මේ මළුවල තියෙන්නේ රතු බෝංචියි, සෝයා බෝංචියි. මම වගාකළ ඒවා."

"සෝජි දැනගත්තොත් අම්මට බනියි."

"මම බය නෑ එයාට. ලේලිට මාව කල්ලු කරලා දාන්න දෙන්නේ නෑ මම. හොඳින් බැරිනම් අතින් පයින් හරි."

"අනේ අම්මා ඔය මොනවත් ඕනෑ නැහැනේ අම්මා මාත් එක්ක එනවානම් ටෝකියෝ."

"බැහැ දුව ඔයාගේ ගෙදර ආගන්තුකයෙක් වෙන්න මට බැහැ. ඒවගේම තමයි ඔයා සැමියයි මායි අතර අතරමැදි වෙනවා. ගැටලු

Ranga

ඇතිවෙයි. ඔයා දැන් ඔයාගේ සැමියව බලාගන්න ඕනෑ. ඒක බිරිඳක ගේ යුතුකම දූව. දැන් ඔයා යන්න. තවත් උදව් එපා ගෙදරට."

"මම උදව් කලේ අම්මයි තාත්තයි වෙනුවෙන්. සෝජි වෙනුවෙන් නම් මම තවත් උදව් කරන් නෑ. ඒත් මම අම්මට මුදලක් එවන්නම්, අම්ම හුගක් මහන්සි වෙන්න එපා."

ඔෂින් ඇයගේ පරණ නිවසට ආයුබෝවන් කීවා. සමහර විට සදහටම.

# දැහැටා

ඔෂින් ටෝකියෝ යෑම පසෙක තබා සකාටා යන්න හිතුවා. මගේ විවාහය ගැන යගිරෝ මැඩම්ට කියන්න ඕනෑ. මිස් කායෝ ගේ අලුත් තොරතුරුත් දැනගන්න පුළුවන්නේ. සකාටා යෑමට හේතු ලෙස ඔෂින් එහෙම හිතුවා.

කගායා ආයතනය ඉදිරිපසදී කායෝගේ පියා ජිරෝ මුණ ගැසුණා.

"හා...... ඔෂින් කොච්චර කාලෙකට පස්සෙ ද අපිව බලන්න ආව නේද ? යන්න ගේ ඇතුළට"

ඔෂින් ජිරෝට හිස නමා ආචාර කළා. ඇය කෙළින්ම ගියේ යගිරෝ මැඩම් ගේ කාමරයට.

"මැඩම්ව බලන්න මම ආවා."

"ඔෂින් ඔයා. ඇයි ඔෂින් කරදරයක් ද ?"

"මගෙ තාත්තා නැති වුණා. අසනීපයෙන් හිටියේ. යමගාටා ඉඳලා එන ගමන් තමයි මේ."

"ආ ඔෂින් ඔයා මෙහෙ? මොනා හරි වෙලාද ?" කාමරයට පැමිණි කායෝ ඇසුවා.

"ඔෂින්ගෙ තාත්ත නැති වෙලා. මුළු ජීවිත කාලයම කුඹුරු වල වැඩ. විවේකයක් ලැබිලා නෑ. අපිට හරි දුකයි ඔෂින්."

"මැඩම් මම ආවේ මගේ විවාහය ගැන කියන්නත් එක්කයි. මම දැන් බිරිඳක්."

" හැබැට අපෙන් සුභ පැතුම් ඔෂින්. " යගිරෝ මහත්මිය සතුටින් කිව්වා.

Rangika

"ඇත්තටම එයා කවුද ඔෂින්."

කායෝ ඇසුවේ නොඉවසිල්ලෙන්.

"ඔයා දන්න කෙනෙක්."

කායෝගේ නොඉවසිල්ල තවත් වැඩි වුණා.

"අනේ කියන්න කවුද කියලා."

"මිස්ට ටනකුරා. "

"මිස්ට ටනකුරා !! අනේ හොඳයි. එයා බොහොම හොඳ මහත්තයෙක්."

"ස්තූතියි මිස් කායෝ. මැඩම් එයා රෙදි වෙළෙන්දෙක්. මුලදී මගේ තාත්තාත් විරුද්ධ වුණා. ඒ වුණාට මැරෙන්න කලින් මම තාත්තාට කිව්වා මගේ විවාහය ගැන. ඊට පස්සේ මට සුභ පැතුවා."

"මිස්ට ටනකුරාගේ පැත්තෙන් ?"

"අම්මා හුගක් විරුද්ධ වුණා. අදටත් එයා විරුද්ධයි. ඒත් තාත්තා ආවා පහුගිය දවසක. අපේ ගෙදර ඉන්නවා සාප්පුවේ වැඩ කරන ගෙන්ජි කියලා මහත්තයෙක්. එයා තමයි හුගක් ම මට විරුද්ධ වුණේ. හැබැයි පස්සේ මා ගැන පැහැදිලා ගෙදරට ලියලා යවලා. ඉතිං තාත්තා ආවා. විවාහයට සුභ පැතුවා. විවාහ උත්සවයක් ගන්න කියලා මුදල් දුන්නා."

"අනේ ඔෂින් ඔයා හරිම වාසනාවන්තයි. මට ඊර්ෂ්‍යා හිතෙනවා ඔයා ගැන." කායෝ කීවා.

"ඔව් ඔෂින් ඔයා හරි වාසනාවන්තයි. ඔෂින්ට හැමෝගෙම හිත් දිනාගෙන වැඩ කරන්න පුළුවන්."

"මැඩම් මම විශේෂයෙන් මෙහෙ ආවේ මැඩමට ස්තූති කරන්න. ඔබ තුමිය තමයි මට ජීවත් වෙන හැටි කියා දුන්නේ. ඉවසීමෙන් කටයුතු කරන හැටි. ඒ විතරක් නෙමෙයි ලියන්න, කියවන්න, ගණන් හදන්න. මේ සේරම මට අද ඉතාමත් ප්‍රයෝජනවත් වෙලා තියෙනවා. මං මැඩමට සදා ණය ගැතියි මැඩම්. "

ඔෂින් බිම අත්දෙක තබා ඒ මත හිස තබාගෙන යශිරෝ මහත්මියට ආචාර කළා.



"ඔෂින් ඔයාට වරදින් නෑ ඔෂින්." යශිරෝ මහත්මියගේ නෙත් අග කඳුලක් දිලිසුණා.

"එන්න ඔෂින් මගෙ කාමරයට යන්න. දැන් ඔයාට මහන්සි ඇතිනේ."

ඔෂින් යශිරෝ මහත්මියට ආචාර කර කායෝ සමග ඇයගේ කාමරයට ගියා. එදා හැන්දෑවේ දෙදෙනාම මුහුදු වෙරළට ගියා. කායෝට ඕනෑ වුණේ ඔෂින්ගෙන් කෝටා ගැන අහන්නයි.

"ඔෂින්, මට ඔයා ගැන හරිම ඉරිසියයි. ඔෂින් මම නම් ජීවත් වුණාට මැරිල වගෙයි. ටාෂිමෝ ගෙදර එන්නෑ හැමදාම. එයා ගේෂා කාන්තාවන් ඇසුරු කරනවා. මුදල් හුගක් වියදම් කරනවා ඒ අයට. කිසිම ආදරයක් නැති කෙනෙක් එක්ක ඇයි මම විවාහ වුණේ. මට තිබුණේ කෝටා කවදාහරි එනතෙක් ටෝකියෝවල ඉන්නයි."

කායෝ මුහුද දෙස බලාගෙන තමාට ම කියා ගත්තා. එකවරම ඇය ඔෂින්ගේ දෙවුරෙන් දැඩිව අල්ලා ගත්තා.

"කියන්න ඔෂින් කෝට මගෙ කාමරේට ආව නේද ? අනේ කියන්න, මට ඇත්ත කියන්න ඔෂින්. කෝට මගෙ කාමරේට එන්න ඇති කියලා මගෙ හිත කියනවා. කියන්න ඔෂින් කියන්න."

ඔෂින් කායෝ දෙස මොහොතක් බලා සිටියා. ඇය සෙමෙන් හිස දෙපසට වනා පැමිණියේ නැති බව හැඟෙව්වා.

"මං මේ ගෙදරින් යනවා යනවාමයි. මම ටෝකියෝ ගිහින් කෝටා එනතුරු බලා ඉන්නවා. ක්ලබ්වල වැඩකරලා ජීවත් වෙන්න සල්ලි හොයා ගන්නවා. මට තවත් ඉවසන්න බෑ ඔෂින්. කෝට නැති ජීවිතයක් මට නෑ ඔෂින්."

"එයා ආපිට ආවේ නෑ මිස් කායෝ. මම ඔයාගේ කාමරේ බඩු විකුණලා කාමරේ බාර දුන්නා. ඊට පස්සේ ආවද මම දන්නේ නෑ. මට කියන්න තියෙන්නේ කෝටා ඔයාට ආදරේ නැති බවයි. මිස් කායෝ ඔයා මෝඩ වැඩ කරන්න එපා."

"ඔයාට මගේ දුක තේරෙන්නෑ ඔෂින්. ඔයා ආදරේ කළ කෙනාව ඔයා විවාහ කරගත්තා. මොකක්ද මගේ ජීවිතයේ තේරුම?' මම හිතින් දුක් විඳ විඳ ඉන්නවා."

"ඇයි මිස් කායෝ ඔයා ඔයාගේ ව්‍යාපාරය දියුණු කරගන්න නොහිතන්නේ. ඒක ඔයාගේ. මහත්තයට දීලා එයා ඒක නාස්ති කරන කල්ද බලාගෙන ඉන්නේ. මම නම් හිතන්නේ ඔයාගේ වරද නිසයි සැමියා වෙනස් වුණේ. අනුන්ට දොස් කියන්න එපා තමන්ගෙ සිතුම් පැතුම් වෙනස් කරගන්න බලන්න."

"කොහොමද මම ඒක කරන්නෙ ඔෂින්."

"බලන්න ඔයාගේ ජීවිතේම විනාශ කළ ඔයාට කිසිම ආදරයක් නැති කෙනෙක් ගැන හිත හිත තැවි තැවී ඔයා ජීවත් වෙන්නේ සිහින ලෝකයක. කෝටාව අමතක කරලා දාන්න. ඔයාගේ ජීවිතේ අලුතින් පටන් ගන්න. ඔයා හොඳට ආදරෙන් කිව්වොත් ඔයාගේ සැමියා ගේෂා කාන්තාවන් හොයන්න යන්නේ නෑ."

"ඔයා දන්නේ නෑ ඔෂින් එයා ඒවා කරන්නේ අපට ලැජ්ජා කරන්න. අපිත් ලැජ්ජාවට ඉවසාගෙන ඉන්නවා."

"පැහැදිලියි නේ මිස් කායෝ. ඔයා බිරිඳක් ලෙස ඔයාගේ යුතුකම් ඉටු නොකරන නිසා ඔයාට රිදවන්නයි ඔහු එහෙම පහත් වැඩ කරන්නේ. ඔයා තවම පමා නෑ. අද ඉඳලා ජීවිතේ හැඩගහගන්න මිස් කායෝ. ආයෙම නම් කවදාවත් කෝට හොයන්න යන්න හිතන්න එපා. එයා සමහර විට හිරේ වැටිලා ඇති. එහෙම නැත්නම් එයා එයාගේ ජීවිතය...."

"නෑ ඔෂින් එහෙම කතා කියන්න එපා. ඒක මට ඉවසන්න බෑ."

"ඒත් මිස් කායෝ අපි ඇත්තට මුහුණ දෙන්න ඕනෑ නේ."

ඔෂින් සෙමෙන් කායෝ ගේ අතින් අල්ලා ගත්තා.

"මිස් කායෝ ඔයා මට යෙහෙළියක්, සොයුරියක්. අපි පුංචි කාලේ එකට හැදුණා වැඩුණා. ඔයා ගෙ හිතේ දුක මටත් වේදනාවක්. ඔයා සතුටින් ඉන්නවා දකින්නයි මට ඕනෑ. ගෙදර සේරටම ඕනෑ ඔයා ගේ සතුට. ඔයා හොඳ උගත් කාන්තාවක්. ඒ වගේම ඔයා පොහොසත්. ඉතින් ඇයි මේ ජීවිතය දුකටම ගෙවා දමන්නේ. මට කියන්න මීට පස්සේ ඔයා අලුත් ජීවිතයක් ගත කරනවා කියලා."

" ඔෂින් ඔයාට තේරුම් ගන්න බෑ මගේ තත්ත්වය. ඒත් මම හිත දාගන්න හුඟාක් උත්සාහ කරන්නම්. "



දෙදෙනාම නිහඬවම ගෙදර ගියා. රාත්‍රියේ ටාෂිමෝ නිවසට ආවා. කායෝ ඔෂින්ගේ අතින් අල්ලාගෙන කාමරයට ගියා. මිනෝත් එතනට ආවා.

"ඔෂින් ඇවිල්ලා අපිව බලන්න." කායෝ සැමියාට කිව්වා. ඒත් ඔහු ඔෂින්ට ආචාර කළේවත් නැහැ.

"මට කායෝ එක්ක කතා කරන්න ඕනෑ. අම්මත් මෙතන ඉන්න එක හොඳයි. මට ඔයාලට කියන්න දෙයක් තියෙනවා. අර මම ආශ්‍රය කරන ගේෂා කෙල්ල ඔසෙණෝ එයා ගැබ්බර වෙලා. ඒ මගෙ දරුවා. ඒ නිසා මට ඒ දරුවා භාරගන්න වෙනවා."

කායෝ මුහුණ වසාගෙන කාමරයෙන් එළියට දුව ගොස් මවගේ කාමරයට වැදුණා. ඔෂින් ඒ පසුපස දුව ගියා.

"මිස් කායෝ ඔහොම ඉන්න."

"දැක්කා නේද ඔෂින්. ඔන්න ඔයාගේ ඇස් දෙකෙන් ම දැක්කා ඔහුගේ හැටි. මං කොහොමද මේවා ඉවසන්නේ ඔෂින්? මට යන්න තැනක් නැති නිසා මං ඉවසනවා. කෝටාටත් මාව එපා නම් මට යන්න තැනක් නෑ ඔෂින්."

කායෝ ඔෂින් වැළඳගෙන හඬා වැලපුණා. ඔෂින්ට තේරුණා කෝටා ගේ පැමිණීම නොසීමෙන් ඇය කායෝට විශාල ද්‍රෝහි කමක් කර ඇති බව. ඇය කායෝ වැළඳගෙන හඬමින් තමාටම ශාප කර ගත්තා. රාත්‍රිය ගෙවී ගියේ හිත් වේදනා සෝ සුසුම් මැදින්. පසුදිනම ඔෂින් නිවැසියන්ගෙන් සමුගත්තා. ඒත් තගායා පැමිණෙන විට තිබූ සැහැල්ලු සිත නම් නැත්තටම නැති වුණා. වරදක් කළ අයෙකු සේ සිත පුරවාගෙන ඇය කායෝගෙන් සමුගත්තා.

"ඔෂින් මම ඔයාට සුබ පතනවා." ඇඬුම් අතරින් කායෝ ඔෂින්ට කිව්වා.

ඔෂින් විශාල සිත් වේදනාවකින් නිවසට පැමිණියත් නිවසේ සුවබර පරිසරය තුළ එය බෙහෙවින් පහව ගියා. කායෝ ගැන සිතන විට තමා කොතරම් වාසනාවන්ත දැයි ඇයට සිතුණා.

"රූසෝ ඔන්න මම ආවා. සමාවෙන්න පරක්කු වුණාට. ආදාහන කටයුතු හොඳට කළා. අම්මා ඔයාට සුභ පැතුවා."

"තාත්තා දැන ගත්තද අපේ විවාහය ගැන."

"ඔව්, මම කිව්වා අපි විවාහ වුණා කියලා. තාත්තා හරියට සතුටු වුණා. මට සුභ පැතුවා. සකේ බොන්න ම ඕනා කිව්වා."

"මමත් ගියානම් තාත්තා එක්ක සකේ බිබී කතා කරන්න තිබුණා නේ." රූසෝ කිව්වා.

"අපි සකේ බොන්න එපා කිව්වා. ඒත් විවාහය සමරන්න සකේ ඕනම කිව්වා. බොහොම සතුටින් හිටියේ. තාත්තා එදා රෑම මිය ගියා."

මේ වෙලාවේ ගෙන්ජි තේ බදුනක් ගෙන ආවා.

"මහන්සි ඇතිනේ තේ බොන්න."

"ස්තූතියි ඔබට. මේ දවස්වල හුඟක් මහන්සි වෙන්න ඇති නේද?"

"ඔබ නැතිව රූසෝ මහත්තයා හිටියේ බොහොම පාළුවෙන්. පිටට ගියෙත් නෑ වෙනදා වගේ."

ගෙන්ජි තේ බදුන තබා එතැනින් ඉවත් වුණා.

"රූසෝ අපේ ගේ හදල නම් ඉවරයි. මම අද ඉඳලා යමගාටා අමතක කරනවා. ආයිම උදව් ඕන නෑ එහාට. මම දැන් ටනකුරා පවුලේ. යමගාටා ගෙලියෙන් කතා කරන්න ඕනෑ නෑ."

"ඔෂින් මම කවදාවත් ඔයාගෙන් වෙන් වෙන්නේ නෑ. ඔයත් එහෙම නේද ? "

"ඔව් රූසෝ. මම සදාකාලිකවම ඔයා එක්ක ඉන්නවා."

"ඔයාගෙන් තොර ලෝකයක් මට නෑ ඔෂින්."

රූසෝ ඔෂින් ව වැළඳ ගත්තා.

"මං කොණ්ඩා දමන්න යන්නද රූසෝ."

"ඔයාගේ කැමැත්තක් ඔෂින්. ඔයා සතුටින් නම් මට ඕනෑ එපමණයි."

"අපි දියුණු වෙන්න ඕනෑ."

"කොහොමටත් මේ කාලයේ මුළු ජපානයටම ආර්ථික ගැටළු තියෙන කාලයක්. අපේ බිස්නස්වලට පාඩුයි. ඒත් අපි මේ කාලයට ඉඩ දීලා අපේ බිස්නස් දියුණු කරමු."



"එහෙම නම් කොණ්ඩා සකස් කරලා ගෙදරට වියදම හොයන්නම්."

පසුවදාම ඔෂින් කොණ්ඩා සැකසුම් උපකරණ ලේන්සුවක ඔතාගෙන සුමිකෝ සහ මිතුරියන් සෙවීමට පිටත් වුණා. ඔෂින්ට දැනුණේ දැඩි සතුටක්. ඇය කල්පනා කළා මම දැන් බිරිඳක්. බිරිඳක් ලෙස ඉටු කළ යුතු යුතුකම් සියල්ල නොපිරිහෙලා ඉටු කළ යුතු බව ඇය සිතුවා. මේ කරදර කාලය ගත වන තෙක් රූසෝට උදව් කිරීමට ඇය තරයේම සිතා ගත්තා. යෙහෙළියන්ට දීම සඳහා වෙළඳපළෙන් රස කැවිලි පෙට්ටියක් ගත්තා. එතනම වූ මල් වෙළඳපළෙන් සකුරා මල් පොකුරක් ගත් ඔෂින් එය අතේ තබාගෙන යෙහෙළියන් සොයා ගියේ ඉතාමත් සතුටින්.

**ඔෂින් නවකතාවේ පළමු කොටස**

**මෙසේ නිමාව දකී.**

**ඔෂින්ගේ මහලුවිය තෙක් ඇගේ ජීවිතයේ බොහෝ සිදුවීම්**

**දෙවන කොටසින් ඔබ හමුවට.**







# ඔෂින්

Rangika